252 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 252 - இல. 2
Volume 252 - No. 2

2017 මැයි 04 වන බ්‍රහස්පතින්දා
2017 மே 04, வியாழக்கிழமை
Thursday, 04th May, 2017

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

අන්තර්ගත ප්‍රධාන කරුණු

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
දෙමළ මාධ්‍ය ගුරු අධ්‍යාපනඥවරුන්ගේ උසස්වීම් ලබා නොදීම

සමාගම් පනත සහ සමිති ආඥාපනත:
නියෝග

සමාගම් පනත:
නියෝග

பிரதான உள்ளடக்கம்

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை

துறைசார் மேற்பார்வைக்குழு அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல்மூல வினா:
தமிழ் மொழிமூல ஆசிரிய கல்வியியலாளர்களுக்கான பதவியுயர்வுகளை வழங்காமை

கம்பனிகள் சட்டம் மற்றும் சங்கங்கள் கட்டளைச் சட்டம் :
ஒழுங்குவிதிகள்

கம்பனிகள் சட்டம் :
ஒழுங்குவிதிகள்

PRINCIPAL CONTENTS

PUBLIC FINANCE COMMITTEE REPORT

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Deprivation of Promotions to Tamil Medium Teacher Educators

COMPANIES ACT AND THE SOCIETIES ORDINANCE:
Regulations

COMPANIES ACT:
Regulations

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2017 මැයි 04 වන බුහස්පතින්දා
2017 மே 04, வியாழக்கிழமை
Thursday, 04th May, 2017

ප.භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2011, 2012 සහ 2013 වර්ෂ සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා මම ඉදිරිපත් කරමි.

එම වාර්තා ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2014 වර්ෂය සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2014 වර්ෂය සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා සෞඛ්‍ය සහ මානව සුබසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2014 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලංකා ලේලන්ඩ් ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව නිෂ්පාදන සහ සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන්, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද "වාර්ෂික ඇස්තමේන්තු පිළිබඳ හඳුන්වාදීමේ සටහනෙහි දක්වා ඇති ජාතික අය වැය දෙපාර්තමේන්තුව යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මගින් සපයා ඇති අතිරේක ප්‍රතිපාදන පිළිබඳ සටහන" සහ "2015 වර්ෂය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)

ගරු කථානායකතුමනි, නිෂ්පාදන සහ සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන්, නිෂ්පාදන සහ

[ගරු සන්දිත් සමරසිංහ මහතා]

සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "2015 වර්ෂය සඳහා පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව" සහ "2015 වර්ෂය සඳහා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව" සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නිහාල් ගලප්පත්ති මහතා - පැමිණ නැත.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) කපුලියද්ද, අනුරගම, අංක 23/6/4 දරන ස්ථානයෙහි පදිංචි බී.එම්.විජේරත්න බණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) බත්තරමුල්ල, වික්‍රමසිංහපුර, 14 වන පටුමඟ, අංක 82/19 දරන ස්ථානයෙහි පදිංචි ජේ. කීර්තිරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) හොරණ, අම්බාගල, අංක 363/2 දරන ස්ථානයෙහි පදිංචි කේ.ආර්.එල්.ජයවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) මාකොල, සභාව පාර, අංක 473/A/30 දරන ස්ථානයෙහි පදිංචි කේ. විජේසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා - පැමිණ නැත.

ගරු බුද්ධික පතිරණ මැතිතුමා. පෙත්සම් 38ක් තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මීට කලින් මම තියපු record එක අද මම ම කඩනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, හොඳයි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තිස්අට පිළිගන්වමි.

(1) ගාල්ල, ඉහළ ඩික්සන් පාර, දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ඒ.එම්.අයි.එස්.ආර්.බී. අබේරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) අකුරැස්ස, ගොඩපිටිය, කනත්තේ වත්ත යන ලිපිනයෙහි පදිංචි ඒ.එන්. චන්ද්‍රලතා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(3) හක්මණ, පොත්තේවෙල, කිරිමගෙරුප්ප යන ලිපිනයෙහි පදිංචි අහංගම ගමගේ සීතා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(4) මතුගම හරහා, හල්වල, අංක 66/A දරන ස්ථානයෙහි පදිංචි අජන්ත නාගහවත්ත මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) මාතර, වැවහමන්දුව, පොකුණහේන, "සම්පත්" යන ලිපිනයෙහි පදිංචි බී.එච්.ඩබ්ලිව්. සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) තෙලිජ්ජවල, උඩුකාව, වෛබීනියාවත්ත යන ලිපිනයෙහි පදිංචි සී.ඒ. ගුණසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(7) වැලිගම, බෙරලෑලිය, වැවහේන වත්ත යන ලිපිනයෙහි පදිංචි සී. ඉඩිප්පිලි මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(8) වැලිගම, මිදිගම, උස්වැලිවත්ත යන ලිපිනයෙහි පදිංචි ඩී.බී. හේමරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(9) අකුරැස්ස, මලිදුව, දෙදියගල, ගුරුල්ලමුල්ල යන ලිපිනයෙහි පදිංචි ඊ.ජී. වික්‍රමරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(10) අකුරැස්ස, මලිදුව, කොහුගොඩ, පහළවෙල, "ක්‍රිෂානි" යන ලිපිනයෙහි පදිංචි ජී.එල්. ක්‍රිෂානි හේමන්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(11) මාතර, නූපේ, ධර්මපාල මාවත, අංක 12/332 දරන ස්ථානයෙහි පදිංචි ජී. වසන්ත කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(12) නාවිමන, නාවිමන උතුර, මාගන්දෙනිය යන ලිපිනයෙහි පදිංචි ගලගමගේ එඩී මහතාගෙන් ලැබුණු පෙත්සම;

(13) මාතර, ගොඩගම, ගොඩඋඩවත්ත යන ලිපිනයෙහි පදිංචි එච්.ඒ. නන්දන හේමප්‍රිය මහතාගෙන් ලැබුණු පෙත්සම;

(14) මාකඳුර, තලහගම, බෙලිකැටිය, යද්දෙනියවත්ත යන ලිපිනයෙහි පදිංචි එච්.ඩබ්ලිව්.ඒ. නන්දසේන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(15) ඉමදුව, ගල්කඩුව, වැවලවත්ත යන ලිපිනයෙහි පදිංචි එච්.වයි. නන්දා මාලනී මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(16) මාතර, කාලිදාස පාර, අංක 10/4 දරන ස්ථානයෙහි පදිංචි කේ.ඒ.කේ. හරසරා මෙනවියගෙන් ලැබුණු පෙත්සම;

(17) පාලටුව, මාලිම්බඩ, පොල් කොරටුව කඩේ යන ලිපිනයෙහි පදිංචි කේ.ජී. ලසන්ත සම්පත් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(18) අකුරැස්ස, හුලංදාව වතුයාය යන ලිපිනයෙහි පදිංචි කේ.එච්.වී. කුසුමාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(19) කඹුරුගමුව, කොටවිල, කැප්පිටියවුව යන ලිපිනයෙහි පදිංචි කේ.කේ. ඇඩ්වින් මහතාගෙන් ලැබුණ පෙත්සම;

(20) රාගම, ගේවත්ත පාර, සොයිසා නිවාස ක්‍රමය, අංක 41/246 දරන ස්ථානයෙහි පදිංචි කිත්සිරි ධර්මපාල මහතාගෙන් ලැබුණු පෙත්සම;

(21) අකුරැස්ස, හේනෙගම, පරගහවත්ත යන ලිපිනයෙහි පදිංචි එම්.එච්. නිහාල් රණසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(22) මාතර, මාකඳුර, තලහගම, වඩිකාව වත්ත යන ලිපිනයෙහි පදිංචි එම්.එල්. සුමතිපාල මහතාගෙන් ලැබුණු පෙත්සම;

(23) කඹුරුපිටිය, ගොරොක්ගහ වත්ත, "සිංහලෙන" යන ලිපිනයෙහි පදිංචි එම්.එම්.ඒ. ගුණසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(24) කැකුණුදුර, පරවාහැර, "ප්‍රසාදි" යන ලිපිනයෙහි පදිංචි එම්.ඩබ්ලිව්.ආර්. සේදර මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(25) කෝට්ටගොඩ, පාරේ කඩේ යන ලිපිනයෙහි පදිංචි එම්.එම්. මොහාන් ඇන්තනී මහතාගෙන් ලැබුණු පෙත්සම;

(26) අපරක්ක, බැද්දෙගම්මැද්ද, තෙළඹුගහවත්ත යන ලිපිනයෙහි පදිංචි එන්.ඒ.ජේ. විජිතා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(27) මාතර, නූපේ, විවෘත විශ්වවිද්‍යාල පාර, අංක 128/1 දරන ස්ථානයෙහි පදිංචි ආර්. බැස්ටියන් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(28) මාතර, රාහුල පාර, අංක 99 දරන ස්ථානයෙහි පදිංචි රංජිත් වනිගසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(29) මීඇල්ල, බඩබද්ද, අංක 26 දරන ස්ථානයෙහි පදිංචි එස්.ඩී. අබේවික්‍රම මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(30) දෙණියාය, පන්සල පාර, "අනුර" යන ලිපිනයෙහි පදිංචි එස්.ජේ. සුසිලා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(31) මාතර, කාලිදාස පාර, අංක 58 සී 1/2 දරන ස්ථානයෙහි පදිංචි එස්. රංජනී මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(32) අකුරැස්ස, බෝපාගොඩ, "සරසී" යන ලිපිනයෙහි පදිංචි සුජාතා පලිහවඩන මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(33) හක්මණ, පොත්තේවෙල, "සිසිල" දරන ස්ථානයෙහි පදිංචි තිලක් දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(34) කඹුරුපිටිය, මලාන, අරඹෙයවත්ත යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ. සුගත් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(35) අකුරැස්ස, මාරඹ, ගල්හේන, පාසල පාර යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ජී. චමරි මධුෂිකා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(36) අකුරැස්ස, මලිදුව, නාවලගොඩ, අංක 193ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එච්. ලක්ෂ්මන් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(37) අකුරැස්ස, ගොඩපිටිය, ගොඩවත්ත පාර, මිගකම්විට යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එම්.පී. පියසේන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(38) මාතර, නාවිමන, දකුණු මිරිස්වත්ත, සෝමාරාම පාර, "විදු පියස" යන ලිපිනයෙහි පදිංචි විදානගේ ජගත් මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා
(மாண்புமிகு நாலக்க பிரசாத் கொலொன்னே)
(The Hon. Nalaka Prasad Colonne)
ගරු කථානායකතුමනි, ගල්ඔය හන්දිය, මින්නේරිය පාර, අංක 58 ලිපිනයෙහි පදිංචි ගාමිණී රත්නායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා - පැමිණ නැත.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලෙස නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, විශේෂ කාරණයක් පිළිබඳව ඔබතුමාගේ අවධානයට ගෙනෙන්න අවසර ඉල්ලනවා.

පළමුවෙන්ම කියන්න ඕනෑ, හිටපු ජනාධිපති සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ජීවිතයට තර්ජනයක් ඇති වන තත්ත්වයකට පත්වෙලා තිබෙන බව. එතුමා විසින්ම ඒ බව ප්‍රකාශ කර තිබෙනවා. මැයි දිනයෙන් පසුව ඊයේ රජය විසින් හදිසියේම මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආරක්ෂක කණ්ඩායම 45දෙනෙකුගෙන් අඩු කරලා, ඊයේ රාත්‍රිය වන විට ඒ සියලු දෙනාම ඉවත් විය යුතුයි කියා නියෝග කර තිබුණා.

ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේදී මෙම ප්‍රශ්නය පිළිබඳව කලින් සාකච්ඡා වෙලා තිබෙන නිසා මම කරුණු කියන්න උත්සාහ දරන්නේ නැහැ. ගරු අගමැතිතුමාම පිළිගත්තා, හමුදා බණ්ඩය ඉවත් කළාට පස්සේ පොලීසිය සහ STF බණ්ඩය ඇතුළත් කරලා අවශ්‍ය පරිදි, අවශ්‍ය ප්‍රමාණයන් ලබා දීම ගැන කිසි ගැටලුවක් නැහැ කියලා. ඒ ක්‍රියාවලිය පසුගිය කාලයේ කළාට පස්සේ දැන් ඉන්නේ පොලීසියේ සහ STF එකේ අය පමණයි. එතුමාගේ ජීවිතයට තර්ජනයක් වන පරිදි හදිසියේම එතුමාගේ මේ කණ්ඩායම ඉවත් කිරීම පිළිබඳ කාරණය මම ගරු කථානායකතුමාගේත්, පාර්ලිමේන්තුවේත් අවධානයට අද යොමු කරනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට පමණක්

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

නොවෙයි, හිටපු ජනාධිපතිතුමා හැටියට එතුමාගේ ජීවිතයට තර්ජනයක් තිබෙන බව එතුමා අද "The Island" පුවත් පතට ප්‍රකාශ කරලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අද උදේ මේ කාරණය සම්බන්ධයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරු තුන් දෙනෙක් මට කථා කළා. සාගල රත්නායක මැතිතුමා අද දවල් වරුවේ මට හමු වනවා. මේ කාරණය පිළිබඳව මම එතුමාව දැනුවත් කරන්නම්. [බාධා කිරීමක්] ඔබතුමන්ලා මේ කාරණය සම්බන්ධයෙන් එතුමන්ලාව දැනුවත් කළාද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Hon. Speaker, I am not trying to make a speech. I am only trying to make a submission. ඊයේ රාත්‍රියේ මම මේ කාරණය සම්බන්ධයෙන් ගරු අගමැතිතුමා එක්ක කථා කළා. සාගල රත්නායක ඇමතිතුමාටත් කථා කළා. නමුත් මේ කටයුත්ත කල් යනවා කියන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ජීවිතයට තර්ජනයක් එල්ල වීමයි. ඒ නිසා ඔබතුමා මේ කටයුත්තට වහාම මැදිහත් වන ලෙස මම ඉතාම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලනවා. මොකද, දේශපාලන වෛරයන් වෙන වෙන අයත් පිරිමහන්න පුළුවන් බව අපි දන්නවා. ඒ නිසා කාට හෝ බය වෙන්න හේතුවක් තිබෙනවා නම් බය වුණාට කමක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මම අද මේ කාරණය සම්බන්ධයෙන් එතුමාව දැනුවත් කරන්නම්, ගරු මන්ත්‍රීතුමා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මොකටද, බය වෙන්නේ? [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් මම ගරු අගමැතිතුමාගේත්, ගරු ජනාධිපතිතුමාගේත් අවධානය යොමු කරන්නම්. මෙතුමා කියන විධියට අපට හමුදා ආරක්ෂාව ඉවත් කිරීමේ වුවමනාවක් නැහැ. අපි එතුමාට ආරක්ෂාව දීලා තිබෙනවා. එස්ටීඑෆ් එකත් දීලා තිබෙනවා; පොලීසියත් දීලා තිබෙනවා. මෙතුමා කියන විධියට එතුමාගේ ආරක්ෂාව සම්පූර්ණයෙන්ම ඉවත් කරලා නැහැ. පොලීසියත් ඉන්නවා. එස්ටීඑෆ් එකත් ඉන්නවා. එස්ටීඑෆ් එක හොඳම කණ්ඩායමක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. අපි කථා කරමු. මම සාගල ඇමතිතුමාත් හම්බ වුණාට පස්සේ දැනුවත් කරන්නම්. ඒ සම්බන්ධයෙන් විවාදයක් අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ කරුණු ගැන අවධානය යොමු කළා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඉදිරිපත් කරපු කාරණයට පහසුවක් වීම සඳහා ඊට අදාළ කරුණු දෙකක් ඉදිරිපත් කිරීමට පමණයි මා බලාපොරොත්තු වෙන්නේ. ගරු සභානායකතුමනි, පළමුවැනි කාරණය මෙයයි. ඔබතුමා දන්නවා, මේ සභාවේ ඉන්න විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු වන සුමන්තිරන් මන්ත්‍රීතුමාගේ ජීවිතයට එල්ටීටීඊ සංවිධානයෙන් තර්ජනයක් වෙලා තිබෙන බව. ඒ සම්බන්ධයෙන් විශාල පරීක්ෂණයක් ක්‍රියාත්මක වෙනවා. ගරු කථානායකතුමනි, සුමන්තිරන් මන්ත්‍රීතුමාට එල්ටීටීඊ එකෙන් තර්ජනයක් තිබෙනවා නම් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට ඒ වාගේ ලක්ෂ ගුණයක තර්ජනයක් තිබෙන්නට ඕනෑ. ඒ පළමුවැනි කාරණයයි.

දෙවැනි කාරණය මෙයයි. මේ මැයි දිනයේදී කැම්බල් පිටියේදී අපේ වග කිව යුතු ඇමතිවරයෙක් වන සරත් ෆොන්සේකා මැතිතුමාගේ කථාව ඔබතුමා අහන්න ඇති. මේ රටේ විනය හදන්න විශේෂ ඒකකයක් හදලා ඒක සරත් ෆොන්සේකා මැතිතුමාට භාර දෙනවාය කියලා කැබිනට් ප්‍රකාශකතුමා -රාජිත සේනාරත්න මැතිතුමා- කිව්වා. ඒ වග කීම භාර දෙන්නට යන සරත් ෆොන්සේකා මැතිතුමා කිව්වා, "හිටපු ජනාධිපතිවරයා ප්‍රාණය නිරුද්ධ වෙන තුරු සාටකයෙන් එල්ල මරන්න ඕනෑ" කියලා. ප්‍රසිද්ධ ප්‍රකාශයක් කළා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මම ඒ ගැන අවධානය යොමු කරන්නම්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මේ ප්‍රකාශ බරපතළයි. ගරු කථානායකතුමනි, ප්‍රාථමික දේශපාලනයට නොවෙයි, අපි යා යුත්තේ. ඒ නිසා මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ඒක අදාළ නැහැ. [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මැතිතුමා. මේ කරුණ සම්බන්ධයෙන් මම අවධානය යොමු කරලා, ගරු සාගල රත්නායක මැතිතුමා සමඟ සාකච්ඡා කරලා දැනුවත් කරන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නමුත් ගරු කථානායකතුමනි, අපි අවධානය යොමු කරන්න ඕනෑ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ කියන්නේ, එතුමා යම් දේශපාලන ව්‍යාපාරයක් නියෝජනය කළ කණ්ඩායමක ප්‍රධානියෙක්. ඔවුන් මැයි දින රැස්වීමක් පැවැත්වූවාට පස්සේ ඒ මත පදනම් වෙලා ආරක්ෂාව ඉවත් කිරීම හෝ ලබාදීම තීරණය කරනවා නම්, ඒක අනිවාර්යයෙන්ම දේශපාලන ක්‍රියාදාමයක්. ඔහුට ආරක්ෂාව දෙනවාද, නැද්ද කියන කාරණය තීරණය කරන්නට ඕනෑ තර්ජනයක් තිබෙනවාද, නැද්ද කියන සාධකය මතයි. හැබැයි, ඒක යම් දේශපාලන ක්‍රියාකාරකම් මත තීරණය වෙනවා නම්, ඒක සාධාරණ නැහැ. ගරු කථානායකතුමනි, ආණ්ඩුව සතුව තිබෙන ආරක්ෂක බලය හෝ ආණ්ඩුව සතුව තිබෙන අනෙකුත් පහසුකම් ලබාදීමේ බලය මත දේශපාලන නායකයන් වෙත හෝ දේශපාලන ව්‍යාපාර වෙත බලපෑම් කිරීම යුක්ති සහගත නැහැ. ඒ වෙනුවට අවශ්‍ය නම් ඔබතුමන්ලාට වෙනත් ආයතන තිබෙනවා. ඒ ආයතන පසෙකලා, පහසුවෙන්ම තමන් සතුව තිබෙන දේශපාලන බලය උපයෝගී කර ගෙන එක් එක් දේශපාලන ව්‍යාපාර සහ නායකයන් වෙත මෙවැනි බලපෑම් ඇති කිරීම සාධාරණ නැහැ, ගරු කථානායකතුමනි. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු මන්ත්‍රීතුමා, ඒ ගැන මම සොයා බලන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ නිසා ඒ පිළිබඳව අනිවාර්යයෙන්ම අවධානය යොමු කළ යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා. [බාධා කිරීමක්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I want to raise a very brief point.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, we discussed this in the morning. I do not want to have a debate on this. Hon. Nanayakkara, you spoke to me on this. ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා, අපි මේ ගැන උදේ කථා කළා. මේ කථාව මෙතැනින් අපි අවසාන කරමු.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මේ ආරක්ෂාව සැපයීමට කුමන හෝ නිර්ණායකයක් තිබෙනවා. ඒ නිර්ණායක පදනම්ව තමයි ආරක්ෂාව ලබා දෙන්නේ හෝ ආරක්ෂාව අඩු කරන්නේ. ඒ නිර්ණායක කවරේද කියන එක ගැනවත් නොතකා, ඒ ගැන ප්‍රසිද්ධියේ ප්‍රකාශයක් නොකර, කුමන නිර්ණායක මත මෙසේ වෙනස් කිරීම් කරනවාද නොකියා, හිතුවක්කාර ලෙස මෙය කිරීම, - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට අවස්ථාව දෙන්න. ගරු අමාත්‍යතුමා සමඟත්, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ගරු ජනාධිපතිතුමා සමඟත් මා මේ ගැන කතා කරන්නම්. ඒ නිසා මට කාලය ලබා දෙන්න.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1-921/'16-(2), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. "ප්‍රශ්නවලට වාචික පිළිතුරු" පැය දැන් පටන් ගන්න කියා මා ඉල්ලනවා.

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Housing and Construction)
ගරු කථානායකතුමනි, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා මතු කරන්නේ ඉතා වැදගත් ප්‍රශ්නයක්. Foreign Exchange Bill එක පිළිබඳව Supreme Court එකේ තීරණය ඔබතුමා ඊයේ දිනයේදී මේ ගරු සභාවට දැනුම් දුන්නා, ගරු කථානායකතුමනි. එහි මෙසේ සඳහන් වනවා:

"A Bill titled 'Foreign Exchange' In the matter of Applications under Article 121 of the Constitution."

ඒ එක් petitioner කෙනෙක්, මම. ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවට තිබෙන මුදල් බලය මත, පුරවැසියන් හැටියට අපට තිබෙන අයිතිය අනුව අපි Supreme Court එකට ගියා, විදේශ විනිමය පාලනය පිළිබඳ රෙගුලාසි සියල්ල ලිහිල් කරලා එල්ටීටීඊ ඩයස්පෝරාව ඇතුළු foreign exchange ජාවාරම්කරුවන්ට මුදල් විශුද්ධිකරණය යටතේ black money මෙහේට ගෙනෙන්න ඉඩ දෙන අවස්ථාව වළක්වන්න. ගරු කථානායකතුමනි, ඔබතුමාට Supreme Court එකේ ඒ තීරණය එවා තිබුණා. එහි ඉතා පැහැදිලිව සඳහන් කර තිබෙනවා, Supreme Court තීරණයේ සඳහන් නිවැරැදිකිරීම්වලට යටත්ව පමණයි එම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන්නේ කියා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, එහෙම තමයි. මා ඊයේ ඒ තීරණය දැනුම් දුන්නේ ඒ විධියට තමයි. ගරු සභානායකතුමා, ඒ පිළිබඳව පැහැදිලි කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ඊයේ ඔබතුමා පැහැදිලිව කිව්වා, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවට යටත්වයි කියා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. මම එය පැහැදිලි කළා. ඒ අනුව තමයි කටයුතු වෙන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ඒක නොවෙයි ප්‍රශ්නය.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේවා මනඃකල්පිත යෝජනා. [බාධා කිරීමක්]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒක නොවෙයි ප්‍රශ්නය. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. මේක, ව්‍යවස්ථාදායකය. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය මොකක්ද කියලා කියන්න කෝ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නය තමයි ඔබතුමා ප්‍රකාශය කළාට පසුව මුදල් ඇමතිතුමා කිව්වා, අපේ රට විනාශ කරන්න මෙහෙම නඩු හබවලට ගිහිල්ලා කටයුතු කරනවා; Supreme Court එකේ විනිශ්චයකාරවරුන්ට ස්තුතිවන්ත වෙනවා. එතුමන්ලා මේවා රටට හිතකරයි කියා නිර්දේශ කරලා තිබෙනවා කියලා. ඒ වාගේ සම්පූර්ණ වැරදි අර්ථකථනයක් එතුමා ගරු සභාවට දුන්නා. ඒවා තමයි මාධ්‍යවල ප්‍රචාරය වන්නේ. රාජ්‍ය බලය පාවිච්චි කරලා මුදල් ඇමතිතුමා කියන,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ගරු සභානායකතුමා කියනවා, ඒක ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයට යටත්ව කරන්නේ කියලා. I accept that.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, නඩු තීන්දුවක් හොඳයි කියන්නත් පුළුවන්; වැරදියි කියන්නත් පුළුවන්. එතුමා කිව්වා හොඳයි කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
We will leave it at that. ගරු මන්ත්‍රීතුමා, මම ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධ කොටස් අපි ඉවත් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒ guarantee එක තිබෙනවා නේ. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ ගොල්ලන් දැන් සල්ලි එනවාට විරුද්ධයි. දැන් විශාල මුදල් ප්‍රමාණයක්,-[බාධා කිරීමක්]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
අපි මොකටද, විරුද්ධ වෙන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දවසේ වැඩ කටයුතු කරගෙන යන්න මට අවස්ථාව දෙන්න. සභානායකතුමා පාර්ලිමේන්තුවට සහතිකයක් දෙනවා,

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට යටත්ව කෙරෙනවා කියලා. බොහොම ස්තුතියි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ගීතා සමන්මලී කුමාරසිංහ මන්ත්‍රීතුමිය ඒ තනතුර දැරීමට නුසුදුසුයි කියා ඊයේ දිනයේ අභියාචනාධිකරණය තීන්දුවක් දීලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් තවම ඔබතුමා දැනුවත් වෙලා නැද්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තවම මට ලිඛිතව දැනුම්දීලා නැහැ. දැනුම් දුන් පසු සුදුසු පරිදි ක්‍රියා කරනවා.[බාධා කිරීම්]

සම්පත් වේරගොඩ මහතා පිළිබඳ විමර්ශන කටයුතු: නිර්දේශ

திரு. சம்பத் வேரகொட மீதான புலன்விசாரணை: சிபாரிசுகள்

INQUIRY ON MR. SAMPATH WERAGODA: RECOMMENDATIONS

992/'16

2. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරි, සම්පත් වේරගොඩ මහතා, ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලේ විදුහල්පති ලෙස පත් කර තිබේද;

(ii) ඔහු මොරටුව, වේල්ස් කුමර විද්‍යාලයේ විදුහල්පති ලෙස කටයුතු කළ සමයේ දී මුදල් වංචාවක් සිදු කිරීම සම්බන්ධයෙන් පවත්වනු ලැබූ අවසන් වූ දිනය කවරේද;

(iii) එසේ නම්, එම විමර්ශනයේ නිගමන සහ නිර්දේශයන් කවරේද;

(iv) ඔහුට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සිදු කරන විමර්ශනය අවසන් වී තිබේද;

(v) එසේ නම්, එහි නිගමන සහ නිර්දේශයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

කල්වි අමෙච්චරෙක් කේට්ට වීනා:

(අ)(i) இலங்கை கல்வி நிர்வாகச் சேவையின் உத்தியோகத்தர் திரு.சம்பத் வேரகொட காலி ரிச்மன்ட் கல்லூரியின் அதிபராக நியமிக்கப்பட்டுள்ளாரா என்பதையும்;

(ii) இவர் மொரட்டுவ வேல்ஸ் குமார கல்லூரி அதிபராகச் சேவையாற்றிய காலத்தில் நிதி மோசடி செய்தமை தொடர்பாக நடத்தப்பட்ட புலன்விசாரணை நடவடிக்கைகள் எப்போது நிறைவடைந்தன என்பதையும்;

(iii) அவ்வாறெனின், அந்தப் புலன்விசாரணையின் முடிவுகள் மற்றும் சிபாரிசுகள் யாவை என்பதையும்;

(iv) இவருக்கு எதிராக இலஞ்சம் அல்லது ஊழல் குற்றச்சாட்டு பற்றிய புலனாய்வு ஆணைக்குழு முன்னெடுக்கும் புலன்விசாரணை முடிவடைந்துள்ளதா என்பதையும்;

(v) ஆமெனில், அதன் முடிவுகள் மற்றும் சிபாரிசுகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) whether Mr. Sampath Weragoda, officer of Sri Lanka Educational Administrative Service, has been appointed as the Principal of Richmond College, Galle;

(ii) the date on which the inquiries conducted on him in regard to the commission of a financial fraud during the period in which he functioned as the Principal of Prince of Wales College in Moratuwa, was concluded;

(iii) if so, the decisions and the recommendations of the aforesaid inquiry;

(iv) whether the inquiry which is being conducted by the Commission to Investigate Allegations of Bribery or Corruption, against him is over; and

(v) if so the decisions and the recommendations of that inquiry?

(b) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) තාවකාලිකව අනුයුක්ත කර ඇත.

ගා/රිච්මන්ඩ් විද්‍යාලේ විදුහල්පති තනතුරෙහි රාජකාරී ආවරණය කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව අමාත්‍යාංශ ලේකම්ගේ 2016.01.07 දිනැති ලිපිය මඟින් තාවකාලිකව අනුයුක්ත කර ඇත.

(ii) මූලික විමර්ශන දෙකක් පවත්වා ඇත.

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

පළමු මූලික විමර්ශනයේ වාර්තාව 2013.08.12 දින ලබා දී ඇත.

එහි නිර්දේශ අනුව පැවති විධිමත් විනය පරීක්ෂණයේ වාර්තාව අනුව චෝදනා පත්‍රයක් නිකුත් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙහි අධ්‍යාපන සේවා කමිටුව විසින් පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයේ වාර්තාව හා විනය නියෝගය 2017.02.08 දිනැතිව ලබා දී ඇත.

පළමු මූලික විමර්ශනයේ නිර්දේශ මත පැවැත්වූ දෙවන මූලික විමර්ශනයේ වාර්තාව 2015.07.10 දින ලබා දී ඇත. එහි නිර්දේශ අනුව පැවැත්වෙන විධිමත් විනය පරීක්ෂණය තවම අවසන් නැත.

(iii) 2017.02.08 දිනැතිව මූලික විමර්ශනයන්හි නිර්දේශය වන්නේ චෝදනා පත්‍රයක් නිකුත් කර විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලෙසය. මේ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා එහි නිර්දේශ අනුව චෝදනා කිහිපයකට වරදකරු කිරීමද, තවත් චෝදනා කිහිපයකට නිවැරදිකරු කිරීමද සිදු කර වැටුප් වර්ධක 3ක් විලම්භනය කිරීම හා තදින් තරවටු කිරීම යන දඬුවම් ලබා දී ඇත.

(iv) නැත.

(v) විමර්ශන කටයුතු අවසන් නොවන නිසා අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(*மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில*)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු අමාත්‍යතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. මූල්‍ය වංචාවක් පිළිබඳ මූලික විමර්ශනය සිද්ධ කරලා එහිදී චෝදනා පත්‍රයක් ඉදිරිපත් කිරීමට තරම් කරුණු තිබෙනවා කියලා විධිමත් චෝදනා පත්‍රයක් ඉදිරිපත් කිරීමට නිගමනය කර තිබියදී, හිටිය පාසලට වඩා හොඳ පාසලක් ඔහුට ලබාදීමෙන් අන් විදුහල්පතිවරුන්ට අසාධාරණයක්ද, වංචා දූෂණවලට දිරිමත් කිරීමක්ද වර්තමාන ආණ්ඩුව කරන බව පෙනී යන්නේ නැද්ද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(*மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, ඔහුගේ වැටුප් වර්ධක තුනක් විලම්බනය කර දඬුවම් දීලා තිබෙන්නේ. අනික් විමර්ශනය කෙරිගෙන යනවා. මෙය අප ඇති කළ තත්ත්වයක් නොවෙයි. විදුහල්පතිවරු විශාල සංඛ්‍යාවකගේ මේ තත්ත්වයම තමයි තිබෙන්නේ. ඒක පසු ගිය කාලයේ ඇති වුණු සංස්කෘතිය. තමුන්නාන්සේලා උපගුරුවරු වැඩ බලන්න දමලා, දැනට උපගුරුවරු 4,400ක් වැඩ බලනවා. මේකට සරිලන්න තමයි අප විදුහල්පතිවරු බඳවා ගැනීමේ විභාගයක් පවත්වලා දේශපාලනය බින්දුවක්වත් ගාවන්නේ නැතිව 3,901ක් බඳවා ගත්තේ. මේක අපේ ප්‍රශ්නයක් නොවෙයි. එහෙම නම් ඔබතුමා මට විදුහල්පතිවරු සොයා දෙන්න. මම ඒ අය පාසල්වලට දමන්නම්, ගරු මන්ත්‍රීතුමනි. ගරු කථානායකතුමනි, පාසල්වලට දමන්න විදුහල්පතිවරු නැහැ. ඒකයි තිබෙන ප්‍රශ්නය. දැනට මේ ඉන්න ටිකදෙනා තමයි එහාට මෙහාට කරකවන්න වෙලා තිබෙන්නේ. මේ හැමෝටම නොවෙයි, බහුතරයකට පොඩි පොඩි හෝ මෙවැනි සිද්ධි තිබෙනවා. දැනට ඉන්න අයගෙන්ම තමයි පාසල්වලට දමන්න වෙලා තිබෙන්නේ.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(*மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில*)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, "කොහෙද යන්නේ?" කියා ඇහුවාම, "මල්ලෙ පොල්" කිව්වා වාගේ උත්තර තමයි අපේ ගරු ඇමතිතුමා දෙන්නේ. එක චෝදනාවකට වැරැදිකරු වෙලා, තවත් චෝදනාවක් විමර්ශනය වෙමින් පවතිද්දි, රටේ තිබෙන කීර්තිමත්ම පාසලක් ඒ විදුහල්පතිවරයාට භාර දීලා කියනවා, " මට විදුහල්පතිවරු නැහැ." කියා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමන්ලා රට භාරගෙන වසර දෙකහමාරකට පසුවත් ඒ ප්‍රශ්නය විසඳාගන්න බැරි වුණා නම් පරණ ආණ්ඩුවට දොස් කියන එක දැන්වත් නතර කරලා, තමන්ගේ අඩු පාඩු හදා ගත්තොත්, අඩුම ගණනේ තව වසරකින්වත් ඔබතුමාට ඇවිත් කියන්න පුළුවන්, "මේ ප්‍රශ්නය විසඳුවා." කියා.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(*மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில*)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු අමාත්‍යතුමනි, ප්‍රමාණවත් ආකාරයට විදුහල්පතිවරු පත් කරගැනීමට ඔබතුමා යොදා ඇති වැඩ පිළිවෙළ කුමක්ද කියන එකයි මම දෙවැනි අතුරු ප්‍රශ්නය වශයෙන් අහන්නේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(*மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, "කොහෙද යන්නේ, මල්ලෙ පොල්" කථා එතුමා තමයි කියන්නේ. මම හරියට උත්තරයක් දුන්නා.

ඒක තමයි, ගරු කථානායකතුමනි වැටුප් විලම්බනයක් කර තිබෙනවා, ඒ අනුව දඬුවමක් දී තිබෙනවාය කියන එක. නමුත් ඒකෙන් අදහස් වන්නේ නැහැ, නැවත තනතුරක් ලැබීමට ඔහු නුසුදුස්සෙක් කියලා. නීතිඥයෙක් විධියට ඔබතුමා නැවත මේ වාගේ ප්‍රශ්නයක් ඇසීම පිළිබඳව මා කනගාටු වෙනවා. මොකද, ඔහුට දඬුවම දීලා තිබෙනවා. නමුත් ඔහුගේ ශ්‍රේණිය අනුව ඔහු වෙනත් තැනක ස්ථානගත කිරීමේ නොහැකියාවක් නැහැ, ගරු කථානායකතුමනි.

තමුන්නාන්සේ දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් ඇහුවා, ඒ සම්බන්ධයෙන් අරගෙන තිබෙන ක්‍රියා මාර්ගය මොකක්ද කියලා. ක්‍රියා මාර්ගය තමයි, අධ්‍යාපන පරිපාලනය විධිමත් කරන්න මේ වන විට කටයුතු කර තිබීම. උදාහරණයක් විධියට අධ්‍යාපන පරිපාලන සේවයේ පුරප්පාඩු 882ක් තිබුණා. තමුන්නාන්සේලා පිරෙව්වේ නැහැ. ඒ සඳහා අපි දැන් විභාග පවත්වලා තිබෙනවා. විවෘත තරග විභාගයෙන් ගත්ත අයට වසරක පුහුණුවක් දෙනවා. ඒගොල්ලෝ පුහුණුව ලබමින් යනවා. අනෙක් පුරප්පාඩු පුරවලා තිබෙනවා. ඒ අනුව අධ්‍යාපන පරිපාලන සේවයට 882ක් ගත්තා, දේශපාලනය බින්දුවක්වත් සම්බන්ධ නැහැ. ඒ වාගේම විදුහල්පතිවරු 3,901ක් බඳවා ගෙන මාස එකහමාරක පූර්ණකාලීන පුහුණුවක් දීලා, විදේශීය පුහුණුවත් ලබා දීලා දැන් පද්ධතියට දමා තිබෙනවා. මීට වඩා කරන්න තිබෙන්නේ මොකක්ද? පසු ගිය කාලයේ ඒවා නොකළ නිසා තමයි දැන් මේ ටික කරලා තිබෙන්නේ. මීට වඩා කරන්න දෙයක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)

හොඳයි. තවත් අතුරු ප්‍රශ්නයක් තිබෙනවාද?

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මම නීතිඥයෙක් කියන එක ඔබතුමා සිහිපත් කළ නිසා මේ ප්‍රශ්නය ඇසිය යුතුමයි. ගරු ඇමතිතුමනි, තමන්ගේ දේශපාලන හෙංචයියන් වැඩිදි කර හසු වුණාම ඒ අයට දඩුවම් ලබා දෙනවා වෙනුවට, රටේ තිබෙන කීර්තිමත්ම පාසලක භාරකාරත්වය භාර දිය යුතු යැයි නීති පොතේ කොතැනදැයි තිබෙන්නේ කියන එක මම නොදන්නා නිසා, නොදන්නාකමට ඔබතුමාගෙන් අසමි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, අපි විදුහල්පතිවරුන් තෝරලා ප්‍රධාන පාසල්වලට දමන්න ඕනෑ, ඉන්න විදුහල්පතිවරුන්ගේ සංචිතයෙන් නේ.

විදුහල්පතිවරුන් සංචිතයෙන් දමද්දී මේ සංචිතයේ ඉන්න බොහෝ අයට මේ වාගේ ප්‍රශ්න තිබෙනවා. එතකොට ඉන්න අයගෙන් අවම ප්‍රශ්න තිබෙන කෙනෙක් තමයි දමන්න වෙන්නේ. තමුන්නාන්සේලාගේ පාලන කාලයේ තමුන්නාන්සේලාට පාසලක විදුහල්පතිවරයෙක් අයින් කරගන්න බැරි වුණාට, අපි ප්‍රධාන පාසල්වල පවා වැඩිදි කරපු විදුහල්පතිවරු සම්බන්ධයෙන් තීන්දු තීරණ ගත්තා. දැන් මේ ගොල්ලන් දේශපාලන න්‍යාය පත්‍රයට යන්න හදනවා.

ගරු කථානායකතුමනි, පසුගිය දවස්වල සෙල්සියස් අංශක 40කට වැඩිය උෂ්ණත්වය වැඩි වුණා. හැමතැනම ඩෙංගු රෝගීන් සහ උණ රෝගීන් බිහි වුණා. බොහෝ අයගේ ඉල්ලීමක් තිබුණා, පාසල් නිවාඩු දෙන්න කියලා. ඒත් අපි පාසල් නිවාඩු දුන්නේ නැහැ. මොකද, මේ රටේ එක දවසකට වුණත් අධ්‍යාපනය ලබා දීම වටිනා නිසා. දැන් මේ ගොල්ලන්, බල තණ්හාව නිසා විපක්ෂයේ ඉන්න බැරිකමට සමහර ව්‍යාත්තීය සමිති ටිකක් එකතු කරගෙන ගුරුවරු අසනීප නිවාඩු යවන්න හදනවා. එහෙම කරන අයට තමයි අධ්‍යාපනය ගැන බොහොම ආදරයක් පහළ වෙලා තිබෙන්නේ.

සෙත්සිරිපාය දෙවැනි අදියර නව ගොඩනැඟිල්ල හා සුහුරුපාය: බදු මුදල හා සේවා ගාස්තු

'செத்சிறிபாய' 2வது கட்டம் மற்றும் 'சுகுருபாய' புதிய கட்டிடங்கள் : குத்தகை மற்றும் சேவைக் கட்டணம்

SETHSIRIPAYA STAGE II NEW BUILDING AND SUHURUPAYA: LEASE AND SERVICE CHARGE

1048/'16

3. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පිහිටි සෙත්සිරිපාය දෙවැනි අදියර නව ගොඩනැඟිල්ලේ හා සුහුරුපාය නව ගොඩනැඟිල්ලේ වර්ග අඩියකට අයකරනු ලබන බදු මුදල හා සේවා ගාස්තුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මෙම ගොඩනැඟිලිවල රථ ගාල් කිරීමට ඇති ඉඩ සඳහා ගෙවීමක් සිදු කළ යුතුද;

(iii) එසේ නම්, එම ගාස්තුව, එක් එක් ගොඩනැඟිල්ල අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මෙම ගාස්තු සංශෝධනයට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

மாநகர மற்றும் மேல்மாகாண அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ)(i) ஸ்ரீ ஜயவர்த்தனபுர கோட்டையில் அமைந்துள்ள செத்சிறிபாய இரண்டாவது கட்டத்தின், புதிய கட்டிடத்தினதும் `சுகுருபாய' புதிய கட்டிடத் தினதும் ஒரு சதுர அடிக்கான குத்தகைப் பணம் மற்றும் சேவைக் கட்டணம் வெவ்வேறாக யாதென்பதையும்;

(ii) மேற்படி கட்டிடங்களில் வாகன தரிப்பிட வசதிகளுக்கு கொடுப்பனவொன்றை மேற் கொள்ள வேண்டுமா என்பதையும்;

(iii) ஆமெனில், குறித்த கட்டணம் ஒவ்வொரு கட்டிடத்துக்கும் ஏற்ப வெவ்வேறாக யாதென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ)(i) மேற்படி கட்டணத்தைத் திருத்துவதற்குத் தேவை யான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

(ii) ஆமெனில், குறித்த திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Megapolis and Western Development:

(a) Will he inform this House -

(i) separately, the lease amount and service charge per square foot at the new building of Sethsiripaya Stage II and Suhurupaya at Sri Jayewardenepura Kotte;

(ii) whether a payment should be made for the parking spaces at these buildings;

(iii) if so, separately, the amount that should be paid for the parking space of each of the aforesaid buildings?

(b) Will he also inform this House -

(i) whether action will be taken to revise the aforesaid fees that are charged;

(ii) if so, the date from which such revision will be made?

(c) If not why?

ගරු ලසන්ත අලගියවන්න මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லசந்த அலகியவன்ன - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Megapolis and Western Development)

ගරු කථානායකතුමනි, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) සෙත්සිරිපාය දෙවන අදියර නව ගොඩනැඟිල්ලේ වර්ග අඩියක් සඳහා කුලිය, සේවා ගාස්තු සහ බදු ඇතුළත්ව පහත සඳහන් පරිදි වේ.

වර්ග අඩියක් සඳහා කුලිය - රු. 133.98

වර්ග අඩියක් සඳහා සේවා ගාස්තු - රු. 66.99

ජාතිය ගොඩනැගීමේ බද්ද - රු. 4.10

අගය මත එකතු කළ බද්ද - රු. 30.75

ඒ අනුව සියලු බදු ඇතුළත්ව වර්ග අඩියක් සඳහා කුලී මුදල - රු. 235.82

සුභූරුපාය ගොඩනැඟිල්ල නාගරික සංවර්ධන අධිකාරිය සතු නොවන අතර, එය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය සතු ගොඩනැඟිල්ලකි. ඒ අනුව, ඒ පිළිබඳව වාර්තා ඉදිරිපත් කිරීමට අපට පුළුවන්කමක් නැහැ.

(ii) සෙත්සිරිපාය දෙවන අදියර නව ගොඩනැඟිල්ලේ රථ ගාල් තුළ කිසිදු මුදල් අය කිරීමක් සිදු නොකෙරේ.

(iii) අදාළ නැත.

(ආ) (i) අදාළ නැත.

(ii) අදාළ නැත.

(ඇ) අදාළ නැත.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් යම් කරුණක් දැන ගැනීමට කැමැතියි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා දැන් සඳහන් කළා, සෙත්සිරිපාය දෙවන අදියර නව ගොඩනැඟිල්ලේ වර්ග අඩියක් සඳහා කුලිය රුපියල් 133ක් සහ වර්ග අඩියක් සඳහා සේවා ගාස්තුව රුපියල් 66ක් බව. බදුත් සමඟ එකතු කරලා තමයි ඔබතුමා ඒ ගණන සඳහන් කළේ. පවතින මිල ගණන් අනුව පෞද්ගලික ව්‍යාපාරිකයන් බදු වශයෙන් සහ මේ විධියට ගාස්තු වශයෙන් අය කරන මුදල් පිළිබඳවත් සලකමින් මෙම මුදල වාර්ෂිකව සංශෝධනය කිරීම සඳහා යම් කිසි ක්‍රමවේදයක් රජයට සහ ඔබතුමාගේ අමාත්‍යාංශයට තිබෙනවාද?

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා යෝජනා කරන්නේ, මෙම ගාස්තු සංශෝධනය කරන්න ඕනෑ කියලාද?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මම අහන්නේ එහෙම ක්‍රමවේදයක් තිබෙනවාද කියලායි. එහෙම නැත්නම් වසර ගණනාවක් -අවුරුදු පහළොවක් විස්සක්- එකම මුදලද පවතින්නේ?

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

නැහැ. විශේෂයෙන්ම කාලෝචිත අවශ්‍යතා අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට පුළුවන්, තීරණය කරලා එම ගාස්තු සංශෝධනය කරන්න. දැනට එවැනි ප්‍රතිපත්තියක් නැහැ. නමුත් කාලයේ අවශ්‍යතාව මත එය සංශෝධනය කරනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. රජයේ ගොඩනැඟිලි මේ විධියට එක පැත්තකින් පාවිච්චි වෙද්දී, තවත් බොහෝ රාජ්‍ය ආයතන -අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා අධිකාරි- බොහෝ ප්‍රමාණයක් පවතින්නේ පෞද්ගලික ගොඩනැඟිලි තුළයි. අපි දන්නවා, සෙත්සිරිපාය පළමුවැනි අදියර, දෙවැනි අදියර ඒ වාගේම සුභූරුපාය වැනි ගොඩනැඟිලි තිබෙන බව. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය මෙවැනි ගොඩනැඟිලි කීයක් ඉදිරි වර්ෂ තුළ නිම කරලා රාජ්‍ය ආයතන රාජ්‍ය ගොඩනැඟිලි තුළට ගෙන එන්නට සැලසුම් කරලා තිබෙනවාද?

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

විශේෂයෙන්ම, කොළඹ නගරය තුළ තිබෙන සියලුම රාජ්‍ය ආයතන කොළඹින් පිටතට ගෙන යෑමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. ඒ අනුව ඉදිරියේදී තවත් මෙවැනි ගොඩනැඟිලි කිහිපයක් බත්තරමුල්ල ප්‍රදේශයේ ඉදි කිරීමට නියමිතව තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

කොළඹ නගරයේ තිබෙන බොහෝ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල බත්තරමුල්ල සහ ඒ අවට ප්‍රදේශයේ ස්ථාපනය වීමත් සමඟ මේ වන විට කොළඹ නගරයට නොදෙවෙනි, වාහන එක තැන හිරවීමේ දැවැන්ත අර්බුදයකට බත්තරමුල්ල සහ ඒ අවට ප්‍රදේශය පත්වෙලා තිබෙනවා. ඒ ප්‍රශ්නය විසඳීම සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශයත්, විශේෂයෙන් මහා මාර්ග අමාත්‍යාංශයත් ඒකාබද්ධ වැඩ පිළිවෙළකට යා යුතුයි. මේ අවස්ථාවේ මහා මාර්ග විෂය භාර ගරු අමාත්‍යතුමාත් මේ ගරු සභාවේ සිටිනවා. ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, පාර්ලිමේන්තුව අවට ප්‍රදේශය, රාජගිරිය පාර සහ ඒ අවට අනෙකුත් මාර්ග ජාලයේ ඇති වෙලා තිබෙන දැවැන්ත වාහන තදබදයට හේතුව බොහෝ රාජ්‍ය ආයතන මේ ප්‍රදේශයට ගෙන ඒමයි. ආගමන විගමන දෙපාර්තමේන්තුව සහ පුද්ගලයන් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව බත්තරමුල්ල ප්‍රදේශයට ගෙනඒමත් එක්ක වාහන තදබදය තවත් උත්සන්න වෙලා තිබෙනවා. මහා මාර්ග අමාත්‍යාංශයට පමණක් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ඔබතුමන්ලා මේ ගොඩනැඟිලි හදනවාත් එක්ක මහා මාර්ග අමාත්‍යාංශයත් සමඟ ඒකාබද්ධ වැඩ පිළිවෙළකට යා යුතුයි. හැබැයි, තවම එවැනි වැඩ පිළිවෙළක් තිබෙන බව අපට පෙනෙන්න නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මේ අමාත්‍යාංශ දෙක එකතු වෙලා වාහන තදබදය අවම කිරීමට ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද? එහෙම නැත්නම් අපි කාටත් පාර්ලිමේන්තුවට එන්නත් අපහසු වේවි.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු කථානායකතුමනි, කොළඹ නගරයට ඇතුළු වන ප්‍රධාන මාර්ග 7න් වැඩිම වාහන සංඛ්‍යාවක් ගමන් කරන මාර්ගය බවට දැනට මේ පාර්ලිමේන්තු මාර්ගය පත් වෙලා තිබෙනවා.

ඒ සඳහා විශේෂයෙන්ම මීට මාස කීපයකට පමණ පෙර අපි නියාමක ව්‍යාපෘතියක් ආරම්භ කළා. ඒ, බස් ප්‍රමුඛතා මං තීරු වැඩ පිළිවෙළ. ඒක ඉතාමත් සාර්ථකයි. ඉදිරි මාසය ඇතුළත ඒ වැඩ පිළිවෙළ ස්ථාවරව ක්‍රියාත්මක කිරීමට කටයුතු ආරම්භ කරන්න දැනට අපේ අමාත්‍යාංශයත්, ප්‍රවාහන අමාත්‍යාංශයත්, මහාමාර්ග අමාත්‍යාංශයත් කටයුතු කරනවා. ඒ වාගේම ඉදිරියේදී සැහැල්ලු දුම්රිය සේවාවකුත් අපි ආරම්භ කරනවා. සැහැල්ලු දුම්රියත් කොළඹ නගරය තුළ කිලෝමීටර් 59ක දුරක් දක්වා ආරම්භ කිරීමට නියමිතව තිබෙනවා. ඒ කිලෝමීටර් 59න්, විශේෂයෙන්ම බත්තරමුල්ල සිට කොළඹ, කොටුව දක්වා සැහැල්ලු දුම්රිය ගමන් වාර ආරම්භ කිරීමට නියමිතව තිබෙනවා. ඒ වාගේම බත්තරමුල්ල සහ කොළඹ අතර විකල්ප මාර්ගයක් ආරම්භ කිරීමටත් නියමිතව තිබෙනවා. ඒ වාගේම පොල්දූව හන්දියේ සිට කොස්වත්ත දක්වා වූ විකල්ප මාර්ගයේ ඉදිකිරීම් කටයුතුත් දැනට නිම වෙමින් පවතිනවා. ඒ අනුව විශේෂයෙන්ම බත්තරමුල්ල ප්‍රදේශයේ මාර්ග තදබදයට අවශ්‍ය විසඳුම් හා ක්‍රියාමාර්ග දැනට අප ගනිමින් තිබෙනවා.

උප තැපැල් කාර්යාල සඳහා ගොඩනැඟිලි ඉදිකිරීම : පියවර

உப தபால் அலுவலகங்களுக்கான கட்டிடங்களை நிர்மாணித்தல் : நடவடிக்கை

CONSTRUCTION OF BUILDINGS FOR SUB-POST OFFICES: STEPS TAKEN

1075/'16

4. ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දිවයින පුරා තැපැල් දෙපාර්තමේන්තුවට අයත් උප තැපැල් කාර්යාල 3,410ක් පවතින බවත්;

(ii) උප තැපැල් කාර්යාල සඳහා ගොඩනැඟිලි සොයා ගැනීම උප තැපැල් ස්ථානාධිපතිවරුන් විසින් සිදු කළ යුතු බවත්;

(iii) උප තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා මාසික කුලිය වශයෙන් උප තැපැල් ස්ථානාධිපතිට ගෙවනු ලබන්නේ රුපියල් 250/-ක මුදලක් පමණක් බවත්;

(iv) මෙවැනි සුළු මාසික කුලියකට ගොඩනැඟිලි සොයා ගත නොහැකිවීම නිසා බොහෝ උප තැපැල් ස්ථානාධිපතිවරුන්ට තම වැටුපෙන් විශාල මුදලක් ගෙවීමට සිදුවී ඇති බවත්;

(v) ඇතැම් ගොඩනැඟිලිවල වැසිකිළි (සනීපාරක්ෂක) පහසුකම් පවා නොමැතිව සේවකයන් අතිශය දුෂ්කරතා මධ්‍යයේ සේවය කරන බවත්;

(vi) විශ්‍රාම වැටුප ලබා ගැනීමට පැමිණෙන වයෝවෘද්ධ විශ්‍රාමිකයන්ට අසුන් ගැනීමට තබා හිටගෙන සිටීමට පවා ප්‍රමාණවත් ඉඩක් නොමැති උප තැපැල් කාර්යාල පවතින බවත්,

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත තත්ත්වයන් සැලකිල්ලට ගෙන සේවකයන්ට මෙන්ම ජනතාවටද පහසුකම් සැලසෙන පරිදි උප තැපැල් කාර්යාල සඳහා ගොඩනැඟිලි ඉදිකිරීමට පියවර ගන්නේද;

(ii) ගොඩනැඟිලි පහසුකම් ලබා දෙන තෙක් දැනට ගෙවනු ලබන රුපියල් 250/- ක මාසික කුලිය වෙනුවට ප්‍රමාණවත් කුලියක් ගෙවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

தபால், தபால் சேவைகள் மற்றும் முஸ்லிம் சமய அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ)(i) நாடு முழுவதும் தபால் திணைக்களத்திற்கு சொந்தமான 3410 உப தபால் அலுவலகங்கள் காணப்படுகின்றன என்பதையும்;

(ii) அலுவலகங்களுக்கான கட்டிடங்களைத் தேடுதல் உப தபால் நிலைய பொறுப்பதிகாரிகளாலேயே மேற்கொள்ளப்பட வேண்டியுள்ளது என்பதையும்;

(iii) உப தபால் அலுவலகமொன்றை கொண்டு நடத்துவதற்கு மாதாந்த வாடகையாக உப தபால் அலுவலக பொறுப்பதிகாரியொருவருக்கு ரூபா 250/- மட்டுமே செலுத்தப்படுகின்ற தென்பதையும்;

(iv) இத்தகைய சிறு தொகையான மாதாந்த வாடகைக்கு கட்டிடங்களை வாடகைக்கு பெற முடியாமையால் பெரும்பாலான உப தபால் அலுவலக பொறுப்பதிகாரிகளுக்கு தமது சம்பளத்திலிருந்து பெருந்தொகை பணத்தை செலுத்த வேண்டியேற்பட்டுள்ளதென்பதையும்;

(v) பெறப்பட்டுள்ள சில கட்டிடங்களில் மலசலகூட (துப்புரவேற்பாட்டு) வசதிகள்கூட இன்மையால் ஊழியர்கள் மிகவும் இன்னல்களுக்கு மத்தியில் சேவையாற்றுகின்றனர் என்பதையும்;

(vi) தமது ஓய்வூதியத்தை பெற்றுக்கொள்வதற்காக வருகைதரும் முதியோர்களான ஓய்வு பெற்றோருக்கு அமர்வதற்கோ அல்லது நிற்பதற்கோ போதுமான இடவசதி இல்லாத உப தபால் அலுவலகங்கள் காணப்படுகின்றனவென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ)(i) மேற்குறிப்பிட்ட நிலைமைகளை கருத்திற் கொண்டு ஊழியர்களுக்கும் மக்களுக்கும் வசதிகளை ஏற்படுத்திக்கொடுக்கும் வகையில் உப தபால் அலுவலகங்களுக்கான கட்டிடங்களை

[ගරු බිමල් රත්නායක මහතා]

நிர்மாணிப்பதற்கு நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்;

(ii) கட்டிட வசதிகளைப் பெற்றுக்கொடுக்கும் வரையில் தற்சமயம் செலுத்தப்படும் ரூபாய் 250/- மாதாந்த வாடகைக்கு பதிலாக போதியளவு வாடகைத் தொகையைச் செலுத்துவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Post, Postal Services and Muslim Religious Affairs:

(a) Is he aware that -

(i) there are 3,410 sub-post offices islandwide belonging to the Department of Posts;

(ii) finding buildings to house sub-post offices has to be done by Sub-Postmasters themselves;

(iii) only a sum of Rs. 250 is paid to a Sub-Postmaster as the monthly rental to run a sub-post office;

(iv) most Sub-Postmasters have to pay a large part of their salary as the monthly rental since buildings cannot be obtained at such a lower monthly rental;

(v) employees of sub-post offices work bearing many hardships since the buildings rented for sub-post offices do not even have (sanitary facilities) toilets; and

(v) there are sub-post offices at which the aged, retired officers who come there to get their pension do not have enough space even to stand rather than to sit, while waiting?

(b) Will he inform this House -

(i) whether steps will be taken to construct buildings for sub-post offices taking the aforesaid situation into consideration so that both employees and the public will be provided with adequate facilities; and

(ii) whether action will be taken to pay a sufficient amount for the monthly rental instead of the current monthly rental of Rs. 250 until building facilities are provided?

(c) If not, why?

ගරු අබ්දුල් හලීම් මහතා (තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு அப்துல் ஹலீம் - தபால், தபால் சேவைகள் மற்றும் முஸ்லிம் சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. Abdul Haleem - Minister of Post, Postal Services and Muslim Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) දිවයින පුරා දැනට ඇති උප තැපැල් කාර්යාල සංඛ්‍යාව 3,410ක් බව සත්‍යයකි.

(ii) උප තැපැල් ස්ථානාධිපති ව්‍යවස්ථාව අනුව උප තැපැල් කාර්යාල පවත්වාගෙන යාම සඳහා සුදුසු ගොඩනැඟිල්ලක් සපයා ගැනීම තෝරා පත් කර ගන්නා උප තැපැල් ස්ථානාධිපති විසින් සිදු කළ යුතුය.

(iii) තක්සේරු දෙපාර්තමේන්තුවේ සා.ලේ. 13/26 හා 2009.09.05 දරන තක්සේරු වාර්තාව අනුව ග්‍රාමීය ප්‍රදේශවල පිහිටි උප තැපැල් කාර්යාල සඳහා රුපියල් 250/-ක් ද, නාගරික ප්‍රදේශවල පිහිටි උප තැපැල් කාර්යාල සඳහා ජලය හා විදුලිය පහසුකම් සහිත ගොඩනැඟිල්ලක් සඳහා රුපියල් 375/-ක් ද, ජලය හා විදුලිය රහිත ගොඩනැඟිල්ලක් සඳහා රුපියල් 325/-ක් ද දැනට ගෙවනු ලැබේ.

වර්තමානයට ගැළපෙන පරිදි මෙම මුදල වැඩි කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.

(iv) සත්‍යයකි. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද පසුව යම් සහනයක් ලැබෙනු ඇත.

(v) උප තැපැල් කාර්යාල පවත්වා ගැනීම සඳහා ගොඩනැඟිලි තෝරා ගැනීමේදී සනීපාරක්ෂක පහසුකම් සහිත ගොඩනැඟිල්ලක් තෝරා ගැනීම උප තැපැල් ස්ථානාධිපතිගේ වගකීම වේ.

(vi) උප තැපැල් කාර්යාල පවත්වාගෙන යන සමහර ස්ථානවල එවැනි තත්ත්වයක් පවතින බව සත්‍යයකි. බොහෝ විට මෙවැනි තත්ත්වයක් පවතින්නේ නාගරික ප්‍රදේශවලය. නාගරික ප්‍රදේශවල පවතින අධික ගොඩනැඟිලි කුලිය හේතුවෙන් ගොඩනැඟිලි තෝරා ගැනීමේදී කුඩා ස්ථානයක් තෝරා ගැනීම නිසා මෙවැනි තත්ත්වයක් උදා වී තිබේ.

(ආ) (i) දැනටමත් සැලකිය යුතු උප තැපැල් කාර්යාල සංඛ්‍යාවක් රජයේ ගොඩනැඟිලි තුළ පවත්වාගෙන යනු ලැබේ. සමහර ප්‍රාදේශීය සභා, නගර සභා මඟින්ද උප තැපැල් කාර්යාල සඳහා ගොඩනැඟිලි පහසුකම් ලබා දී තිබේ. වාර්ෂික අය වැය ඇස්තමේන්තු මඟින් උප තැපැල් කාර්යාල ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කරනු නොලැබේ.

(ii) ඉහත (අ) (iii) හා (iv) අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද පසුව මුදල වැඩි කිරීමට හැකි වනු ඇත.

(ඇ) පිළිතුරු සපයා ඇත.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මාගේ ප්‍රශ්නයේ සඳහන් ආකාරයේ ගැටලු තිබෙන බව ගරු ඇමතිතුමා පිළිගත්තා.

මම මාගේ පළමුවන අතුරු ප්‍රශ්නය අහන්නම්.

මේ උප තැපැල් කාර්යාලවලින් ලියුම් බෙදීමට අමතරව වැඩිහිටි දීමනා, රජයේ සේවක විශ්‍රාම වැටුප්, ගොවි විශ්‍රාම වැටුප්, රෝගාධාර, සමාජ ආරක්ෂණ ගාස්තු ආදිය ගෙවීමත් සිදු කරනවා. උදාහරණයක් විධියට ගත්තොත් හෝකන්දර-උතුර උප තැපැල් කාර්යාලය තිබෙන්නේ අධිවේගී මාර්ගයේ අතුරුගිරිය පිවිසුම ඉදිරිපිට. ස්ථානාධිපතිත් එක්ක එතැන ඉන්න සේවක සංඛ්‍යාව

අටයි. ගරු ඇමතිතුමනි, නාගරික ප්‍රදේශයක ලයිට්, වතුර සහිත ගොඩනැඟිල්ලක් සඳහා රුපියල් 375ක් දැනට ගෙවනවා කියලා ඔබතුමා කිව්වා. ඇත්තටම 'ලයිට්, වතුර සහිත' කියන එකේ තේරුමක් නැහැ. මොකද, ලයිට්, වතුර නැතුව තැපැල් කාර්යාලයක කරන්න පුළුවන් මොනවාද කියලා මම දන්නේ නැහැ. රුපියල් 250ක මාසික කුලියකට වර්ග අඩියක්වත් ගන්න බැහැ. දැනට අවුරුදු දෙකහමාරක් වෙනවා. ඔබතුමා තවමත් කැබිනට් පත්‍රිකාවක් සකස් කරනවා කියලායි කියන්නේ. ඉතින් කොහොමද, මේ සේවාව ලබා දෙන්නේ? මේ සඳහා ඔබතුමා ගන්නා ඉක්මන් පියවර මොකක්ද කියලා මම ඉස්සර වෙලාම දැන ගන්න කැමැතියි.

ගරු අබ්දුල් හලීම් මහතා
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)
ගරු මන්ත්‍රීතුමනි, අපි දැනටමත් කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරලා හමාරයි. ඔබතුමා මේ ප්‍රශ්නය අහලා බොහෝ කාලයක් ගතවෙලා තිබෙනවා. ඊට අවශ්‍ය ප්‍රතිපාදන ඉතා ඉක්මනින් ලබා ගන්න අපට හැකිවෙයි කියලා මම විශ්වාස කරනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළ නිසා ඒ ගැන ඔබතුමාට අවබෝධයක් තිබෙනවා. ඉදිරියේදී, මෙම උප තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යෑම සඳහා කුලියක් ලබා දෙන්නේ රටේ තිබෙන සාමාන්‍ය මිල ගණන, ඒ කියන්නේ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ මිල ගණන් අනුවද? නැත්නම්, කිසිම විද්‍යාත්මක පදනමක් නැතිව රුපියල් 250, රුපියල් 550 වාගේ මුදලක් දෙන්නද යන්නේ?

ගරු අබ්දුල් හලීම් මහතා
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)
තක්සේරුව අනුවයි ඒක සිදු වන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මාගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා කියන කටයුත්ත ඉටු කිරීමට අනිවාර්යෙන්ම ඊළඟ අය වැය දක්වා යා යුතු වෙනවා. මොකද, සැලකිය යුතු කාර්යාල සංඛ්‍යාවක් තිබෙන නිසා. ඔබතුමා අද මේ කටයුතු පටන් ගත්තත් කරන්න වෙන්නේ ලබන අවුරුද්දේ. මොකද, එවැනි කාලයක තමයි ඒ ප්‍රතිපාදන ලබා ගන්න සිද්ධ වෙන්නේ. එම නිසා තාවකාලික පියවරක් වශයෙන් මෙවැනි විශේෂ ගැටලුවලට මුහුණ දී තිබෙන නාගරික මට්ටමේ තැපැල් කාර්යාලවලට හෝ හදිසි ප්‍රතිපාදන ලබා දෙන්න ඔබතුමාට හැකියාවක් තිබෙනවාද, සමහර කාර්යාල මුහුණ දෙන විශාල ගැටලු ප්‍රමාණයක් සඳහන් කර තිබෙන නිසා. ඒ කියන්නේ, වාඩි වෙන්න පුටුවක් නැති එක; ඒ තැන්වලට එන වැඩිහිටියෙකුට ඉඳ ගන්න ඉඩක් නැති එක; ඒ ගොල්ලන්ගේ බයිසිකලයක් නතර කර ගන්න විධියක් නැති එක වැනි ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා රණ්ඩු සරුවල් ඇති වෙනවා. මම දැන් ඒ බොහෝ විස්තර කියන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මට ලැබිලා තිබෙන තොරතුරු අනුව මේ ප්‍රශ්න අතුරුගිරිය, කටුබැද්ද වැනි ප්‍රදේශවල බරපතළ විධියට තිබෙනවා. අඩුම තරමින් ඒ නාගරික ප්‍රදේශවලටවත් හදිසි ප්‍රතිපාදන වෙන් කරන්න ක්‍රියා මාර්ගයක් ගන්න ඔබතුමාට පුළුවන්ද?

ගරු අබ්දුල් හලීම් මහතා
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)
ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය තැන්වලට එම ප්‍රතිපාදන ලබා දෙන්න කටයුතු කරන්නම්.

මුලතිව් දිස්ත්‍රික්කයේ මාර්ග ඉදි කිරීම : වැය කළ මුදල

முல்லைத்தீவு மாவட்ட வீதி நிர்மாணங்கள் : செலவிட்ட தொகை

CONSTRUCTION OF ROADS IN MULLAITIVU DISTRICT: MONEY SPENT

1242/'16

6. ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය-
(1):

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට පැවැති මුළු මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායින් තාර දමා තිබූ මාර්ග සංඛ්‍යාව සහ කි.මී. ප්‍රමාණය කොපමණද;

(iii) වර්ෂ 1983 සිට යුද්ධය නිම වනතුරු එම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදිකිරීම සඳහා පැවති රජයන් විසින් වියදම් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුද්ධය නිම වීමෙන් පසු මෙම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදි කිරීම වෙනුවෙන් එක් එක් වර්ෂය තුළ වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඒ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முல்லைத்தீவு மாவட்டத்தினுள் 1983ஆம் ஆண்டளவில் இருந்த மொத்த வீதிகளின் எண்ணிக்கையாது;

(ii) அவற்றில் தார் இடப்பட்டிருந்த வீதிகளின் எண்ணிக்கை மற்றும் கி.மீ. அளவு எவ்வளவு;

(iii) 1983 ஆம் ஆண்டு தொடக்கம் யுத்தம் முடிவடையும்வரை இம்மாவட்டத்தில் வீதிகளை நிர்மாணிப்பதற்காக அப்போதிருந்த அரசாங்கங்களினால் செலவு செய்யப்பட்ட நிதித்தொகை ஒவ்வோர் ஆண்டின் அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு;

(iv) யுத்தம் முடிவடைந்த பின்னர் இம்மாவட்டத்தில் வீதிகளை நிர்மாணிப்பதற்காக ஒவ்வோர் ஆண்டிலும் ஒதுக்கப்பட்ட நிதித்தொகை வெவ்வேறாக எவ்வளவு;

(v) இது தொடர்பான முழுமையான அறிக்கையைச் சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා]

asked the Minister of Higher Education and Highways:

(a) Will he inform this House -

(i) the total number of roads in the Mullaitivu District as at 1983;

(ii) the number of tarred roads and the extent of those roads in kilometres;

(iii) the amount of money spent by the previous governments to construct the roads in that district during the period from 1983 to the end of war in respect of each year separately;

(iv) the amount of money allocated in each year separately to construct the roads in this district in the aftermath of the war; and

(v) whether a full report is submitted in this regard?

(b) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) මහාමාර්ග දෙපාර්තමේන්තුවට පැවැති කාලයට අදාළ වර්ෂයක් වන 1983 වර්ෂයේ දත්ත නොමැත.

1986න් පසු, (එනම්, මාර්ග සංවර්ධන අධිකාරිය ස්ථාපනය කිරීමෙන් පසු)

A ශ්‍රේණියේ මාර්ග -කි.මී. 99.92යි.

B ශ්‍රේණියේ මාර්ග -කි.මී. 101.93යි.

(ii) 1993 වසරේ දත්ත නොමැත.

(iii) 1983 සිට 2008 දක්වා කාලයට අදාළව වියදම් කළ මුදල් පිළිබඳ දත්ත නොමැත.

(iv)

වර්ෂය	වියදම (දළ වශයෙන්)
2009	-
2010	-
2011	රුපියල් 136,974,870.99
2012	රුපියල් 276,340,287.22
2013	රුපියල් 38,690,775.66
2014	රුපියල් 67,342,285.82
2015	රුපියල් 40,938,074.17
2016	රුපියල් 9,588,062.12

(v) ඔව්.

(ආ) අදාළ නොවේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මේ වෙලාවේ විදුලි බලය නැතිව මුළු පාර්ලිමේන්තුවම අඳුරේ තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. දැන් ඒ ගැන සොයා බලන්නම්.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මා හිතන හැටියට අද රටම අඳුරේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

එතුමා ඉදිරිපත් කරපු වාර්තාව අනුව, එතුමන්ලාගේ රජය බලයට පත් වූ පසු මුලතිව් දිස්ත්‍රික්කය තුළ ඉදි කරන ලද මාර්ග සංඛ්‍යාව කොපමණද කියා සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ හැකිද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මා එතුමාට මතක් කරන්න කැමැතියි, අපේ රජය iRoad ව්‍යාපෘතිය යටතේ මුලතිව් දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, මුළු උතුරු නැඟෙනහිර ප්‍රදේශයේම කිලෝමීටර් 1,500ක් හදන්න දැන් ටෙන්ඩර් කැඳවා තිබෙන බව.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
2015දීයි ඔබතුමන්ලා රජය භාර ගත්තේ. ඊළාම්වාදී, බෙදුම්වාදී මතවාදය වපුරන බෙදුම්වාදීන් කියන්නේ උතුරට සලකන්නේ නැහැයි කියන මතයයි. උතුරේ සුළුතරයක් වන දෙමළ බෙදුම්වාදීන් ඉතිහාසය පුරා උතුරේ දෙමළ ජනතාවට වපුරන මතය තමයි උතුරට සලකන්නේ නැහැයි කියන එක. ඔබතුමන්ලා "යහ පාලනය" කියන නාමයෙන් බලයට පැමිණි රජයක්; වැඩිපුර උතුර් දෙමළ ජනතාවගේ ඡන්ද රැගෙන ආපු ආණ්ඩුවක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය අහන්න.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මා අහන ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා 2015, 2016 හා 2017 කියන අවුරුදු තුන ඇතුළත මේ දිස්ත්‍රික්කයේ හදපු මාර්ග සංඛ්‍යාව කොපමණද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
1986න් පසු එනම්, මාර්ග සංවර්ධන අධිකාරිය ස්ථාපනය කිරීමෙන් පසු "ඒ" ශ්‍රේණියේ මාර්ග කිලෝමීටර් 99.92ක් හා "බී" ශ්‍රේණියේ මාර්ග කිලෝමීටර් 101.93ක් ඉදි කර තිබෙනවා.

මෙතුමා මුලතිව් දිස්ත්‍රික්කය ගැන අහලා නැහැ. මෙතුමා අහලා තිබෙන්නේ, "... 1983 වර්ෂය වනවිට පැවැති මුළු මාර්ග සංඛ්‍යාව කොපමණද?" කියලායි.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
"මුලතිව් දිස්ත්‍රික්කය තුළ" කියලා අහලා තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ, නැහැ. "මුලතිව්" කියා සඳහන් කරලා නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
(අ) (i) ප්‍රශ්නයේ සඳහන් මුලතිව් දිස්ත්‍රික්කය ගැන කියන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපේ රජය පසුගිය අවුරුදු දෙක තුළ ආසියානු සංවර්ධන බැංකුවත් එක්ක සාකච්ඡා කරලා iRoad ව්‍යාපෘතිය යටතේ සෑම මැතිවරණ කොට්ඨාසයකම අඩුම ගණනේ කිලෝමීටර් 70ක් සංවර්ධනය විධියට කටයුතු කරනවා. අපි මේ අවුරුද්ද අවසානයේ ඒ වැඩ පටන් ගන්නවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි මම අහන්නේ ඒක නොවෙයි. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉතාම වග කීමෙන් අහන්නේ. මේ 1983 වසරේ කථාවක් නොවෙයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි ආවේ අවුරුදු පහකට, අවුරුදු දෙකකට නොවෙයි.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
තමුන්නාන්සේලාට දින 100 වැඩසටහනක් තිබුණා නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමන්ලාගේ කාලයේ කොච්චර හැදුවාද?

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මම අහන්නේ ඒක නොවෙයි. ඔබතුමා මගෙත් එක්ක තරහා ගන්න ඕනෑ නැහැ. ඔබතුමා වග කීමෙන් මේ පාර්ලිමේන්තුවට උත්තර දෙන්න. ඔබතුමන්ලා හැම වෙලාවේම මහින්ද රාජපක්ෂ මුව හමට තලන්න එපා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, ඔබතුමා ඒ අතුරු ප්‍රශ්නයට පිළිතුරක් දෙනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මගේ පිළිතුර මෙකයි. අපේ රජය බලයට පත් වුණාට පස්සේ ආසියානු සංවර්ධන බැංකුවත් එක්ක සාකච්ඡා කරලා උතුරු - නැඟෙනහිර සෑම මැතිවරණ කොට්ඨාසයකටම කිලෝ මීටර් 60ක කාපට් පාරවල් ලබා දෙන්න තීරණය කර තිබෙනවා. දැන් අපි ඒකට ටෙන්ඩර් කැඳවලා තිබෙනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඒ කියන්නේ ඔබතුමන්ලාගේ රජයේ මේ අවුරුදු දෙක-තුනම මේ විධියට තමයි ගෙවිලා තිබෙන්නේ. ඒ කියන්නේ මොකුත් කරලා නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහන්න.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු ඇමතිතුමනි, ටෙන්ඩර් කැඳවලා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමක් ගැනයි ඔබතුමා කියන්නේ. මම අහන්නේ මේකයි. 1983 සිට යුද්ධය පැවැති කාලයේත්, යුද්ධය නිම වීමෙන් පසුවත් උතුරු පළාතේ මේ දිස්ත්‍රික්කයේ මාර්ග වැඩියෙන්ම සංවර්ධනය වුණේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය යටතේ කියලා මහාමාර්ග විෂය භාර අමාත්‍යතුමා විධියට තමුන්නාන්සේ පිළිගන්නවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක ඔබතුමාගේ මතය.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඉන් පසුව රජය භාර ගත්තේ තමුන්නාන්සේලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අද වැඩ කටයුතු රාශියක් තිබෙන නිසා අතුරු ප්‍රශ්නය ඉක්මනින් අහන්න.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න මම ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මන්ත්‍රීතුමියට භාර දෙනවා.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)
ගරු කථානායකතුමනි, මම තුන්වන අතුරු ප්‍රශ්නය අහනවා.

[ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය]

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා මේ කාලය තුළ පාරවල් හදන්න විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඔබතුමා දැන් ඒක පිළිගත්තා. ඔබතුමන්ලාට මේ පිළිබඳව කිසියම් සැලැස්මක් තිබෙනවාද, ඒ සැලැස්ම මොකක්ද? අධිවේගී මාර්ගයක් හදලා නැත්තේ ඇයි? අපේ ගාල්ල දිස්ත්‍රික්කයෙන් යන අධිවේගී මාර්ගයේ ඉතුරු කොටස ඔබතුමන්ලා ආරම්භ කරන්නේ කවදාද? ඒක කොහොමද කරන්නේ?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය ගිහින් හොඳට බලන්න. බෙලිඅත්ත දක්වා අධිවේගී මාර්ගය ඉතාම හොඳින් සකස් කරනවා.

ගරු මන්ත්‍රීතුමියනි, අපි දෙදෙනාම එකට යමු; ගිහින් බලමු.

අනවසරයෙන් භුක්ති විඳින රජයේ ඉඩම්වලට බලපත්‍ර බෙදා දීම : මාතර දිස්ත්‍රික්කය

අනුමතියින්றிப் பயன்படுத்துகின்ற அரச காணிகளுக்கு உறுதிப்பத்திரம் வழங்கல்: மாத்தறை மாவட்ட ம்

PROVISION OF LICENCES TO GOVERNMENT LAND UTILIZED IN UNAUTHORIZED MANNER: MATARA DISTRICT

1279/'16

7. ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2)

(අ) (i) තමාගේ පදිංචිය සඳහා හෝ වගාවන් සඳහා හෝ ව්‍යාපාරික කටයුතු සඳහා හෝ ප්‍රවේණිගත ඉඩම් නොමැති ජනතාව රජයට අයත් ඉඩම් තම පරිහරණය පිණිස අනවසරයෙන් උපයෝගී කර ගන්නා බවත්;

(ii) කාලයාගේ ඇවෑමෙන් එසේ අනවසරයෙන් භුක්ති විඳිනු ලබන ඉඩම් රජයේ අයිතියෙන් බැහැර කොට, නියමානුකූලව පවරාදීමේ පිළිවෙතක් සෑම රජයක් විසින්ම පවත්වාගෙන ආ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, වර්ෂ 2013 සිට මේ දක්වා මාතර දිස්ත්‍රික්කය තුළ බෙදා දී ඇති ඔප්පු, දීමනා පත්‍ර, හිමිකම් පත්‍ර හෝ බලපත්‍ර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත (i) හි සඳහන් සංඛ්‍යාව, මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මාතර දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් අනවසරයෙන් භුක්ති විඳින, එහෙත් කිසිදු නීත්‍යානුකූල ලේඛනයක් අහිමි පුද්ගලයන් සංඛ්‍යාව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත (iii)හි සඳහන් පුද්ගලයන් වෙත දීමනා පත්‍රයක් හෝ අවම වශයෙන් බලපත්‍රයක් හෝ ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

காணி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தமது குடியிருப்புக்காக அல்லது பயிர்ச் செய்கைக்காக அல்லது வர்த்தக நடவடிக்கை களுக்காக மரபுரிமைக் காணிகளைக் கொண்டிருக்காத மக்கள் அரசுக்குச் சொந்தமான காணிகளைத் தமது பயன்பாட்டுக்காக அனுமதி யின்றிப் பயன்படுத்துகின்றனர் என்பதையும்;

(ii) காலப்போக்கில் அவ்வாறு அனுமதியின்றிப் பயன்படுத்தப்படுகின்ற காணிகளை அரச உரிமையிலிருந்து அகற்றி, முறைசார்ந்த விதத்தில் கையளிக்கும் நடைமுறையொன்று ஒவ்வொரு அரசாங்கத்தினாலும் பேணிவரப் பட்டது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) அதன் பிரகாரம், 2013ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை மாத்தறை மாவட்டத்தில் பகிர்ந்தளிக்கப்பட்டுள்ள உறுதிகள், அளிப்புப் பத்திரங்கள், உரித்துப் பத்திரங்கள் அல்லது உரிமப் பத்திரங்களின் எண்ணிக்கை தனித்தனியாக எத்தனையென்பதையும்;

(ii) மேலே (i) இல் குறிப்பிடப்பட்டுள்ள எண்ணிக் கையானது மாத்தறை மாவட்டத்தின் பிரதேச செயலாளர் பிரிவு மட்டங்களில் வெவ்வேறாக எத்தனையென்பதையும்;

(iii) மாத்தறை மாவட்டத்தில் அரச காணிகளை அனுமதியின்றிப் பயன்படுத்துகின்ற, இருப் பினும் எதுவித சட்ட ரீதியான ஆவணத்தையும் கொண்டிராத ஆட்களின் எண்ணிக்கை, பிரதேச செயலாளர் பிரிவின் பிரகாரம் தனித்தனியாக யாதென்பதையும்;

(iv) மேலே (iii) இல் குறிப்பிடப்பட்டுள்ள ஆட்களுக்கு அளிப்புப் பத்திரத்தை அல்லது ஆகக் குறைந்தது உரிமப் பத்திரத்தைப் பெற்றுக்கொடுப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Lands:

(a) Is he aware that -

(i) people without inherited lands for their residential or cultivation or business purposes grab government land for their use without permission;

(ii) a policy of alienating and properly transferring the ownership of such grabbed lands with the passage of time, has been maintained by all successive governments?

(b) Will he inform this House -

(i) accordingly, the number of deeds, grants, title certificates or licenses distributed in Matara District from 2013 up to now, separately;

(ii) the number mentioned in (i) above separately in terms of Divisional Secretary's Divisions in Matara District;

(iii) the number of persons who utilize government lands in an unauthorized manner but lack any legal document, in terms of each Divisional Secretary's Division in Matara District; and

(iv) whether action will be taken to provide a grant or at least a license to the people mentioned in (iii) above?

(c) If not, why?

ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சரும் காணி அமைச்சரும்)
(The Hon. John Amaratunga - Minister of Tourism Development and Christian Religious Affairs and Minister of Lands)
ගරු කථානායකතුමා, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) දනිමි.

(ii) දනිමි.

(ආ) (i) 2013 වසරේ සිට මේ දක්වා ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත හා ඉඩම් විශේෂ විධිවිධාන පනත යන පනත් මඟින් බැහැර කරන ලද ඉඩම්වල විස්තර පහත පරිදි වේ.

1. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ -

බලපත්‍ර 11,158 (එකොළොස්දහස් එකසිය පනස්අට)

දීමනා පත්‍ර 9,260 (නවදහස් දෙසීය හැට)

මධ්‍යම පාන්තික දීමනා පත්‍ර 217 (දෙසිය දාහත)

2. රජයේ ඉඩම් ආඥා පනත යටතේ -

දීර්ඝ කාලීන බදු බලපත්‍ර 1,424 (එක්දහස් හාරසිය විසිහතර)

නිදහස් දීමනා පත්‍ර 03 (තුන)

සුනාමි දීමනා පත්‍ර 489 (හාරසිය අසූනමය)

පූජා භූමි දීමනා පත්‍ර 04 (හතර)

දෙපාර්තමේන්තු පැවරීම 17 (දාහත)

3. ඉඩම් **ප්‍රඥාන** (විශේෂ විධිවිධාන) පනත යටතේ-

නියාදන සාධන පත්‍ර 21 (විසි එක)

(ii) ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ලබා දී තිබෙන බලපත්‍රවල විස්තර පහත වගුවේ දැක්වේ.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ		රජයේ ඉඩම් ආඥාපනත යටතේ					මධ්‍යම පාන්තික ඉඩම්	නියාදන සාධන බලපත්‍ර
	බලපත්‍ර	දීමනා පත්‍ර	බදු බලපත්‍ර	නිදහස් දීමනාපත්‍ර	සුනාමි දීමනාපත්‍ර	පූජාභූමි දීමනාපත්‍ර	දෙපාර්තමේන්තු පැවරීම		
පිටබැද්දර	240	94	201	-	-	01	02	-	09
කොටපොල	156	41	55	-	-	-	02	01	-
පස්ගොඩ	8304	6762	915	-	-	-	-	216	12
මුලටියන	41	179	33	-	-	-	-	-	-
අතුරලිය	333	206	58	-	-	-	-	-	-
අකුරැස්ස	232	204	33	-	-	-	01	-	-
වැලිපිටිය	21	69	-	-	-	-	-	-	-
මාලිම්බඩ	04	22	-	-	-	-	01	-	-
කුඹුරුපිටිය	72	166	15	02	-	01	01	-	-
හක්මන	-	17	07	-	-	01	-	-	-
කිරින්ද - පුහුල්වැල්ල	35	64	21	-	-	-	02	-	-
හිහගොඩ	1151	1037	66	-	-	-	01	-	-
වැලිගම	360	235	11	-	284	-	-	-	-
මාතර කඩවත් සතර	50	25	02	-	31	01	02	-	-
දෙවිනුවර	43	112	03	-	99	-	05	-	-
දික්වැල්ල	116	24	04	01	75	-	-	-	-
එකතුව	**11158**	**9260**	**1424**	**03**	**489**	**04**	**17**	**217**	**21**

[මෙම ලේඛනය පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த ஆவணம் நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது.]
[This document also placed in the Library.]

(iii) අනවසරයෙන් මාතර දිස්ත්‍රික්කය තුළ ඉඩම් හුක්ති විඳින නීත්‍යානුකූල ලේඛනයක් අහිමි පුද්ගලයින්ගේ සංඛ්‍යාව 8,123කි. (අටදහස් එකසිය විසිතුන)

මාතර දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් අනවසරයෙන් හුක්ති විඳින පුද්ගලයින් පිළිබඳ තොරතුරු ලබාගැනීම.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	04. රජයේ ඉඩම් අනවසරයෙන් හුක්ති විඳින සංඛ්‍යාව	05. නීත්‍යානුකූල ලේඛණය (බලපත්‍ර/ දී.කා.ඔ) ලබා දීමට හැකියාවක් ඇති සංඛ්‍යාව	06. නීත්‍යානුකූල ලේඛණය ලබා දීමට නොහැකි සංඛ්‍යාව
අකුරැස්ස	766	360	406
අතුරලිය	177	35	142
දෙවිනුවර	68	49	19
දික්වැල්ල	2	1	1
හක්මන	140	127	13
කුඹුරුපිටිය	288	87	201
කිරින්ද පුහුල්වැල්ල	225	28	197
කොටපොල	1073	745	328
මැලිම්බඩ	18	18	0
මාතර කඩවත් සතර	72	7	25
මුලටියන	2195	1947	248
පස්ගොඩ	2535	2205	330
පිටබැද්දර	458	275	183
හිහගොඩ	74	44	30
වැලිගම	50	49	1
වැලිපිටිය	22	0	22
එකතුව	**8123**	**5977**	**2146**

[මෙම ලේඛනය පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த ஆவணம் நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது.]
[This document also placed in the Library.]

(iv) ඔව්.

(ඇ) අදාළ නොවේ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ සංඛ්‍යා ලේඛන අනුව එම දිස්ත්‍රික්කයේ ඉඩම් අහිමි, ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යොමු කරනු ලැබූ ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව, එහෙම නැත්නම් හඳුනාගෙන තිබෙන ඉඩම් අහිමි පවුල් සංඛ්‍යාව කොපමණද?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔබතුමා මේ ප්‍රශ්නයෙන් ඒ පිළිබඳව අහලා නැහැ. දීමනා පත්‍ර පිළිබඳ විස්තර තමයි ඔබතුමා අහලා තිබෙන්නේ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ඔබතුමා ළඟ ඒ තොරතුරු තිබෙනවා නම් මට ලබා දෙන්න.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ, ඒ තොරුතුරු නැහැ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ඒ තොරතුරු දැනට නැහැ?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔව්, අද ගෙනැල්ලා නැහැ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
හොඳයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු කථානායකතුමනි, අපේ දිස්ත්‍රික්කයේ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා ඉන්නවා; බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා ඉන්නවා; කංචන විජේසේකර මන්ත්‍රීතුමා ඉන්නවා; අපි සියලු දෙනාම දන්නවා, අපේ කාලයත් ඇතුළුව මේ දක්වාම නීත්‍යානුකූල ඔප්පු ලබාදී නොමැති සුනාමි ගම්මාන රාශියක් තිබෙන බව. ගරු ඇමතිතුමනි, මෙතැන තිබෙන ලොකුම ගැටලුව තමයි, Condominium Property Act එක යටතේ - සභාධිපත්‍ය දේපළ පනත යටතේ - විශේෂයෙන්ම මහල් නිවාස විධියට හදපු නිවාසවලට ඔප්පු ලබාදීමට ප්‍රාදේශීය ලේකම්වරුන්ට තිබෙන නොහැකියාව.

පාර්ශ්ව කීපයක් එකතු වෙලායි ඒ ප්‍රශ්නය විසඳිය යුතුව තිබෙන්නේ. මේක ඉතා බරපතළ කාරණයක්. නුපේවෙල, කම්මල්වත්ත, හාමුගෙවත්ත ආදී වශයෙන් මාතර නගරයේ පමණක් ඒ වාගේ ගම්මාන පහක් තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා කඩිනම් විශේෂ ව්‍යාපෘතියක් ඒ වෙනුවෙන් සැලසුම් කරනවාද? ගරු කථානායකතුමනි, මොකද, ඒ පන්නයේම නිවාස ගොඩ නැඟූ අනෙකුත් දිස්ත්‍රික්කවලත් හැම තැනම මේ ගැටලුව ඇතැයි කියා අපි උපකල්පනය කරනවා. ඒකට විශේෂ සැලැස්මක් ඔබතුමා ළඟ තිබෙනවාද, එහෙම නැත්නම් තමුන්නාන්සේලාට මේ සම්බන්ධයෙන් තිබෙන විසඳුම මොකක්ද?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
බලපත්‍ර ලබා දීලා තිබෙනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු ඇමතිතුමනි, බලපත්‍ර ලබා දීම ගැන නොවෙයි. මහල් නිවාස විධියට හදපු සුනාමි ගම්මාන තිබෙනවා. බලපත්‍රය - ඔප්පුව - දීමට නොහැකියි කියලා ප්‍රාදේශීය ලේකම්වරු පවසන්නේ, ඒවා මහල් නිවාස නිසයි. එය සභාධිපත්‍ය දේපොළ පනත - Condominium Property Act එක - යටතේ තමයි දෙන්න වෙන්නේ කියලායි ඔවුන් කියන්නේ. නමුත් ඒ යටතේ අවශ්‍ය මූලික සාධක සම්පූර්ණ කර ගැනීමට නොහැකියාවක් තිබෙන බවයි රාජ්‍ය නිලධාරීන් පවසන්නේ. ඒ නිසා ඔබතුමාගේ මැදිහත් වීම මේ සඳහා කඩිනමින් අවශ්‍ය වනවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මම ඒ ගැන සොයා බලා විසඳුම් ලබා දෙන්නම්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ඔබතුමාව අපහසුතාවට පත් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ, නැහැ. අපහසුතාවකට පත් වීමක් නොවෙයි. මේක අවශ්‍යතාවක්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
පැහැදිලියි.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අයිතිවාසිකම් ලැබිලා නැතිව මිනිසුන් මොන තරම් අපහසුතාවලට ලක් වෙලා ඉන්නවාද කියලා අපි දන්නවා. ඔබතුමා හොඳ ප්‍රශ්නයක් ඇහුවේ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
බොහොම ස්තුතියි.

මගේ අවසන් අතුරු ප්‍රශ්නය, ගරු කථානායකතුමනි. නිවාස අහිමි, ඉඩම් අහිමි අයට තිබෙන ආසන්නම විකල්පය තමයි, ගම් පුළුල් කිරීම යටතේ අවශ්‍ය නිවාස, ඉඩම් ලබා දීම. විශේෂයෙන්ම ඉඩම් ලබා දීම. ඒ සඳහා සුදුසු ඉඩම් රාශියක් මාතර දිස්ත්‍රික්කයේ තිබෙනවා. මේ මොහොතේ සංඛ්‍යා ලේඛන ඔබතුමාගේ අතේ නැති නිසා දිස්ත්‍රික්කයේ ඉඩම් අහිමි පවුල් සංඛ්‍යාව කොපමණද කියලා ඔබතුමාට නිශ්චිතව කියන්න බැහැ. මම ඔබතුමාට දොස් පවරන්නේත් නැහැ, ඔබතුමාට ඒ සඳහා සූදානම් වෙලා එන්න පුළුවන්කමක් තිබුණේ නැති නිසා. නමුත් ඉඩම් අහිමි පවුල් සංඛ්‍යාවත්, ගම් පුළුල් කිරීම යටතේ ලබා දිය හැකි ඉඩම් සංඛ්‍යාවත් - විශාල ඉඩම් සංඛ්‍යාවක් තිබෙන නිසා - සම්බන්ධයෙන් ඔබතුමා මාතර දිස්ත්‍රික්කයට අදාළ විශේෂ තීන්දුවක් ගන්න කියලා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

පසු ගිය දවස්වල අපි මාතර, ගාල්ල ආදී ප්‍රදේශවල ඉඩම් අයිතිවාසිකම් පිළිබඳව රැස්වීම් ගණනාවක් පැවැත්වුවා. හැම ගමේම ඉඩම් නැති අයට ඉල්ලුම් කරන්න කියලා වාගේම ඒ අයගේ අවශ්‍යතාවන් ඉටු කරලා දෙන්න අපි කටයුතු කළා. ජනාධිපතිතුමාගේ කාර්ය සාධන වැඩ පිළිවෙළ යටතේ තමයි එය ක්‍රියාත්මක වුණේ. ඒ කාර්යට සම්බන්ධ වෙලා, ඉඩම් නොලැබුණු අය ඉන්නවා නම් අපි ඒ සම්බන්ධයෙන් හොයලා බලලා, විසඳුමක් ලබා දෙන්නම්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

විශාල පිරිසක් ඉන්නවා, ගරු ඇමතිතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අවධානය යොමු කරන්න, ගරු ඇමතිතුමා. හොඳයි. බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 8-1322/'16 - (1), ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා. අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමේ (විශේෂ) යෝජනා ක්‍රමය : අනුරාධපුර දිස්ත්‍රික්කය

நிதி ஏற்பாடுகளைப் பெற்றுக்கொடுக்கும் (விசேட) திட்டம் :அநுராதபுர மாவட்டம்

SPECIAL SCHEME FOR PROVISION OF FINANCIAL ALLOCATION: ANURADHAPURA DISTRICT

1519/'17

9. ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2014 වර්ෂයේ රුපියල් මිලියන 25 ක මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමේ (විශේෂ) යෝජනා ක්‍රමය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයට කොපමණ මුදලක් ලැබුණේද;

(ii) එම මුදල් යොදවා සිදු කර ඇති කාර්යයන් කවරේද;

(iii) මෙම යෝජනා ක්‍රමය යටතේ ස්වයං රැකියාලාභීන් සඳහා මිලදී ගෙන මේ වනවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉතිරි වී ඇති භාණ්ඩ ප්‍රමාණය සහ ඒවායේ වටිනාකම, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ස්වයං රැකියාලාභීන් නිර්දේශ කරන ලද්දේ තුලානේ සංවර්ධන නිලධාරියා විසින් බව පිළිගන්නේද;

(v) ඉතිරි භාණ්ඩ ස්වයං රැකියාලාභීන්ට බෙදා අවසන් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2014ஆம் ஆண்டு 25 மில்லியன் ரூபாய் நிதி ஏற்பாடுகளை பெற்றுக் கொடுக்கும் (விசேட) திட்டத்தின் கீழ் அநுராதபுரம் மாவட்டத்திற்கு எவ்வளவு நிதி கிடைத்தது என்பதையும்;

(ii) மேற்படி நிதியைப் பயன்படுத்தி மேற்கொள்ளப் பட்டுள்ள பணிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி திட்டத்தின் கீழ் சுயதொழில் முயற்சி யாளர்களுக்காகக் கொள்வனவு செய்யப்பட்டுத் தற்போது பிரதேச செயலகங்களில் எஞ்சியுள்ள பொருட்களின் அளவுகள் மற்றும் அவற்றின் பெறுமதி, ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவுக்கும் அமைய தனித்தனியே யாது என்பதையும்;

(iv) சுயதொழில் முயற்சியாளர்கள் துலானே அபிவிருத்தி அலுவலகினாலேயே சிபாரிசு செய்யப்பட்டனர் என்பதை அவர் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(v) எஞ்சியுள்ள பொருட்களைச் சுயதொழில் முயற்சி யாளர்களுக்கு விநியோகித்து முடிக்கப்படும் திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු එස්. සී. මුතුකුමාරණ මහතා]

asked the Minister of Home Affairs:

(a) Will he inform this House -

(i) the amount received by Anuradhapura District under the special scheme to provide a financial allocation of Rs.25 million in the year 2014;

(ii) tasks carried out spending that amount;

(iii) the quantity of items left in Divisional Secretariat Offices after being purchased for self-employed persons under this scheme and their value, separately according to each Divisional Secretariat;

(iv) whether he admits that self-employed persons were recommended by the Development Officer of Thulane;

(v) projected date of completion of distribution of remaining items to self-employed persons?

(b) If not, why?

ගරු නිමල් ලාන්සා මහතා (ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிமல் லான்சா - உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Nimal Lanza - Deputy Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) රුපියල් මිලියන 175කි.

(ii) යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති

සමාජ සුබසාධන ව්‍යාපෘති

ජීවනෝපාය ආශ්‍රිත කර්මාන්ත/ව්‍යාපෘති වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සැපයීම හා අභිප්‍රේරණ සඳහා භාණ්ඩ හා උපකරණ ලබාදීම.

(iii) සියලුම භාණ්ඩ මේ වනවිට ප්‍රතිලාභීන් අතර බෙදා අවසන් කර ඇත.

(iv) ඔව්.

ප්‍රතිලාභීන් නියෝජනය කරන ආඥනයේ දේශපාලන අධිකාරිය විසින් යොජනා කරන ලද ජීවනෝපාය ආශ්‍රිත කර්මාන්ත සඳහා අදාළ ව්‍යාපෘති වාර්තාව ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව දිස්ත්‍රික් ලේකම් වෙත ලැබීමෙන් අනතුරුව ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ විසින් ව්‍යාපෘති වාර්තාව අනුමත කොට ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කරන ලදී. ඒ අනුව දේශපාලන අධිකාරිය විසින් යෝජනා කරන ලද ප්‍රතිලාභීන් අතුරින් සුදුසු ප්‍රතිලාභීන් තුලානේ ආර්ථික සංවර්ධන නිලධාරි විසින් නිර්දේශ කර ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සඳහා යොමු කරන ලදී.

(v) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

ගරු කථානායකතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල භාණ්ඩ තව ඉතුරු වෙලා තිබෙනවා. ඒ ඉතුරු ටික බෙදන්නේ කවදාද කියලායි මම අහන්නේ.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉතුරු වෙලා තිබෙනවා නම්, හැකි ඉක්මනින් ඒවා බෙදන්න කටයුතු කරන්නම්.

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

බෙදන දිනය මට පැහැදිලි මදි.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

ඔබතුමා කියනවා, භාණ්ඩ ඉතුරු වෙලා තිබෙනවා කියලා. මට දුන්නු ලිපිවල ඒ පිළිබඳව සවිස්තර වාර්තාවක් නැහැ. ඒ නිසා භාණ්ඩ වර්ග මොනවා හරි ඉතුරු වෙලා තිබෙනවා නම්, ඒ අදාළ සුදුසුකම්ලාභීන්ව තෝරාගෙන ඉතා ඉක්මනින් -මම හිතන්නේ සති දෙකක කාලයක් තුළ- ඒවා බෙදා අවසන් කරන්න අපි කටයුතු කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ස්වයං රැකියා කිරීම සඳහා ලබා දීමට තිබෙන භාණ්ඩ දැනට ඒ ස්ථානවල අවුරුදු දෙකහමාරක් තිස්සේ තිබෙනවා. අවුරුදු දෙකහමාරක් වෙන කොට සමහර භාණ්ඩ පාවිච්චි කරන්න බැරි තත්ත්වයට පත් වෙනවා. මම අහන්නේ, මේ ආණ්ඩුව මේ තරම් පොඩි දෙයක් කරන්න ප්‍රමාද වෙන්නේ ඇයි කියන එකයි. අවශ්‍ය ලැයිස්තු දීලා තිබෙනවා. නිලධාරීන් පරීක්ෂා කරලා දීලා තිබෙනවා. එහෙම තිබේද්දීත් අවුරුදු දෙකහමාරක් මේ භාණ්ඩ බෙදා දීම පරක්කු කිරීම තුළ, සමහර භාණ්ඩ පාවිච්චි නොකිරීම නිසා අක්‍රිය වෙලා තිබෙනවා. එවැනි තත්ත්වයක් තුළ ඒ ස්වයං රැකියාලාභියාට එම භාණ්ඩ ලබා ගැනීමෙන් ප්‍රයෝජනයක් වේවිද?

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

ගරු මන්ත්‍රීතුමනි, මම පළමුවැනි අතුරු ප්‍රශ්නයට උත්තර දුන්නු විධියටම තමයි මෙයටත් උත්තර දෙන්න වෙන්නේ. එහි තිබෙන භාණ්ඩ පිළිබඳ වාර්තාවක් මගේ අතේ දැනට නැහැ. ඔබතුමා අහන දෙවැනි අතුරු ප්‍රශ්නය සඳහා පිළිතුරු දෙන්න, මෙතරම් ප්‍රමාද වී එම භාණ්ඩ බෙදාදීමෙන් ප්‍රයෝජනයක් තිබෙනවාද, නැද්ද කියන ප්‍රශ්නයට අදාළ උත්තරය දෙන්නත් මගේ ළඟ වාර්තාවක් නැහැ. ඔබතුමා කියපු කාරණා පිළිබඳව අමාත්‍යාංශයෙන් හොයලා බලලා ඔබතුමාට පිළිතුරක්

සපයන්නම්. බෙදන්න ගෙනාපු භාණ්ඩවලින් දැනට ඉතුරු වෙලා තිබෙනවාද, ඒවා අලාභහානි වෙලා තිබෙනවාද, ඒවාට මොනවාද කරන්න පුළුවන් කියන එක ගැන ඔබතුමාට වාර්තාවක් දෙන්නම්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නයක් තිබෙනවාද, ගරු මන්ත්‍රීතුමනි?

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(මාණ්පුමිකු එස්.සී. මුත්තුකුමාරණ)
(The Hon. S.C. Mutukumarana)
ගරු කථානායකතුමනි, මම මේ තත්ත්වය ගැන ඇහුවේ, මේ ගැන දිස්ත්‍රික් කමිටුවේදීත් සාකච්ඡා කළ නිසායි. ඒක දේශපාලන අර්බුදයකට ගිහිල්ලා තිබුණා. අපි දැක්කා, මේ අවුරුදු දෙකහමාර තුළ මේ භාණ්ඩ මෙසේ තිබියදී අදාළ පුද්ගලයින්ට තවම මේවා ලබාදී නොමැති බව. මහන මැෂින් ආදිය දමා මේ වෙන කොට අවුරුදු දෙකහමාරක්, අවුරුදු තුනක් විතර වෙනවා. මේවා ප්‍රයෝජනයට ගෙන නැහැ. ඒ නිසා ඔබතුමා මේ පිළිබඳව පෞද්ගලිකව සොයා බලා මේ භාණ්ඩ ඒ පුද්ගලයින්ට ලබා දෙන්න කියා ඉල්ලීමක් කරනවා. අදාළ ලයිස්තුව සංවර්ධන නිලධාරියා සමීක්ෂණය කරලා, "මේ මේ පුද්ගලයාට මේක ලැබිය යුතුයි, ඔහු මේක ලැබීමට සුදුසුයි" කියලා දැන් තීරණය කර තිබෙනවා. ඒ නිසා ඉතා ඉක්මනින් ඒවා බෙදා හැරීමට කටයුතු කරන්න කියා ඉල්ලනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. ඒ පිළිබඳව ගරු නියෝජ්‍ය ඇමතිතුමා අවධානය යොමු කරන්න.

යාපනය දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදිකිරීම : වෙන් කළ මුදල
யாழ்ப்பாண மாவட்ட வீதி நிர்மாணங்கள் : செலவிட்ட தொகை
CONSTRUCTION OF ROADS IN JAFFNA DISTRICT: MONEY SPENT

1243/'16

11. ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යාපනය දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට පැවැති මුළු මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායින් තාර දමා තිබූ මාර්ග සංඛ්‍යාව සහ කි.මී. ප්‍රමාණය කොපමණද;

(iii) වර්ෂ 1983 සිට යුද්ධය නිම වනතුරු එම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදිකිරීම සඳහා පැවති රජයන් විසින් වියදම් කරන ලද මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුද්ධය නිම වීමෙන් පසු මෙම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදි කිරීම වෙනුවෙන් එක් එක් වර්ෂය තුළ වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඒ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම් ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யாழ்ப்பாண மாவட்டத்தினுள் 1983ஆம் ஆண்டளவில் இருந்த மொத்த வீதிகளின் எண்ணிக்கையாது;

(ii) அவற்றில் தார் இடப்பட்டிருந்த வீதிகளின் எண்ணிக்கை மற்றும் கி.மீ. அளவு எவ்வளவு;

(iii) 1983 ஆம் ஆண்டு தொடக்கம் யுத்தம் முடிவடையும்வரை இம்மாவட்டத்தில் வீதிகளை நிர்மாணிப்பதற்காக அப்போதிருந்த அரசாங்கங்களினால் செலவு செய்யப்பட்ட நிதித்தொகை ஒவ்வோர் ஆண்டின் அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு;

(iv) யுத்தம் முடிவடைந்த பின்னர் இம்மாவட்டத்தில் வீதிகளை நிர்மாணிப்பதற்காக ஒவ்வோர் ஆண்டிலும் ஒதுக்கப்பட்ட நிதித்தொகை வெவ்வேறாக எவ்வளவு;

(v) இது தொடர்பான முழுமையான அறிக்கையைச் சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Will he inform this House -

(i) the total number of roads in the Jaffna District as at 1983;

(ii) the number of tarred roads and the extent of those roads in kilometres;

(iii) the amount of money spent by the previous governments to construct the roads in that district during the period from 1983 to the end of war in respect of each year separately;

(iv) the amount of money allocated in each year to construct the roads in this district in the aftermath of the war; and

(v) whether a full report is submitted in this regard?

(b) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මහාමාර්ග දෙපාර්තමේන්තුව පැවති කාලයට අදාළ වර්ෂයක් වන 1983 දත්තයන් නොමැත.

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

1986න් පසු (එනම්, මාර්ග සංවර්ධන අධිකාරිය ස්ථාපනය කිරීමෙන් පසු)

A ශ්‍රේණියේ මාර්ග	- කි.මී. 40.13
B ශ්‍රේණියේ මාර්ග	- කි.මී. 246.11
AB ශ්‍රේණියේ මාර්ග	- කි.මී. 201.11

(ii) 1983 දත්තයන් නොමැත.

1986 දත්තයන්ට අනුව කි.මී. 487.35ක් තාර දමා ඇත.

(iii) 1983 සිට 2005 දක්වා කාලයට අදාළ දත්තයන් නොමැත.

වර්ෂය	වියදම
2006	රු. මිලියන 51.30
2007	රු. මිලියන 74.68
2008	රු. මිලියන 96.40

(iv)

වර්ෂය	වියදම
2009	රු. මිලියන 102.50
2010	රු. මිලියන 79.60
2011	රු. මිලියන 117.00
2012	රු. මිලියන 120.00
2013	රු. මිලියන 245.00
2014	රු. මිලියන 103.00
2015	රු. මිලියන 39.50
2016	රු. මිලියන 96.66

(v) ඔව්. අදාළ තොරතුරු සහිත සම්පූර්ණ වාර්තාවක් ඇමුණුමෙහි දැක්වේ. ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙසේයි. කලින් ප්‍රශ්නයේදී ඇසුවා වාගේම මා අහන්නේ, 2015 වර්ෂයේ තමුන්නාන්සේලා රජය භාරගත්තාට පසුව 2017 වර්ෂය - මේ වසර- වනතුරු යාපනය දිස්ත්‍රික්කයේ හදන ලද මුළු මාර්ග සංඛ්‍යාව කොපමණද, ඒ සඳහා වන, ඒ ඒ වර්ෂවලට අදාළ සමස්ත වියදම් කොපමණද කියන එකයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මා කලින් දුන් උත්තරයමයි දෙන්න තිබෙන්නේ, ගරු කථානායකතුමනි. අපේ රජය බලයට පත් වුණාට පසුව ආසියානු සංවර්ධන බැංකුව සමහත් සාකච්ඡා කරලා, කලින් ආණ්ඩුව කළා වාගේ සිල්ලර වැඩ නොව කාපට් ඇතිරූ කිලෝමීටර 1,500කට ආසන්න ප්‍රමාණයක මාර්ග උතුර නැඟෙනහිර සෑම මැතිවරණ කොට්ඨාසයකටම කිලෝමීටර 60ක්, 70ක් ලැබෙන සේ හදන්න අවශ්‍ය මුදල් සොයාගෙන, ටෙන්ඩර් කැඳවා මේ අවුරුද්දේ අවසානයේදී අපි වැඩ ආරම්භ කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මා මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි, "ප්‍රශ්නවලට වාචික පිළිතුරු" යටතේ නියමිත වෙලාව දැනටමත් අවසානයි කියන කාරණය කෙරේ. ඒ නිසා ප්‍රශ්න ඇසීමත්, පිළිතුරු දීමත් කරුණාකර ඉක්මන් කරන්න. දැන්, දෙවන අතුරු ප්‍රශ්නය.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, මා අහන්නේ, අතිශය වැදගත් කාරණාවක්. මොකද, යාපනය දිස්ත්‍රික්කය නියෝජනය කරන ද්‍රවිඩ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුත් මේ ගරු සභාවේ ඉන්නවා. යාපනය දිස්ත්‍රික්කය නියෝජනය කරන ස්වාධීන වෙනත් මන්ත්‍රීවරුත් ඉන්නවා. යාපනය දිස්ත්‍රික්කය නියෝජනය කරන, එක්සත් ජාතික පක්ෂයේ රාජ්‍ය අමාත්‍යතුමියක් හරියටම මට කෙලින් මේ විෂයය භාර අමාත්‍යතුමා වන ඔබතුමාට පිටුපසින් ඉන්නවා, ගරු අමාත්‍යතුමනි. ඒ ඔක්කෝම පෙනී සිටියා නේ මේ ආණ්ඩුව හදන්න. මා අහන්නේ ඉතා වැදගත් ප්‍රශ්නයක්. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා දෙන පිළිතුරේ හැටියට පෙනෙන්නේ, 2015, 2016, 2017 වර්ෂවල තමුන්නාන්සේලා විසින් හදන ලද මාර්ග ප්‍රමාණය කොපමණද කියා තමුන්නාන්සේට කියන්න බැරි බවයි. ඒ ඉදිකිරීම් සඳහා කළ ප්‍රතිපාදන කොපමණද කියලායි මා අහන්නේ. නමුත් ගරු අමාත්‍යතුමනි, ඔබතුමා කියන්නේ අනාගතයක් ගැනයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මා උත්තරය මෙන් විස්තර කියා තිබෙනවා, 1986 වර්ෂයේ ඉඳලාම. A ශ්‍රේණියේ මාර්ග කිලෝමීටර 40යි; B ශ්‍රේණියේ මාර්ග කිලෝමීටර 246යි; AB ශ්‍රේණියේ මාර්ග කිලෝමීටර 201යි. එම ප්‍රමාණය කිලෝමීටර 1,000ට අඩුයි. ඒවා, තාර දැමූ ඒවා මිස කාපට් අතිරූ ඒවා නොවෙයි. නමුත් ඉදිරි වර්ෂ දෙක ඇතුළත උතුර සහ නැඟෙනහිර ප්‍රදේශවල සෑම මැතිවරණ කොට්ඨාසයකම කිලෝමීටර් 70ක් බැගින් කාපට් කරන්න අපි දැන් ටෙන්ඩර් කැඳවා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දැන් තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා තුන්වන අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය (ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன் - சிறுவர் அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran - State Minister of Child Affairs)

ඇයි, තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න ඔබතුමා දන්නේ නැද්ද?

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
එය අහන්න, මගේ අවසරය දුන්නා මෙතුමාට.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මෙතුමිය කියනවා, උතුරේ ඡන්ද හම්බ වුණේ නැහැ කියා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපට කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා, තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු අමාත්‍යතුමනි, මා මේ ප්‍රශ්නය ඔබතුමාගෙන් පෞද්ගලිකවත් ඇහුවා. වාද්දුව-මොරොන්තුඩුව නමින් පාරක් තිබෙනවා, ගාලු පාරත් කළුතර - බණ්ඩාරගම පාරත් යා කරන. මේ සඳහා ඇස්තමේන්තුත් හදා මුදලුත් වෙන් කළා, පසු ගිය ආණ්ඩුව කාලයේ. නමුත් තවම ඒ කටයුත්ත කරලා නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මා එය කර දෙන්නම්. ඔබතුමා මා හමුවන්න.

මාතර දිස්ත්‍රික්කයේ කලාප අධ්‍යාපන කාර්යාල : පුරප්පාඩු
மாத்தறை மாவட்ட வலயக் கல்விக் காரியாலயங்கள்: வெற்றிடங்கள்
ZONAL EDUCATION OFFICES OF MATARA DISTRICT: VACANCIES

1296/'16

12. ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ සේවය කරනු ලබන අධ්‍යාපන පරිපාලකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් අධ්‍යාපන කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මාතර දිස්ත්‍රික්කයේ කලාප අධ්‍යාපන කාර්යාලයන්හි පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අධ්‍යාපන පරිපාලකයන්ගේ ඌනතාවක් පවතින්නේ නම්, ඒවා සම්පූර්ණ කිරීමට අනුගමනය කරනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මාතර දිස්ත්‍රික්කය සඳහා විශ්‍රාමලත් අධ්‍යාපන පරිපාලකයන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) ඔවුන් බඳවාගත් පටිපාටිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தில் பணியாற்றுகின்ற கல்வி நிருவாக உத்தியோகத்தர்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) அவ்வெண்ணிக்கையானது ஒவ்வொரு கல்வி வலயத்தின் பிரகாரம் தனித்தனியாக எத்தனை யென்பதையும்;

(iii) மாத்தறை மாவட்டத்தின் வலயக் கல்வி காரியாலயங்களில் நிலவுகின்ற வெற்றிடங் களின் எண்ணிக்கை தனித்தனியாக எத்தனை யென்பதையும்;

(iv) கல்வி நிருவாக உத்தியோகத்தர்களின் பற்றாக் குறை நிலவுமெனில், அவற்றைப் பூர்த்தி செய்வதற்கு பின்பற்றப்படும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மாத்தறை மாவட்டத்தின் பொருட்டு ஓய்வுபெற்ற கல்வி நிருவாக உத்தியோகத்தர்கள் ஒப்பந்த அடிப்படையில் ஆட்சேர்ப்புச் செய்யப் பட்டுள்ளனரா என்பதையும்;

(ii) ஆமெனில், இவர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவையென்பதையும்;

(iii) இவர்கள் ஆட்சேர்பபுச் செய்யப்பட்ட நடைமுறை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the number of education administrators serving in the Matara District;

(ii) the said number, separately, in respect of each education zone

(iii) separately, the number of vacancies that exists in the Zonal Education Offices of the Matara District;

(iv) the measures to be taken to fill vacancies, if there exists a shortage of education administrators;

(b) Will he also inform this House -

(i) whether retired education administrators have been recruited on contract basis for the Matara District;

(ii) if so, their names and addresses;

(iii) the procedure adopted in recruiting them;

(c) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(*மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) 45කි.

(ii)

	අධ්‍යාපන කලාපය	සිටින සංඛ්‍යාව
i	මාතර	12
ii	මුලටියන	12
iii	දෙනියාය	10
iv	අකුරැස්ස	13
		47

(iii)

	කලාපය	අනුමත	සිටින	පුරප්පාඩු
i	මාතර	18	12	06
ii	මුලටියන	19	12	07
iii	දෙනියාය	17	08	09
iv	අකුරැස්ස	18	13	05

(iv) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරීන් අටසිය පනස් දෙදෙනෙකු බඳවා ගැනීම සඳහා මේ වනවිට කටයුතු කරමින් පවතී. විවෘත පදනම මත බඳවා ගත් නිලධාරීන් මේ වන විට සේවාස්ථ පුහුණුව ලබමින් සිටින අතර සීමිත පදනම හා ජ්‍යෙෂ්ඨතාව හා කුසලතා පදනම මත බඳවා ගන්නා නිලධාරීන් සම්බන්ධයෙන් බඳවා ගැනීමේ ඉදිරි කටයුතු සිදු කරනු ලබයි.

(ආ) (i) ඔව්.

(ii)

අනු අංකය	නම	ලිපිනය
1	ආර්.කේ.ජී. පුංචිහේවා මිය	නො.13, සද්ධාතිස්ස මාවත, වල්ගම මැද, මාතර
2	වන්දන දේවසුරේන්ද්‍ර මයා	මොටාගෙදර, කැකණදුර.
3	ඩබ්. කුලතුංග මයා	නො. 17, මංගල පාර, මැද්දවත්ත, මාතර.

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නව සේවා ව්‍යවස්ථාව ගැසට් පත්‍රයේ පළකර ඒ අනුව බඳවා ගැනීම් සිදු කිරීම සඳහා ගතවන කාල සීමාව සලකා එම බඳවා ගැනීම් සිදු කරන තෙක් එම සේවාවට අයත් තනතුරුවල කටයුතු බිඳවැටීමකින් තොරව විධිමත්ව හා අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා දැනට පවතින පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය 2015.06.15 දිනැති ලිපියෙන් ලබා දී ඇත. ඒ අනුව පළාතේ/දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු සඳහා පසුගිය වසර දෙක තුළ විශ්‍රාම ගිය අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් නිර්දේශ කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරන ලෙස සියලු පළාත් ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන් වෙත කරන ලද දැනුවත් කිරීමට අනුව ඔවුන් විසින් නිර්දේශ කර ඉදිරිපත් කරන ලද නිලධාරීන් සම්බන්ධ ඉල්ලීම් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව, ඔවුන් මාස 06ක කාලයක් සඳහා නැවත කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවීමට කටයුතු කර ඇත.

මේ වන විට බඳවා ගැනීම් ප්‍රමාණවත් පරිදි සිදු කර ඇති බැවින් තවදුරටත් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවීම සිදු නොකිරීමට තීරණය කර ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(*மாண்புமிகு டலஸ் அழகப்பெரும*)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, මට ගරු ඇමතිතුමාගෙන් අහන්න අතුරු ප්‍රශ්න රාශියක් නැහැ.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහනවා, ඔබතුමා ඉදිරිපත් කළ සංඛ්‍යා ලේඛනවල හැටියට මාතර දිස්ත්‍රික්කයේ පරිපාලන සේවයේ පුරප්පාඩු 32කට වැඩිය තිබෙනවා. ඒවා දීර්ඝකාලීනව පවතින පුරප්පාඩු. ඔබතුමා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල කාර්යභාරය පිළිබඳ මීට පෙර ප්‍රකාශයක් කළ නිසා මම ඒ ප්‍රශ්නයේ ගැඹුරට කිමිදෙන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා සඳහන් කළේ අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරීන් අටසිය පනස් දෙදෙනෙකු බඳවා ගැනීමට කටයුතු කරලා තිබෙනවා කියලා ද එහෙම නැත්නම් බඳවාගෙන දැන් ඔවුන් පුහුණුවේ ඉන්නවා කියලා ද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(*மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරීන් අටසිය පනස් දෙදෙනෙකු බඳවාගෙන දැන් පුහුණුව ලබමින් සිටිනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(*மாண்புமிகு டலஸ் அழகப்பெரும*)
(The Hon. Dullas Alahapperuma)
අධ්‍යාපන පරිපාලන සේවයේ පුරප්පාඩු 32ක් පමණ තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ පුරප්පාඩුත් පවතින්නේ මාතර දිස්ත්‍රික්කයේ ඉතාම දුෂ්කර ප්‍රදේශ වන දෙනියාය, මුලටියන, අකුරැස්ස වැනි කලාප කොට්ඨාසවලයි. මා දන්නා තොරතුරු අනුව දකුණු පළාතේ පමණක් අවුරුදු ගණනාවක් තිස්සේ පුරප්පාඩු 70කට අධික ප්‍රමාණයක් තිබෙනවා.

එවකට, අපේ ආණ්ඩුව පැවැති කාලයේ ඉඳලා පවා මේ පුරප්පාඩු පවතින්නත් පුළුවන්. එම නිසා නිලධාරීන් බඳවා ගැනීමට, පුහුණු කිරීමට ගනු ලැබූ තීන්දුව අගය කරමින් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අපට ලැබුණු තොරතුරුවල හැටියට ඒ පුහුණුව ලබන නිලධාරීන් සංඛ්‍යාවට වඩා රටේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව වැඩියි. මම වැරදි නම් නිවැරදි කරන්න. නමුත්

මාතර දිස්ත්‍රික්කයේ ජනතා නියෝජිතයෙකු විධියට මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ, ඒ පුහුණුව ලැබූ නිලධාරීන් රාජකාරියට මුදා හැරීමේදී විශේෂයෙන් අපේ දිස්ත්‍රික්කයේ දුෂ්කරම කොට්ඨාසවල තිබෙන පුරප්පාඩු සියල්ලම පිරවීමට ඔබතුමා කටයුතු කරනවාද කියලා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(*மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, අපි ගැසට් එක යවන අවස්ථාවේ පැවති සියලු පුරප්පාඩු සංඛ්‍යාව 852යි. මේ වන විට විවෘත විභාගයෙන් 200 ගණනක් බඳවාගෙන තිබෙනවා. ඒ අයට වසරක පුහුණුවක් ලබා දෙනවා. දැන් ඒ පුහුණුව කරමින් යනවා; ඒක ඉතාම ශක්තිමත් පුහුණුවක්. ඒ වාගේම ඔවුන්ට විදේශීය පුහුණුව ලබා දෙන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔය සියලු පුරප්පාඩු අපට පුරවන්නට පුළුවන්. ඇත්ත වශයෙන්ම මේ කාලයක් තිස්සේ බඳවා නොගැනීම නිසා ඇති වූ පුරප්පාඩු. අපි ආපු අවස්ථාවේම මේ කටයුත්ත භාර ගත්තා. මේ පුරප්පාඩු ටික සොයලා ගැසට් කළා. ඒ සඳහා අවම වශයෙන් ගතවන කාලය පමණයි ගිහින් තිබෙන්නේ. ඒ ක්‍රියාවලිය ගිහින් දැන් බඳවා ගැනීම කරලා තිබෙනවා. මේ සියලුම පුරප්පාඩු පුරවනවා. මේ වසර අවසානයේදී නැවතත් පුරප්පාඩු ගණනය කරලා නැවතත් ගැසට් කරලා ඉතිරි ටික බඳවා ගන්නවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(*மாண்புமிகு டலஸ் அழகப்பெரும*)
(The Hon. Dullas Alahapperuma)

මීට අදාළ නැති එක අතුරු ප්‍රශ්නයක් අහන්න ඔබතුමා එකඟද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(*மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)

අහන්න.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(*மாண்புமிகு டலஸ் அழகப்பெரும*)
(The Hon. Dullas Alahapperuma)

ගරු ඇමතිතුමනි, "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ මාතර දිස්ත්‍රික්කය තුළ ගොඩනැඟිලි ඉදි කිරීම් රාශියක් සිද්ධ වෙනවා. නමුත් මම දන්නා තොරතුරුවල හැටියට මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් මේ වන විට විශාල අර්බුදයක් මතු වෙලා තිබෙනවා. ඒ කියන්නේ ඉදි කිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ bills ටික settle කරන්නට පළාත් සභාවලට ලැබුණු මුදල් ප්‍රමාණවත් නොවීම නිසා ඒ බොහෝ කටයුතු ඇණ හිටලා තිබෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(*மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය සඳහා පාසල් තෝරා ගනු ලැබුයේ අපි දුන් විධිමත් නිර්ණායක මත. හැම කලාපයේම සහකාර සැලසුම් අධ්‍යක්ෂවරුන්ට පැහැදිලිව උපදෙස් දෙනු ලැබුවා තෝරා ගත යුතු නිර්ණායක මොනවාද කියලා. ඒ නිර්ණායක මත තෝරා ගත්තා නම්, -ඊයේ පෙරේදා පාසල් ගොඩනැඟිල්ලක් කඩා වැටීමක් වුණා- පාසල් ගොඩනැඟිලි කඩා වැටෙන්නට බැහැ. නිර්ණායක මත තෝරා ගත් පාසල් ටික අපි මේ පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරුන්ට දැනුම් දීලා, පළාත් අධ්‍යක්ෂවරු සහ කලාප අධ්‍යක්ෂවරු ගෙනැල්ලා නැවත තහවුරු කිරීමක් කරනු ලැබුවා ගරු කථානායකතුමනි, නිලධාරීන්ගේ මේ තෝරා ගැනීම හරිද නැද්ද කියලා.

පසුව එහිදීත් යම් යම් වෙනස්වීම් කරලා, කැබිනට් මණ්ඩලයටත් යොමු කරලා, අනුමත කරගත් නිර්ණායක මත එම පාසල් 10,000න් 7,000ක් තෝරා ගනු ලැබුවා. පාසල් 7,000 තුළත් පළමුවැනි අදියර, දෙවැනි අදියර, තුන්වැනි අදියර වශයෙන් 2020 දක්වා ඉලක්ක කර තමයි මේ කටයුතු සිද්ධ වුණේ. එසේ තිබියදීත්, සමහර අය විසින් ඊට පරිබාහිර ඒවාත් දමා තිබෙනවා. ඒ විස්තර වහාම දෙන්න කියා මම Internal Audit Division එකටත් කියා තිබෙනවා. ඒ අනුමත කර ගත් ප්‍රමාණය ඉක්මවා සමහර අය දමමින් යම් යම් පළාත් විසින් කටයුතු කර තිබෙනවා. අපට ඒවාට මුදල් දෙන්න පුළුවන්කමක් නැහැ. පළාතට තමයි මුදල් යවන්නේ කියා අප දැන් තීරණය කර තිබෙනවා. පළාතට මුදල් යවද්දීත්, කෙළින්ම, අප අනුමත කළ වැඩ විෂයයටම ඒවා යවන්නත් තීරණය කළා. මොකද, ඊට පරිබාහිරව සමහර අය දමා තිබෙනවා. මම උදාහරණයක් කියන්නම්. තරගකාරී මිල ක්‍රමයට දමන්න කියා තමයි අප කිව්වේ. නමුත්, සමහර අය එහෙම නොදමපු නිසා ඒවාට විරුද්ධවත් කටයුතු කරලා අප ඒක නැවැත්තුවා. හැබැයි, මෙහිදී පොඩි ප්‍රමාදයක් වුණා. මම "නැහැ" කියන්නේ නැහැ. ඔබතුමා කියන කාරණය හරි, ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමනි. අපට හරියට ඒ bills ටික එන්න ඕනෑ. වසර මුලදී ඔක්කොම මුදල් දෙන්නෙත් නැහැ. නමුත්, වසර මුලදී ඒ ඉල්ලපු advance අප දීලා තිබෙනවා. පොඩි delay එකක් ඇති. සමහර පළාත් සභා විසින් වැඩිපුර දමා තිබෙනවා. එතකොට අප යවන සල්ලි ප්‍රමාණය මදි වෙනවා. එවිට එහි නොගැළපීමක් මතු වෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒකයි, ඔතැන වුණේ.

මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව: ඉදිකිරීමට වැයවූ මුදල

மஹிந்த ராஜபக்ஷ சர்வதேச மாநாட்டு மண்டபம்: நிர்மாணச் செலவு

MAHINDA RAJAPAKSA INTERNATIONAL CONFERENCE HALL: COST OF CONSTRUCTION

1444/'16

13. ගරු බුද්ධික පතිරණ මහතා
(*மாண்புமிகு புத்திக பதிரண*)
(The Hon. Buddhika Pathirana)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) හම්බන්තොට මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීමට වැයවූ මුදල කොපමණද;

(ii) ඒ සඳහා මුදල් සපයා ගත් මූලාශ්‍ර කවරේද;

(iii) 2015.01.01 සිට 2016.12.31 දින දක්වා හම්බන්තොට මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව උපයා ගත් ආදායම කොපමණද;

(iv) මෙහි පාලන කටයුතු සිදු කරන්නේ කුමන ආයතනයක් විසින්ද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) මෙම සම්මන්ත්‍රණ ශාලාවේ සංවර්ධන කටයුතු සඳහා තවදුරටත් මුදල් යෙදවීමට රජය කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

[ගරු බුද්ධික පතිරණ මහතා]

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாந்தோட்டை மஹிந்த ராஜபக்ஷ சர்வதேச மாநாட்டு மண்டபத்தை நிர்மாணிக்கச் செலவான பணத்தொகை யாதென்பதையும்;

(ii) அதற்கென பணத்தைப் பெற்றுக்கொண்ட மூலங்கள் யாவை என்பதையும்;

(iii) 2015.01.01 தொடக்கம் 2016.12.31ஆம் திகதி வரை அம்பாந்தோட்டை மஹிந்த ராஜபக்ஷ சர்வதேச மாநாட்டு மண்டபம் ஈட்டிய வருமானம் யாதென்பதையும்;

(iv) இதன் நிர்வாக நடவடிக்கைகள் எந்த நிறுவனத்தினால் மேற்கொள்ளப்படுகின்றன என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) இதன் அபிவிருத்தி நடவடிக்கைகளுக்கென அரசாங்கம் தொடர்ந்தும் பணத்தை ஈடுபடுத்த நடவடிக்கை எடுக்குமா என்பதையும்;

(ii) ஆமெனில், அது எவ்வித்தத்தில் என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he state-

(i) the cost of construction of Hambantota Mahinda Rajapaksa International Conference Hall;

(ii) the funding sources of the above construction;

(iii) the income earned by the Hambantota Mahinda Rajapaksa International Conference Hall from 01.01.2015 to 31.12.2016;

(iv) the institution by which its administration is done?

(b) Will he inform this House-

(i) whether arrangements will be made by the Government to allocate further funds for the development activities of this Conference Hall;

(ii) if so, in which manner that is?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) "මහින්ද රාජපක්ෂ සම්මන්ත්‍රණ ශාලාව" නමින් සම්මන්ත්‍රණ ශාලාවක් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් හම්බන්තොට ඉදිකර නොමැත. එහෙත් "මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව" නමින් සම්මන්ත්‍රණ ශාලාවක් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් හම්බන්තොට ඉදිකර ඇත. එම ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 3,868ක මුදලක් වැය කර ඇත.

(ii) කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (KOICA) වෙතින් ඇමෙරිකානු ඩොලර් මිලියන 20ක ණය මුදලක් ලබාගෙන ඇත. ඉතිරි මුදල භාණ්ඩාගාරය විසින් ලබාදී ඇත.

(iii) 2015.01.01 සිට 2016.12.31 දින දක්වා "මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව" උපයා ගත් ආදායම රුපියල් මිලියන 8.35කි.

(iv) නාගරික සංවර්ධන අධිකාරිය

(ආ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, සමහර විට ඔබතුමාට මේ ප්‍රශ්නයට සෘජුව උත්තරයක් දෙන්න බැරි වෙයි. මේ සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය තුළ මීට අමතරව තවත් ගොඩනැඟිලි හැදීමේ සැලැස්මක් තිබෙනවාද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අදාළ අමාත්‍යාංශයට යොමු කරලා ඒකට පිළිතුරක් දෙන්න පුළුවන් වෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, අනෙකුත් කාරණාත් මේ වාගේ සෘජුවම අහන්න තිබෙන ඒවා. ඒ නිසා මම ඒවා වෙනම ප්‍රශ්නයක් විධියට දමන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, ඔබතුමා ඇහුවොත් එතුමා පිළිතුරක් දෙයි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මොකද, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් පැහැදිලි පිළිතුරක් මේ වෙලාවේ ගන්න බැරි වන නිසා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

පානීය ජල සැපයුම් ව්‍යාපෘති: මඩකලපුව දිස්ත්‍රික්කය

குடிநீர் வழங்கல் கருத்திட்டங்கள் : மட்டக்களப்பு மாவட்டம்

PROJECTS FOR SUPPLY OF DRINKING WATER: BATTICALOA DISTRICT

1244/'16

14. ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 1983 වර්ෂය වනවිට මඩකලපුව දිස්ත්‍රික්කය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් පිරිසිදු පානීය ජලය සපයා තිබූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට පිරිසිදු පානීය ජලය සපයා ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) 1983 වර්ෂයෙන් පසුව යුද තත්ත්වය නිම වනතුරු පානීය ජලය ලබා දීම වෙනුවෙන් එක් එක් වර්ෂය සඳහා රජය විසින් වෙන් කරන ලද මුළු මුදල කොපමණද;

(iv) යුද තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය වනතෙක් පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘති වෙනුවෙන් රජය වෙන් කරන ලද මුළු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1983ஆம் ஆண்டளவில் மட்டக்களப்பு மாவட்டத்தில் தேசிய நீர் வழங்கல் மற்றும் வடிகால மைப்புச் சபையினால் சுத்திகரிக்கப்பட்ட குடிநீர் வழங்கப்பட்டிருந்த வீடுகளின் எண்ணிக்கை யாது;

(ii) இன்றளவில் சுத்திகரிக்கப்பட்ட குடிநீர் வழங் கப்படுகின்ற வீடுகளின் எண்ணிக்கை யாது;

(iii) 1983ஆம் ஆண்டின் பின்னர் யுத்த நிலைமை முடிவடையும்வரை குடிநீர் வழங்குவதற்காக ஒவ்வோர் ஆண்டிற்கும் அரசாங்கம் ஒதுக்கிய மொத்தப் பணத்தொகை யாது;

(iv) யுத்த நிலைமை முடிவடைந்த பின்னர் 2015ஆம் ஆண்டுவரை குடிநீர் வழங்கல் கருத்திட்டங்களுக் காக அரசாங்கம் ஒதுக்கிய மொத்த பணத்தொகை ஆண்டுவாரியாக தனித்தனியாக எவ்வளவு;

(v) மேற்படி அனைத்தினதும் முன்னேற்ற அறிக்கை யைச் சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning and Water Supply:

(a) Will he inform this House-

(i) how many households within the Batticaloa District had been connected to the supply of clean drinking water by the National Water Supply and Drainage Board by 1983;

(ii) how many households are provided with clean drinking water at present;

(iii) what amount was allocated by the government in each year for providing drinking water until the end of the war situation after 1983;

(iv) what amounts had been allocated by the government for projects implemented for the supply of drinking water, separately in respect of each of the years following the war situation until the year 2015;

(v) whether he will table a progress report on all above?

(b) If not, why?

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே - நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of City Planning and Water Supply)

ගරු කථානායකතුමනි, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 1983 වර්ෂය වන විට මඩකලපුව දිස්ත්‍රික්කය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් පිරිසිදු පානීය ජලය සපයා තිබූ නිවාස සංඛ්‍යාව 700ක් වේ.

(ii) 2017 පෙබරවාරි මස වන විට පිරිසිදු පානී ජලය සපයා ඇති නිවාස සංඛ්‍යාව 39,739ක් වේ.

(iii) 1983 - 2010 වර්ෂය සඳහා රජය විසින් වැය කර ඇති මුළු මුදල රුපියල් මිලියන 54.6ක් වේ.

(iv) 2010-2015 වර්ෂයන්ට අදාළව රුපියල් මිලියන 9334.6ක් ආසියානු සංවර්ධන බැංකු 04 වන ව්‍යාපෘතිය යටතේ ලබා දී ඇත.

(v) 1975 වර්ෂය දක්වා ජල සැපයුම නඩත්තු කරන ලද්දේ මඩකලපුව හා කාත්තන්කුඩි නගර සභා මඟිනි.

ඉන් පසු 1976දී ජල සම්පාදන මණ්ඩලය මෙම ජල යෝජනා ක්‍රම දෙක පවරා ගන්නා ලදී.

1983 වර්ෂයේදී මඩකලපුව දිස්ත්‍රික්කයේ නගර සභා බල ප්‍රදේශයේ ජල සැපයුම් 200ක් හා දිස්ත්‍රික් රෝහල්ද ඇතුළත්ව ජල සැපයුම් 500ක් පමණ ලබා දී තිබුණි. 1990 වර්ෂයේදී මෙම ජල යෝජනා ක්‍රම දෙකෙහි වැඩි දියුණු

[ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය]

කරන ලද අතර, එමඟින් නව භූගත නල ළිං 02ක් ඌරුනි හා කොක්කුවිල් ප්‍රදේශයේ ඉදි කරන ලදී.

2005 වර්ෂයේදී සුනාමි ව්‍යසනයෙන් පසු රාජ්‍ය නොවන සංවිධාන මඟින් මෙම ප්‍රදේශවල පැරණි වීනචට්ටි හා ඇස්බැස්ටස් ජල නළ ඉවත් කර අලුතින් ජල නළ එළීම සිදු කරන ලදී.

2008 වර්ෂයේදී ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර යටතේ ආරම්භ කරන ලද ජල සැපයුම් ව්‍යාපෘතිය 2011 වර්ෂයේදී අවසන් කරන ලදී. එම ව්‍යාපෘතිය මඟින් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 05ක් ආවරණය කරන ලදී. එම ව්‍යාපෘතියට සමගාමීව 2006 වර්ෂයේ සිට ක්‍රියාත්මක කල්ලර්, කාලුවාන්චිකුඩි ජල සැපයුම් ව්‍යාපෘති 2008 හා 2011 වර්ෂවලදී නිම කරන ලදී. ඒ සඳහා STAART හා හෙල්විටාස් සමාගම් මූල්‍ය දායකත්වය සපයන ලදී.

2017 වර්ෂයේ පෙබරවාරි මස වන විට මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 14න් 08ක් ආවරණය කර ජනගහනයෙන් 200,000ක් සඳහා පිරිසිදු පානීය ජලය ලබා දී ඇත. ඒ අනුව 40,000කට ආසන්න ගෘහස්ථ ජල සැපයුම් ප්‍රමාණයක් ලබා දී ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු රාජ්‍ය ඇමතිතුමිය විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කළා. ඒ සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතියි. ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

2017 වන විට අවසන්වීමට නියමිත ව්‍යාපෘතියක් ගැන ඔබතුමිය කිව්වා. මේ ව්‍යාපෘතියට ගිවිසුම් අත්සන් කරන ලද්දේ කුමන වර්ෂයේ ද? ඒ සමස්ත ප්‍රතිපාදන හා ඒ ව්‍යාපෘතිය නිමවීමට නියමිතව තිබෙන්නේ 2017 වර්ෂය ද? නැත්නම්, ඒක තවත් ඉදිරියට යන ව්‍යාපෘතියක් ද?

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
2010 සිට 2015 දක්වා තමයි ආසියානු සංවර්ධන බැංකුව 4වන ව්‍යාපෘතිය යටතේ මිලියන 9,334.6ක ප්‍රතිපාදන ලබාදී තිබෙන්නේ. 2017 පෙබරවාරි වන විට මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 14න් 8ක් ආවරණය වන පරිදි ලක්ෂ දෙකක ජනගහනයකට පානීය ජලය දීලා තිබෙනවා. කල්ලර් සහ කාලුවාන්චිකුඩි ජල සැපයුම් ව්‍යාපෘති 2008 හා 2011 වර්ෂවලදී නිම කර තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා ඊළඟ ප්‍රශ්නය අහන්න.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්නයක් නොව ඒ ප්‍රශ්නයට අදාළවයි මම අහන්නේ. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, 2017 වන විට ජලය ලබා දුන්නේ 2010දී ආරම්භ කරපු ව්‍යාපෘතියෙන් ද?

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
2010 සිට 2015 වර්ෂයන් අතරතුර ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන වෙන් කරලා, 2017 වර්ෂයේදී ලබා දීපු ජල සැපයුම් ගණන තමයි සඳහන් වුණේ. 2016-2017 අලුත් ව්‍යාපෘතියක් ගැන ඔබතුමා ප්‍රශ්නයක් අහලා තිබුණෙත් නැහැ. පිළිතුරෙහි සඳහන් වෙන්නෙත් නැහැ. ඔබතුමා අසා තිබෙන ප්‍රශ්නවලට අදාළ පිළිතුරු තමයි දැන් මා ළඟ තිබෙන්නේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

2015 ජනවාරි මස 08වැනිදා මේ ආණ්ඩුව පත් වුණු දා සිට, 2017 වර්ෂයේ මේ වනතුරු ඔබතුමිය නියෝජනය කරන රජය විසින් මඩකලපුව දිස්ත්‍රික්කයේ ජල ව්‍යාපෘති ඇති කිරීම සඳහා ඒ ඒ වර්ෂයන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන හා කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණ ද?

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
ඒ සඳහා අවශ්‍ය කරන විස්තර මම ඔබතුමාට පසුව ලබා දෙන්නම්. මොකද, ඔබතුමා අසා තිබෙන ප්‍රශ්නවල අලුත් ව්‍යාපෘති සම්බන්ධයෙන් සඳහන් වෙලා නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු රාජ්‍ය ඇමතිතුමියනි, සංඛ්‍යාත්මකව කියන්න බැරි නම්, එවැනි ව්‍යාපෘති 2015, 2016, 2017දී ක්‍රියාත්මක කොට තිබෙනවා ද කියලාවත් කියන්න. දළ වශයෙන් එහෙම කියන්න පුළුවන් ද? අලුතින් ව්‍යාපෘති පටන් ගත්තා ද, නැද්ද කියලා කියන්න පුළුවන් නේ.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
මඩකලපුව දිස්ත්‍රික්කය ගැන විශේෂයෙන් කියන්න බැහැ. නමුත්, ලංකාව පුරා ව්‍යාපෘති ආරම්භ කරලා තිබෙනවා. අලුත්ම මහ බැංකු වාර්තාවේ තිබෙනවා, ජලසම්පාදන මණ්ඩලය මඟින් සියයට 47.7ක ජනගහනයකට පානීය ජලය ලබා දෙනවා කියලා. එය 2020 වන විට සියයට 60ක් දක්වා වැඩි දියුණු කිරීම තමයි මේ රජයේ අරමුණ වන්නේ.

ඒ නිසා රට පුරා ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන් මඩකලපුව දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් විස්තර අවශ්‍ය නම් ඔබතුමා වෙනම ප්‍රශ්නයක් අහන්න. එතකොට සවිස්තරාත්මකව පිළිතුරු ලබා දෙන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

රාගම නගරය සංවර්ධනය: විස්තර
றாகம நகர அபிவிருத்தி : விபரம்
DEVELOPMENT OF RAGAMA TOWN: DETAILS

1448/'16

15. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) රාගම නගරය සංවර්ධනය සඳහා සැලසුම් සකස් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iii) සංවර්ධන කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) නගර සංවර්ධනයේදී රාගම නගරයට එක්වන නව අංග කවරේද;

(ii) එම ඉදිකිරීම් සඳහා ටෙන්ඩර් කැඳවා තිබේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

මානකර මත්‍රුම් මේල් මාකාණ අපිවිරුත්දි අමෙච්චරුමානවරෙක් කේට්ට විනා:

(අ) (i) றாகம நகரத்தை அபிவிருத்தி செய்ய திட்ட மிடப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கென செலவிட உத்தேசித் துள்ள பணத்தொகை எவ்வளவென்பதையும்;

(iii) அபிவிருத்திப் பணிகள் ஆரம்பிக்கப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) றாகம நகர அபிவிருத்தியின்போது நகரத்திற்கு இணைக்கப்படும் புதிய அம்சங்கள் யாவையென்பதையும்;

(ii) மேற்படி நிர்மாணப் பணிகளுக்கென கேள்விப் பத்திரங்கள் கோரப்பட்டுள்ளனவா என்பதையும்;

(iii) அவ்வாறாயின், அது எத்தேதியில் என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Megapolis and Western Development:

(a) Will he inform this House-

(i) whether plans have been formulated to develop Ragama town;

(ii) if so, the projected expenditure ;

(iii) the date on which the development activities would be commenced?

(b) Will he also inform this House-

(i) the new features that would be added to the town when developed;

(ii) whether tenders have been called for the aforesaid constructions;

(iii) if so, the date on which it was done?

(c) If not, why?

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ගරු කථානායකතුමනි, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) නාගරික සංවර්ධන අධිකාරිය

කෙටුම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර ඇත.

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව

ඉහළගම පිහිටි පොල්ගහ වැව සංවර්ධනය සහ පාරිසරික සංවර්ධනය සඳහා රුපියල් මිලියන 155ක ඇස්තමේන්තුවකින් යුතු ව්‍යාපෘතියේ දෙවන අදියර ආරම්භ කර ඇත.

මීට අමතරව කළු ඔය ගංවතුර පාලනය සහ පාරිසරික සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කරගෙන යනු ලබන අතර ඉඩම් අත්පත් කර ගැනීම අවසන් කරන ලද ඉඩම්වල ජලාපවහන වැඩිදියුණු කිරීමේ කටයුතු කරගෙන යනු ලබයි.

(ii) නාගරික සංවර්ධන අධිකාරිය

ව්‍යාපෘති හඳුනාගෙන ප්‍රමුඛතා ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කරමින් පවතී.

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව

පොල්ගහ වැව සංවර්ධනය සහ පාරිසරික සංවර්ධනය සඳහා 2017 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 50ක් මහා භාණ්ඩාගාරය විසින් අනුමත කර ඇත.

කළු ඔය ගංවතුර පාලනය සහ පාරිසරික සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 50ක් මහා භාණ්ඩාගාරය විසින් වෙන්කර ඇත.

(iii) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව

වැසි ජලාපවහන පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතු දැනටමත් ආරම්භ කර ඇත.

මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය ඉඩම් සංවර්ධනය අවසන් කර ඇති අතර, ආයෝජකයින් හඳුනා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.

(ආ) (i) බහු-මහල් සාජ්පු සංකීර්ණයක්

ජල තටාක, ශරීර සුවතා මධ්‍යස්ථාන ඇතුළු රජයේ සේවකයින් සඳහා මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

වැසි ජලාපවහන පද්ධතිය සංවර්ධන ව්‍යාපෘතිය

ළමා ක්‍රීඩා උද්‍යානය

මාර්ග සංවර්ධනය හා වැඩිදියුණු කිරීම්

ජලාපවහන පද්ධතිය පිළිසකර කිරීම හා වැඩිදියුණු කිරීම

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති

වාහන නැවතුම් ඉඩකඩ සංවර්ධනය

විවෘත භූමි හා රැස්වීම් ශාලා සංවර්ධනය

දුම්රිය ස්ථානය සංවර්ධනය

දුම්රිය ස්ථානය හා යෝජිත බහු-මහල් සාප්පු සංකීර්ණය යා කරන මගී පාලම සංවර්ධන ව්‍යාපෘතිය

(ii) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව - නිවාස ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් පත්‍රිකා සකස් කරමින් පවතී.

ජලාපවහන පද්ධතිය ක්‍රියාත්මක කරමින් පවතී.

වැව හැරීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

(iii) බහු-මහල් සාප්පු සංකීර්ණය, දුම්රිය ස්ථානය හා බහු-මහල් සාප්පු සංකීර්ණය යාකෙරෙන මගී පාලම සංවර්ධන ව්‍යාපෘති 2018 වර්ෂයේ ආරම්භ කිරීමට යෝජිතය. අනෙකුත් ව්‍යාපෘති ඊට සමගාමීව ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී.

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව - රජයේ සේවකයින් සඳහා වන මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු 2017 මැයි මස තුළ හඳුනාගත හැක. ජූනි මස සිට ඉදිකිරීම් ආරම්භ කිරීමට කටයුතු කළ හැක.

(ඇ) අදාළ නැත.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, සාමාන්‍ය සුළු වර්ෂාවකට වුණත් රාගම නගරය ප්‍රධාන වශයෙන් ජලයෙන් යට වෙන්නට හේතුවක් තමයි වැසි ජලය සහ වැඩි ජලය තැන්පත් කිරීමට ස්ථානයක් නොමැතිකම. ඉහළගම පිහිටි පොල්ගහ වැව ඇත්තටම එම ජලය තැන්පත් කිරීම සඳහා හොඳ ජල මූලාශ්‍රයක් විධියට පාවිච්චි කරන්න පුළුවන්. නමුත් පොල්ගහ වැවේ සංවර්ධන කටයුතු මේ වෙනකොට නතර වෙලා තිබෙනවා. ඒකට හේතුව වැව අනවසරයෙන් අල්ලා ගත් අය කරන බලපෑමයි. මේ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද?

ගරු ලසන්ත අලගියවන්න මහතා
(මාණ්පුමිකු ලසන්ත අලකියවන්න)
(The Hon. Lasantha Alagiyawanna)

ඇත්ත වශයෙන්ම පසුගිය වර්ෂයේ ප්‍රතිපාදන මුදල් යොදවලා අපි මේ ව්‍යාපෘතිය ආරම්භ කළා. සුළු ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළක් පමණයි අපි සැලසුම් කරලා ආරම්භ කළේ. නමුත් ව්‍යායාම මං තීරුවක් ඇති උද්‍යානයක් ඇති කරලා දෙන්න කියලා ප්‍රදේශවාසීන් සහ මහජන නියෝජිතයන් ඉල්ලීම් කළා. ඒ අනුව සැලසුම් සකස් කරමින් පවතිනවා. ඒ වාගේම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු මේ වන විට ආරම්භ කරලා තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඒ වැවට අයිති භූමියේ ස්ථිර ගොඩනැඟිලි පවා ඉදි වෙලා තිබෙනවා. සමහර අය ඒ භූමිය ගොඩ කරලා ගස් හිටවලා තිබෙනවා; පොල් ගස්, තැඹිලි ගස් පවා හිටවලා තිබෙනවා. සමහර අය කංකුං වැනි වගාවන් සිදු කරනවා, මේ වැවේ ගොඩ වුණු ප්‍රදේශයේ. හරියට බැලුවොත් වැව වාගේම වැදගත් දෙයක් තමයි වැව් රක්ෂිතයත්. වැවත්, වැව් රක්ෂිතයත් අල්ලා ගත් පුද්ගලයන්ගෙන් මුදා ගැනීමේ කටයුතු කොපමණ කාලයකින් නිම කර ගන්න පුළුවන්ද සහ මේ සංවර්ධන කටයුතු ආරම්භ කරන්න තව කොපමණ කාලයක් ගත වෙයිද? මේ වසරේ දැනට කිසිම කටයුත්තක් සිදු වන්නේ නැහැ. අද වන විට වැවේ ගොඩ දමපු ප්‍රදේශයේ තණකොළ සහ පන් වර්ග වැවිලා කැලය වෙලා තිබෙනවා.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(මාණ්පුමිකු ලසන්ත අලකියවන්න)
(The Hon. Lasantha Alagiyawanna)

මේ ව්‍යාපෘතිය සඳහා අදාළ මැනීම් කටයුතු සිදු කරලා තිබෙනවා. මැනීම් කටයුතු සිදු කළාට පසුව තමයි ඔබතුමා ඔය කියන සියලුම අනවසර දේවල් වාර්තා වුණේ. ඒ මැනීම් කටයුතුවල ප්‍රතිඵලයක් විධියට හඳුනා ගත්ත සියලුම අනවශ්‍ය දෑ ඉවත් කිරීම සඳහා කටයුතු ආරම්භ කරලා තිබෙනවා. අපි පසුගිය වසරේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළා. පෙර පරිදි මේ වසරේත් රුපියල් මිලියන 50ක මුදලක් වෙන් වෙලා තිබෙනවා. අපි නැවත ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, පසුගිය වසරේ රුපියල් මිලියන 2ක් කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලබා දුන්නාට රුපියල් මිලියන දෙක වාගේ කිහිප ගුණයක වැඩ කටයුතු පසුගිය වසරේ කෙරිලා තිබෙනවා. ඔබතුමාගේ අමාත්‍යාංශය තමයි ඉතිරි බරපැන දරලා නිබුණේ. මේ වසරේ යම් මුදලක් වෙන් කළත්, ඒ සඳහා පාවිච්චි කරන යන්ත්‍ර සූත්‍ර ඉතා සුළු ප්‍රමාණයක් තිබෙන්නේ. එම යන්ත්‍ර සූත්‍ර මුතුරාජවෙල ප්‍රදේශයට ගෙන ගියා; ඇඹිලිපිටියට ගෙන ගියා කියලා තමයි ප්‍රමාද වෙන්නේ. එම නිසා ඔබතුමා විශේෂ අවධානයක් යොමු කරලා මේ ස්ථානයට ගැළපෙන යන්ත්‍ර සූත්‍ර කඩිනමින් මේ ස්ථානයට යොමු කර,- ඉදිරි මාස කිහිපයේ වැස්ස ආරම්භ වුණොත් මේක කරන්න බැහැ. එහෙම වුණොත් වැව නිස් කරන්න වෙනවා. ඒක බෙදවාචකයක්. - මේ පායන සමය නැත්නම් නියං සමය ප්‍රයෝජනයට අරගෙන එම කටයුත්ත කඩිනමින් ආරම්භ කිරීමට ඔබතුමාගේ සොයා බැලීම සහ අවශ්‍ය මහ පෙන්වීම කරන්න පුළුවන්ද?

ගරු ලසන්ත අලගියවන්න මහතා
(මාණ්පුමිකු ලසන්ත අලකියවන්න)
(The Hon. Lasantha Alagiyawanna)

අනිවාර්යෙන්ම ඒ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන කටයුතු කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. දෙවන වටය.

උතුරු වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: විස්තර

வாகரை வடக்கு பிரதேச செயலாளர் பிரிவு : விபரம்
VAKARAI NORTH DIVISIONAL SECRETARY'S DIVISION: DETAILS

1143/'16

5. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු එම්.එච්.එම්. සල්මාන් මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு எம்.எச்.எம். சல்மான் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. M.H.M. Salman)
ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තු, උතුරු වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් ආවරණය වන සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එහි ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව කොපමණද;

(v) එම ග්‍රාම නිලධාරී වසම්වල නිල අංක හා නාමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවීමේදී නිල වශයෙන් සීමා නිර්ණය කිරීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) එකී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති ග්‍රාම නිලධාරී වසම් අතරින් කිසියම් වසමක/ වසම්වල පරිපාලන කටයුතු හෝ මෙහෙයවීම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදුකරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරී වසම්වල නාමය, නිල අංක ඇතුළු විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்தின் கோரளைப்பற்று வாகரை வடக்குப் பிரதேச செயலாளர் பிரிவு தாபிக்கப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) அது தொடர்பாக வெளியிடப்பட்ட வர்த்தமானிப் பத்திரிகையின் பிரதியொன்றை சபையில் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iii) அப்பிரதேச செயலாளர் பிரிவின் மூலம் உள்ள டக்கப்படும் மொத்த நிலப் பரப்பளவு எவ்வளவு என்பதையும்;

(iv) அதிலுள்ள கிராம அலுவலர் பிரிவுகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(v) அக்கிராம அலுவலர் பிரிவுகளின் உத்தியோக பூர்வ இலக்கங்களும் பெயர்களும் யாவை யென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அப்பிரதேச செயலாளர் பிரிவைத் தாபிக்கும் போது உத்தியோகபூர்வமாக எல்லைகளை நிர்ணயித்தல் நடைபெற்றுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அது பற்றிய விபரங்கள் யாவை யென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) அப்பிரதேச செயலகத்திற்குரிய கிராம அலுவலர் பிரிவுகளில் ஏதேனும் பிரிவின்/பிரிவுகளின் நிருவாக நடவடிக்கைகள் அல்லது தொழிற் பாடுகள் வேறு பிரதேச செயலகங்களின் மூலம் மேற்கொள்ளப்படுகின்றனவா என்பதையும்;

(ii) ஆமெனில், அக்கிராம அலுவலர் பிரிவுகளின் பெயர்கள், உத்தியோகபூர்வ இலக்கங்கள் உள்ளிட்ட விபரங்களை சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Home Affairs:

(a) Will he inform this House-

(i) the date on which the Vakarai North Divisional Secretary's Division of Koralepattu in the Batticaloa District was established;

(ii) whether he will table a copy of the Gazette Notification issued in this regard;

(iii) what total extent of land area is covered by that Divisional Secretary's Division;

(iv) how many Grama Niladhari Divisions are located in the Division concerned; and

(v) what the official codes and names of such Grama Niladhari Divisions are?

(b) Will he also inform this House-

(i) whether an official delimitation mission has taken place in establishing that Divisional Secretary's Division; and

(ii) if so, what its details are?

(c) Will he state-

(i) whether administration or other operations of any of the Grama Niladhari Divisions falling under the Divisional Secretary's Division concerned are currently handled by some other Divisional Secretariats; and

(ii) if so, whether he will submit the names and official codes of such Grama Niladhari Divisions?

(d) If not, why?

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 1972.01.01

(ii) ඔව්.

(iii) ව.කි.මී. 509.88

(iv) 16

(v)

අංකය	ග්‍රාම නිලධාරී වසම	ග්‍රාම නිලධාරී වසමෙහි අංකය
01	මන්කර්නි මධ්‍යම	211
02	පූනානි - නැහෙනහිර	211 බී
03	වඩ්ඩාවන්	211 සී
04	කිරුම්විවෙයි	211 එෆ්
05	මන්කර්නි දකුණ	211 ජී
06	මතුරන්කර්නි කුලම්	211 ඊ
07	පනිවිවන්කර්නි	211 සී
08	වාහරෙයි මධ්‍යම	212
09	කයර්න්කර්නි	211 ඒ
10	වාහරෙයි උතුර	212 ඒ
11	කතිරවෙලි	213
12	කඩුමුරිච්	213 බී
13	පුවිවාකර්නි	213 සී
14	පාල්චිචේනයි	213 ඒ
15	උරියන්කඩ්ඩු	212 බී
16	අම්මාන්දනාවෙලි	213 සී

(ආ) (i) ඔව්.

(ii) හඳුනාගත් ග්‍රාම නිලධාරී වසම් 16 ට අදාළ සීමාව වේ.

1972.01.01 දින ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටවූ අතර, එහි ගැසට් පත්‍රය නිකුත් කරන ලද්දේ 1998 ජූනි 12 වැනි සිකුරාදා දිනය. අංක 1032 දරන ගැසට් පත්‍රයට අනුව 111 වන තීරය පරිදි මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි මායිම් පසුබිම් වාර්තාවේ* විස්තර කර ඇත.

(ඇ) (i) ඔව්.

(ii) ඔව්.

අංකය	ග්‍රාම නිලධාරී වසමේ නම	ග්‍රාම නිලධාරී වසමෙහි අංකය	වර්තමානයේ දී පාලනය කරන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
01	රිදීකැන්න	211 බී	කෝරලේපත්තු - මධ්‍යම
02	ජයන්තිජාජා	211 බී	කෝරලේපත්තු - මධ්‍යම

(ඇ) අදාළ නොවේ.

කෝරලේපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : විස්තර
கோரளைப்பற்று பிரதேச செயலாளர் பிரிவு : விபரம்
KORALAIPATTU DIVISIONAL SECRETARY'S DIVISION: DETAILS

1144/'16

10. ගරු බුද්ධික පතිරණ මහතා (එම්. එච්. එම්. සල්මාන් මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு எம்.எச்.எம். சல்மான் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. M.H.M. Salman)

ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් ආවරණය වන සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එහි ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව කොපමණද;

(v) එම ග්‍රාම නිලධාරී වසම්වල නිල අංක හා නාමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවීමේදී නිල වශයෙන් සීමා නිර්ණය කිරීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) එකී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති ග්‍රාම නිලධාරී වසම් අතරින් කිසියම් වසමක/ වසම්වල පරිපාලන කටයුතු හෝ මෙහෙයවීම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදුකරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරී වසම්වල නාමය, නිල අංක ඇතුළු විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்தின் கோரளைப்பற்றுப் பிரதேச செயலாளர் பிரிவு தாபிக்கப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) அது தொடர்பாக வெளியிடப்பட்ட வர்த்தமானிப் பத்திரிகையின் பிரதியொன்றை சபையில் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iii) அப்பிரதேச செயலாளர் பிரிவின் மூலம் உள்ளடக்கப்படும் மொத்த நிலப் பரப்பளவு எவ்வளவு என்பதையும்;

(iv) அதிலுள்ள கிராம அலுவலர் பிரிவுகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்,

(v) அக்கிராம அலுவலர் பிரிவுகளின் உத்தியோக பூர்வ இலக்கங்களும் பெயர்களும் யாவை யென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அப்பிரதேச செயலாளர் பிரிவைத் தாபிக்கும் போது உத்தியோக பூர்வமாக எல்லைகளை நிர்ணயித்தல் நடைபெற்றுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அது பற்றிய விபரங்கள் யாவை யென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) அப்பிரதேச செயலகத்திற்குரிய கிராம அலுவலர் பிரிவுகளில் ஏதேனும் பிரிவின்/பிரிவுகளின் நிருவாக நடவடிக்கைகள் அல்லது தொழிற் பாடுகள் வேறு பிரதேச செயலகங்களின் மூலம் மேற்கொள்ளப்படுகின்றனவா என்பதையும்;

(ii) ஆமெனில், அக்கிராம அலுவலர் பிரிவுகளின் பெயர்கள், உத்தியோகபூர்வ இலக்கங்கள் உள்ளிட்ட விபரங்களை சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Home Affairs:

(a) Will he inform this House-

(i) the date on which the Koralaipattu Divisional Secretary's Division in the Batticaloa District was established;

(ii) whether he will table a copy of the Gazette Notification issued in this regard;

(iii) what total extent of land area is covered by that Divisional Secretary's Division;

(iv) how many Grama Niladhari Divisions are located in the Division concerned; and

(v) what the official codes and names of such Grama Niladhari Divisions are?

(b) Will he also inform this House-

(i) whether an official delimitation mission has taken place in establishing that Divisional Secretary's Division; and

(ii) if so, what its details are?

(c) Will he state-

(i) whether administrative or other operations of any of the Grama Niladhari Divisions falling under the Divisional Secretary's Division concerned are currently handled by some other Divisional Secretariats; and

(ii) if so, whether he will submit the names and the official codes of such Grama Niladhari Divisions?

(d) If not, why?

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම පිළිතුර සභාගත* කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i). 2002.05.24

(ii). ගැසට් පත්‍රය නිකුත් කර නොමැති බැවින් ඉදිරිපත් කළ නොහැක.

(iii). ව.කි.මී. 34.01

(iv). 08කි.

(v).

අනු අංකය	ග්‍රාම නිලධාරී වසම	නිල අංකය
01	තයිවට්ටවන්	210 සී
02	වාලච්චේනයි 5 මුස්ලිම්	206 බී
03	වාලච්චේනයි 4 මුස්ලිම්	206
04	වාලච්චේනයි 5 මුස්ලිම් (දකුණ)	206 ඩී
05	බ්‍රේන්තුරයිච්චේනයි (උතුර)	206 ඒ
06	බ්‍රේන්තුරෙයිච්චේනයි (දකුණ)	206 සී
07	මාවඩිච්චේනයි	208 ඒ
08	සෙම්මොනොදායි	208 ඩී

(ආ) (i). ඔව්.

(ii). හඳුනාගත් ග්‍රාම නිලධාරී වසම් 08ට අදාළ සීමාව වේ.

(ඇ) (i). ඔව්.

(ii). ඔව්.

අනු අංකය	ග්‍රාම නිලධාරී වසම	නිල අංකය	වර්තමානයේ දී පාලනය කරන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
01	පුනනායි නැඟෙනහිර	211 බී (ගැසට් පත්‍රය නිකුත් කර ඇත.)	කෝරලේපත්තු උතුර, වාකරයි
02	රොධිතැන්න	211 එච් (යෝජිත කොට්ඨාසයකි)	
03	කරමුනයි	211 ජී /2 (යෝජිත කොට්ඨාසයකි)	

(ඇ) අදාළ නොවේ.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

දෙමළ මාධ්‍ය ගුරු අධ්‍යාපනඥවරුන්ගේ උසස්වීම් ලබා නොදීම
தமிழ் மொழிமூல ஆசிரிய கல்வியியலாளர்களுக்கான பதவியுயர்வுகளை வழங்காமை
DEPRIVATION OF PROMOTIONS TO TAMIL MEDIUM TEACHER EDUCATORS

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ கல்வி அமைச்சர் அக்கில விராஜ் காரியவசம் அவர்களிடம் கேள்வி கேட்க அனுமதித்ததற்கு நன்றி.

இலங்கை கல்வியியலாளர் சேவை தரம் 2(II) இலிருந்து தரம் 2(I) க்கு பதவி உயர்வு வழங்குவதற்காக 2015ஆம் ஆண்டு விண்ணப்பம் கோரப்பட்டது. முன்னைய சேவைப் பிரமாணக் குறிப்பிற்கு அமைய 2016ஆம் ஆண்டு பெப்ருவரி மாதம் 44 வெற்றிடங்களுக்கென நேர்முகப்பரீட்சை நடத்தப்பட்டதாகவும் இதற்கு தமிழ் மொழிமூல தேசிய கல்வியியற் கல்லூரிகளான யாழ்ப்பாணம், வவுனியா, மட்டக்களப்பு, தர்கா நகர், அட்டாளைச்சேனை, கொட்டகல ஆகியவற்றிலிருந்து விரிவுரையாளர்கள் தோற்றியிருந்தனர் என்றும் கூறப் படுகிறது. எனினும், மேற்படி பதவி உயர்வு வழங்கப்பட்டோர் பட்டியலில் தமிழ் மொழிமூல விரிவுரையாளர்கள் ஒதுக்கப் பட்டுள்ளனர் என்று தெரிய வருகின்றது.

1. மேற்குறிப்பிட்ட பதவி உயர்வு தொடர்பில் தமிழ் மொழிமூல உத்தியோகத்தர்கள் புறக்கணிப்பு இடம் பெற்றுள்ளதா?
2. ஆமெனில், அதற்கான காரணங்கள் எவை?
3. இல்லையெனில், தமிழ் மொழிமூல உத்தியோகத் தர்கள் பதவி உயர்வுகளைப் பெறாததற்குக் காரணம் என்ன?

மேற்படி எனது கேள்விகளுக்கான பதிலை கௌரவ அமைச்சரிடமிருந்து எதிர்பார்க்கின்றேன்.

ගරු වී.එස්. රාධාකිෂ්ණන් මහතා (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன் - கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. V.S. Radhakrishnan -State Minister of Education)

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 23/2 இன் கீழ் எழுப்பப்பட்ட வினாவுக்கான விடையை கௌரவ அமைச்சரின் சார்பில் நான் சமர்ப்பிக்கின்றேன்.

இலக்கம் 1070/13 மற்றும் 1999.03.11ஆம் திகதிய இலங்கை ஆசிரிய கல்வியியலாளர் சேவை பிரமாணக் குறிப்பிற்மைய, இலக்கம் 1919 கொண்ட 2015.06.12ஆம் திகதியன்று வெளியிடப்பட்ட 2(I) பதவி உயர்வுக்கான வர்த்தமானி அறிவித்தல், மற்றும் இலக்கம் 1942 கொண்ட 2015.11.20ஆம் திகதியன்று வெளியிடப்பட்ட திருத்தப்பட்ட வர்த்தமானி அறிவித்தல் என்பவற்றுக்கு அமைய விண்ணப்பம் கோரப்பட்டு, 2(II) தரத்தின் 153 அலுவலர்களுக்கு 2(I) தரத்தில் 44 வெற்றிடங்களைப் பூர்த்தி செய்வதற்காக 2016 பெப்ரவரி 18, 19 மற்றும் 23ஆம் திகதிகளில் நேர்முகப்பரீட்சை நடைபெற்றது. இவ்வெற்றிடங்களின் விபரம் பின்வருமாறு: 2012.07.01ஆம் திகதியன்று 35 வெற்றிடங்களும், 2013.01.01 ஆம் திகதியன்று 2 வெற்றிடங்களும், 2013.07.01ஆம் திகதியன்று 3 வெற்றிடங்களும், 2014.01.01ஆம் திகதியன்று ஒரு வெற்றிடமும், 2014.07.01ஆம் திகதியன்று 3 வெற்றிடங் களுமாக மொத்தம் 44 வெற்றிடங்கள் காணப்பட்டன.

இவற்றில் 2 - i தரத்திற்கான பதவி உயர்வு தொடர்பாக மேன்முறையீட்டு நீதிபதியிடம் முன்வைக்கப்பட்ட இலக்கம் AAT/72/2014 (PSE) கொண்ட மேன்முறையீட்டின் தீர்ப்புப்படி சேவையிலுள்ள தமிழ் மொழிமூல அதிகாரிகள் 03 பேருக்குப் பதவியுயர்வை வழங்குவதற்கு அரச சேவை ஆணைக்குழுவின் PSC/APP/07684/2014 இலக்க மற்றும் 2016.10.10 திகதியிட்ட கடிதத்தின் ஊடாக அனுமதி அளிக்கப்பட்டுள்ளது. மேற்குறிப் பிட்ட 44 வெற்றிடங்களில் பதவி உயர்வு வழங்கப்பட்டது 41 வெற்றிடங்களுக்கு மட்டுமே. அதேபோல் சேவைப் பிரமாணக் குறிப்புக்கு அமைய நடவடிக்கை மேற்கொள்ளும்போது மொழிமூலத்திற்கு அமைய வெவ்வேறாகப் பதவி உயர்வு வழங்கப்படமாட்டாது என்பதோடு, பெற்றுக்கொள்ளப்பட்ட புள்ளிகளின் தொடர் ஒழுங்குக்கு அமைய தகுதிபெற்ற அதிகாரிகளுக்கே பதவியுயர்வும் பெற்றுக்கொடுக்கப் பட்டுள்ளது. அந்த வகையில்,

1 வது வினாவுக்கான விடை : இல்லை.

2 வது வினாவுக்கான விடை: அதற்கான காரணங்கள் இல்லை.

3 வது வினாவுக்கான விடை: இலங்கை ஆசிரியர் கல்வியியலாளர் சேவையின் 2(I) தரத்தில் 2012.07.01ஆம் திகதி தொடக்கம் 2014.07.01 வரையில் நிலவிய 44 வெற்றிடங்களை நிரப்புவதற்காக 2(II) தரத்தின் அதிகாரிகளுக்காக நடத்தப்பட்ட நேர்முகப்பரீட்சையில் அடிப்படைத் தகுதிகளைப் பூர்த்தி செய்தவர்களின் எண்ணிக்கை 75 ஆகும். வெற்றிட எண்ணிக்கை குறைவானதால், சேவைப் பிரமாணக் குறிப்புக்கு அமைய சம்பந்தப்பட்ட வர்களுக்குக் கல்வி மற்றும் தொழில்வாண்மைத் தகுதிகளுக்காகப் புள்ளி வழங்கப்பட்டது. புள்ளி வழங்கப்பட்ட தொடர் ஒழுங்கு அடிப்படையில் அதிகமான புள்ளிகளைப் பெற்றுக்கொண்ட 41 பேருக்குப் பதவி உயர்வு வழங்கப்பட்டது. அந்த 41 பேரில் தமிழ் மொழிமூல அதிகாரிகள் தகுதி பெற்றிருக்கவில்லை. அதாவது, அடிப்படைத் தகுதிகளைப் பூர்த்திசெய்த 75 பேருக்கு மத்தியில் விண்ணப்பம் கோரப்பட்டிருந்தபோதிலும் 41 வெற்றிடங்களே காணப்பட்டன. அந்த 75 பேரில் 5 தமிழ் மொழிமூல அதிகாரிகள் இருந்தார்கள். ஆனால், புள்ளி வழங்கப்பட்ட தொடர் ஒழுங்கு அடிப்படையில் 41 பேருக்குப் பின்னால் இருந்ததனால் அவர்களைப் பதவியுயர்வுக்குத் தெரிவுசெய்ய முடியாமல் போய்விட்டது. எனவேதான் அந்த 41 பேரில் தமிழ் மொழிமூல அதிகாரிகள் அடங்கவில்லை.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

அதை மீளாய்வு செய்ய முடியாதா? ஏனென்றால் தகுதியுள்ளவர்கள் நிறையப் பேர் இருப்பதாகச் சொல்லப் படுகின்றது. ஆகவே, நீங்கள் இதைத் தயவுசெய்து மீளாய்வு செய்வது நல்லது. ஏனென்றால், "குறித்த வெற்றிடங்களை

நிரப்புவதற்குத் தமிழ் மொழிமூல ஆட்கள் இல்லை" என்று எப்போதும் சொல்லப்படுகின்றது. இந்த நிலைமையைச் சீர்செய்வதற்காக முன்னாள் ஜனாதிபதி பிரேமதாச அவர்களின் ஆட்சிக்காலத்தில் 15/90 என்ற இலக்கமுடைய ஒரு சுற்றுநிருபம் வெளியிடப்பட்டது. அதாவது, அப்போது இந்த விடயத்தில் இன விகிதாசாரம் பேணப்பட வேண்டும் என்ற ஒரு கோட்பாடு முன்வைக்கப்பட்டுத் தகுதியானவர்கள் தெரிவுசெய்யப்பட்டு வந்தார்கள்.

ගරු වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)

அப்படியானால் அது எல்லாருக்கும் பயன்படும். அதாவது வடக்கு, கிழக்கிற்கும் மலையகத்திற்கும் பயன்படும். ஆனால், இந்த விடயத்தில் தகுதியுள்ள 75 பேரில் 5 தமிழர்கள் இருந்தபோதிலும் புள்ளி அடிப்படையில் அவர்கள் 41 பேருக்குப் பின்னர் உள்ளதனால் பதவியுயர்வு வழங்குவதற்குத் தெரிவுசெய்ய முடியவில்லை என்றுதான் இங்கு குறிப்பிடப் பட்டிருக்கின்றது.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
இன விகிதாசாரம் பேணும்போது -

ගරු වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)

இந்த இனவிகிதாசாரம் பேணப்படுவதற்கான நடவடிக்கை மேதகு ஜனாதிபதி அவர்களின் மூலமாகத்தான் எடுக்கப்பட வேண்டும்.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
இந்த விடயத்தை இன்னொரு தரம் மீளாய்வு செய்ய வேண்டும்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මේ කාරණය මම ඔබතුමාගේ අවධානයට ගෙන එන්නට කැමතියි. අද දින පාර්ලිමේන්තුව කල්තබන අවස්ථාවේ විවාදය ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම වෙනුවෙන් වෙන් කර තිබුණේ. ඒ අනුව මම කල්තැබීමේ යෝජනාවක් හාර දුන්නා. එය, වෛද්‍යවරුන්ගේ සංගමය - GMOA එක - කැඳවා තිබෙන වර්ජනයත්, ඒ වර්ජනයට කරන තර්ජනයත් පිළිබඳව යෝජනාවක්. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, මම මේ කාරණය ගැන පැහැදිලි කරන්නද? ඊයේත් මම මේ සම්බන්ධව ඔබතුමාව දැනුවත් කළා. එම යෝජනාව පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාගේ කාර්යාලයට ලැබෙනකොට පස්වරු 2.25 පමණ වුණා. නියමිත වෙලාවට වඩා හුඟක් ප්‍රමාද වෙලායි එය ලැබුණේ. ඒ අවස්ථාවේදී අපි ගරු සභානායකතුමා සමහත් සාකච්ඡා කළා. මොකද, අපි පක්ෂ නායකයින්ගේ රැස්වීමේදී එකඟවෙලා තිබෙන්නේ කල් තැබීමේ යෝජනා දහවල් 12.00 වෙනකොට මහලේකම්තුමාට ඉදිරිපත් කිරීමටයි. එම යෝජනාව ප්‍රමාදවී ලැබුණු නිසා අද සභාව කල්තබන අවස්ථාවේදී එය විවාදයට ගැනීමට අපහසු බව දැන්වුවා. අද උදේත් මා ඒ ගැන දැනුවත් කළා. ඒ යෝජනාව අද දින ඉදිරිපත් කිරීමට අපහසුතාවක් තිබෙන බව මේ අවස්ථාවේදී නැවතත් මම සඳහන් කරන්නට කැමැතියි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අද එම කාලය වෙන් කරනු ලැබුවේ අපට Adjournment Motion එකක් ඉදිරිපත් කිරීමටයි. ඒ Adjournment Motion එක රටේ හෙට සිදුවන බරපතළම දේ -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, මම ඒක පිළිගන්නවා; මම දන්නවා. මාවත් අපහසුතාවට පත් වනවා, යෝජනාව නියම වෙලාවට ලැබුණේ නැති වුණාම මටත් බල කරන්නට බැහැ ඒ යෝජනාව ගන්නට කියලා. මොකද, එම යෝජනාව පැය දෙකක් ප්‍රමාදවෙලා ලැබුණේ. එම නිසා දැනට මේ අවස්ථාවේදී මට අපහසුතාවක් තිබෙනවා ඒක -[බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ඔබතුමා කියන එක මම පිළිගන්නේ නැහැ. මොකද, මේ යෝජනාව අද විවාදයට ගන්න බැහැ කියන ලිපිය මහලේකම්තුමා මට භාර දුන්නේ, ඊයේ පස් වරු 5.35ටයි. පස් වරු 5.35ටයි මහලේකම්තුමා මා වෙත ඇවිත් මේ යෝජනාව අද විවාදයට ගැනීමට භාර ගන්න බැහැයි කිව්වේ. එතකොට හරිද ඒක?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. මම ඔබතුමාට-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැහැ ගරු කථානායකතුමනි, මේ කාරණා මම කියන්නේ අපි වැඩ කරන ක්‍රමය ගැන. ඔබතුමාට මම චෝදනා කරනවා නොවෙයි. අපේ මන්ත්‍රීවරු 52කගේ ඉල්ලීමක් අනුව, හෙට තිබෙන වැඩ වර්ජනයට කරන්නට හදන භයානක අන්තරාව වළක්වන්නට තමයි වෛද්‍යවරුන් සම්බන්ධ මේ ප්‍රශ්නය අපි ඉදිරිපත් කරන්නට උත්සාහ ගත්තේ. අපට මේ ගැන පාර්ලිමේන්තුවේ කථා කරන්න දෙන්නේ නැත්නම් මම ඉල්ලා සිටියේ මට මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නට ඉඩ දෙන්නය කියායි. ආණ්ඩුව පසුව දවසක හෝ උත්තර දීපුවාවේ. ඒකට කමක් නැහැ. Please allow us to -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එහෙම සම්ප්‍රදායයක් නැහැනේ ගරු මන්ත්‍රීතුමා. මේ යෝජනාව ඔබතුමා නියමිත වෙලාවට ඉදිරිපත් කළා නම් මේක අද දින වැඩ පිළිවෙළට ඇතුළත් කරන්නට තිබුණා. අනික්

[ගරු ගරු කථානායකතුමා]

කාරණය, මහලේකම්තුමා කියන්න ඉස්සෙල්ලා, මා හිතන හැටියට ඊයේ පස් වරු 4.30 වෙනකොට මා ඔබතුමාව දැනුවත් කළා. Verbally, I conveyed to you that this is not possible. But, you did not make any comment. So, I am sorry I cannot allow this. If I do, I will be creating a bad precedent.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
No. You told me that the Hon. Ministers were not available. That is what you conveyed to me.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, they were not available.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
But, I should have been given the right to propose the Adjournment Motion. That is what I am saying.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, they were not prepared to reply.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
That is your Ruling, but we say that it is very unreasonable, depriving us of our right to have a debate on an Adjournment Motion.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Anyway, I took your point. -[*Interruption.*] Okay, that is your point of view.

ඊළඟට යෝජනා පිළිබඳ දැනුම්දීම හා දිනට නියමිත කටයුතු. සමාගම් පනත සහ සම්මති ආඥාපනත යටතේ නියෝග අනුමත කිරීමට. ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා.

Order, please! මේ අවස්ථාවේදී නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தி னின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

සමාගම් පනත සහ සමිති ආඥාපනත : නියෝග
கம்பனிகள் சட்டம் மற்றும் சங்கங்கள் கட்டளைச் சட்டம்: ஒழுங்குவிதிகள்
COMPANIES ACT AND THE SOCIETIES ORDINANCE: REGULATIONS

[12.03 p.m]

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)
Hon. Deputy Chairman of Committees, I move,

"That the Regulations made by the Minister of Industry and Commerce under Section 527 of the Companies Act, No. 7 of 2007 read with Section 477 of the said Act and Regulations made under Section 19 of the Societies Ordinance (Chapter 123) No. 16 of 1891 read with the Societies Ordinance (Amendment) Act, No.11 of 2005 relating to the Companies (Fees) and Societies (Fees) and published in the Extraordinary Gazette No. 1990/12 of 25th October, 2016 which were presented on 24.01.2017, be approved.

(Cabinet approval signified.)"

Sir, the fee changes proposed by the Department of the Registrar of Companies are a follow-up step to fulfil the Proposals made in the Budget 2016. This Department is one of the most important institutions in the development of Sri Lanka's private sector and entrepreneurship and therefore, it is critical for the reform vision of the Unity Government.

Sir, I am pleased to say that in 2016, the Department's income increased by a huge 182 per cent - to Rs. 1.78 billion from Rs. 632 million in 2015. Also in 2016, 8,289 new companies were registered in Sri Lanka, a 7 per cent increase from 7,762 in 2015. Registration of foreign companies in Sri Lanka also increased by 17 per cent - to 41 in 2016. Even new registrations of associations under Section 34 increased by 140 per cent - to 367 in 2016.

Also, to upgrade company registrations in Sri Lanka with modern technology, KPMG was selected as the software developer under the eROC Project. The Department is now open even on weekends. Every Saturday and Sunday, from 9.00 a.m. to 2.00 p.m., the Department provides selected services.

Sir, the Proposal made in Section 419 of the 2016 Budget Speech was to review fees and charges made by different government entities every three years by all the Chief Accounting Officers and Accounting Officers including Revenue Accounting Officers in the public sector entities.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is your point of Order?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කාරකසභාපතිතුමනි, ගරු ඇමතිතුමාගෙන් පැහැදිලි කර ගැනීමකට අවසර ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, 2016 අය වැය ලේඛනයෙන් මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ අය වැය යෝජනාවද ඔබතුමා ඉදිරිපත් කරන්නේ? එසේ නැත්නම් සංශෝධනය පමණද?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ යෝජනාව අනුව, න්‍යාය පත්‍රයේ විෂය අංක 1, අංක 2 මම ඉදිරිපත් කරනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඔබතුමාගෙන් පැහැදිලි කර ගන්නයි අහන්නේ. අය වැයේ 581වන යෝජනාවේ මෙහෙම තිබෙනවා.

"බොහෝ ලියාපදිංචි සමාගම් ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති බව පෙනී ගොස් ඇත. එවැනි සමාගම් යළි ක්‍රියාකාරී කිරීම සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් විසින් එකතු කරනු ලබන වාර්ෂික ගාස්තුවක් සියලුම ලියාපදිංචි සමාගම් වෙත පනවනු ලැබේ. තවදුරටත් ස්වකැමැත්තෙන්ම කරනු ලබන ඇවර කිරීම් අධෛර්යවත් කිරීමේ අරමුණින් ස්වේච්ඡාවෙන් ඇවර කරනු ලබන සමාගම්වලින් රුපියල් 500.000ක් අය කිරීමට යෝජනා කරමි."

ඒ වාගේම, අය වැයේ 582 වන යෝජනාවේ මෙහෙම කියනවා.

"2016 ජනවාරි 1 දින සිට සියලුම ව්‍යාපාරික ආයතන අදාළ පළාත් පාලන ආයතනවල වසරකට රුපියල් 100ක නාමික ගාස්තුවක් මත ලියාපදිංචි විය යුතුය. අලුතින් ඇති කරනු ලබන ව්‍යාපාරික ආයතනයක් එම ආයතන සඳහා ජල හා විදුලි සම්බන්ධතා ලබා ගැනීමටද බැංකු මගින් ණය ලබා ගැනීමටද මෙම ලියාපදිංචිය මූලික අවශ්‍යතාවක් වනු ඇත"

ඒ දෙවැනි යෝජනාව.

ඊට පසුව Technical Notes තිබෙනවා නේ. අය වැය පොතේ 123 වන පිටුවේ ඒ තාක්ෂණික සටහන්වල මේ විධියට තිබෙනවා.

"(vi) සමාගම් ලියාපදිංචි ගාස්තුව

සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි වී ඇති සියලුම සමාගම් වෙනුවෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අය කෙරේ. පුද්ගලික සමාගම් රුපියල් 60,000ක්, නිල ලැයිස්තුගත සමාගම් රුපියල් 500,000ක්, වෙනත් රුපියල් 100,000ක් සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ගෙවිය යුතු වේ. (ක්‍රියාකාරී නොවන සමාගම්ද ඇතුළුව)

(vii) සමාගම් ලියාපදිංචි වීමේ ගාස්තු වර්තමානයේ පවතින අනුපාතය 2016 ජනවාරි 1 වන දින සිට සංශෝධනය කෙරේ."

ගරු අමාත්‍යතුමනි, මට තිබෙන ප්‍රශ්නය මෙයයි. මේ යෝජනාවේ තිබෙන ගණන්ද ඔබතුමා මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නේ? එසේ නැත්නම් වෙනත් එකක්ද කියා මේ ගරු සභාවට පැහැදිලි කිරීම වැදගත්. මොකද, මෙය සමස්ත සමාගම්වලටම බලපාන නිසා. ඔබතුමාගේ පහසුවටයි මම මේ කරුණු කියන්නේ. මොකද, මාත් හිටපු වෙළෙඳ ඇමතිතුමෙකු නිසා, ඔබත් මගේ මිත්‍ර වෙළෙඳ ඇමතිතුමා නිසා- [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, நீங்கள் தொடரலாம்!

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
That is a very valuable legal argument.

ගරු ඇමතිතුමනි, ඔබතුමා බලන්න ඕනෑ, මුදල් අමාත්‍යතුමා පාර්ලිමේන්තුවට කියා තිබෙන අය වැය යෝජනාවේ තිබෙන ටික ගැනද අපි අද විවාද කරන්නේ, එසේ නැත්නම් ඊට වෙනස් එකක්ද කියලා.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන එක මම පිළිගන්නම්. මගේ කථාවෙන් පසුව ඔබතුමාගේ කථාවත් තිබෙනවානේ. ඒ අවස්ථාවේදී ඔබතුමා ඒ කරුණු කියන්න. ඔබතුමා කියන විධියට ඒ යෝජනා අනුව තමයි කරුණු ඉදිරිපත් කරන්නේ. [බාධා කිරීමක්] ඊට පසුවත් මම ආපසු කථා කරනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු ඇමතිතුමා, මා කියන කරුණුත් කියවලා නිවැරදි කරන්න. රට පැත්තෙන් ඒක වැදගත්.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
Thank you, Hon.Member.

Sir, three types of changes are introduced by the Registrar of Companies which comes under my Ministry's purview in keeping with the Proposal made in Section 419 of Budget - 2016. The three changes are:

(1) Fees for Societies

(2) Fees Regulations for renewal and registration of Auditors and

(3) Introducing a new qualification to be registered as a Company Secretary in Sri Lanka.

The fee for registration of a Public Limited Company under Form 1 has been increased from Rs. 15,000 to Rs. 20,000; the fee for registration of an unlimited company has been increased from Rs. 12,500 to Rs. 15,000; the fee for registration of a company limited by guarantee under Form 5 has been increased from Rs. 25,000 to Rs. 30,000; the fee for registration of mortgages, charges and

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

debentures has been increased from Rs. 5,000 to Rs. 7,500; the fee for registration of an annual return has been increased from Rs. 5,000 to Rs 6,000; the fee for registration of any document required or authorized to be registered or required to be delivered, sent, given or forwarded to be filled with the Registrar General of Companies other than the notices and reports required to be delivered to the Registrar-General of Companies by a receiver or a manager, an administrator or a liquidator has been increased from Rs. 1,000 to Rs. 2,000; the fee for approval of a name of a company (Name Request) has been increased from Rs. 1,000 to Rs. 2,000; the fee for inspection of a file kept by the Registrar-General of Companies has been increased from Rs. 500 to Rs. 1,000; the fee for certification of any document or extract thereof filed with the Registrar of Companies has been increased from Rs. 500 to Rs. 1,000; the fee for inspecting the Register of Charges has been increased from Rs. 500 to Rs. 1,000; the fee for registration of individuals as Company Secretaries has been increased from Rs. 2,500 to Rs. 5,000; the fee for registration of sole proprietorship or partnership as Company Secretaries has been increased from Rs. 5,000 to Rs. 10,000; the fee for registration of an offshore company has been increased from Rs. 100,000 to Rs. 150,000; the fee for registration of a place of business in Sri Lanka by an overseas company has been increased from Rs. 50,000 to Rs. 60,000; the fee for renewal of registration of an offshore company for its continuation has been increased from Rs. 100,000 to Rs. 150,000; the fee for registration of individuals as Auditors has been increased from Rs. 5,000 to Rs. 6,000; the fee for registration of partnership as Auditors has been increased from Rs. 10,000 to Rs. 15,000; the fee for renewal of registration of the registered individual Auditors has been increased from Rs. 3,000 to Rs. 4,000 and the fee for renewal of registration of the registered individual professional business auditing institutions has been increased from Rs. 5,000 to Rs. 6,000.

A small fee increase is also made with regard to society registrations. Fees for Registration of Societies has been increased from Rs. 2,000 to Rs. 3,000. Fees for amendments to the constitutions of societies has been increased from Rs. 1,000 to Rs. 1,500. Fees for issuing certified copies of a society has been increased from Rs. 200 to Rs. 500, and fees for a file search of a society has been increased from Rs. 100 to Rs. 200.

We have not increased fees for re-registration of any existing company other than an overseas company. We have not increased the fee to file an annual return of a society. We have also not increased the Rs. 100,000 that is required to be credited to a bank to defray the expenses of an off-shore company for the purpose of its office in Sri Lanka. Considering the fact that there is a need to promote entrepreneurship in Sri Lanka, we have reduced an important fee that is widely used in our business sector.

Sir, I am pleased to inform the House that as part of changes in fees, we have reduced the fee of registration of a Private Limited Company under Form 1, by as much as Rs. 11,000. In that we have reduced this fee from Rs. 15,000 to Rs. 4,000 to develop entrepreneurship in Sri Lanka. All fee changes are effective from 1st January, 2017.

I am also pleased to inform the House that as a result of these amendments qualified Accountants can become Company Secretaries. Therefore, as a result of these amendments from 20th December, 2016 the CMA qualified Sri Lankans will become eligible to be appointed as a Company Secretaries as well.

Now, I shall explain the proposed changes in detail:

1. Fees for Societies

Implementation and regulation authority of the Societies Ordinance is vested with the Registrar of Societies and Registrar General of Companies that shall be the ex-officio of the Registrar of Societies.

Fees for Societies had been imposed by the Gazette Notices No. 10703 dated 13.09.1954 under the provisions of Section 19 of the Societies Ordinance No. 16 of 1891 (Chapter 123) and it was amended by the Societies Ordinance (Amendment) Act No. 11 of 2005.

These fees amendment Regulations have been made by the Minister of Industry and Commerce by using Extraordinary Gazette Notice No. 1847/02 dated 27.01.2014 under Section 19 of the Societies Ordinance No. 16 of 1891 (Chapter 123). As per paragraph 419 of the Budget Proposals of 2016, government fees should be concluded and action should be taken to amend it in every 03 years. Therefore, these Fees Amendment Regulations have been made by the Minister of Industry and Commerce by using Extraordinary Gazette Notice No. 1990/12 dated 25.10.2016 under Section 19 of the Societies Ordinance No. 16 of 1891 (Chapter 123.)

2. Fees Regulations for renewal and registration of Auditors

Fees Regulations for the renewal and registration of Auditors had been imposed under Sections 157(5), 477 and 527 of the Companies Act, No. 7 of 2007. Actually, the implementation and regulation authority of the Companies Act, No. 7 of 2007 is vested with the Registrar General of Companies.

3. Introducing a new qualification to be registered as Company Secretaries

The Companies (Secretaries) Regulations had been imposed by the Extraordinary Gazette Notification No. 471/6, dated 14th September 1987, which was made under the provisions of Section 448 along with

Section 176 of the Companies Act No. 17 of 1982 and the present Section 527 of the Companies Act No. 7 of 2007 is in force in this regard. The qualifications to be registered as Company Secretaries were not amended and not considered as a new qualification for past years. The Institute of Certified Management Accountants of Sri Lanka requested to consider their qualifications to be registered as "Company Secretaries" under the said Gazette Notice. Advisory Commission on Company Law reviewed the said request and agreed to accept the said qualifications to be registered as Company Secretaries.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
මොකක්ද, ඔබතුමාගේ රීති ප්‍රශ්නය?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු ඇමතිතුමනි, සහතිකලත් වරලත් ගණකාධිකාරී- Chartered Certified Accountants- ඔබතුමා දැන් අනුමැතිය දෙන්න යනවා. ඒක හොඳයි. අපි ඒක අනුමත කරනවා. මොකද, එහි ප්‍රවර්ධකයෙක් ලෙස මමත් කටයුතු කළා. ඒ වාගේම දශක දෙක-තුනකට වැඩි දීර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය -AAT එක- තිබෙනවා. ඒක තිබෙන්නේත් ඔබතුමා යටතේ. දැන් සිංහල, දෙමළ මාධ්‍යවලින් ඉතා විශාල ගණකාධිකරණ ශිල්පීන් ප්‍රමාණයක් ඉන්නවා. Qualified Chartered Accountantsලාත් නොවෙයි, Chartered Certified Accountantsලාත් නොවෙයි, ඊට වඩා පහළ මට්ටමේ MAATලාකී තරුණයින් විශාල පිරිසක් ඉන්නවා. ඔබතුමාට පුළුවන්, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ Advisory Committee එකට දමලා, AAT සමත් තරුණයින්ට රැකියා අවස්ථා ජනිත කරලා, සමාගම් ගිණුම්කරණ ක්‍රියාවලියට ඔවුන් සම්බන්ධ කර ගන්න විධිවිධානයක් යොදන්න. ඒක ඉතා පහසු වෙනවා,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට කථා කරන්න වෙලාවක් තිබෙනවා නේ.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(මාණ්පුමිකු රිසාට් පතියුතීන්)
(The Hon. Risad Badhiutheen)
එතුමාගේ වෙලාවෙන් අඩු කරන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
මෙය මමත්, ඇමතිතුමාත් අතර අදහස් හුවමාරුවක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
හොඳයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු ඇමතිතුමනි, එතකොට ඔබතුමාට පුළුවන් මේක සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරලා විශාල පිරිසකට රැකියා අවස්ථා ජනිත කර දෙන්න. AAT සමත් දෙමළ තරුණයෝත් විශාල පිරිසක් ඉන්නවා. එතකොට ඔබතුමාටත් ඒක ගෞරවයක් වෙනවා. ඊට අතිරේකව තනි පුද්ගල හා හවුල් ව්‍යාපාරවලත් ගිණුම්කරණය අනිවාර්ය කරන නීතියක් ගෙනාවොත්, විශාල පිරිසකට රක්ෂා අවස්ථා ජනිත කරන්න පුළුවන්. ඒ ගැනත් බලන්න.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(මාණ්පුමිකු රිසාට් පතියුතීන්)
(The Hon. Risad Badhiutheen)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාගේ යෝජනාව ඉතා වැදගත් යෝජනාවක්. මම ඒ සම්බන්ධව උපදේශක කමිටුවට යොමු කරලා, ඒ අයගේ අවසරයත් අරගෙන එය ඉටු කිරීම සඳහා වැඩ පිළිවෙළක් යොදන්නම්.

அந்த வகையிலே கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சு கடந்த காலங்களிலே பாரிய பல வேலைத்திட்டங்களை முன்னெடுத்து வந்திருக்கின்றது. இந்த அமைச்சின் கீழிருக்கின்ற நிறுவனங்கள் தொடர்பாக மாண்புமிகு பந்துல குணவர்தன அவர்களும் கடந்த காலத்தில் அமைச்சராக இருந்தபொழுது நல்ல பல திட்டங்களை நடைமுறைப்படுத்தியிருந்தார். அந்த வகையில், அவர் வழங்கிய நல்ல ஆலோசனைகளுக்காக இச்சந்தர்ப்பத்தில் அவருக்கு நன்றியைக் கூறிக்கொள்கின்றேன்.

மாண்புமிகு நிதியமைச்சர் அவர்கள் முன்வைத்த விடயங்களை முன்னெடுத்துச் செல்கின்ற விதத்திலே இன்று என்னால் சமர்ப்பிக்கப்பட்டிருக்கின்ற கம்பனிகள் சட்டம் மற்றும் சங்கங்கள் கட்டளைச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் - Item 1 and Item 2 - அமைந்துள்ளன. எனது அமைச்சு பல திணைக்களங்களையும் பல நிறுவனங்களையும் கொண்டிருக்கின்றது. நாம் இந்த நாட்டில் கைத்தொழில் துறையை வளப்படுத்துவதற்கான ஏற்பாடுகளைத் திட்டமிட்டு முன்னெடுத்து வருகின்றோம். அந்தவகையில் வடக்கு, கிழக்கில் யுத்தத்தால் அழிக்கப்பட்ட அல்லது சிதைக்கப்பட்ட கைத்தொழிற்சாலைகளை எல்லாம் மீளப் புனரமைத்து அந்தப் பிரதேசங்களில் மக்களுக்கு வேலைவாய்ப்பைப் பெற்றுக் கொடுக்கின்ற பணியை மேற்கொள்வதற்கான ஒரு வேலைத்திட்டத்தையும் நாங்கள் ஆரம்பித்திருக்கின்றோம். எனவே, வடக்கு, கிழக்கிலே வாழுகின்ற மக்களுடைய நலனுக்காக, குறிப்பாக தமிழ், முஸ்லிம், சிங்கள பாராளுமன்ற உறுப்பினர்கள் அனைவரும் தங்களுடைய ஒத்துழைப்பைத் தரவேண்டுமென்றும் அதேபோல இரண்டு மாகாண சபைகளும் முன்வந்து அவற்றின் ஒத்துழைப்பைத் தரவேண்டுமென்றும் வேண்டிக்கொள்கின்றேன்.

மேலும், மக்களுக்குக் குறைந்த விலையிலே அத்தியாவசியப் பொருட்களை வழங்குகின்ற வேலைத்திட்டத்திற் கிணங்க, நாடு பூராவும் 500 சதொச நிறுவனங்களையும் 8,000 franchise நிறுவனங்களையும் அமைக்கின்ற பணியை நாங்கள் முன்னெடுத்து வருகின்றோம். அந்த வகையிலே எதிர்காலத்தில்

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

அதனூடாக அத்தியாவசியமான பொருட்களை நாட்டின் நாலாபுறங்களிலும் பெறக்கூடிய வாய்ப்புக் கிடைக்குமென்று கூறிக்கொள்கின்றேன்.

Thank you very much.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
ඛිනා එදුත්තියම්පප්පෙට්‍රත්තු.
Question proposed.

[අ.භා. 12.25]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාතුමා ඉදිරිපත් කරන නියෝග පිළිබඳ ඒකාබද්ධ විපක්ෂය වශයෙන් අපේ විරෝධතාවක් නැහැ. පාර්ලිමේන්තුවක් තුළ ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය අතර සංවාදයක් සහ විපක්ෂයෙන් ඉදිරිපත් කරන වැදගත් යෝජනා, අදහස් හා විවේචනවලට ඔරොත්තු දෙන සහ ඒවාට ඇහුම්කන් දෙන ඇමතිවරු රටක සිටිය යුතු වෙනවා. නමුත්, ඊයේ දිනයේ මුදල් අමාත්‍යාතුමා ඉදිරිපත් කරපු වැදගත් පනත්වල නියමයන් සම්බන්ධයෙන් සාකච්ඡා කළා. ඒක මුළු රටේම සමාගම් ඇතුළුව මුළු ක්ෂේත්‍රවලටම අදාළ වෙනවා. ඒ අදාළ වෙන්නේ කෙසේද? ආර්ථික සේවා ගාස්තුව සියයට 2.5 සිට සියයට 5 දක්වා වැඩි කරනවා. ලංකා ඉතිහාසයේ සියයට සියයකින් ආර්ථික සේවා ගාස්තු වැඩිවීමක් සිදු වෙන්නේ පළමුවෙනි වතාවටයි.

දෙවැනි කරුණ, දැන් මෙතුමාගේ මේ යෝජනා ක්‍රියාත්මක වෙන්නේ 2017 ජනවාරි 01 වෙනිදා සිටයි. මේ වර්ෂයට අදාළ යෝජනා මේ වර්ෂයේ ජනවාරියේ සිටයි ක්‍රියාත්මක වෙන්නේ. නමුත්, ඊයේ දිනයේදී ඉදිරිපත් කරපු යෝජනා අතීතයට බලපාන ලෙස තමයි ඉදිරිපත් කර තිබෙන්නේ. 2016 වර්ෂයට අදාළ වන ලෙස 2017 වර්ෂයේදී යෝජනා ඉදිරිපත් කරනවා. මේවා ඉතාම කනගාටුදායකයි. රාජ්‍ය මූල්‍ය පිළිබඳව පාර්ලිමේන්තුවට තිබෙන බලය වැරදි ලෙස, හිතුවක්කාරී ලෙස මුදල් අමාත්‍යවරයා ක්‍රියාත්මක කරනවා. අපි මේ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාදාමයකට ගියොත් එතුමා හිතන්නේ ඒක එතුමාට විරුද්ධව කරන පෞද්ගලික අපහාසයක් කියලායි. මේක ඉතාම නොමේරූ තත්ත්වයක්. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය මූල්‍ය පිළිබඳ පාලනය සතු වන්නේ පාර්ලිමේන්තුවටයි. මහජනතාව අපව නියෝජිතයෝ ලෙස පත් කරලා එවලා තිබෙන්නේ ඒ කාර්යභාරයටයි. එතකොට මීට කලින් වෙළෙඳ අමාත්‍ය ධුර හා අනෙක් වැදගත් අමාත්‍ය ධුර දැරූ ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා, ගාමිණී දිසානායක මැතිතුමා වැනි ඇමතිවරු මේ ගරු සභාවේ සිටියදී අපි විපක්ෂයේ ඉඳලා ඉතා දරුණු විවේචන, විචාරයන් කරද්දී කවදාවත් එතුමන්ලා ඒවා ගැන වැරදි ආකල්ප ඇති කර ගත්තේ නැහැ. දැන් මේ සිටින අය පාර්ලිමේන්තු එන්න කලින් අපි පාර්ලිමේන්තු ඇවිල්ලා තිබෙන්නේ. මේ උත්තරීතර සභාව; මහජනයා තුළ ගෞරවයක් ඇති වෙන ස්ථානය පෞද්ගලිකවම මඩ ගහන්න යොදා ගන්නවා නම්, ඊළඟ දවසේ ඉඳන් මුදල් අමාත්‍යවරයාගේ පෞද්ගලික සියලු කරුණු පිළිබඳව හෙළිදරවු කිරීම සඳහා ඒකාබද්ධ විපක්ෂයේ අපි මුදල් අමාත්‍යාංශයේ හැම කරුණක්ම පාවිච්චි කරනවා කියලා මම මේ ගරු සභාවට දැනුම් දෙන්න කැමතියි. මොකද, අපි මේ රට කඩන්නේ නැතිව; බෙදන්නේ නැතිව රටත් බේරා ගත්තා.

අපේ සිංහල, දෙමළ, මුස්ලිම් යන හැම මනුෂ්‍යයෙකුටම ජීවත් වෙන්න අයිතිය හදපු, ත්‍රස්තවාදය නැති කරපු රජ්‍ය නායකයා වුණු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට හිටපු මුදල් ඇමතිවරයා කියලා මෙම ගරු සභාව පටන් ගත්ත අවස්ථාවේ සිට එළවා එළවා ගහනවා නම්, එතුමාට අභියෝග කරලා මුදල් ඇමතිතුමාත් එක්ක හැප්පෙන්න එන්න කියනවා නම් අපි මේ තත්ත්වයේදී වර්තමාන මුදල් ඇමතිතුමා කවුද කියන එක පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ හෙළදරවු කිරීමක් අවශ්‍යයෙන්ම කරන්න වෙනවා. එය කනගාටුවෙන් වුවත් කරන්න වනවා. මොකද හේතුව, අපි මේ ගරු සභාවට දැනුම් දෙන්න ඕනෑ අපි මේ රටේ ජනතාවගේ වස්තුව නූල් පොටක්වත් හොරකම් නොකරපු, කොමිස් හෝ වෙනත් ව්‍යාපාර නොකරපු, මේ රටේ ජාතියේ දේපොළ ගඩොලකින්වත් අඩු කරන්න උදව් නොවුණු, විදේශ විනිමය වංචා පිළිබඳ නඩුවලට හවුල් නොවුණු, විවිධ අයථා ක්‍රියාමාර්ගවලට පෞද්ගලිකව සම්බන්ධ නොවුණු, රාජ්‍ය බලය අයුතු ලෙස පාවිච්චි නොකළ, ආධාරකරුවෝ ලෙස මැර කණ්ඩායම් තියා නොගත්ත අහිංසක දේශපාලනඥයන්ට පාර්ලිමේන්තුව තුළ කටයුතු කරන්න ඉඩ ප්‍රස්තාව තියෙන්න ඕනෑ කියන එක. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හෝ ඇමතිවරු පිම්බෙන්න නරකයි. මොකද, මේ බලය කියන එක තාවකාලික දෙයක්. මීට වඩා දරුණු ලෙස මිනී මරපු ආණ්ඩු අපි දැකලා තිබෙනවා. අපි එක්සත් ජාතික පක්ෂයේත්, විපක්ෂයේත් ඉඳලා තිබෙනවා. ඒ නිසා අපි ඒ තත්ත්වයට සූදානම් නැහැ. නමුත්, අපි ඒ තත්ත්වයට ලබන පාර්ලිමේන්තු වාරේ ඉඳන් සූදානම් වෙනවා කියන එක මම දැනුම් දෙනවා. එයට හේතුව, මේ රටේ පාර්ලිමේන්තුවක් තිබෙන්නේ -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Bandula Gunwardane, you can continue your speech after lunch.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

Okay, Sir.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The Sitting is suspended till 1.30 p.m.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.30ට නැවත පවත්වන ලදී.
අතන්පඩි අමර්වු ඉිටෙනිරුත්තප්පට්ටු, පි.ප. 1.30 මණික්කු මීන්ඩුම් ආරම්පමායිර්‍රු.
Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම පැහැදිලි කරමින් සිටියේ අපේ රටේ උත්තරීතර ආයතනය වන මුදල් පිළිබඳ සම්පූර්ණ බලය තිබෙන පාර්ලිමේන්තුව මූල්‍ය හා සම්බන්ධිත කරුණුවලදී වෙර දේශපාලනයෙන් බැහැරව බලන්න ඕනෑය කියලායි. පසුගිය මැයි පළමුවැනි දා මේ රටේ නිරායුධ, අවිහිංසක මිනිස්සු ලක්ෂ ගණනක් තමන්ගේ ශක්තියත්, රජයට තිබෙන විරෝධතාවත් පැහැදිලිව පෙන්නුම් කළ බව අපි දන්නවා. රජයට විරුද්ධ ජන මතය කොහේද තිබෙන්නේ? එවැනි ජන මතයක් ඇති වුණේ ඇයි කියන එක පිළිබඳව වූ දේශපාලන පණිවුඩය මැනවින් වටහා ගැනීම නිරෝගි ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්ම සඳහා අතිශයින්

වැදගත් වනවා. මැයි දින මහා ජන සන්නිපාතය දැකලා සමහරු වියරු වැටුණා. රට කඩන්නේ, බෙදන්නේ නැතිව ත්‍රස්තවාදය මුලිනුපුටා දමා රට බේරා ගෙන රට සංවර්ධනයේ ඉසව්වකට ඔසවා තැබූ මේ රටේ ජනතාව ආදරය කරන මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාව හුස්ම යන තෙක් සාටකයෙන් එල්ලා තබන්න ඕනෑය කියන්න තරම් වෛරයක් පැසවන ඇමතිවරු සිටින කැබිනට් මණ්ඩලයක් මොන වාගේ මිනී මරු චේතනාවෙන් යුත් කැබිනට් මණ්ඩලයක්ද කියන එක පිළිබඳව ජනතාව රටට කියා තිබෙනවා. මේ රජයේ සමහර අය සිටින්නේ වෛරයෙන් මුසපත් වෙලා.

මේ රටේ සාමාන්‍ය සිංහල බෞද්ධ ජනතාව, කතෝලික ජනතාව, හින්දු ජනතාව ප්‍රභාකරන් මේ රටේ අහිංසක මිනිස්සු ලක්ෂ ගණනක් ඝාතනය කළත්, ප්‍රභාකරන්ට වද දීලා තිරිසන් විධියට ඝාතනය කළ යුතුය කියලා කවදාවත් කියා නැහැ. එහෙම කියපු සිංහලයෙකු පිළිබඳව මා දන්නේ නැහැ. ප්‍රභාකරන් යුද්ධයේදී ආයුධ සන්නද්ධව සිට සටන් කරලා සටනේදී තමයි මිය ගියේ. ආයුධ සන්නද්ධ පුද්ගලයෙකු මරණයට පත් වුණාම රාජ්‍ය ආරක්ෂක අංශ එම මරණය සම්බන්ධයෙන් දැනුම් දෙන්නේ නිල වශයෙන් ආයුධ පාවිච්චි කරලා ඇති වූ මරණයක් ලෙසයි. මේ රට බේරා ගත් නායකයා හුස්ම යනතෙක් සාටකයෙන් එල්ලා මරන්න ඕනෑය කියලා පුපුරණ වෛරයෙන් යුතුව හිටපු හමුදාපතිවරයා කියනවා නම්, ඒ ප්‍රකාශය අනිකුත් දේශපාලන පක්ෂ අනුමත කරනවාද? දේශපාලන පක්ෂ පාට භේදයෙන් තොරව එක්සත් ජාතික පක්ෂයේ කිසිවෙකු වුණත් මේ ප්‍රකාශය අනුමත කරන්නේ නැහැ. නමුත්, ඔවුන් ඒ ප්‍රකාශය අනුමත කරන්නේ නැහැයි කියලා කියන්න බැරි තත්ත්වයක් දැන් ඇති වෙලා තිබෙනවා. ඒ මොකද? මැයි දිනය අවසන් වූ අවස්ථාවේදීම මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාගේ ජීවිතයට තර්ජනයක් වන ලෙස එතුමාගේ ආරක්ෂාවට සිටි සියලු දෙනා එදිනම මාරු කරන්න තීන්දුවක් ගත් නිසායි. ඒ තීන්දුව සඳහා අණ දුන්නේ කවුද කියන එක පිළිබඳව මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන මිනිස්සු වශයෙන් අප දැනගත යුතු වනවා.

ඒ වෙන හැම අනතුරකටම මේ රටේ ආරක්ෂක ලේකම්වරයා, බුද්ධි අංශ සාමාජිකයින් රණවිරුවන් දඩයම් කිරීමේ කොටසක් ලෙස මේ මර්දන යන්ත්‍රණය දියත් කරනවා නම් දේශපාලන පක්ෂ, පාට භේදයෙන් තොරව අපි රටක් ලෙස ඒ මර්දනයට විරුද්ධ පැත්තේ ඉඳගත යුතුයි. රට බේරාගෙන ජාතික යුතුකම, වගකීම ඉෂ්ට කරපු නායකයාගේ -මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාගේ- ජීවිතය පිළිබඳ වගකීම, ගරු කථානායකතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ ජීවිතයක් වශයෙන් භාර ගත යුතුය කියන ටිකත් අපි මේ සභාවේ සටහන් කර තැබිය යුතු වෙනවා.

සමාගම් පිළිබඳව අද තිබෙන ප්‍රධාන ප්‍රශ්නය මම ගරු ඇමතිතුමාට ඉදිරිපත් කළා. එතුමා බොහොම සාවධානව ඇහුම්කන් දුන්නා. අය වැය යෝජනාවල 581, 582 යෝජනා, 123 වන පිටුවේ තිබෙන තාක්ෂණික සටහන් සියල්ල මීට වඩා වෙනස්. මොකද, මුදල් අමාත්‍යාංශය මුදල් නීති පනත යටතේ මේ මුදල් අය කරන්න කියලා ගැසට් නිවේදනයක් නිකුත් කළා. ඒ අනුව සමහර කොම්පැනි register වුණා. සමහර කොම්පැනි register වුණේ නැහැ. මොකද, ඒක කරන්න අයිතියක් නැති නිසා.

ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේට තිබෙන අයිතියක් තමයි මුදල් අමාත්‍යවරයා උදුරා ගන්න හදන්නේ. මමත් වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යවරයා ලෙස කටයුතු කරලා තිබෙනවා. සමාගම් පනතේ බොහොම පැහැදිලිව කියා තිබෙනවා, සමාගම් රෙජිස්ට්‍රාර් විසින් එකතු කරනු ලබන මුදල්වලින් කොටසක් සමාගම් අරමුදලට බැර කරන්න ඕනෑය කියලා. ලලිත් ඇතුලත්මුදලි මහතා වෙළෙඳ ඇමතිතුමා වශයෙන් සිටියදී ප්‍රඥාවන්ත නීතිඥයෙක් ලෙස එතුමා මේ සමාගම් ක්‍රමය පවත්වා ගෙන යාම සඳහා ඒ ලැබෙන ආදායමෙන් -රෙජිස්ට්‍රාර් කවුරු වෙනුවෙන් එකතු කළත් ඒ එකතු වෙන මුදලෙන්- කොටසක් -තුනෙන් දෙකක්- සමාගම් පනත අනුව සමාගම් අරමුදලට බැර කරන්න ඕනෑ කියා කිව්වා. තුනෙන් එකයි මහා භාණ්ඩාගාරයට ගන්න පුළුවන්. තුනෙන් තුනම මහා භාණ්ඩාගාරය ගන්නවා නම්, තමුන්නාන්සේ ඉන්න ඕනෑ තමුන්නාන්සේගේ පනත පැත්තේ. ඒකට විරුද්ධ වෙන්න ඕනෑ. මුදල් අමාත්‍යවරයාට ඕනෑ විධියට මුදල් මංකොල්ල කන්න දෙන්න බැහැ. මේ පිළිබඳව අධිකරණයේ නඩු විභාග වුණොත්, ඒ නඩුවලදී තමුන්නාන්සේලාට මේ එකතු කරපු මුදල් -භාණ්ඩාගාරය ගත්ත මුදල්- සමාගම් අරමුදලට ආපසු දෙන්න වෙනවා. ඒ නිසා තමයි මේ යෝජනා කළාට මුදල් අමාත්‍යවරයා, ඒවා ඉදිරිපත් කරලා නැත්තේ. මෙතැන අසාධාරණයක් වෙලා තිබෙනවා. මේ අය වැය යෝජනා අනුව සමාගම් ප්‍රමාණයක් ගෙවලා තිබෙනවා. අනෙක් සමාගම් එසේ ගෙවලා නැහැ. මේ නිශ්චිත ගනු - දෙනුව බේරුම් කිරීම සඳහා මැදිහත් වෙන්න. නීතිමය කටයුත්තකට මැදිහත් වෙන්න එපා. මොකද තමුන්නාන්සේ රකින්න ඕනෑ, සමාගම් රෙජිස්ට්‍රාර්; සමාගම් මැදුර. සමාගම් ක්‍රමය ආරක්ෂා කිරීමේ වගකීම තිබෙන ඇමතිවරයා වශයෙන් ඒක මුදල් අමාත්‍යාංශයට අරගෙන යන්න දෙන්න එපා. මුදල් අමාත්‍යාංශය කරන ක්‍රියා පිළිබඳව අද බරපතළ අර්බුදයක් මතු වෙලා තිබෙනවා.

මා මේ කාරණය කෙරෙහි මේ ගරු සභාවේ අවධානය යොමු කරවනවා. මේ රටේ සමස්ත බැංකු ක්‍රමය, මුදල් ක්‍රමය පාලනය පිළිබඳ සම්පූර්ණ ඒකාධිකාරී බලය මුදල් නීති පනතින් පාර්ලිමේන්තුව පවරා දීලා තිබෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවටයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා ශ්‍රී ලංකා පුරවැසියෙක් නොවෙයි; සිංගප්පූරු පුරවැසියෙක්. සිංගප්පූරු පුරවැසිකම ලබපු කිසි කෙනකුට වෙනත් රටක පුරවැසිකම ගන්න බැහැ. එහෙම වුණොත් සිංගප්පූරුවේ පුරවැසිකම අහෝසි වෙනවා. සිංගප්පූරු පුරවැසියකුට dual citizenship එකක් ගන්න බැහැ. සිංගප්පූරු පුරවැසියකු වුණු අර්ජුන මහේන්ද්‍රන් සමස්ත බැංකු ක්‍රමය, මුදල් ක්‍රමය හසුරුවන ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ධුරයට පත් කළා. එසේ පත් කළාට පස්සේ රවි කරුණානායක මුදල් අමාත්‍යවරයායි, ඒ පුරවැසියකු නොවන තැනැත්තායි ශ්‍රී ලංකා පුරවැසියන් සියලු දෙනා භාවිත කරන මුදල් නෝට්ටුවට අත්සන් කළා. ඒ රුපියල් 5,000 මුදල් නෝට්ටුව කෝ කියලා මුදල් අමාත්‍යවරයා මේ ගරු සභාවට උත්තර දෙන්න ඕනෑ. ඒ රුපියල් 5,000 මුදල් නෝට්ටුව කෝ?

මේ ගරු සභාවට මහජන ඡන්දයෙන් තේරී පත් වුණු අපේ ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමිය -ජනතා නියෝජිතතුමිය- ද්විත්ව පුරවැසිකමින් ඉවත්වෙලා තිබියදීත්, එතුමියට ද්විත්ව පුරවැසිකම තිබෙනවාය කියා එතුමියගේ මන්ත්‍රී ධුරය අහෝසි කිරීමට අභියාචනාධිකරණය තීන්දුවක් දුන්නා. එතුමිය අද කථානායකතුමාටත්, මහ ලේකම්තුමාටත් ලිඛිතව භාර දුන්නා, එතුමිය මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට යනවාය කියලා. ඒක ඉතාම සාධාරණයි. මොකද, දැන් මේ රටේ මුදල් කොළය පිළිබඳවත් බරපතළම ප්‍රශ්නයක් ඇති වනවා. අද මේ රටේ ලක්ෂ ගණන් මහ ජනයා අතේ, අපි හැමදෙනාම අතේ ගනු-දෙනු කරන මුදල් කොළයක් තිබෙනවා. ඒ මුදල් කොළයට ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන කෙනෙකු අත්සන් කරනවා. අත්සන් කළාම ඒක වලංගු වනවා නම්, අපේ ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමියගේ මන්ත්‍රී ධුරය අහෝසි වන්නේ කොහොමද? සහ, වෙද, ගුරු, ගොවි, කම්කරු, දිළිඳු, පොහොසත් සියලු අය අත තිබෙන ප්‍රබලම යන්ත්‍රණය මුදල් නෝට්ටුව නේ. මෙම අවස්ථාවේදී රුපියල් 5000 මුදල් නෝට්ටුවක පිටපතක් මා **සභාගත*** කරනවා. ඒ මුදල් නෝට්ටුවේ අත්සන තිබෙන්නේ රවි කරුණානායක ඇමතිතුමාගේ

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

සහ තවත් කාගේද කියලා බලන්න පුළුවන්කම ලැබෙනවා. මේ නඩු තීන්දුවත් සමඟ මේ රටේ මුදල් නෝට්ටුවේ නීත්‍යානුකූලභාවය පිළිබඳ ප්‍රබල අභියෝගයක් රට හමුවේ තිබෙනවා.

මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ සභාපතිත්වයෙන් තිබෙන COPE එකේදී, "තමන් මේ රටේ පුරවැසියකු නම් රාජකාරිය භාර ගන්නකොට දිවුරුම් දෙන්න ඕනෑ. එහෙම දිවුරුම් දුන්නාද?" කියලා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවාම, එහෙම දිවුරුම් දීමක් කරලා නැහැයි කියලා එතුමා සාක්ෂියක් දීලා තිබෙනවා. මේ රටේ ඕනෑම තනතුරක් දරන හැමදෙනාමත් දිවුරුම් දෙනවා. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු වශයෙන් පත් වනකොටත් දිවුරුම් දෙනවා. එහෙම දිවුරුමක් දුන්නේ නැති, සිංගප්පූරු පුරවැසියකු ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති බවට පත් වෙනවා. ඊට පස්සේ මහ දවල් මහ බැංකුවේ මහා මුදල් මං කොල්ලය සිදු වෙනවා. මහ දවල් මහ බැංකුවේ මහා මුදල් මංකොල්ලය සිදු වෙලාත් ඔහුට විරුද්ධව කිසිම නඩුවක් පවරා නැහැ. ඔහු අධිකරණයට ගෙන යන්නේ නැහැ; ඇප දෙන්නේ නැතුව බන්ධනාගාරගත කරන්නේ නැහැ. ඔක්කොම ගජ මිතුරන්ට සලකනවා.

දොම්පේ පැත්තේ සමහර මන්ත්‍රීවරු කුණු ප්‍රශ්නය බලන්න යන්නේත් අර්ජුන මහේන්ද්‍රන්ලාගේ කොම්පැනිවලින් දෙන හෙලිකොප්ටර් යානාවලිනුයි. ආණ්ඩුවේ ඇමතිවරු එයට කෙළින්ම සම්බන්ධයි. අද මහින්ද රාජපක්ෂ පැත්තට අත ඔසවන මිනිසුන්ගේ ගෙවල් කුලිය ගෙවා තිබෙන්නේ කවුද? ෆ්ලැට් එක කාගේද? ඒකට කවුද සල්ලි දුන්නේ? ඒ සල්ලි හොර සල්ලි නොවෙයිද? එවැනි හොර කළු මුදල් මෙහාට ගෙනෙන්න විනිමය පාලන පනත්, රෙගුලාසි සියල්ල වෙනස් කළාම, එය අමාත්‍ය ධුරයේ වගකීම තමන්ගේ පෞද්ගලික න්‍යාය පත්‍රයක් සඳහා යොදා ගැනීමක් නොවෙයිද? ඒ නිසා අද රටේ බරපතළ ඛේදවාචකයක් ඇති වෙලා තිබෙනවා.

අද තමුන්නාන්සේලාට පිළිගන්වා තිබෙන ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව මොකක්ද කියන්නේ? ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව සමස්ත රටේ ආර්ථිකය පිළිබඳව දේශපාලන පක්ෂ පාට භේදයෙන් තොරව විද්වතුන් විසින් සකස් කරන ලද වාර්තාවයි. අවුරුදු 15කට පස්සේ අපේ ඒකපුද්ගල ආදායම අඩු වෙලා තිබෙනවා.

ලංකා ඉතිහාසයේ එසේ සිදු වුණු අවුරුදු දෙකයි තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒක පුද්ගල ආදායම 2010දී ඇමෙරිකානු ඩොලර් 2,744යි; 2014දී 3,821යි; 2015දී 3,843යි; 2016දී 3,835යි. නිදහසින් පස්සේ දෙවනාවයි ඒකපුද්ගල ආදායම අඩු වෙලා තිබෙන්නේ. එකක්, චන්ද්‍රිකා කුමාරතුංග යුගයේදී. 2001දී ආර්ථිකය ඍණ වෙලා ඒක පුද්ගල ආදායම අඩු වුණා. ඊට පස්සේ ඒක පුද්ගල ආදායම අඩු වුණේ, 2016දී. අන්න රටේ සමස්ත ආර්ථිකයට වෙලා තිබෙන දේ. මහින්ද රාජපක්ෂ යුගයේදී සියයට 7ක්, 8ක් පැවැති සාමාන්‍ය ආර්ථික වර්ධන වේගය අද සියයට 4.4ට අඩු වෙලා. කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ වර්ධනය ආපස්සට ගිහින්, ඍණ 4.2ට පත් වෙලා. එදා 32.3ක් තිබුණ රටේ ආයෝජන අනුපාතය 31.5ට අඩු වෙලා. මහින්ද රාජපක්ෂ යුගයේදී 29.9ට තිබුණ ජාතික ඉතුරුම් 28.9ට අඩු වෙලා. කොළඹ පාරිභෝගික මිල දර්ශකයට - Colombo Consumer Price Index - අනුව සියයට 2.1ට තිබුණ රටේ බඩු මිල වැඩි වීමේ වේගය සියයට 4.4 දක්වා වැඩි වෙලා.

රටේ සමස්ත ගෙවුම් ශේෂය කවදාකවත් පිට පිට දෙවතාවක් ඍණ වෙන්නේ නැහැ. සමස්ත ගෙවුම් ශේෂය එක අවුරුද්දක ඍණ වුණොත්, ඊළඟ අවුරුද්දේ ධන වනවා. මොකද, රටේ තිබෙන සියලුම විදේශ ගනු-දෙනු හර හා බැර වශයෙන් සටහන් කරන්නේ අන්තර්ජාතික ගෙවුම් තුලාවේ; Balance of Paymentsවල. සමස්ත ගෙවුම් ශේෂය 2015දී ඍණ 1,489යි; 2016දී ඍණ 500යි. වර්ෂ දෙකක් පිට පිට ගෙවුම් ශේෂය හිඟ වෙලා තිබෙනවා. ජාත්‍යන්තර සංචිත කඩා වැටිලා තිබෙනවා. රුපියලේ අගය කඩා වැටිලා තිබෙනවා. රජයේ මූලික වග කීමක් තමයි, රුපියලේ අගය ආරක්ෂා කිරීම. එය ආරක්ෂා කරන්න රජයට බැරි වෙලා තිබෙනවා.

ණයබරතාව 2010දී සියයට 71.6යි. 2014 වන කොට ඒක සියයට 71.3 දක්වා අඩු කරලා තිබුණා. මේ රජය බලයට ඇවිල්ලා අවුරුදු දෙකක් යන කොට ජාතියේ ණයබර වැඩි කරලා තිබෙනවා, සියයට 79.3ට. මම නොවෙයි එය කියන්නේ. මේ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව කියවන්න. අද පිළිගැන්නූ 2016 - මහ බැංකු වාර්තාව කියවලා බලන්න, රටට මොකක්ද වෙලා තිබෙන්නේ කියන එක දැනගන්න.

සමස්ත කොටස් මිල දර්ශකය එදා 7,219යි; අද 6,228යි. මුළු රටම අනෙක් පැත්තට ගෙනියලා. මේ ශ්‍රී ලංකා මහා බැංකු වාර්තාව අනුව පෙනෙනවා, රටේ ඇති වෙලා තිබෙන භයානක වෛරී දේශපාලනයේ ප්‍රතිඵලය; වෛරී දේශපාලනය තුළින් රටේ ආර්ථිකයේ ඇති වෙලා තිබෙන අර්බුදය. රටේ සමස්ත නිමැවුම වැටිලා; ආදායම වැටිලා; සේවා නියුක්තිය වැටිලා; විරැකියාව වැඩි වෙලා; උද්ධමනය වැඩි වෙලා; පොලී අනුපාත වැඩි වෙලා. මේ සියල්ල වෙලා තිබෙන කොට, එය එසේ වෙලා තිබෙන බව අවිවාදයෙන් ගහලා පාර්ලිමේන්තුවට පිළිගන්වලා තිබෙන කොට, වෛරී දේශපාලනයෙන් යුතුව බැණ වදින්නේ නැතුව, මර්දනය කරන්න සූදානම් වෙන්නේ නැතුව, ජනතාව නැඟිටින්නේ ඇයි කියන එක තේරුම් ගන්න. හෙට වන කොට රටේ වෛද්‍යවරු වැඩ වර්ජනය කරාවි. ජනතාවගේ හඬට කන් දෙන්නේ නැතුව උච්ච මානසිකත්වයෙන් යුතුව මර්දනයේ හස්තය දිගු කරනවාට විරුද්ධව තමයි ඔවුන් වර්ජනය කරන්නේ. නිරායුධ මිනිසුන් ප්‍රජාතන්ත්‍රවාදීව කරන මේ හැම වැඩ වර්ජනයකදීම, picketing එකකදීම, ඕනෑම උද්ඝෝෂණයකදී ඒකාබද්ධ විපක්ෂය පිඩාවට පත්වන මිනිසුන්ගේ පැත්තේ හිට ගෙන ඉන්නවා. අපේ ගරු මන්ත්‍රීවරු පනස්දෙදෙනාම හිරේ දැම්මත්-

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඉන්නවාද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලාට වඩා ලොකු ප්‍රේමදාස මිනී මරු යුගයේත් අපි මේ පාර්ලිමේන්තුවේ ඉඳලා විපක්ෂය විධියට මුහුණ දීලා තිබෙනවාය කියන එක මතක තබා ගන්න. එන්ට එපා, මර්දනය කරන්න. තමුන්නාන්සේලා නොවෙයි, හට හමුදා සමඟ ආවත් මහින්ද රාජපක්ෂ යුගයක් ඇති කිරීම සඳහා වන උත්සාහය නතර කරන්න ඔය බණ්ඩාරලාට පුළුවන්කමක් නැති බව සඳහන් කරමින් මගේ වචන කීපය අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 1.46]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සහ 2005 අංක 11 දරන සමිති ආඥා පනත යටතේ අද ඉදිරිපත් කර ඇති නියෝග පිළිබඳව සාකච්ඡා කරන මේ මොහොතේ මා විශේෂයෙන්ම කියන්න ඕනෑ, මෙහි ඇති වැදගත්කම හා විවිධ නීති රීති ගැන අපේ ගරු ඇමතිතුමා පැහැදිලි කර දුන් බව. ඒ පිළිබඳව අප සියලු දෙනාගේ එකඟතාව තිබෙනවා.

නමුත් මේ සමිති සමාගම් කිව්වාම අපට මතක් වෙන්නේ පසුගිය කාලයේ තිබුණු සමිති සමාගම්. සහෝදර සමාගම්, ඥාති සමාගම්, ගජමිතුරු සමාගම් ඕවා තමයි ඒ කාලයේ රට කාපු සමාගම්. මේ නීති - රීති හෝ ඇවිත් ආයෙත් එහෙම සමාගම් බිහි වෙන්නේ නැති යුගයකට රට ගෙනියන්න පුළුවන් නම් විශේෂයෙන් වැදගත්ය කියා අපි හිතනවා. ඒ වාගේම ඔය සමහර සමාගම් ගැන FCID එක තවමත් පරීක්ෂණ පවත්වනවා. SriLankan Airlines එකේ සිටිය මාමයි, පාර්ලිමේන්තුවේ හිටපු බෑනායි එක්කාසු වෙලා කළ ගනු-දෙනු Hello Group වාගේ සමාගම්-[බාධා කිරීම්] මට වෙලාව මදි. මට ඉඩ දෙන්න විධියක් නැහැ. Hello Group වාගේ සමාගම් එකතුවෙලා රටේ කෝටි ගණන් සල්ලි, ජනතා මුදල්, මේ හරහා හොරා කාපු හැටි, කොල්ලා කාපු හැටි මේ සමාගම් පනත සහ සමිති ආඥාපනත ගැන සාකච්ඡා කරද්දී අපට දැනෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා මේ සභා ගැබෙන් පිටවී යන්නට ඉස්සෙල්ලා මම විශේෂයෙන් කියනවා, වෛරීය දේශපාලනය කළේ කවුද කියා. එදා සරත් ෆොන්සේකා මැතිතුමා ඡන්දය ඉල්ලුවාය කියන වරදට නීතියක්, නඩුවක්, නඩු තීන්දුවක් නැතිව බල්ලෙක් වාගේ ඇදගෙන ගිහින් හිරගෙදරට දැමුවාම, යුද්ධය දිනූ නායකයාට එහෙම කරනකොට ඔබතුමන්ලාගේ ඔය කඳුළු තිබ්බේ නැහැ. "අන්න හොඳයි " කියා අත උස්සාගෙන හිටියා. නමුත් අද සරත් ෆොන්සේකා මැතිතුමා, මහින්ද රාජපක්ෂ මහත්මයාට වචනයක් කිව්වාම, වෛරී දේශපාලනය කියා කථා කරනවා. එදා රටේ යුද්ධ හමුදාවේ හිටපු නායකයා, සෙන්පතියා ඇදගෙන යනකොට කෝ ඔය කඳුළු? - [බාධා කිරීමක්] ඔබතුමා කියන දේවල් කවුරුත් පිළිගන්නේ නැහැ. මොකද, රුපියල් දෙදහස් පන්සියයෙන් පවුලකට කන්න දෙන්න පුළුවන්ය කිව්ව ඇමතිතුමා නේ. ශක්‍රයාගේ පුතා වයිමා ආවත් ගෑස් මිල අඩු කරන්නට බැහැයි කියා ඔබතුමා කිව්වත්, මන්ත්‍රීතුමනි, අපි ආණ්ඩුව භාර ගත් ගමන් ගෑස් මිල අඩු කළා.

මේ ප්‍රශ්න මැද්දේ අපේ රට ඉතා ශක්තිමත් නිරසාර අත්තිවාරමක් දමා ගෙන ඉදිරියට යනවා. බොහෝ බාධක මැද තමයි අපි ඒ ගමන යන්නේ. පසුගිය දවස්වල අපට බොහෝ බාධක තිබුණා. ඉදිරියටත් මේ ගමන යද්දී අපට බාධක එනවා. බුදුරජාණන් වහන්සේටත් ගල් පෙරළුවා. සත්වයන් සසරින් එතර කරන්නට උන්වහන්සේ ඒ ගමන ගියා. ඒ වාගේ අධිෂ්ඨානයක්, ආශීර්වාදයක් අපට තිබෙනවා.

අප විශේෂයෙන් ජනතාවට පොරොන්දු වුණේ මාස හැටකින් අලුත් රටක් හදා දෙනවාය කියායි. දැනට මාස විස්සක් ගත වී තිබෙනවා. අලුත් රට හදන අත්තිවාරම අපි දැන් දමා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ මැයි පෙළපාළිය දැක්කාම ජනතාව අප විශ්වාස කර තිබෙනවාය කියන එක අපට භය නැතිව කියන්න පුළුවන්. ජනතාව අප විශ්වාස කර තිබෙනවා. කවුරු මොනවා කිව්වත්, මොන බාධක දැම්මත්, මේ මාස හැටේ වැඩ පිළිවෙළත් එක්ක අලුත් රට හදන්නට ජනතා බලවේග අපත් එක්ක ඉන්නවාය කියන කාරණය මේ පාර්ලිමේන්තුවේ ඉන්න සියලු දෙනාම පිළිගන්නවා ඇති.

පසුගිය කාලයේ සුරංගනා කථා කිව්වා. සුරංගනා කථා කිය කියා ජනතාව රැවැට්ටුවා. ජනතාව රවට්ටලා මේ රට බදාගෙන කෑවා; බෙදාගෙන කෑවා. සමහරු සල්ලි වෙන රටවලට ගිහිල්ලා තැන්පත් කළා. මේ රට රවට්ටපු කුහක කල්ලිය, අද මේ රට ස්ථිරසාර ගමනකට යනකොට එයට බාධා කරනවා; දන්න ජාති ඔක්කොම දාලා මේවා නවත්වන්න හදනවා. නමුත් අපි මේ ව්‍යායාමයේ යෙදෙන්නේ, උත්සාහ කරන්නේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රතිරූපය හදන්නවත්, රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රතිරූපය හදන්නවත් නොවන බව මතක තියා ගන්න. එහෙමනම් පසුගිය ආණ්ඩුව කාලයේ වාගේ පොල් ගස් වාගේ උස cut-outs පාරවල් වටේට ගහන්න තිබුණා. අපි එහෙම cut-outs ගහන සංස්කෘතිය අයින් කරලා, ප්‍රතිරූපය හදන එක අයින් කළා. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිරූපය හදන්න නොවෙයි අපි උත්සාහ කරන්නේ. ශ්‍රී ලංකා ජනතාවගේ අනාගතයයි අපි මේ නිර්මාණය කරන්න උත්සාහ කරන්නේ. ශ්‍රී ලංකාව තුළ තිබෙන ප්‍රතිරූපය ගොඩ නහන්නයි අපේ මේ උත්සාහය. අපට මඩ ගැහුවාට කමක් නැහැ. එක්සත් ජාතික පක්ෂයට මඩ ගැහුවාට කමක් නැහැ. අපේ නායකයන්ට මඩ ගැහුවාට කමක් නැහැ. නමුත් අපේ සමස්ත ශ්‍රී ලාංකිකයන් ඉහළට ඔසවා තබමින්, ඔවුන්ගේ රැකී රක්ෂා ප්‍රශ්නය විසඳමින්, ඔවුන්ගේ අනාගතය නිර්මාණය කරන්න යන ගමනට ශ්‍රී ලංකා ජාතියක් වශයෙන් බාධා කරන්න එපා කියලා මම ඔබතුමන්ලාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එදා ණය අරගෙන හදපු හම්බන්තොට වරායයි, මත්තල ගුවන් තොටුපොළයි අද රටට සුදු අලි බවට පත්වෙලා තිබෙන බව අපි දන්නවා. අපි ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලාට ඇඟිල්ල දිගි කරන්නේ නැහැ. අපි ඒවා ලාභදායී ව්‍යාපාර බවට පත් කරන්න උත්සාහ කරනවා. කර්මාන්තශාලා හදන්නේ නැතිව හම්බන්තොට වරායක් හැදුවේ ඇයි කියලා අපි දන්නවා. සංචාරක පාරාදීසයක් නැතිව ගුවන් තොටු පොළක් හැදුවේ ඇයි? තණ කොළ පටවන්නද? නැහැ. කුඩු ගෙනෙන්න. ඒවා හැදුවේ කුඩු ගෙනෙන්න. එහෙම නැත්නම් කැසිනෝ ව්‍යාපාරයට සෙනඟ ගේන්න තමයි ඒවා හැදුවේ. විදේශීය සම්භවයකින් යුතු හෝටල් හැදුවා. කැසිනෝ ව්‍යාපාරයට සෙනඟ ගෙනෙන්න තමයි ඒ හෝටල් හැදුවේ. නීති විරෝධී, -

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
Sir, I rise to a point of Order.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මගේ වේලාව දෙන්න බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මගේ වෙලාව ගන්න එපා. මට කථා කරන්න වෙලාව මදි.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මම අහන්නේ රීති ප්‍රශ්නයක්. ගරු මන්ත්‍රීතුමනි, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ගුවන් තොටුපොළ කටුනායකට ගෙනා, -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඒක point of Order එකක් නොවෙයි. ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
එතුමා කථාවක් නේ කරන්නේ. [බාධා කිරීමක්] ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමනි, ඔබතුමා මගෙන් උත්තරයක් ලබා ගන්න ප්‍රශ්නයක් අහන්න එපායැ. Point of Order කියලා කියන්නේ මොකක්ද කියලා තේරෙන්නේ නැද්ද? Point of Order කියලා කියන්නේ මොකක්ද කියලා දන්නේ නැද්ද? ස්ථාවර නියෝග බලලා ඒ ගැන දැනගෙන එන්න. මේ දිවුලපිටියේ ප්‍රාදේශීය සභාව නොවෙයි. ගිහිල්ලා ඒවා බලාගෙන එන්න. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ point of Order එක මොකක්ද? හම්බන්තොට කුඩු හදන මධ්‍යස්ථානයක් ඇති කරන්න, හම්බන්තොට ලෝකයේ කැසිනෝ මධ්‍යස්ථානය කරන්න අවශ්‍ය නීති විරෝධී බඩු ගෙන්වන්න තමයි කර්මාන්තශාලා හදන්නේ නැතිව, සංචාරකයන්ගේ පාරාදීසය හදන්නේ නැතිව එදා මේ ව්‍යාපෘති කළේ. අපි ඒක දැක්කා. අපි විපක්ෂයේ ඉන්නකොට ඒවා බලන්න හම්බන්තොටට ගියා; මත්තල ගුවන් තොටුපොළට ගියා. ඒවා ආරක්ෂක කලාප වෙන්න ඕනෑ. නමුත් එදා පිස්තෝල ගත් මැරයන් තමයි බලහත්කාරයෙන් හම්බන්තොට වරාය ඇතුළට ඇවිල්ලා අපට තර්ජනය කළේ. ඒ කාගේ ආශීර්වාදය තුළද? ඒ අයට ඒක පාරාදීසයක් වෙලා තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි හිතන්නේ රට ගැනයි. අපි දේශපාලන පක්ෂ ගැන හිතන්නේ නැහැ. රටේ මිනිසුන්ගේ රැකියා ප්‍රශ්නය ගැන තමයි අපි හිතන්නේ. අපි කර්මාන්ත පුරයක් හදන්න ගියාම මොනවාද කළේ? අපි අක්කර 15,000ක් අරගෙන කර්මාන්ත පුරයක් නිර්මාණය කරන්න ගියා. ඒ අක්කර 15,000න් සියයට 85ක්ම රජයේ ඉඩම්. හැබැයි, මේගොල්ලන් පන්සල්වලට ගිහිල්ලා ස්වාමීන් වහන්සේලා කුලප්පු කළා; පල්ලිවලට ගිහිල්ලා Fathersලා කුලප්පු කළා. ගම්වල ඉන්න මිනිසුන්ට ගිහිල්ලා කිව්වා, "ගෙවල් කැඩෙනවා ඉවරයි" කියලා. මේගොල්ලන් දැන දැන තමයි මේ කටයුත්ත කළේ, නොදැන නොවෙයි. ඉන් සියයට 85ක් රජයේ ඉඩම් කියලා දන්නවා. මිනිසුන් කුලප්පු කරලා, පාරට බස්සලා කාව හෝ මරන්න තමයි උත්සාහ කළේ. එදා ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ වැලිවේරියේ කොල්ලෝ මැරුවා වාගේ, ඒකල රොෂේන් චානක මැරුවා වාගේ තව එකෙක් බිලි දෙයි කියලා හිතලා ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ජාත්‍යන්තරව පහළට දමන්නයි ඔබතුමන්ලා උත්සාහ කළේ. අපි ඒවාට ඉඩ හදන්නේ නැහැ. මේවා මැඩ පවත්වාගෙන, මේවාත් දරාගෙන අපි හදන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයයි. ඔය ඕනෑම දේකට මුහුණ දීලා මේ රටේ ජනතාවගේ අනාගතයයි අපි හදන්නේ කියලා කියන්න ඕනෑ.

ඊළඟට, මම විශේෂයෙන්ම SAITM ප්‍රශ්නය ගැන කියන්නම්. දැන් SAITM ප්‍රශ්නය ගැන කථා කරනවා. SAITM එක කවුද හැදුවේ? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පානදුරේ හිටපු මන්ත්‍රීවරයා - නෙවිල් ප්‍රනාන්දු - තමයි SAITM එකේ අයිතිකාරයා. අපේ මහාචාර්ය කාලෝ ෆොන්සේකාත් එක්ක එකට වෛද්‍ය විද්‍යාලයේ ඉගෙන ගත්, වෛද්‍ය උපාධිය ගත් කෙනෙක් තමයි SAITM එක හැදුවේ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වුණු, වෛද්‍ය විද්‍යාලයේ කාලෝ ෆොන්සේකාත් එක්ක එකට ඉඳගෙන MBBS උපාධිය ලබාගත් වෛද්‍යවරයෙක් තමයි ඒක හැදුවේ. එහෙම නැතුව නිකම් යන කෙනෙක් නොවෙයි. දේශපාලනය පැත්තකින් තියලා අපි පිළිගන්නවා, ඔහු මේ රටට බිහි වූ නිර්මාණකරුවෙක්, මේ රටට බිහි වූ හොඳ දක්ෂයෙක් බව. ආසියාවේ තිබෙන ලොකුම press එක තිබෙන්නේත් ඔහු සතුවයි.

SAITM එකට දැන් විරුද්ධ වෙන්නේ කවුද? SAITM එක ආරම්භ කරලා අවුරුදු 7කට පස්සේ මහින්ද රාජපක්ෂ මහත්මයා අරලියගහ මන්දිරයට ගිහිල්ලා වෛද්‍ය උපාධිය - MBBS උපාධිය - ගන්න රූපවාහිනිය ඉදිරියේ 10දෙනෙකුට ශිෂ්‍යත්ව දුන්නා. "යන්න SAITM එකට, මෙන්න ලක්ෂ 70කට ශිෂ්‍යත්වයක්" කියලා ලෝකයටම පෙනෙන්න ශිෂ්‍යත්ව දුන්නා. එක්කෙනෙක්වත් කෑ ගැහුවාද? GMOA එකේ ඉන්න ඔය පණ්ඩිතයෝ ටික එදා බලු කුක්කෝ වාගේ බලාගෙන සිටියා. GMOA එකේ ඉන්න කුහක දොස්තරලා ටික ඒ ගැන කථා කළා ද? නැහැ. එහෙම නම් මොකක්ද මේ කරන්නේ? අපි නිදහස දුන්නාම මේ ආණ්ඩුව පෙරළන්න එනවා. එහෙම නම් එදාත් කෑ ගහන්න තිබුණා නේ. SAITM එක ආරම්භ කරලා තිබියදී අවුරුදු 7ක් පොල් ගෑවාද? අපි දේශපාලනය පැත්තෙන් බැලුවේ නැහැ. එහෙම නම් රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත්, අපටත් ඕකට විරුද්ධ වෙන්න තිබුණා. "එයා අපේ මිනිහෙක් නෙමෙයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයෙක්, මිනිහා දොස්තර කෙනෙක්, ඒ නිසා ඒක නවත්වන්න ඕනෑ" කියලා අපටත් විරුද්ධ වෙන්න තිබුණා. නැහැ, අපි ගොඩනඟන්නේ දේශපාලනය නොවෙයි. ඒක මතක තියාගන්න. අපි ගොඩනඟන්නේ රටේ ජනතාවගේ අනාගතය; ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය. ඒක මතක තියාගන්න.

දේශීය වෛද්‍යවරයෙක් වෙන්න නම් රජයේ විශ්වවිද්‍යාලයකටම යන්න ඕනෑද? ඉංජිනේරුවෙක් වෙන්න ඕනෑ නම් රජයේ විශ්වවිද්‍යාලයකටම යන්න ඕනෑද? ගණකාධිකාරිවරයෙක් වෙන්න ඕනෑ නම් රජයේ විශ්වවිද්‍යාලයකටම යන්න ඕනෑද? නීතිඥයෙක් වෙන්න ඕනෑ නම් රජයේ විශ්වවිද්‍යාලයකටම යන්න ඕනෑද? රජයේ විශ්වවිද්‍යාලයකට නොගොස් සෑම වෘත්තියකටම අදාළ උපාධිධාරී වෘත්තිකයන් මේ රටට බිහිවෙන්න පුළුවන් නම්, වෛද්‍යවරයෙක් විතරක් බිහිවෙන්න බැරි ඇයි? රජයේ විශ්වවිද්‍යාලයකට නොගොස් පෞද්ගලික විශ්වවිද්‍යාලයකින් හැම වෘත්තියකටම අදාළව උපාධියක් ගන්න පුළුවන්. වෛද්‍යවරුන්ගේ තිබෙන මේ පිස්සුව මොකක්ද? ආණ්ඩුවේ විශ්වවිද්‍යාලයකින්ම ඉගෙන ගන්න ඕනෑය කියන පිස්සුව මොකක්ද? ඔවුන් මේ විධියට විරුද්ධ වෙන්නේ ඇයි? ජනතා විමුක්ති පෙරමුණ විරුද්ධ වුණාට කමක් නැහැ. එතුමන්ලාගේ ප්‍රතිපත්තිය තමයි නිදහස් සෞඛ්‍යය, නිදහස් අධ්‍යාපනය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබාදුන් කාලය දැන් අවසානයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
නමුත්, මේ කට්ටිය විරුද්ධ වෙන්නේ මොකටද? මම වග කීමෙන් කියනවා, මේ සඳහා දොස්තරලාට ඇඟිල්ල දිගු කරන්න බැහැ කියලා. මේක නවත්වනවාට දොස්තරලාගෙන් සියයට 90ක් විරුද්ධයි. අපි GMOA එකට කියනවා, පුළුවන් නම් මීට විරුද්ධව තමන්ගේ සාමාජිකයන්ගෙන් සියයට 25කගේ අත්සන් අරගෙන පෙන්වන්න කියලා. SAITM එක වහනවාට GMOA එක කැමතිද කියලා පුළුවන් නම් ලිඛිතව අරගෙන පෙන්වන්න. නැහැ, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ බළල් අතක් තමයි එතැන ක්‍රියාත්මක වෙන්නේ. එහෙම නැතුව මේක GMOA එකේ හඬ නොවෙයි. ඒක මතක තියාගන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මීතොටමුල්ලට කුණු කන්ද කවුද ගෙනාවේ? ඒ කාලයේ කොළඹ හැදුවා කියලා ඒකට අයිතිකාරයෝ සිටියා නේද? කොළඹ හැදුවේ කවුද? "අපි තමයි කොළඹ හැදුවේ" කියලා කිව්වා නේද? කුණු කන්ද පෙරළෙන කොට කොළඹ හදපු එකා හැංගිලා. අන්තිමට රනිල් වික්‍රමසිංහ මහත්මයා තමයි මිනී 40ක් වැළඳුණු තැනට ගිහිල්ලා කිව්වේ, "මේ කුණු කන්දේ බෙදජනක සිද්ධියට මම වගකීම භාරගන්නවා" කියලා. ඒ වෙලාවේ කොළඹ හදපු අයිතිකාරයෝ නැහැ. [බාධා කිරීමක්]

1924 ඉඳලා ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි නිකම් තිබෙන්නේ. අපි ඒවා අවුරුදු 35කට බදු දීලා මාසයකට ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 100ක් මේ රටට අරගෙන දුන්නා. ඒ සල්ලි අපි කන්න නොවෙයි, රටේ ජනතාවගේ යහපතටයි ගත්තේ. මාසයකට ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 100ක් අරගෙන දුන්නා. තව තෙල් ටැංකි 85ක් තිබෙනවා. නිකම් වල් වැදිලා තිබෙන තෙල් ටැංකිවලින් ඩොලර් ලක්ෂ 100ක් ගත්තා නම්, අපට වර්ෂයකට රුපියල් කෝටි 10ක් ගන්න පුළුවන්. [බාධා කිරීමක්] අපි විකුණන්නේ නැහැ, බදු දීමයි කරන්නේ. රටේ දේපළ විකුණුවේ ඔබතුමන්ලායි. Port City එකට අක්කර 600 ගණනක් විකුණුවේ කවුද? අපි ඒවා නිදහස් කරලා දුන්නා. මේ ආණ්ඩුව කිසිම දවසක රටේ දේපළ විකුණන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබාදුන් කාලය අවසානයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මේ කුහක දේශපාලනයෙන් අයින් වෙලා ශ්‍රී ලංකාව ගොඩනඟන්න, රටේ ජනතාවගේ අනාගතය ගොඩනඟන්න අපිත් එක්ක අත්වැල් බැඳගෙන කටයුතු කරන්න කියා ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

මීළඟට ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා.

[අ.භා. 1.58]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ගරු රිසාඩ් බදියුදීන් ඇමතිතුමා විසින් අනුමැතිය සඳහා ගෙනැවිත් තිබෙන්නේ පසුගිය අය වැය යෝජනාවලට අනුකූල ගැසට් නිවේදන දෙකක්. විවිධ සමාගම්වලින් අය කරන ගාස්තු වැඩි කිරීමත්, ඒ වාගේම එම සමාගම්වල විවිධ කටයුතු වෙනුවෙන් අය කරන ගාස්තුව වැඩිකර ගැනීමත් තමයි පසුගිය අය වැය යෝජනාවල තිබුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. Lucky Jayawardana to the Chair?

ගරු සාගල රත්නායක මහතා (නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சாகல ரத்நாயக்க - சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sagala Ratnayaka - Minister of Law and Order and Southern Development)
Sir, I propose that the Hon. Lucky Jayawardana do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ගරු ලකී ජයවර්ධන මහතා මහතා මූලාසනාරූඪ විය.

අතන්පිටකු, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව පසුගිය අය වැයේදී මේ යෝජනාව ඉදිරිපත් කරන්නේම ආණ්ඩුවට මේ රටේ ආර්ථිකය ගොඩගන්න, නිෂ්පාදනය මත පදනම් වෙච්ච ආර්ථිකයක් ඉදිරියට ගෙන යන්න බැරිකම නිසා. ආණ්ඩුව අය වැයෙන් යෝජනා කරන්නේ බදු වැඩි කරන්න; දඩ මුදල් වැඩි කරන්න; විවිධ සේවා ගාස්තු වැඩි කරන්න. හැඳුනුම්පත් නිකුත් කිරීමේ ගාස්තු, විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු, විභාග ගාස්තු යන ඒ හැම දෙයක්ම වැඩි කරන්න තමයි එදා යෝජනා කළේ. ඒ අනුව තමයි සමාගම් පනත යටතේ අද මේ ගැසට් නිවේදනය එන්නේත්. මේ නිවේදනයේ තිබෙන්නේත් විවිධ කාර්යයන් සඳහා අය කරන රජයේ ගාස්තු වැඩි කිරීම්. ඇත්තටම ගත්තොත් මේක මහා ලොකු හපන්කමක්, පුළුවන්කමක් නොවෙයි, බැරිකම ප්‍රදර්ශනය කිරීමක්. ඒ නිසා තමයි ජනතාවගෙන් අය කරන මුදල් වැඩි කරලා තිබෙන්නේ; ගාස්තු වැඩි කරලා තිබෙන්නේ.

මෙතැනදී ප්‍රශ්න කිහිපයක් පැන නඟනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.ඒ අය වැය යෝජනාවල තිබුණා, සීමාසහිත සමාගම්වලින් හා පොදු සමාගම්වලින් වාර්ෂිකව 60,000ක් සහ ලක්ෂ පහක බලපත්‍ර ගාස්තුවක් අය කරන්න. නමුත් ඒ රුපියල් 60,000ක් වාර්ෂිකව අය කිරීම සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපාදන මේ වන තෙක් පාර්ලිමේන්තුවේ සම්මත කර නැහැ. ඒ නිසා එවැනි වාර්ෂික බදු මුදලක් අය කර ගන්න සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට කිසිදු නීතිමය බලයක් නැහැ. නමුත්, පසුගිය කාලයේ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් පත්තරවල දැන්වීම් දැම්මා, නිවේදන නිකුත් කළා, වාර්ෂිකව හැම සමාගමක්ම මේ රුපියල් 60,000ක සහ මුලින් කියපු ලක්ෂ පහේ ගාස්තුව අනිවාර්යයෙන්ම ගෙවිය යුතුයි කියලා. පසුගිය කාලයේ ව්‍යාපාරිකයන් යම් යම් කටයුතු සඳහා ලියකියවිලි ඉල්ලන්න ඒ ආයතනවලට ගියාම කොන්දේසියක් පැනෙව්වා, වාර්ෂික ගාස්තුව ගෙවලා නැත්නම් ඒ අදාළ ලියකියවිලි දෙන්නේ නැහැ කියලා. හැබැයි, ඒ වාර්ෂික ගාස්තු අය කරන්න නීතිමය ප්‍රතිපාදනයක් නැතුව, එහෙම නැත්නම් අඩුම ගණනේ සමාගම් පනත සංශෝධනය කරන්නේ නැතුව කොහොමද සමාගම් රෙජිස්ට්‍රාර්වරයා බලපෑම් කරන්නේ, අනිවාර්යය කරන්නේ, මේ රුපියල් 60,000 අනිවාර්යයෙන්ම ගෙවන්න ඕනෑ කියලා?

[ගරු විජිත හේරත් මහතා]

ඒ කටයුත්ත ඇත්තටම අයිති වෙන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් තමයි ඒ කටයුත්ත සිද්ධ කළ යුතු වෙන්නේ. නමුත් එහෙම දෙයක් සිද්ධ වෙලා නැහැ. ඒ නිසා අද වුණත් යම් කිසි සමාගමක් මේ වාර්ෂික ගාස්තුව ගෙවන්න බැහැයි කිව්වොත් ඇමතිවරයාට හෝ අමාත්‍යාංශයට ඒ පිළිබඳව ගන්න තිබෙන නීතිමය ක්‍රියා මාර්ගය මොකක්ද? එහෙම නීතිමය ක්‍රියා මාර්ගයක් ගන්න බැහැ. කියන්න පුළුවන්, "අරක කරන්නම්, මේක කරන්නම්" කියලා. හැබැයි, ඕනෑම සමාගමකට පුළුවන් ඒක නොගෙවා ඉන්න. මොකද, ඒ ගාස්තුව වැඩි කිරීම පිළිබඳව නෛතික බලයක් සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට මෙතෙක් ලැබිලා නැති නිසා. එහෙම නීතිමය ඉඩකඩක් මේ පාර්ලිමේන්තුවෙන් විවර කළේත් නැහැ. ඒ නිසා අදත් ඒ ප්‍රශ්නය බරපතළ ප්‍රශ්නයක් විධියට තිබෙනවා. එහෙම තියෙද්දී තමයි දැන් මේ අනෙකුත් ගාස්තුත් වැඩි කරන්නේ. මම ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි, මොන නීතිය යටතේද, මොන නීතිමය ප්‍රතිපාදන යටතේද ඔබතුමන්ලා සමාගම්වලින් මේ වාර්ෂික ගාස්තු අය කරන්නේ කියලා.

සමාගම් කිව්වාම මහා පරිමාණ කොම්පැනි විතරක් නොවෙයි අයිති වෙන්නේ. මේ වාර්ෂික ගාස්තු අය කිරීම් යටතට ගම්වල තිබෙන පුංචි පුංචි සමිතිත් අයිති වෙනවා. ලියාපදිංචි වෙලා සමිතිත් මේකට අදාළ වෙනවා. උදාහරණයක් ගත්තොත්, විහාරස්ථ දායක කාරක සභාත් සමිති විධියට වැටෙනවා. ඒවායින් අය කරන ගාස්තුවල වෙනස්කම් තිබෙන්න පුළුවන්. මේ කථා කරන්නේ මහා පරිමාණ කොම්පැනි ගැන විතරක් නොවෙයි. මහා පරිමාණ කොම්පැනිවලින් ගාස්තු අය කරන එක ප්‍රශ්නයකුත් නොවෙයි. හැබැයි, මේ කරුණ අනෙකුත් පුංචි, අවශේෂ ග්‍රාමීය මට්ටමේ තිබෙන සමිති සමාගම්වලටත් බලපානවා. අන්න එතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. එතකොට, කිසිදු නීතිමය ඉඩක්, නීතිමය රාමුවක් නැතුව කොහොමද ආගමික සමිතිවලින් මේ ගාස්තු අය කරන්නේ? ඒක පන්සලේ විහාරස්ථ දායක කාරක සභාව වෙන්න පුළුවන්. පල්ලියේ සංවිධානයක් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් හින්දු ආගමේ හෝ ඉස්ලාම් ආගමේ යම් කිසි සංගමයක් වෙන්න පුළුවන්. නමුත් මේ නීතිය ඒ හැමෝටම බලපානවා.

හැබැයි, ඒ නීත්‍යානුකූල ඉඩ නැති වුණත්, "අනිවාර්යයෙන් මේ ගාස්තුව ගෙවන්න" කියලා දැන් එය බලපෑමක් විධියට තිබෙනවා. සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට නැති බලයක් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා පාවිච්චි කිරීම නීතිවිරෝධී කටයුත්තක්. ඒ නිසා උසාවියක් ඉදිරියට යම් කිසි සමාගමක් ගියොත්, ඒකට වගඋත්තර බඳින්න වෙන්නේ ඇමතිවරයාට නොවෙයි, ඒ නිවේදන නිකුත් කරපු සමාගම් රෙජිස්ට්‍රාර්වරයාටයි. ඒ නිසා මෙහිදී නැවත සිතා බැලිය යුතු, නැවත අවධාරණය කළ යුතු බරපතළ කාරණාවක් තිබෙනවා. නීතියේ කිසිදු ප්‍රතිපාදනයක් නැතිව, ඒ පිළිබඳව කිසිදු නීතියක් මේ පාර්ලිමේන්තුවෙන් සම්මත වෙන්නේ නැතිව, "වාර්ෂික ගාස්තුවක් අය කරන්න" කියලා සමාගම් රෙජිස්ට්‍රාර්වරයා බලපෑම් කරන එක මුළුමනින්ම නීති විරෝධීයි. ඒ පිළිබඳව ඔහුට වග කියන්න සිද්ධ වෙනවා. එවැනි තත්ත්වයක් තිබියදී තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගාස්තු වැඩි කරන්නට අද යෝජනා කරන්නේ. එතැනදීත් පුංචි, පුංචි සමිතිවලින් අය කරන ගාස්තු වැඩි කරන එක කිසිසේත්ම සාධාරණ වෙන්නේ නැහැ. යම් කිසි සමාගමක් ලියකියවිල්ලක් ලබා ගන්න, ඔවුන්ගේ ගිණුම් පිළිබඳ ප්‍රකාශනයක් ලබා ගන්න, ඒ ආයතනයේ නිලධාරි මණ්ඩලය පිළිබඳ වාර්තාවක් ගන්න -එවැනි ආකාරයේ මොන දේ කරන්න ගියත්- දැන් මේ ගැසට් නිවේදනය අනුව ගාස්තු අය කරනවා සහ ගාස්තු වැඩි කරනවා. නමුත් පුංචි සමාගම්වලින්, පුංචි සමිතිවලින් එවැනි ගාස්තු අය කිරීම සාධාරණ වෙන්නේ නැහැ.

පසුගිය කාලයේ ඇති වුණු ප්‍රායෝගික ප්‍රශ්නයක් තිබෙන බව අප දන්නවා. පසුගිය ආණ්ඩුව -රාජපක්ෂ පාලනය- කාලයේ විහාරස්ථ දායක කාරක සභා මඟින් වාහන ලබා ගැනීමක් කළා. ඒ කාලයේ රාජපක්ෂ පාලනය, විශේෂයෙන්ම ආගමික නායකයන් තමන්ගේ දේශපාලන චුවමනාවලට පාවිච්චි කර ගැනීම සඳහා ඒ බොහෝ තැන්වලට වැන් එකක් දුන්නා. ඒ වැන් එක ලබා ගන්න පුළුවන් වුණේ ඒ දායක කාරක සභාව හරහා තමයි. සාමාන්‍යයෙන් අපි දන්නවා, ගම්වල තිබෙන පුංචි සමිති, එහෙම නැත්නම් ආගමික සභා කොම්පැනියක ආකාරයට වාර්ෂික ආදායම් වියදම් පවත්වා ගෙන යන්නේ නැහැ; ගිණුම් පවත්වා ගෙන යන්නේ නැහැ කියලා. පිළිගත්, වරලත් ගණකාධිකාරිවරයෙක් හරහා ඒවායේ විගණනයක් සිද්ධ වෙන්නේ නැහැ. මොකද, ඒවා ආගමික සංවිධාන නිසා. විවිධ අය ආගමික සංවිධානවලට මුදල් පරිත්‍යාග කරනවා. ඒ පරිත්‍යාගවලින් තමයි ඒ ආගමික සංවිධානවල කටයුතු සිද්ධ වෙන්නේ. නමුත්, පසුගිය රජය ඒ ආගමික සංවිධානවලට වාහනයක් ලබා දීලා, ඒ පිළිබඳ යම් සංඛ්‍යා ලේඛන ලබා ගැනීමක් සිද්ධ කළා.

අද වෙන කොට මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ හැම විහාරස්ථ දායක කාරක සභාවකටම අද විගණකාධිපති දෙපාර්තමේන්තුව පැත්තෙන් විගණන විමසුම් යනවා. එවැනි ආකාරයට විගණන විමසුම් යවද්දී ඔවුන් බලන්නේ මේක ආගමික සංවිධානයක්ද නැද්ද කියන එක නොවෙයි, නීතියට එකඟව විගණන කටයුතු සිද්ධ වුණාද, ඒ ලබා ගත් දේවල් හරියට පවත්වා ගෙන ගියාද කියන එකයි. ඒ නිසා දැන් විශේෂයෙන්ම ආගමික සංවිධානවලට ලොකු ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඔවුන් වාර්ෂිකව මේ ගිණුම් ලබා දෙන්නත් ඕනෑ. ඒ වාගේම, සමාගම් රෙජිස්ට්‍රාර්වරයා අනුමත කරන ලද පිළිගත් විගණන නිලධාරියෙක් ඒ ගිණුම් අනුමත කරන්නත් ඕනෑ. සාමාන්‍යයෙන් ගමේ පන්සලේ, ගමේ මුස්ලිම් පල්ලියේ, කෝවිලේ ගිණුම් පිළිබඳ විගණන කටයුත්ත කරලා විගණන සහතිකය ලබා ගන්න සමාගම් රෙජිස්ට්‍රාර්වරයා අනුමත කරන ලද විගණන නිලධාරියෙකු සම්බන්ධ කර ගත්තොත් ඔහුගේ "වෘත්තීය මට්ටමට ගැළපෙන ගාස්තුවක්" ගෙවන්න ඕනෑ. වෘත්තීය මට්ටමට ගැළපෙන ගාස්තුවක් කියන්නේ ලොකු එකක්. එතකොට මේ පුංචි පුංචි ආගමික සමිතිවලට විශාල අසීරුතාවකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒක අද ප්‍රායෝගිකව බිම් මට්ටමේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නයක්.

මුදල් අමාත්‍යාංශය වාර්ෂික අය වැය ලේඛනය ඉදිරිපත් කරද්දී බලන්නේ, ලියා පදිංචි වුණු සමාගම් කොච්චර තිබෙනවාද, සමිති කොච්චර තිබෙනවාද කියලායි. දැන් මේ සමිතිවල වාර්ෂික ගාස්තුව වැඩි කරලා, - රුපියල් හැටදහස ගණනේ- සමිති ගණන පිළිබඳව ගණන් හදනවා.

එතකොට එනවා, ලොකු ඉලක්කමක්. ලොකු ඉලක්කමක් ආ ගමන් අපට අය වැය ලේඛනයේ පෙන්වනවා, "මෙන්න සමාගම් ප්‍රමාණය, අවුරුද්දකට රුපියල් 60,000 ගණනේ ගාස්තුවක් අනිවාර්ය කළොත් මෙච්චර ප්‍රමාණයකින් මුදල් ආදායම් ප්‍රමාණය වැඩි වනවා" කියලා. ඒක තමයි මුදල් අමාත්‍යවරයා පසුගිය 2015 වර්ෂයේ දී සහ 2016 වර්ෂයේ දී පෙන්නුවේ. සමාගම් ගණන අනුව රුපියල් 60,000න් වැඩි කරලා, රුපියල් ලක්ෂ 5න් වැඩි කරලා ගණන් හදලා රජයට මෙච්චර ආදායමක් එනවා, අච්චර ආදායමක් එනවා කියා ලොකු ඉලක්කම්වලින් පෙන්නුවා. හැබැයි, ඒ වැඩි කරපු මුදල, එහෙම නැත්නම් අනිවාර්ය කරපු ගාස්තු අය කර ගැනීම සඳහා වූ නීතියක් හෝ හදන්නේ නැතිවයි එහෙම කළේ. අය වැය තුළ පොල් ගෙඩි අකුරින් 'රජයේ ආදායම වැඩි කළා' කියලා අපට පෙන්වා ගැනීම සඳහා ඒ කර තිබෙන්නේ ඇත්තටම විහිළුවක්; බොරුවක්; වංචාවක්. මොකද, ප්‍රායෝගික තලයේ එහෙම එකක් වෙන්නේ නැහැ. අපට අය වැයේදි කියන්න පුළුවන්, "ඔන්න ආණ්ඩුවේ ආදායම වැඩි කළා" කියා.

ඊට පසුව කියනවා, "පසු ගිය රාජපක්ෂ පාලනයට වඩා මේ ආණ්ඩුවේ වාර්ෂික අය වැය තුළ අපේ ආදායම වැඩි කරගෙන තිබෙනවා" කියලා. සමාගම් සංඛ්‍යාව මෙච්චරයි, ඒ ප්‍රමාණය රුපියල් 60,000න්, රුපියල් ලක්ෂ 5න් වැඩි කළාම ආදායම මෙච්චරයි කියලා පෙන්වනවා. හැබැයි වර්ෂය අවසාන වන කොට අපට දකින්න පුළුවන් වන දේ තමයි, එහෙම ආදායමක් එන්නේ නැහැ කියන එක. ඒක තමයි, මෙය බොරුවක් කියා කිව්වේ; මෙය මිථ්‍යාවක් කියා කිව්වේ. මුදල් අමාත්‍යවරයාට, පෙන්වන්න පුළුවන්කම තිබෙනවා, 'මේ ආදායම වැඩි වුණා' කියන එක. එහෙම පෙන්වන්න පුළුවන් පොතෙන් විතරයි, ඉලක්කම්වලින් විතරයි. හැබැයි ප්‍රායෝගිකව ඒ ආදායම ලැබී නැහැ; ලබා ගන්නත් බැහැ. දැන් ඒ ප්‍රශ්නයට මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා මෙතැනදී සැලකිල්ලට ලක් කළ යුතු කාරණාවක් තිබෙනවා. ආණ්ඩුවේ ආදායම වැඩි කරන්න කියලා මුදල් අමාත්‍යාංශය පැත්තෙන් පෙන්වන ඉලක්කම් නිකම් විහිළුකාරි ඉලක්කම් බවට පත් වීමක් තමයි ඇත්තටම මෙතැනදී සිද්ධ වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් ප්‍රශ්නයක් තිබෙනවා. පොදු කොන්ත්‍රාත් ලියා පදිංචි කිරීමේ දී නෛතික ගැටලුවක් මතු වී තිබෙනවා. එහි අනුනියෝජිතයන් හෙවත් sub-agentsලාට යම් නීත්‍යානුකූල බලයක් ලැබී තිබෙනවා. හැබැයි ඒ ප්‍රධාන නියෝජිතයාට -principal agentට- ටෙන්ඩර් ලබා ගැනීමේදී දැනට තිබෙන සමාගම් පනතට අනුව ඒ බලය නිවැරැදිව ලැබෙන්නේ නැහැ. එනිසා ගොඩක් තැන්වලදී, විශේෂයෙන්ම රුපියල් මිලියන 5ට වඩා වැඩි ටෙන්ඩර් ලබා ගැනීමේදී ප්‍රධාන නියෝජිතයාට ටෙන්ඩර් ලබා ගැනීමේ නෛතික බලයක් නොමැති වීම හේතුවෙන් ප්‍රායෝගික ප්‍රශ්න ගොඩක් මතු වෙලා තිබෙනවා. ඇත්තටම ඒ නීතිමය වගන්තිය ඇතුළේ අනුනියෝජිතයන්ට පමණයි ඒ බලය ලැබී තිබෙන්නේ. ඒවා වෙනස් කරන්න අමාත්‍යතුමා තවමත් කටයුතු කර නැහැ. නීතිමය බලයක් නැතිව ප්‍රායෝගික තලයට ගියාම, විශේෂයෙන්ම පොදු කොන්ත්‍රාත් ලියා පදිංචි කිරීමේ කටයුත්තට අවතීර්ණ වුණාම මහ පොළොවේ දැන් මෙය ලොකු ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාගම් පිළිබඳව කතා කරද්දී කියන්න ඕනෑ තව කාරණයක් තිබෙනවා. රිසාඩ් බදියුදීන් අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ප්‍රධාන ආයතන කීපයක් තමයි, හම්බන්තොට Lanka Salt Limited එක, Mantai Salt Limited එක, ඒ වාගේම පුල්මුඩේ ඛනිජ වැලි නිධිය. රජය සතු ඒ ආයතන, ඒ සමාගම් මේ වන කොටත් අධික ලෙස ලාභ ලබන ආයතනයි. වාර්ෂික ආදායම ගත්තොත්, ඇත්තටම ලාභ මට්ටමේ තිබෙන තැනකයි ඒවා තිබෙන්නේ. ඒවා පාඩු ලබන ආයතන නොවෙයි. හම්බන්තොට Lanka Salt Limited එකත්, Mantai Salt Limited එකත් පසුගිය කාලය පුරාවට ඉතා පැහැදිලිව ඔප්පු කර තිබෙනවා, ඒවා ලාභ ලබන ආයතන බව. හැබැයි අමාත්‍යතුමා නිකුත් කර තිබෙන මේ ගැසට් නිවේදනයට අදාළ අය වැය යෝජනාවෙහිම, ඒ ලාභ ලබන සමාගම් සම්බන්ධයෙන් ඉතා පැහැදිලිව සඳහන්ව තිබෙනවා, ඒ ආයතන පෞද්ගලික අංශයට දෙනවා කියා. ඒකට නමක් දාලා තිබෙනවා Public-Private Partnership කියා. ඒ නම දාලා අවසානයේ දී ඇත්තටම කරන්න යන්නේ ඒවා පෞද්ගලික අංශයට දෙන එකයි. රජයට ආදායම නැහැ. ඒ කියන්නේ, ආණ්ඩුවට සල්ලි නැහැ. සල්ලි නැති නිසා දැන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා යටතේ ලියා පදිංචි කර තිබෙන සමාගම්වලින අය කරන ගාස්තු වැඩි කරනවා. ඒ සඳහා අලුත් ගැසට් පත්‍රයක් නිකුත් කරනවා. හැබැයි, එහෙම කරද්දී, තමන්ගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ලාභ ලබන ආයතන විකුණා දමනවා. ඒක බොහොම පරස්පරයි.

එක පැත්තකින් කියනවා, සමාගම්වලින් ලැබෙන ආදායම මදි කියලා. එහෙම කියලා වාර්ෂික ගාස්තු වැඩි කරනවා; වෙනත් ලියකියවිලි ලබා ගැනීමේදී අය කරන ගාස්තු වැඩි කරනවා. ඒ ඔක්කෝම කරන්නේ සල්ලි මදි නිසා අය වැයේදී ආදායම වැඩි කරලා පෙන්වන්න. හැබැයි, එහෙම කරන ගමන් මේ වනකොටත් ලාභ උපයන හම්බන්තොට ලංකා ලුණු සමාගම සහ මාන්තේ ලුණු සමාගම විකුණන්න පිඹුරුපත් සකස් කරනවා. එකම අය වැය තුළ මේ යෝජනා දෙකම තිබෙනවා. එක පැත්තකින් කියනවා, මේ සමාගම්වලට වාර්ෂික බද්දක් පැනෙව්වොත්, සමාගම්වලින් අය කරන ගාස්තුව වැඩි කළොත් ආණ්ඩුවට ආදායම හොයා ගන්න පුළුවන් කියලා. සල්ලි මදි නිසා අපි ඒවා වැඩි කරනවා කියලා කියනවා. එහෙම තත්ත්වයක් තිබෙද්දී , දැනටමත් ලාභ උපයන ආයතන විකුණන්නේ ඇයි? එතකොට තිබෙන ලාභයත් නැති වෙනවා නේ. මෙතැන තිබෙන්නේ පරස්පරයක්.

ඇත්තටම සල්ලි නැත්නම්, ලාභය වැඩි කර ගන්න ඒ ආයතන දියුණු කරන්න පුළුවන්; ඒ සමාගම් දියුණු කරන්න පුළුවන්. ඒකට මේ වාගේ අලුත් ගැසට් ඕනෑ වෙන්නේ නැහැ; ලියකියවිලි ලබා ගැනීමේ දී අය කරන ගාස්තුව වැඩි කරන්න ඕනෑ වෙන්නේ නැහැ. වාර්ෂික බලපත්‍ර ගාස්තුව රුපියල් 60,000කින් වැඩි කරන්න ඕනෑ වෙන්නේ නැහැ. ඇයි? හම්බන්තොට Lanka Salt Limited එකෙන්, Mantai Salt Limited එකෙන් සහ පුල්මුඩේ ඛනිජ නිධියෙන් දැනටත් උපරිම ලාභ ගන්න පුළුවන්. නවීන තාක්ෂණයට අනුව ඒවා නවීකරණය කළොත් මේ ලාභය තුන් ගුණයකින්, සිව් ගුණයකින් වර්ධනය කර ගන්නත් පුළුවන්. එහෙම තිබෙද්දී ගමේ පන්සලේ, පල්ලියේ පුංචි සමිතියේ ගාස්තුව වැඩි කරනවා. හම්බන්තොට ලංකා ලුණු සමාගම, Mantai Salt Limited එක වැනි ලාභ ලබන ආයතන විකුණලා ගමේ සමිතියෙන් අය කරන ගාස්තුව වැඩි කරනවා. මොකක්ද, මේ විහිළුව. පොඩි මිනිසුන්ගේ සමිතියේ, ගමේ ආගමික සමිතියේ ගාස්තුව වැඩි කරනවා; වාර්ෂික ගාස්තුවත් වැඩි කරනවා; ලියකියවිලිවලට අය කරන ගාස්තුවත් වැඩි කරනවා. ලාභ ලබන සමාගම් ටික තමන්ගේ හෙංචයියන්ට, හිතවතුන්ට විකුණා දානවා. ඒ නිසා ඔබතුමන්ලාගේ මේ අය වැය යෝජනාව ඇතුළේ තියෙන්නේ පරස්පරයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී නෛතික රාමුවක් නැතුව නෛතික ක්‍රියාමාර්ග ගන්න එක වැරැදියි. දැන් බොහෝ දේවල් සම්බන්ධයෙන් ඉතා පැහැදිලිව නීතිමය සහතිකයක්, නීතිමය අර්ථකථනයක් දීලා තිබෙනවා. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා සඳහන් කළා, සමහර ගිවිසුම් අත්සන් කරද්දී මේ රටේ පුරවැසියන් නොවන අය ඒවා අත්සන් කරලා තිබෙන බව.

විශේෂයෙන්ම අර්ජුන මහේන්ද්‍රන් මහතා සම්බන්ධව ගත්තොත් එතුමා මහ බැංකු අධිපතිවරයා විධියට සිංගප්පූරු පුරවැසිභාවය තියාගෙන මුදල් නෝට්ටුවට අත්සන් කළ එක වැරැදියි. ඇත්තටම ඒක බරපතළ වැරැද්දක්. අපේ රටේ මුදල් නෝට්ටුවට විදේශිකයෙක් අත්සන් කරන්නේ කොහොමද? මේක අපි හැමෝටම බලපාන පොදු ප්‍රශ්නයක්. අපි අපේ ස්වෛරීත්වය ගැන කථා කරනවා. හැබැයි, එහෙම කථා කරන ගමන් අපේ රටේ නොවන පිටස්තරයෙක් අපේ සල්ලි කොළේට අත්සන් කරනවා. එහි කිසිදු වලංගුභාවයක් නැහැ. ඒ වාගේම 2007 දී ශ්‍රී ලංකාව හා ඇමෙරිකාව අතර ආරක්ෂක හරස් සේවා ගිවිසුමක් අත්සන් කළා. ඒ ආරක්ෂක හරස් සේවා ගිවිසුම අත්සන් කළේත් එවකට ශ්‍රී ලංකාවේ හිටපු ඇමෙරිකානු තානාපති රොබට්. ඕ. බ්ලේක් මහතා සහ එවකට ශ්‍රී ලංකාවේ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතායි. එතකොට ඇමෙරිකානු පුරවැසිභාවයක් සහිත ද්විත්ව පුරවැසිභාවයක් තියාගෙන හිටපු ගෝඨාභය රාජපක්ෂ මහතා ඇමෙරිකානු පුරවැසියෙක් වූ රොබට්. ඕ. බ්ලේක් මහතා එක්ක ගිවිසුමක් අත්සන් කළා. ඇත්තටම ඒ ගිවිසුම ගත්තොත්, ඇමෙරිකානුවන් දෙදෙනෙකු අතර අත්සන් කරන ලද ගිවිසුමක්.

[ගරු විජිත හේරත් මහතා]

රටේ ආරක්ෂාව පිළිබඳ සහ ශ්‍රී ලංකාවේ භූමිය ඇමෙරිකන් ගුවන්, නාවික, පාබල හමුදාවට පාවිච්චි කරන්න ඉඩකඩ හදලා දෙන ඒ ආරක්ෂක හරස් සේවා ගිවිසුම අත්සන් කළේ ඇමෙරිකානු පුරවැසිභාවයක් තිබුණු පුද්ගලයෙක්. ඒකත් වැරැදියි. එදා ඒ වැරැද්දත් සිද්ධ වුණා. අද, නිටපු මහ බැංකු අධිපතිවරයා මුදල් නෝට්ටුවේ අත්සන් කිරීමත් සිදු වුණා. මෙවා නීතියට පිටින් සිද්ධ වෙන දේවල්. එතකොට ඒවායේ වලංගුභාවයක් නැති වෙනවා. ඒ ගිවිසුම් තමයි මේ අලුත් ආණ්ඩුවත් නැවත අලුත් කරන්න යන්නේ.

එදා 2007 අත්සන් කළ ආරක්ෂක හරස් සේවා ගිවිසුමට දැන් අවුරුදු 10ක් පිරෙනවා. මේ මාර්තු මාසයේ 07වෙනි දාට ඒකට අවුරුදු 10 පිරුණා. එතකොට මේ අලුත් ආණ්ඩුව දැන් ඒක අලුත් කරනවා. එදා රොබට් ඕ. බ්ලේක් මහත්මයලාත් සමඟ ගෝඨාභය රාජපක්ෂ මහත්මයලා අත්සන් කළ, මේ රටේ ස්වෛරීත්වය පිළිබඳ ප්‍රශ්නයක් මතු කළ ආරක්ෂක හරස් සේවා ගිවිසුම අලුත් ආණ්ඩුව අහෝසි කළාද? නැහැ, අලුත් ආණ්ඩුව ඒක දීර්ඝ කරගෙන යනවා. එදා ඇමෙරිකානු පුරවැසිභාවයක් තිබෙන පුද්ගලයෙක් අත්සන් කළ ගිවිසුම නීත්‍යානුකූල වෙන්නේ නැහැ, වලංගු වෙන්නේ නැහැ. හැබැයි ඒවා එහෙම අහෝසි වෙලාත් නැහැ. ඒක ප්‍රශ්නයක් විධියට තිබෙනවා.

ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමිය අහනවා, ස්විට්සර්ලන්තයේ පුරවැසිභාවය තිබෙන්නේ එතුමියට විතරද කියලා. එතුමිය කියනවා, ස්විට්සර්ලන්තයේම පුරවැසිභාවය තිබෙන මේ ආණ්ඩුවේ ඇමතිකම් දරන පුද්ගලයෝ ඉන්නවා කියලා. මහින්ද අමරවීර ඇමතිතුමා කියලා තිබුණා, ඇමෙරිකානු පුරවැසිභාවය තිබෙන මන්ත්‍රීවරු ආණ්ඩුවේ විතරක් නොවෙයි ඒකාබද්ධ විපක්ෂය පැත්තෙත් ඉන්නවා කියලා. රටේ ජනතාව දැන ගන්නට කැමැතියි කවුද මේ කියලා. ගීතා කුමාරසිංහ මහත්මියට එක නීතියකුයි, ආණ්ඩුව ඇතුළේ ඉන්න ඇමතිවරුන්ට තව නීතියකුයි, රාජපක්ෂ කණ්ඩායමේ ඉන්න මන්ත්‍රීවරයෙකුට තව නීතියකුයි විධියට නීති තුනක් ක්‍රියාත්මක වෙන්න බැහැ.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පැහැදිලිව සඳහන් වෙනවා, ද්විත්ව පුරවැසිභාවයක් සහිත කෙනෙකුට පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වෙන්නත් බැහැ, ඉදිරිපත්වෙලා තේරී පත් වෙන්නත් බැහැ කියලා. ඒක දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඉතා පැහැදිලිව, නිශ්චිතව දැක්වෙනවා. එය මේ පාර්ලිමේන්තුවේ සම්මත වුණු සංශෝධනයක්. ඒක ආණ්ඩුවේ ඇමතිවරයෙකුටත්, ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රී කෙනෙකුටත් පමණක් අදාළ නොවෙන්න බැහැ. ඒ නිසා රටේ ජනතාව දැන ගන්නට කැමැතියි කවුද මේ කියලා. මේක සරල දෙයක් නොවෙයි. මේ ගැන හෙළි කරන්නේ එක පැත්තකින් ආණ්ඩුවේ ඇමතිවරයෙක් සහ අනෙක් පැත්තෙන් ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමිය. එතුමිය කියනවා, "මම දන්නවා මේ ආණ්ඩුව ඇතුළේ ඉන්න ඇමතිවරයෙකුටත් ස්විට්සර්ලන්තයේ පුරවැසිභාවය තිබෙනවා" කියලා. එහෙම නම් කවුද මේ, ඇයි නීති දෙකක්? ඒ ප්‍රශ්නය ජනතාවට තිබෙනවා.

නීතිය ක්‍රියාත්මක වෙන්නට ඕනෑ සමාකාරවයි. එක එක්කෙනාට එක එක විධියට නීතිය ක්‍රියාත්මක වෙන්නට බැහැ. සමාගම් පනත සහ සමීති ආඥාපනත යටතේ ගෙන එන ලද නියෝග මඟින් සමාගම්වලින් රුපියල් 60,000 අය කරන විට, සමාගම් රෙජිස්ට්‍රාර්වරයා ළඟට ගිහින් එය අභියෝගයට ලක් කළ සමාගම්වලින් එම මුදල අය කර ගන්නට බැරි වුණා. සමහර සමාගම් මේකට විරෝධතාව දැක්වුවා. සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට මේක අය කර ගන්නට බලයක් නැහැ, නීතිමය බලයක් නැහැ කියලා සමහරු ලිඛිතව දැන්වුවා. එහෙම කිව්ව සමහර ආයතනවලින් මේක අය කරලා නැහැ. එහෙම නොකියූ සමාගම් භය කරලා ඒක අය කර ගත්තා. අනෙකුත් ලිය කියවිලි දෙන්නේ නැහැ, වාර්ෂික කටයුතු කරගෙන යන්න ඉඩ දෙන්නේ නැහැ කියලා පොඩ්ඩක් සද්දේ දැම්මාම ඒවාට භය වුණු සමහර සමාගම් රුපියල් 60,000 ගෙව්වා. එතැනත් නීති දෙකක්. එහෙම වෙන්න බැහැ. ද්විත්ව පුරවැසිභාවය පිළිබඳව නීති දෙකක් ක්‍රියාත්මක වෙන්නට බැරි නම් සමාගම් ලියා පදිංචි කිරීම සහ සමාගම් පවත්වාගෙන යාමේදීත් නීති දෙකක් ක්‍රියාත්මක වෙන්නට බැහැ. නීතිය කාටත් එක හා සමාන වෙන්න ඕනෑ. ඒ අසමාන තත්ත්වය අද අපිට දකින්නට ලැබෙනවා.

මේ ගැසට් නිවේදනය නිකුත් කිරීම හරහා බලාපොරොත්තු වෙන්නේ සමාගම්වලින් අය කරන ගාස්තුව වැඩි කර ගැනීම නම්, එසේ වැඩි කර ගනිද්දී ගම්වල තිබෙන ආගමික සංවිධාන සහ කුඩා සිවිල් සමාජ සේවා සමිතිවලට මේ ගාස්තු වැඩි කිරීම බරපතළ අසාධාරණයක්. ඒ නිසා එවැනි සංවිධානවලට මේක බල නොපැවැත්වෙන විධියට සහ ඒවායේ ගාස්තු අඩු කරන විධියටයි මේ ගැසට් නිවේදනය නිකුත් විය යුත්තේ. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා එකක්, දෙකක් ගැන කිව්වා. ඒක හොඳයි. නමුත් පොදුවේ විය යුත්තේ මහා පරිමාණ සමාගම්වලින් ඒ ගාස්තුව වැඩිපුර අය කිරීමත්, ගම් මට්ටමේ තිබෙන කුඩා සමිතිවලින් ඒ අය කරන ගාස්තුව අඩු කරන දිශාවට ඒක වෙනස්වීමයි.

අනෙක් පැත්තට මේ ආයතනවලින් ගාස්තු අය කර ගන්නා ක්‍රමවලින් ආණ්ඩුවේ ආදායම වැඩි කර ගන්නවා වෙනුවට නිෂ්පාදනය මත ආදායම වැඩි කර ගැනීමේ ක්‍රමවේදයකට යා යුතු වෙනවා.

ඒ නිෂ්පාදනයට යන්න තමයි, Mantai Salt Limited, පුල්මුඩේ ඛනිජ නිධිය සහ හම්බන්තොට Lanka Salt Limited ගැන මම කිව්වේ. ඒවා නිෂ්පාදන සමාගම්. එම සමාගම්වල නිෂ්පාදනය වැඩි කරලා, තමන්ගේ ආදායම වැඩි කරගන්න. ඒක තමයි ආණ්ඩුව කළ යුත්තේ. ඒ නිසා ඒවා විකුණන්නේ නැතිව, ඒවායේ නිෂ්පාදනයෙන් ආදායම වැඩි කරගන්නා දිසාවට නීතිය හදලා, එතැනින් රටේ නිෂ්පාදනයත්, රැකියා උත්පාදනයත් වැඩි කරලා රටේ ආදායම වැඩිකරගන්න පුළුවන්කම තිබෙනවා. එහෙම නොකර, මෙවැනි ගැසට් නිවේදන මඟින් මේ පුංචි සමිතිවලින් අයකරන ගාස්තු වැඩි කරන එක අසාධාරණයි; අයුක්තිසහගතයි. එසේ නොකරන ලෙසත්, නිෂ්පාදනයෙන් ආදායම වැඩි කරගන්නා දිසාවට යොමු වන ලෙසත් ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.24]

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාගම් පනත යටතේ නව සමාගම් ලියා පදිංචි කිරීම පිළිබඳව අද උදේ සිට කරන මේ සාකච්ඡාවට එකතු වෙලා මටත් කෙටියෙන් හෝ අදහස් දක්වන්න අවස්ථාව ලබාදීම පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද උදේ සිට අප සවන් දුන් කථාවලින් විවිධ කාරණා ඉදිරිපත් වුණා. යම් කාරණයක් ඉෂ්ට කිරීමට යාමේදී අපට එහි යම් යම් දෝෂ පෙනෙන්න පුළුවන්. මේ නියෝග ක්‍රියාත්මක කිරීමේදීත් යම් යම් සමිති සමාගම්වලට අසාධාරණයක් සිද්ධ වන බව ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාගේ කථාවේදී කිව්වා. හැබැයි, මේවාට

සම්බන්ධ පනත් නිවැරදි විය යුතුව තිබෙනවා. ඒ පනත් පාර්ලිමේන්තුව තුළින් සම්මත විය යුතුව තිබෙනවා. විශේෂයෙන්ම කුඩා සමිති සමාගම්වලට බදු පැනවීම ගැන අපට එකඟතාවක් පළ කරන්න බැහැ. මෙම නියෝගවල අපට එහෙම දෙයක් පැහැදිලිව සඳහන් කරලාත් නැහැ. විනිවිදභාවයෙන් යුක්තව යම් කිසි කාරණයක් සිද්ධ කරනවා නම්, රටේ ජනතාව එයට එකඟතාව ප්‍රකාශ කරනවා. එම නිසා ඒ කාරණය එසේ සිද්ධ විය යුතුව තිබෙනවා. ඒ වාගේම සමාගම් ලියා පදිංචි කිරීමේදී පැනවෙන ගාස්තු එම මුදලේ අගයත් සමඟ යම් යම් සංශෝධනවලට ලක් කළ යුතුව තිබෙනවා. මේ නව කාරණා කටයුතු සමඟ යම් යම් සංශෝධන කළ යුතුයි කියා මා හිතනවා. ඒ සංශෝධන තුළින් මේ රටේ ආර්ථික තත්ත්වයේ දියුණුවට යම් යම් කාරණා කටයුතු එකතු වන බවක් අප දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත්, මමත් නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේ කෙරෙන පිත්තල කර්මාන්තය පිළිබඳව ඊළඟට මා කියන්නම්. අද එම ප්‍රදේශවල මේ කර්මාන්තය කරගෙන යන්න බැරිව කඩා වැටිලා තිබෙනවා. මොකද, රටේ තිබෙන පිත්තල නොයෙක් ආකාරයෙන් විදේශ රටවලට විකිණීම නිසාත්, මේ පිත්තල එකතු කරන කර්මාන්තකරුවන්ට ලැබිය යුතු යම් යම් සහන නොලැබීමත් නිසාත්. එම නිසා ගරු අමාත්‍යතුමාටත්, ඒ වාගේම මේ ක්ෂේත්‍රය පිළිබඳව දන්නා සියලුදෙනාටත් මා ඉතා කාරුණිකව මතක් කර සිටිනවා, මේ පිත්තල කර්මාන්තය පිළිබඳව මීට වඩා ගැඹුරින් කටයුතු කරනවා නම් හොඳයි කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ඒ ගැන දන්නවා. ඔබතුමා නියෝජනය කරන උඩුනුවර ආසනයේ විශාල පිරිසක් පිත්තල කර්මාන්තයේ නියැලී සිටිනවා. ඒ සියලු දෙනා අද ඉතා අමාරු තත්ත්වයක ඉඳගෙන තමයි මේ කර්මාන්තය ගෙන යන්නේ. එම නිසා පිත්තල කර්මාන්තය පිළිබඳව අප මීට වඩා සැලකිලිමත්ව කටයුතු කළ යුතුව තිබෙනවා. ඊළඟට, අබලි ද්‍රව්‍ය, යකඩ එකතු කරන කර්මාන්තකරුවනුත් යම් යම් බාධා තුළ ඉඳගෙන තමයි ඒ කටයුත්ත කරගෙන යන්නේ. මට ලැබී තිබෙන කෙටි කාලය මෙවැනි ඉතාම වැදගත් කාරණා කීපයක් කියන්නයි මා යොදා ගන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් කාරණයක් කියන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා. පසුගිය දිනක ගම්පොළ ප්‍රදේශයේ පුද්ගලයන් දෙදෙනෙක් පැහැර ගෙන, ඔවුන් කොළඹ ප්‍රදේශයේ පොලිසියකට ගෙනැත්, ඉතා අමානුෂික ලෙස පහර දීලා තිබෙනවා. මම ගම්පොළ ප්‍රදේශයට ගිහින් එහි පොලිස් අධිකාරිතුමාගෙන්, HQI මහත්මයාගෙන් මේ පිළිබඳව විමසුවා. ගම්පොළ ප්‍රදේශයේ දෙදෙනෙක් කොළඹ පොලිසියකට ගෙනාවා කියා ඒ කිසිම කෙනෙක් කිසිම දවසක දැනගෙන ඉඳලා නැහැ. ඒ අයට ඉතා අමානුෂිකව පහර දීලා, පෙට්‍රල් දමලා තිබෙනවා. එක පුද්ගලයෙක් ඇවිදින්න බැරිව රෝහල්ගත කර තිබෙනවා. අන්තිමට ඒ අය ගම්පොළ පොලීසියට භාර දීමට ගිය අවස්ථාවේ ඒ තුවාල දැකලා, ගම්පොළ පොලීසිය ඒ අය භාර ගන්න බැහැයි කියලා තිබෙනවා.

ඊට පස්සේ රාත්‍රී 12.00ට විතර මහෙස්ත්‍රාත්තුමිය ළඟට ඉදිරිපත් කරලා තිබෙන්නේ ඒ අය ළඟ ගංජා තිබුණාය කියලායි. ගංජා තිබුණා නම් ඒ වෙලාවේම ගම්පොළ පොලීසියට භාර දීලා මහෙස්ත්‍රාත්තුමිය වෙත ඉදිරිපත් කරන්න තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යහපාලන ආණ්ඩුවේ අර යම පාලකයෝ ටික තවමත් හොල්මන් කරමින් සිටිනවා. යහපාලන ආණ්ඩුව ගෙන යාමට විරුද්ධව කරන බාධාවන් තමයි මේ සිද්ධ වන්නේ. හිටපු ජනාධිපතිතුමාට මීට අවුරුදු දෙකකට කලින් ගෙදර යන්න සිද්ධ වුණේත් මේ යම පාලකයෝ නිසායි. මේවා නිවැරදි විය යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. අපි එකම දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු. එම නිසා මෙවැනි අසාධාරණකම් සිද්ධ වීමට ඉඩ නොතබන ලෙසත්, මේ සිද්ධිය පිළිබඳව වහාම පරීක්ෂණයක් පවත්වලා එම නිලධාරින්ට දඬුවම් ලබා දෙන ලෙසත් මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාගම් පනත සහ සමිති ආඥාපනත යටතේ ඉදිරිපත් කර තිබෙන නියෝග පිළිබඳව මේ ගරු සභාවේ විවාද කරන අවස්ථාවේ මේ සිද්ධිය සම්බන්ධයෙන් කථා කරන්නට සිදු වීම පිළිබඳව මම කනගාටු වෙනවා. එහෙත් අපේ මැතිවරණ කොට්ඨාසයේ ඉන්න ජනතාවට, අපේ මැතිවරණ කොට්ඨාසයේ ඉන්න පුරවැසියන්ට සිදු වුණු අසාධාරණයක් නිසායි, මා මෙම කාරණය මේ අවස්ථාවේ මතු කළේ. මේ සම්බන්ධයෙන් පොලිස්පතිතුමාටත් දන්වා තිබෙනවා. පොලිසියේ නිලධාරීන් 12 දෙනෙක් ගිහිල්ලා තමයි මේ අයව ඇද ගෙන ඇවිල්ලා, එල්ලලා පහර දී තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් උසාවියේදී සාක්ෂි මෙහෙයවලා තිබෙනවා. CCTV තුවක්කුවක් තමයි ඉල්ලලා තිබෙන්නේ. ඒ මිනිස්සු ඒ තුවක්කු ගැන දන්නේත් නැහැ. මම හිතන විධියට වැරදීමකින් තමයි මේ අහිංසක මිනිස්සු පොලීසියට ගෙනැල්ලා තිබෙන්නේ. කුකුල් ෆාම් එකක් කර ගෙන, ළමයි තුන් දෙනෙක් රක්ෂා කර ගෙන සිටි අවුරුදු 40ක පුද්ගලයෙක් තමයි රෝහල්ගත වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ රටේ නීතිය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව ජනතාව තුළ නැවත නැවතත් සැක මතු වෙනවා. යහපාලන ආණ්ඩුව ඉතාමත් විනිවිදභාවයෙන් යුතුව වැඩ කටයුතු කරන මේ අවස්ථාවේදී පොලීසියේ නිලධාරීන් විතරක් නොවෙයි, හැම ආයතනයකම ඉන්න නිලධාරීන් මෙවැනි අඩු පාඩුකම් සිදු කරන අවස්ථා තිබෙනවා. එම නිසා නීතිය ක්‍රියාත්මක කිරීමේදී මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිමින්, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

ඊළඟට ගරු රොෂාන් රණසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.31]

ගරු රොෂාන් රණසිංහ මහතා
(மாண்புமிகு ரொசான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාගම් පනත සහ සමිති ආඥා පනත යටතේ ඉදිරිපත් කරන නියෝගත්, සමාගම් පනත යටතේ ඉදිරිපත් කරන නියෝගත් පිළිබඳව සාකච්ඡා කරන මේ විවාදයේදී කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

ප්‍රථමයෙන්ම ආයතනයක් සඳහා වාර්ෂිකව ගෙවිය යුතු බද්ද - මෙතෙක් කල් කිසිම දවසක නොනිබුණු බද්දක් - රුපියල් 60,000ක් දක්වා වැඩි කිරීම ආයතන ලියා පදිංචිය අඩු කරන එක යෝජනාවක් විධියට තමයි අපි දකින්නේ. ඊට හේතුව මේ තුළින් ආයතනයක් ලියා පදිංචි කිරීමේ උනන්දුව අඩු වෙනවා. ආයතන ලියා පදිංචි කළ පමණින් රටක් දුවන්න හැකියාවක්වත්, ඒ ආයතනවල ආර්ථිකය ගොඩනඟන්න හැකියාවක්වත් නැහැ.

[ගරු රොෂාන් රණසිංහ මහතා]

අද මේ ගරු සභාව තුළ කථා කළ ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් මන්ත්‍රීතුමන්ලා අතර පසු ගිය කාලය පිළිබඳව කථා කිරීමේදී තද බල වාග් ප්‍රහාර එල්ල වුණා. අපි කාලයෙන් කාලයට වුණු අඩු පාඩු ගැන කථා කරනවාට වඩා, අපේ ආර්ථිකයේ ප්‍රගතිය වාගේම අප රට තුළ අලුතින් ආරම්භ කරන්න යන හෝ, දැනටමත් තිබෙන සමාගම් මේ රටේ ආර්ථිකයට කොයි තරම් දායකත්වයක් ලබා දෙනවාද, රජයක් විසින් ඒ සමාගම් දිරිමත් කරන්න මොන විධියේ සහයෝගයක් ලබා දෙනවාද කියන එක තමයි අපි සොයා බැලිය යුත්තේ. නමුත් පසු ගිය අය වැය යෝජනා තුළින් සමාගම්වලට අදාළ බදු සම්පූර්ණයෙන්ම වැඩි කරන්න යෝජනා වෙලා තිබෙනවා.

වැට් එක සියයට 11 සිට 15 දක්වා වැඩි කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. සියයට 12.5ක්ව තිබුණු ආයතනික ආදායම් බද්ද සියයට 14 දක්වා වැඩි කළා. ඒ කියන්නේ, මිලියන 5ට අඩු ලාභයක් ලබන ආයතන ඒ බද්දට යටත් වෙනවා. ඒ වාගේම, මිලියන 5ට වැඩි ලාභයක් ලබන ආයතනවල සියයට 28ක් තිබුණු බද්ද සියයට 40 දක්වා වැඩි කළා. කෘෂිකර්ම නිෂ්පාදනය මත තිබුණු සියයට 12ක බද්ද සියයට 14ක් කරන්නත්, සංචාරක කර්මාන්තය තුළ පනවා තිබුණ සියයට 12ක බද්ද, සියයට 28ක් දක්වා වැඩි කරන්නත් කටයුතු කළා. ඒ වාගේම, ආයතනික ආර්ථික සේවා බද්ද මිලියන 50ට අඩු නම් - 2.5යි තිබුණේ.- මේ බද්ද මිලියන 50 නොව මිලියන 12 සීමාවට අරගෙන දශම 5 දක්වා වැඩි කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රිසාඩ් බදියුදීන් ඇමතිතුමා කථා කරන්න.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
රුපියල් 60,000ක් අවුරුද්දක් පාසා ගෙවන්න ඕනෑ එක 2017 ජනවාරි ඉඳලා අපි අය කරන්නේ නැහැ. අපි ඒක නතර කරලා තිබෙනවා.

ගරු රොෂාන් රණසිංහ මහතා
(மாண்புமிகு ரொசான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා.

ඇත්තටම ඒක ඉතාම වැදගත්. මොකද, ආයතනයක් ලියා පදිංචි කරද්දී ගරු ඇමතිතුමා රුපියල් 60,000ක් වර්ෂයකට ගෙවනවා කියන එක සුළු පටු මුදලක් නොවෙයි. ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා. අපි එතැනදී මතක් කරන්න බලාපොරොත්තු වෙන කාරණා කීපයක් තිබෙනවා. ලියා පදිංචි කරනු ලබන ආයතන මත මෙවැනි බදු පැටවීම නිසා එක පැත්තකින් මේ රටේ සංචාරක කර්මාන්තය සම්පූර්ණයෙන්ම කඩා වැටිලා. ගරු ඇමතිතුමනි, ඒ නිර්ණායක තුළ ඔබතුමා ඒක දකිනවා. අපේ ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. ආර්ථිකය පිළිබඳව හොඳ අත් දැකීම් තිබෙන නියෝජ්‍ය ඇමතිවරයෙක් විධියට එතුමා මේ සම්බන්ධයෙන් පැහැදිලි කරයි කියලා මම හිතනවා. මොකද, එතුමා බොරු කියන්නේ නැති, ඇත්ත කථා කරන නියෝජ්‍ය ඇමතිවරයෙක්.

ඊළඟ කාරණය තමයි, වෙළෙඳ ශේෂය. ආනයන වැඩි වෙලා. අපේ රටේ අපනයන අඩු වෙලා. අපනයන සම්පූර්ණයෙන්ම කඩා වැටිලා. දේශීය කෘෂි කර්මාන්තය අධෛර්යවත් කරලා මේ රටට අවශ්‍ය සහල්, මුං ඇට, මිරිස්, මේ සියල්ලම ගෙන්වන නිසා ආනයනයට යන වියදම වැඩි වෙලා අද වෙළෙඳ ශේෂයේ පරතරය වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, 2014දී ඇමෙරිකානු ඩොලර් මිලියන 1,635ක් තිබුණු විදේශ ආයෝජන අද වන විට ඇමෙරිකානු ඩොලර් මිලියන 400ට බැහැලා තිබෙනවා. මේකට හේතුව කුමක්ද? බ්ලූම්බර්ග් වාර්තාවට අනුව ශ්‍රී ලංකාව ආයෝජනයට රතු කලාපයක් කරලා තිබෙනවා. මේවාට ගෙනෙන විසඳුම් මොනවාද? ඇයි, මේ විධියට මේ රටේ ආර්ථිකය කඩා වැටෙන්නේ? විරැකියාව සියයට 4.3 සිට 4.7 දක්වා වැඩි වෙලා තිබෙනවා. අද තිබෙන පොලී අනුපාතයත් එක්ක ව්‍යාපාරයක් කරගෙන යන්නේ කොහොමද?

මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පාලන කාලයේ සියයට 7ට, 8ට තිබුණු පොලී අනුපාතය අද වන විට සියයට 15ක්, 18ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ එක පැත්තකින් විතරයි. විශේෂයෙන්ම මූල්‍ය ආයතන කළමනාකාරිත්වයක් සිදු වෙන්න ඕනෑ. මොකද, අද සියයට 40 ගන්න කළු කඩ පොලීකාරයෝ ඉන්නවා. මේ පිළිබඳව විශේෂ අවධානයක් දෙන්න ඕනෑ. මේක එදත් තිබුණා, අදත් තිබෙනවා. එක් එක් නම්වලින් ආයතන හැටහුටහමාරක් තිබෙනවා. මේ ආයතනවල අය කරන පොලිය සියයට 40යි, සියයට 38යි, සියයට 50යි. ඒ නිසා මූල්‍ය ක්ෂේත්‍රයේ ආයතන කළමනාකාරිත්වයක් සිදු විය යුතුයි. ඒක එදා ඉඳලාම මේ රට තුළ තිබුණු අඩු පාඩුවක් විධියට අපි දකිනවා. ඒ නිසා මේ පිළිබඳව අපේ අවධානය දෙන්න ඕනෑ. එක පැත්තකින් විනිමය අනුපාතය. අද ව්‍යාපාරයක් කොහොමද, කරගෙන යන්නේ? ඩොලරයේ අගය ශීඝ්‍රයෙන් ඉහළ යනවා, රුපියල කඩා වැටෙනවා. මේ අවදානම් තත්ත්වයට දෙන විසඳුම මොකක්ද?

කොටස් වෙළෙඳ පොළ ගත්තාම, කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කළ හැම කෙනෙකුම අද ආයෝජනය කරන්නේ නැහැයි කියන එක පෙනෙනවා. රජයේ සේවයක් කරලා යම් මුදලක් කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කළා නම් එම පුද්ගලයා පවා කියන්නේ, "අයියෝ! කොටස් වෙළෙඳ පොළ හින්දා අපි ඉවරයි." කියලායි. එදා, කොටස් වෙළෙඳ පොළේ මිල දර්ශකය 7,299 කාණ්ඩයේ තිබුණේ. අද එය 6,140ට -සියයට 15.2කින්- කඩා වැටී තිබෙනවා. ඒ නිසා ආර්ථික වර්ධන වේගය සියයට 4.8 සිට 4.1 දක්වා පහළට වැටී තිබෙනවා. හැබැයි, මේ සියල්ල සිදු වෙද්දී, බදු ආදායම් පැත්ත බලන්න.

මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩු කාලයේ කෝටි එක්ලක්ෂ පන්දහසක් තිබුණු බදු ආදායම මේ වෙනකොට සියයට 80කින් වැඩි වෙලා. මේ රටේ සමාගම්වලින් අය කරන බදු ආදායම පමණක් කෝටි එක්ලක්ෂ අසූදෙදහසකට වැඩි වෙලා තිබෙනවා. එදා, විපක්ෂයේ සිටියදී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමන්ලා නොයෙක් යෝජනා ගෙනා ආකාරය අපි දැක්කා. එතුමන්ලා තරුණ මන්ත්‍රීවරුන් විධියට නොයෙක් අදහස් දැක්වුවා. හැබැයි, අද එක්සත් ජාතික පක්ෂය නායකත්වය දරන රජයක් තුළ මේවා සිද්ධ නොවෙන්නේ ඇයි කියන එකයි අපට තිබෙන ප්‍රශ්නය. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ රජය හොඳ නැහැ කියලා, එම රජයේ තිබුණු අඩු පාඩු විවේචනය කරලා, මේ රටේ ජනතාව එක පැත්තකින් නොමඟ යවලා ආණ්ඩු බලය ගත්තාට පසුව මේ රටේ ආර්ථිකය දිනෙන් දින පහළට යනවා නම්, මේකට ගෙනෙන විසඳුම කුමක්ද කියන එක අපි අහනවා.

ඊයේ-පෙරේදා ගරු කථානායකතුමා අපේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් පොදු රාජ්‍ය මණ්ඩලයේ පාර්ලිමේන්තු සංගමයේ සේවාව පිළිබඳව වැඩ මුළුවකට යැව්වා. එතැනදී කථා බහට ලක් වුණේ, මැද-පෙරදිග යන කාන්තාවන්ට අත්වන ඉරණම ගැනයි. එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක්ද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ

ආණ්ඩුවක්ද කියන ප්‍රශ්නය නොවෙයි තිබෙන්නේ. ගෘහ සේවය සඳහා මේ රටේ කාන්තාවන් පිට රට යවන එක අපි නතර කළ යුතුයි. ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළක් ගෙන යා යුතුයි. ඒ වෙනුවෙන් මේ රට තුළ තිබෙන අපේ ව්‍යාපාර, ආයතන, සමාගම් දියුණු විය යුතුයි. ඒවා දියුණු කරනවා වෙනුවට අපේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා කිව්වා වාගේ රජය සතු ආයතනවලට කරන්නේ මොනවාද? ලාභ ලබන ආයතන ටිකත් විකුණනවා. ලුණු සමාගම, ඇපලෝ රෝහල, හිල්ටන් හෝටලය යනාදී මේවා ලාභ ලබන ආයතන. ලාභ ලබන ආයතන ටිකත් විකුණනවා. මෙය නොවෙයි, සිදු විය යුත්තේ.

ලාභ ලබන ආයතන තවත් ශක්තිමත් කරනවා වාගේම මේ රට තුළ පාඩු ලබන යම් යම් ව්‍යාපාර, ආයතන තිබෙනවා නම් එම ව්‍යාපාර තුළ හරියාකාර කළමනාකාරීත්වයක් සිදු කළ යුතුයි. එදා, ශ්‍රීලන්කන් ගුවන් සමාගම පාඩු ලබනවා කියලා කියනවා. හැබැයි, ඒක වෙනස් විය යුතුයි. ඇයි, ශ්‍රීලන්කන් ගුවන් සමාගම ලාභ ලබන තත්ත්වයට හරවන්න බැරි? ඒ සඳහා අවධානය නොදී මේ රාජ්‍ය සම්පත් ටික කුණුකොල්ලෙට විකුණන වැඩ පිළිවෙළ දිගින් දිගටම සිද්ධ කරන්නේ ඇයි? ඒ නිසා රජය සතු සියලු සම්පත් ටික විකුණා දමා, ආණ්ඩුවක් විධියට අත් බැඳ ගෙන, මිනිසුන්ට බදු ගහලා මිනිසුන්ගේ ගෙල තද කරන ප්‍රතිපත්තියෙන් අයින් වෙලා මේ රටට ප්‍රායෝගික වැඩ පිළිවෙළක් සිද්ධ වෙන්න ඕනෑ. අද එම වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම සිද්ධ වෙන්නේ නැහැ කියන මම පැහැදිලිවම කියනවා.

මම මෙතැනදී කථා කරන්නේ, දේශපාලන පක්ෂයක මතයක් අනුව වාසියක් ගන්න නොවෙයි. රටේ ජනතාවගේ මතය මෙයයි. රටේ ජනතාව අද බදු බරින් මිරිකිලා සිටින්නේ. මේ රටේ ආයතන අද කරගෙන යන්න බැහැ. අද ආයතන හිමිකරුවන් අසරණ වෙලා. මේකයි අද තිබෙන තත්ත්වය.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

ගරු රොෂාන් රණසිංහ මහතා
(மாண்புமிகு ரொசான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

අපි විශේෂයෙන්ම ඉල්ලන්නේ, විශේෂයෙන්ම අවධානය දෙන්න කියන්නේ, මේ රටේ ආර්ථික දර්ශක සියල්ල දිගින් දිගටම කඩා වැටිලා තිබෙන නිසායි. ආර්ථික දර්ශක සියල්ල! ආර්ථික දර්ශකයේ නිර්ණායකයක් වන Fitch වාර්තාව, Moody's වාර්තාව, S & P වාර්තාව යන මේ සියල්ල තුළින් පෙන්වන්නේ මේ රට ආර්ථික වශයෙන් පරිහාණියට වැටෙන රටක් විධියට අද පත් වෙලා තිබෙන බවයි. කථාවලින්, වචනවලින් කියනවා. "අරවා කරනවා, මේවා කරනවා" කියලා. රැකියා දස ලක්ෂයක් දෙනවා කියලා දැන් අවුරුදු දෙකහමාරක් ඉවරයි. අවුරුදු පහෙන් රැකියා දස ලක්ෂයක් ලබා දෙනවා නම් මේ වන විට යහ පාලන රැකියා ලක්ෂ පහක් බිහි කරලා තිබෙන්න ඕනෑ. මේ දේවල් නිකම් වචනවලට සීමා නොකර, "අද කරනවා, හෙට කරනවා" කියලා යෝජනා ගෙනෙන්නේ නැතිව, මේ රටේ ජනතාව වෙනුවෙනුත් මේ රටේ ආර්ථිකය සුරක්ෂිත කිරීමට නිසි වැඩ පිළිවෙළක් ගෙනෙන්න කියන ඉල්ලීම අපි කරනවා. ඒ ඉල්ලීම කරමින් මට කාලය ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට මගේ ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා. .

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මොකක්ද point of Order එක?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)uQ
(The Hon. Chandrasiri Gajadeera)
එක්සත් ජාතික පක්ෂයටත් ආණ්ඩුව එපා වෙලා වාගේ. මේ අවස්ථාවේදී සභා ගැබේ කවුරුවත් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාට විනාඩි 15ක කාලයක් වෙන්ව තිබෙනවා.

[අ.භා. 2.45]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of Foreign Affairs)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද අපි මේ සංශෝධනවලින් කරන්න බලාපොරොත්තු වන්නේ මොකක්ද කියන එක ගැන පොඩි පැහැදිලි කිරීමක් සිදු කිරීම වැදගත් වෙනවා කියලායි මම හිතන්නේ. ගරු රිසාඩ් බදියුදීන් ඇමැතිතුමාගේ අමාත්‍යාංශයෙන් තමයි මේ කටයුත්ත කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් ලංකාවේ වැඩිපුරම ලියා පදිංචි වන්නේ පෞද්ගලික සමාගම්. නිවැරදියි නේ. ඒ කියන්නේ තනි ව්‍යාපාර තිබෙනවා, හවුල් ව්‍යාපාර තිබෙනවා. ඒවා පළාත් සභාවටයි අයිති. රජයට අයිති නැහැ. ඒ කියන්නේ සමාගම් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට අයිති වෙන්නේ පෞද්ගලික සමාගම්, පොදු සමාගම්, සීමාරහිත සමාගම්, ඇපයෙන් සීමාසහිත සමාගම් යනාදී ඒවායි. අද අපේ රටේ වැඩිපුරම තිබෙන්නේ සීමාසහිත පෞද්ගලික සමාගම්. අපි ඒවාට කියනවා, "Private limited liability companies," කියලා. ලංකාවේ සීමාසහිත පෞද්ගලික සමාගම් 72,894ක් තිබෙනවා. -දැන් මම අපේ නිලධාරීන්ගෙන් ඇහුව.- "දවසකට මෙවැනි සමාගම් කීයක් විතර ලියා පදිංචි වෙනවාද" කියලා මම ඇහුවා. ඔවුන් කිව්වා, "දවසකට සමාගම් 40ක් විතර ලියා පදිංචි වෙනවා" කියලා. මෙවැනි සමාගමක් ලියා පදිංචි කරන්න කලින් යම් කිසි ගාස්තුවක් අය කළා. ඒ තමයි රුපියල් 15,000. අද ගෙනෙන සංශෝධනයෙන් කරන්නේ මේ රුපියල් 15,000ක ගාස්තුව රුපියල් 4,000කට අඩු කිරීමයි.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම වගකීමෙන් කියන්නේ මෙතැන වැඩිපුරම ලියාපදිංචි වෙන්නේ සීමාසහිත පෞද්ගලික සමාගම්, එනම් Private limited liability companies. මෙපමණ කාලයක් ඒ සඳහා රුපියල් 15,000ක් ගෙවන්න තිබුණා. අද මේ සංශෝධනයෙන් කරන්නේ එම මුදල රුපියල් 4,000ට අඩු කිරීමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට ඒක තමයි වැදගත් කාරණාව. ඒක තමයි වෙන්න ඕනෑ. ඒ වෙනුවෙන් ගරු ඇමැතිතුමාට අපේ ප්‍රශංසාව හිමි කරනවා. මොකද, එතුමා ඒ ප්‍රශ්නය තේරුම් අරගෙන ඒ ලියාපදිංචි ගාස්තුව අඩු කරලා තිබෙනවා.

ඊළඟට තිබෙනවා, සීමාසහිත පොදු සමාගම්, එනම් "Public companies" කියන ඒවා. මේවා මහ විශාල ව්‍යාපාර. එහෙම නේ? මේවායේ ලියා පදිංචි ගාස්තුව රුපියල් 15,000 සිට 20,000 දක්වා වැඩි කරලා තිබෙනවා. ඊළඟට, සීමාරහිත සමාගම් ලියාපදංචි ගාස්තුව රුපියල් 10,000 සිට 15,000 යනාදී වශයෙන් පොඩි ගණන්වලින් වැඩි කරලා තිබෙනවා. නමුත් වැදගත් වන්නේ අර 72,894ක් වන පුද්ගලික සමාගම් ලියාපදිංචි කිරීම ඉදිරියේදී ඉතාම අඩු මුදලකට කරන්න පුළුවන් වීමයි. ඒකෙන් අපට බලාපොරොත්තු වන්න පුළුවන්, ඒ සමාගම් නෛතික රාමුවකට ඇතුළු වෙනවා කියලා. සීමාසහිත පුද්ගලික සමාගමක් වුණාම annual accounts ඉදිරිපත් කරන්න ඕනෑ; ඒවායේ directorsලාගේ තොරතුරු ඉදිරිපත් කරන්න ඕනෑ; ඒවායේ P&L ඉදිරිපත් කරන්න ඕනෑ. එතකොට මේකට යම් කිසි විධියක transparency එකක් - විනිවිදභාවයක්- එනවා. මම හිතන විධියට මේක හොඳ දෙයක්. අපි මෙය හොඳ දෙයක් හැටියට දකිනවා. ඒ සඳහා අපේ සහයෝගය අපි ලබා දෙනවා.

ගරු රොෂාන් රණසිංහ මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කරපු, තවත් සමහර මන්ත්‍රීවරුනුත් මෙතැන ප්‍රකාශ කරපු දෙයක් තමයි, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව මඟින් 2015 අය වැය යෝජනාවක් අනුව පෞද්ගලික සමාගම්වලට රුපියල් 60,000ක වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අය කළාය කියන කරුණ. ඊළඟට, කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත පොදු සමාගමකට රුපියල් ලක්ෂ පහක් සහ විදේශ සමාගම් ශාඛා කාර්යාලවලට රුපියල් ලක්ෂයක් 2016 වර්ෂයේදී අය කළා. නමුත්, ගරු මන්ත්‍රීතුමනි, 2016 වර්ෂයේ සිට මේ අය කිරීම කරන්නේ නැහැ. යම් කිසි අය කිරීමක් සිද්ධ කළා. රුපියල් 60,000 කථාව පිළිගන්නවා. 2016 වර්ෂයේදී එම අය කිරීම කළා. නමුත්, 2017 වර්ෂයේ සිට ඒක කරන්නේ නැහැ. ඒකට අවශ්‍ය නීතිමය රාමුව, ඒකට අවශ්‍ය ගැසට් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැහැ. එම නිසා දැන් යම් කිසි පුද්ගලයෙකු යම් කිසි ආයතනයක් පවත්වාගෙන යනවා නම්, ඒ අයට වාර්ෂිකව රුපියල් 60,000ක් ගෙවීමේ අවශ්‍යතාවක් නැහැ.

ගරු රොෂාන් රණසිංහ මහතා
(மாண்புமிகு ரொசான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)

මා එතැනදී විශේෂයෙන් එක් කරුණක් මතක් කරන්න ඕනෑ. මේක නීතියක් වන්න කලින් එක වර්ෂයක් මේ රුපියල් 60,000 අය කර ගෙන තිබෙනවා. එක වර්ෂයක් මේ රුපියල් 60,000 ගෙවපු ආයතන විශාල ප්‍රමාණයක් තිබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඔව්, ඒක හරි.

ගරු රොෂාන් රණසිංහ මහතා
(மாண்புமிகு ரொசான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)

නීතියක් විධියට සම්මත නොවී බලයක් නොමැතිව මේ විධියට මුදල් අය කරන්නේ ඇයි? ඔබතුමාට යොමු කරන මගේ පළමුවන ප්‍රශ්නය ඒක.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දෙවෙනි කාරණය මෙයයි. ඇත්තටම ආයතනයක් ලියා පදිංචි කිරීමේ ගාස්තුව අඩු කිරීම ඉතා හොඳයි. මොකද හේතුව, මේ රටේ බදු ගෙවන මිනිහාගෙන් ඔහුව මිරිකා හෝ බදු අය කර ගන්නවා. තවත් කොටසක් ඉන්නවා, හොඳට ව්‍යාපාර කරනවා, කිසිම බද්දක් ගෙවන්නේ නැහැ. එම නිසා ඒක හොඳයි. නමුත්, අර රුපියල් 60,000 දැමීම සහ එක අවුරුද්දක් ඒ මුදල් ගැනීම නීත්‍යානුකූල නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහන්නේ වැදගත් ප්‍රශ්නයක්. රාජ්‍ය නිලධාරීන්ගේ කුටියේ සිටින නිලධාරීන්ගෙන් මම ප්‍රශ්න කරද්දි ඔවුන් කිව්වේ, 2016 වර්ෂයට ඉදිරිපත් කරපු අය වැය 2015 නොවැම්බර් මාසයේ 20වෙනි දා මේ පාර්ලිමේන්තුවෙන් සම්මත වෙලා තිබෙනවා, ඒ සම්මත වීමත් සමඟ තමයි ඔවුන් ඒ මුදල් අය කරලා තිබෙන්නේ කියලා.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

Final එකට ආවේ නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Final එකට කිව්වේ මොකක්ද?

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

සංශෝධිතවලදී ඉදිරිපත් කළා මිසක් final එකට ආවේ නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Final එකට ඇවිල්ලා තිබෙනවා.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

මූලිකව ඉදිරිපත් කරපු එකට තමයි ආවේ. මුදල් අමාත්‍යවරයා පාර්ලිමේන්තුවට පළමුවෙනි වරට ඉදිරිපත් කරපු අය වැයට පමණයි ආවේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු මන්ත්‍රීතුමනි, දෙසැම්බර් 19වන දා ඒක අනුමත වෙලා තිබෙනවා. ඒක යම් කිසි අත් වැරදීමක් වෙන්න ඇති. ඔබතුමා Library එකෙන් සොයා බලන්න. දෙසැම්බර් මාසයේ 19වෙනි දා එය අනුමත වෙලා තිබෙනවා. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් ඒක අය කරලා තිබෙන්නේ ඒ නීතිමය තත්ත්වය මතයි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*மாண்புமிகு சந்திரசிறி கஜதீர*)
(The Hon. Chandrasiri Gajadeera)
ඒක ගැසට් කළාද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(*மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா*)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒක ගැසට් කරලා නැහැ. ඒක මුදල් අමාත්‍යාංශයෙන් කළ යුතු දෙයක්. මට නිලධාරීන් කියන්නේ ඒක ගැසට් කරලා නැහැ කියලායි. ඒ කෙසේ වෙතත් මේ ගැසට් එකේ ඒක ඉදිරිපත් කරලා නැහැ, ගරු මන්ත්‍රීවරුනි. මා හිතන විධියට ඒ මූලික පැහැදිලි කිරීම කරන්න අවශ්‍ය වුණා. එතකොට මෙම නියෝගය මඟින් අපි රුපියල් 15,000ට තිබුණු ලියා පදිංචි ගාස්තුව රුපියල් 4,000ට අඩු කරලා තිබෙනවා. ඔව්, කොටස් වෙළඳපොළේ යම් කිසි කඩා වැටීමක් කාලයක් තිස්සේ තිබුණා. නමුත්, ළඟකදී ඉඳලා අපි දකිනවා, කොටස් වෙළෙඳපොළ ශීඝ්‍රයෙන් ඉහළට යන්න පටන් ගෙන තිබෙන බව. දැන් අපට අවශ්‍ය වන්නේ කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ආයතන හරහා මේ රටේ සංවර්ධනය ඇති කරලා ගමේ, නගරයේ සාමාන්‍ය පුද්ගලයන්ට -ඒ ව්‍යවසායකයන්ට- තමන්ගේ ආර්ථිකය දියුණු කර ගන්න අවස්ථාවක් ලබා දීමයි. එම නිසා ආණ්ඩුව ඒ වැඩ පිළිවෙළ ඒ ආකාරයට ඉස්සරහට ගෙන යනවා. මේ යන අතර වාරයේ තමයි හෙට සමහරු වැඩ වර්ජනයක් කරන්න ලැහැස්ති වෙලා ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමෙරිකාවේ හිටපු ජනාධිපති බැරක් ඔබාමා කරන ලද ප්‍රකාශයකින් පොඩි ඡේදයක් කියවන්න මම කැමැතියි. මේ ඊයේ-පෙරේදා හොවර්ඩ් විශ්වවිද්‍යාලයේදී තමයි එතුමා මේ ප්‍රකාශය කරන්නේ. එතුමා කළ ප්‍රකාශය අපි කවුරුත් උනන්දුවෙන් සවන් දුන්නොත් හොඳයි කියලා මා හිතනවා.

Sir, I quote:

> "And democracy requires compromise, even when you are 100 per cent right. This is hard to explain sometimes. You can be completely right, and you still are going to have to engage folks who disagree with you. If you think that the only way forward is to be as uncompromising as possible, you will feel good about yourself, you will enjoy a certain moral purity, but you are not going to get what you want. And if you do not get what you want long enough, you will eventually think the whole system is rigged. And that will lead to more cynicism, and less participation, and a downward spiral of more injustice and more anger and more despair."

මම හිතන විධියට ඒක ඉතාමත් වැදගත් කථාවක්. අපි දන්නවා, සමහර අවස්ථාවලදී අපි සියයට 100ක් නිවැරදියි කියා. නමුත් මොනයම් හේතුවක් නිසා හෝ අප විවේචනය කරන පුද්ගලයින් කියනවා, "ඔබ වැරදියි" කියලා. එහෙම නම් අපි මොකක්ද කළ යුත්තේ? Even if you are 100 per cent right, democracy requires compromise. "Compromise" කියන වචනයේ සිංහල තේරුම මොකක්ද? පාර්ලිමේන්තුවේ කථා පරිවර්තක අංශයේ නේ වැඩිපුරම translatorsලා ඉන්නේ. මම ඔවුන්ගෙන් ඇහුවා, "compromise" කියන වචනයට සිංහල වචනයක් තිබෙනවාද කියලා. අද මහාචාර්ය රොහාන් සමරජීව මැතිතුමා "Daily FT" කියන පත්තරයට ලියලා මේ SAITM විරෝධී වැඩ වර්ජනය පිළිබඳව කියනවා, "compromise" කියන වචනයට සිංහල භාෂාවේ translation එකක් නැහැයි කියලා. In the Sinhala language, there is no single word for "compromise". When a language lacks a word, it begs the question why. Is it that the people who speak Sinhala see no need for compromise? මේක අපි හිතන්න ඕනෑ දෙයක්. නමුත් වචන කිහිපයකින් අපට මේක කියන්න පුළුවන්.

ඔබ සියයට 100ක් නිවැරදි වුණත් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් සමඟියෙන් හා සම්මුතියෙන් කටයුතු කරන්න අපට සිද්ධ වෙනවා. ඔබ සම්පූර්ණයෙන්ම නිවැරදි වුණත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ ඔබ සමඟ එකඟ නොවන අයගේ අදහස්වලට කන් දීමට ඔබට සිද්ධ වෙනවා. දැන් ප්‍රජාතන්ත්‍රවාදී රජයක - හෙට එන වැඩ පිළිවෙළත් එක්ක ඇදා ගෙනයි මම මේ කථා කරන්නේ- අපේ කාර්ය භාරය මොකක්ද? SAITM එක ගැන කථා කරනකොට පෞද්ගලික උපකාරක පන්ති ආධාර කරගෙන වෛද්‍ය විද්‍යාලයට පැමිණිලා, පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපනයට එරෙහි වීමේ කුඛකත්වය පිළිබඳව අපට අමතක කරන්න බැහැ. නමුත් අපි ටිකකට අමතක කරමු. නමුත් බදු ගෙවන ජනතාවගේ මුදල්වලින් අධ්‍යාපනය ලබලා, බදු ගෙවන ජනතාවගේ මුදල්වලින් ලැබෙන වැටුපට, මෝටර් රථ වාහන බලපත්‍රයට අමතරව චැනල් සේවාවලින් මුදල් ඉපයීම සිදු කරලා, පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපනයට සදාචාරාත්මකව විරුද්ධ වෙන්න පුළුවන්ද කියන සාධාරණ ප්‍රශ්නය ජනතාව අහනවා. කෙසේ වුවත් පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපනය ලබා දීම සහ ඒ සඳහා අනුමැතිය ලබා දීමේ ජාතික ප්‍රතිපත්තියක් පිළිබඳව කථා කරනකොට, එවැනි සාකච්ඡාවකට සහභාගි වීමට ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් තුළ වෘත්තිය සමිතිවලට අයිතියක් තිබෙන බව අපි පිළිගන්නවා. ඒ අයිතිය තිබෙනවා. අපි ඒක පිළිගන්නවා. නමුත් මෙවැනි අර්බුදකාරී, සංකීර්ණ ගැටලුවක පාර්ශ්වකරුවන් බොහෝ දෙනෙක් අතුරින් 'වෘත්තිය සමිති' කියන්නේ එක පාර්ශ්වකරුවෙක් පමණයි.

අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය, SAITM පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ ශිෂ්‍යයින්, ඔවුන්ගේ දෙමව්පියන්, වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු මහතා ඇතුළු මේ ප්‍රශ්නයට සම්බන්ධ තවත් බොහෝ පාර්ශ්වකරුවන් ප්‍රමාණයක් ඉන්නවා. ඇත්ත වශයෙන්ම මට අමතක වෙලායි තිබුණේ, 'ආශා සෙන්ටල්' ඉස්පිරිතාලය හැදුවේ නෙවිල් ප්‍රනාන්දු දොස්තර මහත්මයායි. 'ආශා සෙන්ටල්' ඉස්පිරිතාලය විකිණුවාට පසුව දැන් ඒක ලොකු ඉස්පිරිතාලයක් හැටියට Softlogic එකෙන් පවත්වාගෙන යනවා. ඒ ඉස්පිරිතාලය විකුණලා තමයි එතුමා SAITM එක පටන් ගත්තේ. ඒ සියලු පාර්ශ්වකරුවන්ට මේ ගැටලුව විසඳා ගැනීමේ සාකච්ඡාවකට පැමිණීමට අයිතියක් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් තුළ තිබෙනවා. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදී රජයක වගකීම වෙන්නේ ඒ පාර්ශ්වකරුවන්ගේ ගැටෙන අරමුණු විසඳලා, ජාතික අවශ්‍යතාවකට අදාළ පරිදි විසඳුමක් ලබා දීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි වෛද්‍ය සේවා ලබා ගන්නා පාරිභෝගිකයින් ගැනත් අවධානය යොමු කරන්න ඕනෑ. අපේ දෙමව්පියන් වයසයි. අපේ දරුවන් අසනීප වෙනවා. ඒ වෛද්‍ය සේවා ලබා ගන්නා පාරිභෝගිකයිනුත් මේ වැඩ කටයුත්තේ පාර්ශ්වකරුවෙක් වෙනවා. ඒ නිසා කවුරු වුණත් සියයට 100ක් නිවැරදි වුණත් -අපි හිතමු, එහෙම වුණාය කියලා- ප්‍රශ්නයකට මැදිහත් වී සිටින එක කණ්ඩායමක් පමණක් සතුටු කිරීමට ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයකට, රජයකට නොහැකි බව අපි අවබෝධ කර ගන්න ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදී රජයක් සියලුදෙනාට ඇහුම්කන් දෙන්න ඕනෑ. මේ ගැටලුවට සම්බන්ධ වෙලා තිබෙන වෘත්තිය සමිති ඇතුළු සියලු පාර්ශ්වයන්ට තම අදහස් දැක්වීමට අවස්ථාව ලැබුණා. ජනාධිපතිතුමා ඒ අවස්ථාව ලබා දුන්නා. සියලු පාර්ශ්වකරුවෝ ජනාධිපතිතුමා හමු වුණා. ජනාධිපතිතුමා වෘත්තීය සමිති සාමාජිකයන් හමු වුණා; දොස්තර මහත්වරු හමු වුණා; දෙමව්පියෝ හමු වුණා; රජයේ ඇමතිවරු හමු වුණා; විශ්වවිද්‍යාල ආචාර්යවරු හමු වුණා. මේ සියලු දෙනා හමු වුණා. එහෙම නම් මොකක්ද compromise එක? සම්මුතියෙන් යුතු විසඳුම මොකක්ද? රජය සියලු පාර්ශ්වයන්ට ඇහුම්කන් දීලා තිබෙනවා. SAITM විශ්වවිද්‍යාලයේ සිසුන් අමතර විභාගවලට පෙනී සිටීමටත්, එය අයිති වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු මැතිතුමා තම නීතිමය අයිතිය අඩු කිරීමටත් පොරොන්දු වෙලා තිබෙනවා. මම

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

හිතන හැටියට එතුමා කියලා තිබෙනවා, 'මගෙන් SAITM එක ගන්න, එය පොදු ආයතනයක් හැටියට පවත්වා ගෙන යන්න' කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නිසා මෙම ගැටලුවට මැදි වී ඉන්න සියලු පාර්ශ්ව සම්මුතියෙන් යුතු විසඳුමක් සඳහා එකතු වීම ඉතාම වැදගත් බව මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. එහෙම නොවී, මේ ගැටලුවට සම්බන්ධ එක් පාර්ශ්වයක් පමණක් තර්ජනාත්මකව කටයුතු කිරීම ප්‍රජාතන්ත්‍ර විරෝධී වැඩ කටයුත්තක්ය කියන එකත් මම මතක් කරන්න කැමැතියි. එයින් පෙනෙන්නේ සමහර පාර්ශ්ව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයකට වැඩ කරන්න අකැමැති බවයි. මේ ආකාරයෙන් සිදු කරන වැඩ වර්ජන ප්‍රජාතන්ත්‍රවාදී වැඩ වර්ජන නොවෙයි. මම ඒක කියන්නේ මේ පාර්ලිමේන්තුවේදීයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට වැටිලා ඉන්න තත්ත්වයෙන් උඩට අරගෙන යන්න උත්සාහ කරන අවස්ථාවේ අපට compromise එකකට එන්න පුළුවන් වෙන්න ඕනෑ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඒකට උත්සාහ කරනවා. නමුත්, අදාළ ඇමතිවරයා බොහොම තර්ජනාත්මකව ප්‍රකාශ කරනකොට ඒ ප්‍රකෝපය වැඩි වෙනවා නේ. එවැනි compromise එකකට එන්න පුළුවන් විධියට නොවෙයි සමහර අය හැසිරෙන්නේ. ඔබතුමා කියන කාරණාවට අපින් එකඟයි. සාමූහිකව සාකච්ඡා කරලා මේ ප්‍රශ්නයට විසඳුමක් ගෙනෙන්න අපිත් එකඟයි. ඇත්ත වශයෙන්ම මෙය දැන් අර්බුදයක් බවට පරිවර්තනය වෙලා නේ තිබෙන්නේ. ඒක විසඳන්න බැහැ, වණ්ඩි කථාවලින්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒක හරි. එක පැත්තකින් වණ්ඩි කථා. අනෙක් පැත්තෙන් වණ්ඩි වැඩ. ගරු මන්ත්‍රීතුමා, දෙපැත්තේම පුද්ගලයෝ තදින් කථා කළා. අපි දැක්කා, නොයෙකුත් පුද්ගලයෝ කථා කරපු විධිය. [බාධා කිරීමක්] හරි. ඒක ඇත්ත. නමුත්, තර්ජනාත්මකව මේ වැඩ කටයුත්ත කරන එකත් අසාධාරණයි නේ. තර්ජනාත්මකව කරන්න බැහැ නේ. ඒ කෙසේ වෙතත් අපි වැදගත් දේශපාලනඥයන් හැටියට, වැදගත් වෘත්තීය සමිති හැටියට ඔබතුමා කියන විධියේ compromise එකක් ඇතිකර ගන්න අපට පුළුවන් වෙන්න ඕනෑ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
රජයක් හැටියට ඔය කියන විධියට, මැදිහත් විධියට බලනවා නම් මේ ප්‍රශ්නවලට විසඳුම් ගෙනෙන්න පුළුවන්. නමුත් ප්‍රශ්න අවුල් කරන විධියට බලයේ ඉන්න අය හැසිරුණොත් කවදාවත් ප්‍රශ්නයක් විසඳෙන්නේ නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

නමුත් හෙට මේ වර්ජනය කරනවා කියලා මම දන්නවා. ඒක ප්‍රජාතන්ත්‍ර විරෝධී වර්ජනයක් හැටියට සඳහන් කරන්න සිද්ධ වෙනවා. මොකද, තර්ජනාත්මකව මේ වැඩ කරන්න බැරි නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහාචාර්ය රොහාන් සමරජීව අද පත්තරයකට ලියලා තිබෙන ලිපිය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන ලෙස මම **සභාගත*** කරනවා.

මහාචාර්ය රොහාන් සමරජීව මැතිතුමා මේ පිළිබඳව බොහෝ අදහස් දක්වා තිබෙනවා. ඒ අදහස ඉතාම වැදගත්. ඉතින්, මොකද වෙන්නේ කියලා අපි බලමු. නමුත්, ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ compromise එකක්. ප්‍රජාතන්ත්‍රවාදය තුළ, ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධව වැඩ කරන්න අපට බැහැ. ඒ සඳහා තව වෙලාව තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වනවා මේ සියලු දෙනාම compromise එකකට ඒවි කියලා. එහෙම නැතුව මේ වාගේ වැඩ වර්ජන කිරීම අවසානයේ හෙට මිනිස් ජීවිත තමයි නැති වන්නේ.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Douglas Devananda.

ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
"ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

විසින් ස්ථිර කරන ලදී
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair and* THE HON. J.M. ANANDA KUMARASIRI *took the Chair.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[பி.ப. 3.05]

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று உலகில் செயற்பட்டுவருகின்ற பாரிய பரிமாணத்தைக் கொண்ட நிறுவனங்களை எடுத்துக்கொண்டால், அவற்றுள் பலவும் ஆரம்பத்தில் மிகச் சிறிய அளவில் ஆரம்பிக்கப்பட்ட, ஒரு துறைசார்ந்த தொழில்முயற்சிகளாக இருந்திருப்பதைக் காணலாம். அந்த வகையிலேயே, எமது நாட்டிலுள்ள முன்னணி நிறுவனங்களின் நிலையும் காணப்படுகின்றது. எமது நாட்டைப் பொறுத்தவரையில் பல்துறை சார்ந்த ஒரு தள உற்பத்தியின் முன்னணி நிறுவனங்கள் பல இல்லாவிடத்தும், ஒரு துறை சார்ந்த உற்பத்திகளின் சிறிய மற்றும் நடுத்தரத் தொழில்முயற்சி நிறுவனங்கள் பல தொழிலக ரீதியாகவும் குடிசைக் கைத்தொழில் ரீதியாகவும் கூட்டுறவு ரீதியாகவும் பரவலான நிலையில் காணப்படுகின்றன. எமது நாடு தற்போது முகங்கொடுத்துள்ள பொருளாதார நிலைமையையும் எமது எதிர்காலப் பொருளாதார நிலைமையையும் அவதானிக்கின்ற போது, இவ்வாறான சிறிய மற்றும் நடுத்தர தொழில்முயற்சிகளின் ஊக்குவிப்பு என்பது இன்றியமையாதது என்பதில் எவ்வித சந்தேகமும் இல்லை. அதுமட்டுமல்லாது, தரமற்ற மற்றும் அதிகளவிலான கழிவுகளைக் கொண்ட, எமது நாட்டின் இயற்கை வளங்களுக்குப் பெரிதும் சவாலான உற்பத்திகளின் இறக்குமதிகளைத் தடுப்பதற்கும் இந்த ஊக்குவிப்பானது முக்கியத்துவம் வாய்ந்ததாகும். இருப்பினும், சிறிய மற்றும் நடுத்தரத் தொழில்முயற்சி சார்ந்து விதிக்கப் படுகின்ற வரிகள் மற்றும் பதிவுக் கட்டணத் தொகைகள் என்பவற்றின் முன்பாக இன்று இந்தத் தொழில்முயற்சி யாளர்கள் அத்துறைகளைக் கைவிட்டு ஒதுங்குகின்ற ஒரு நிலைமை காணப்படுவதாகவே அன்றாடம் அதுசார்ந்து கிடைக்கின்ற தகவல்கள் தெரிவிக்கின்றன. அதேநேரம், இத்துறையினை மேலும் ஊக்குவித்து அதனைக் கட்டியெழுப் புவதற்கு ஏற்றவகையில் வரி விதிப்புகள், கட்டண அறவீடுகள், இலகு அனுமதிகள், கடன் வசதிகள், மூலப்பொருட்களுக்கான இலகு ஏற்பாடுகள் போன்ற வசதிகளை ஏற்படுத்திக் கொடுப் பதற்குப் பதிலாக, அத்துறைகளை இந்த நாட்டிலிருந்து துடைத்தெறிந்துவிடக்கூடிய நிலைமை ஏற்படுமோ என்ற சந்தேகம் எழுவதும் இயல்பானது.

ඒ වාගේම ඉතාම වැදගත් තවත් කාරණයක් කියන්න ඕනෑ. ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ලබා දුන්නු විශේෂ අවස්ථාවක් මත පසුගිය සති කිහිපය තුළ අපට දින ගණනාවක් යුරෝපා පාර්ලිමේන්තුවේ රැඳෙන්න අවස්ථාව ලැබුණා. ප්‍රථම වතාවට තමයි ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කණ්ඩායමකට පුහුණුවක් සඳහා යුරෝපා පාර්ලිමේන්තුවට යන්න ආරාධනයක් ලැබුණේ. මේ ආරාධනය ලැබුණේ කෝප් කමිටුව හෙවත් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව - කොප් සහ කෝපා- කියන මේ කමිටු දෙකේ සාමාජිකයන්ටයි. කෝප් කමිටුවට වැඩි වශයෙන් සහභාගි වූ මන්ත්‍රීවරයකු හැටියට මටත් අවස්ථාව ලැබුණා, මේ වැඩමුළුව සඳහා එහෙම නැත්නම් මේ ඉගෙන ගැනීමේ කටයුත්තට සහභාගි වෙන්න. එතැනදී අපි දැක්කා ඒ පාර්ලිමේන්තුවේ සිදුවන කටයුතු සහ ඒ පාර්ලිමේන්තුවේ තිබෙන කාරක සභා ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියන කරුණ. සමස්ත යුරෝපයම ආරක්ෂා වෙන විධියට, යුරෝපයම දියුණු වෙන විධියට කොහොමද ඒ අය ඒ අයගේ යෝජනා ඉදිරිපත් කරන්නේ, කොහොමද ඒ අයගේ අදහස් ඉදිරිපත් කරන්නේ, කොහොමද ඒ අයගේ සැලසුම් ඉදිරිපත් කරන්නේ, ඒ සියල්ලම එකට සාකච්ඡා කරලා එක කණ්ඩායමක් හැටියට එක මිටකට හිටගෙන යුරෝපය දියුණු කරන වැඩ පිළිවෙළ කොහොමද ඒ ගොල්ලන් කරගෙන යන්නේ කියන එක අපට ඉගෙන ගන්න ලැබුණා. එතැනදී විශාල පාඩමක් අපට ඉගෙන ගන්න පුළුවන් වුණා. අපි කොහොමද රටක් හැටියට ඉස්සරහට යන්නේ, අපි කොහොමද මේ රටම නියෝජනය කරන පාර්ලිමේන්තුවේ කණ්ඩායම් හැටියට -විපක්ෂයේ වෙන්න පුළුවන්, ආණ්ඩු පක්ෂයේ වෙන්න පුළුවන්- මේ රට පාලනය කරන්න, පරිපාලනය කරන්න අවශ්‍ය සියලු කටයුතු නිවැරැදිව කරන්නේ කියන එක ගැන ඉගෙන ගන්න එහිදී අවස්ථාවක් ලැබුණා. විශේෂයෙන්ම එතැන තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය ගැන ඉගෙන ගන්න ලැබුණා. කොයි ආකාරයෙන්ද ඒ අයට අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීලා තිබෙන්නේ කියන එක විතරක් නොවෙයි, ඒ අදහස්වලට ගරු කිරීම, ඒ අදහස් පිළිබඳව විවේචනාත්මකව අදහස් දැක්වීමට අවස්ථාව තිබීම සහ ඒ අනුව තීන්දු තීරණ ගැනීම, ඡන්දය පාවිච්චි කිරීම වැනි කාරණා සියල්ල දෙස බැලුවාම රටක් දියුණු කරන්න ඒවා විශාල වශයෙන් වැදගත් වෙනවාය කියන එක තේරුම් ගන්න පුළුවන් වුණා.

අපට ඒ අවස්ථාවේදී ඒ මන්ත්‍රීතුමන්ලා එක්ක GSP Plus සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාව ලැබුණා. වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුවේදී මොන තරම් කෑ ගැහුවත් මම එතුමා ගැන ආඩම්බර වෙනවා. මොකද, එතුමා පළපුරුද්දක් තිබෙන නායකයකු හැටියට එහිදී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් අපිත් එක්ක එකට හිට ගත්තා. එතුමා ප්‍රකාශ කළා, "ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හොඳ තත්ත්වයේ තිබෙනවා. හොඳට වැඩ කටයුතු කරගෙන යනවා. රටේ ජනතාව වෙනුවෙන් වැඩ කටයුතු කරනවා. ඒ නිසා විශේෂයෙන්ම GSP Plus සහනය අපට ලැබෙන්න ඕනෑ" කියලා. ඒ නිසා මා එතුමා අගය කිරීමට ලක් කරන්න ඕනෑ. එතුමා එතැනට ගිහිල්ලා පක්ෂ ගැන නොවෙයි හිතුවේ. එතුමා හිතුවේ රට ගැන. එතුමා වැනි මන්ත්‍රීතුමන්ලාගෙන්, හිටපු අමාත්‍යවරුන්ගෙන් අපට යම් කිසි පාඩමක් ඉගෙන ගන්න පුළුවන්කම ලැබෙනවා. මොකද, ඒ පාඩම අපේ රටේ ඉදිරි අනාගතය සඳහා ඉතාම වැදගත් වන නිසා.

මම හැම තිස්සේම යෝජනා කියන්නේ මෙකයි. විශාල මුදලක් වියදම් කරමින් මේ උත්තරීතර පාර්ලිමේන්තුව රැස් වුණත් අපි මෙතැනදී පල්හැලි දොඩවනවා. එහෙම නැත්නම් කාටහරි මඩ ගහනවා. ඒ දේ කරනවාට වඩා අප සියලු දෙනාට පුළුවන් නම් අලුත් යෝජනා ගෙනැල්ලා මේ රටේ ජීවත් වෙන අහිංසක අඩු ආදායම් ලබන ජනතාව වෙනුවෙන් සහ අනෙකුත් සියලු ජනතාව වෙනුවෙන් රට නිවැරැදි ගමන් මාර්ගයේ ගෙන යන වැඩසටහනක් හදන්න, ඒක තමයි අපි කළ යුත්තේ. අපි දෙගොල්ලෝ අතර තිබෙන යෝජනා, අපි අතර තිබෙන සංවාදාත්මක දෙබස් යන මේ සියල්ලම මේ රටේ ජනතාවගේ යහපත වෙනුවෙන් කෙරෙන වැඩසටහන් සහ වැදගත් වන වැඩසටහන්වලට පමණක් සීමා වෙන්න ඕනෑ. මේ රටේ ජනතාව වෙනුවෙන් වැඩ කටයුතු කරද්දී විශේෂයෙන්ම අපි විනය ගරුක මන්ත්‍රීවරු හැටියට ඉන්න ඕනෑ. ඒ විනය ගරුකභාවය අපි ළඟ තිබෙන්න ඕනෑ. ඒ වාගේම, අපි ළඟ සැලසුම් තිබෙන්න ඕනෑ. අපි ළඟ නිර්මාණ තිබෙන්න ඕනෑ. නිර්මාණ සහ සැලසුම් ගැන අපි කථා කරලා, අපි එකිනෙකා අතර අදහස් හුවමාරු කර ගනිමින්, නිවැරැදි ක්‍රමවේදය අනුව ඒක සකස් කරමින් රටට ගෙන යන්න අවශ්‍යයි. කර්මාන්ත වෙන්න පුළුවන්; සමාගම් වෙන්න පුළුවන්; එහෙම නැත්නම් පොදු සම්මති ටික වෙන්න පුළුවන්. මේ සියල්ලම තුළින් රටේ නිවැරැදි ගමන් මාර්ගයක් නිර්මාණය කරනවා නම්, කර්මාන්තකරුවාගෙන් බදු ගන්නවා හා සමානවම කර්මාන්ත දියුණු කිරීමේ වැඩසටහන් අපි සකස් කරන්නට ඕනෑ. විශේෂයෙන්ම අනෙකුත් සම්මති-සමාගම් ටික දියුණු කරලා ඒවායින් ජනතාවට නිසි ප්‍රයෝජන ලබා ගන්න හැකි වන ආකාරයෙන් ඒ සම්මති දියුණු කරන, ශක්තිමත් කරන වැඩ පිළිවෙළක් අපි ළඟ තිබෙන්නට ඕනෑ. ඒ සියල්ලම සඳහා මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළින් නිවැරැදි සැලසුම් සහ නිර්මාණ එළියට යන්න ඕනෑ. මේ සියල්ලම අපි එක මිටකට අරගෙන වැඩ කටයුතු කළොත්, "අපේ කාලයේ දී අපේ වගකීම ඉෂ්ට කළා" කියා අපට සෑහීමකට පත් වෙන්න පුළුවන්. අවසානයේ අපි ගෙදර ගියාට පස්සේ ආපහු හැරිලා බලන කොට, "අපේ කාලයේ අපි යමක් කළා" කියලා අපට සන්තෝෂ වෙන්න පුළුවන්.

අපි මේ පාර්ලිමේන්තුව තුළ නොයෙකුත් දේවල් ඉගෙන ගන්නවා. හැම දාම ඉදිරිපත් කරන යෝජනා වෙන්න පුළුවන්; පනත් වෙන්න පුළුවන්. රීට් එහා ගිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙන්න පුළුවන්. මේ සියල්ල තුළින්, රටේ එහා කොනේ ඉඳලා මෙහා කොන දක්වා ජීවත් වන සෑම ජනතාවටම එක හා සමානව සලකන හොඳ රටක් නිර්මාණය කිරීමේ හැකියාව අප සියලු දෙනා තුළම තිබෙන්නට ඕනෑ. මම මේක වැඩි වශයෙන්ම යුරෝපා පාර්ලිමේන්තුවේ දී දැක්කා. අපට ඒ අවස්ථාව ලබාදීම සම්බන්ධව මම නැවත නැවතත් ගරු අග්‍රාමාත්‍යතුමාට විශේෂ ස්තුතිය පළ කරනවා. එතැනදී අපි බොහෝ දේවල් ඉගෙන ගත්තා. ඒ ඉගෙන ගත් දේවල් සියල්ලම අපට පාවිච්චි කරන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා මම දේශපාලනයේ දී හුහාක් වේලාවට බලාපොරොත්තු වෙන්නේ, රටේ ඉදිරි සැලසුම් පිළිබඳව කථා කිරීම සහ රටේ ජීවත් වන ජනතාවගේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා වැඩ කටයුතු කරන්නයි. ඒ සඳහා දේශපාලනඥයන් සහ පරිපාලන නිලධාරීන් -අපි සියලු දෙනාම- එකට එකතු වෙලා, මේ නිර්මාණයන් සම්බන්ධ වැඩ පිළිවෙළවල් පිළිබඳව කථා කළ යුතුයි කියා මා විශ්වාස කරනවා. ඉදිරියේ දී ඒ සියලු කටයුතු සඳහා සහභාගි වෙන්න මම උත්සාහ කරනවා.

විශේෂයෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව රටේ යහපත වෙනුවෙන් විශාල වැඩ කොටසක් කරනවා. ඒ විතරක් නොවෙයි, පාර්ලිමේන්තුවෙන් අලුතින් ආරම්භ කළ ආංශික අධීක්ෂණ කාරක සභාවලින් අපට බොහෝ දේවල් කරන්න පුළුවන්. මම එතැන දී ලබා ගත් තොරතුරු අනුව, ආංශික අධීක්ෂණ කාරක සභාවලින් කරන දේවල් තවත් දියුණු කරන්න පුළුවන් කියලා මා විශ්වාස කරනවා. මේ සියලු කාරක සභාවලින් සහ උත්තරීතර පාර්ලිමේන්තුව තුළින් ඉදිරියේදී මේ රටේ ජනතාව වෙනුවෙන් විශාල වැඩ කොටසක් කරන්නට හැකි වෙයි කියා විශ්වාස කරනවා. මට කථා කිරීමට අවස්ථාව ලබාදීම සම්බන්ධව ඔබතුමාට මගේ ගෞරවය, ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමා.

[අ.භා. 4.11]

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කර තිබෙන සමාගම් පනත සහ සමිති ආඥාපනත යටතේ නියෝග පිළිබඳව කථා කරන මේ අවස්ථාවේ දී සමහරක් සමාගම්වලට බදු අඩු කරලා තිබෙනවා කියලා මට හිතෙනවා. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යුතු යෝජනා, ගැසට් පත්‍රයක පළ නොකර 2016 අය වැය යෝජනා ලෙස මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර අය කරන්නට කටයුතු කර තිබෙනවා. ඒ වරද නිවැරැදි කර ගැනීම සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් අද දින නව නියෝග ඉදිරිපත් කරලා තිබෙනවා. මෙහිදී එක් සමාගමකට ගාස්තු වැඩි කරද්දී සමහර සමාගම්වලට ගාස්තු අඩු කරලා තිබෙනවා. ඒ ගාස්තු තමයි මේකේ තීරණය කරලා තිබෙන්නේ.

සමාගමක් ආරම්භ කරන්න ව්‍යාපාර පරිසරයක් තිබෙන්න ඕනෑ. එවැනි ව්‍යාපාර පරිසරයක් තුළ තමයි නව ආයෝජකයන් දිරිගැන්වීම් තුළ නව ව්‍යාපාර උත්පාදනය වෙන්නේ. මේ ආණ්ඩුව කිව්වා, "නව උත්පාදන ආර්ථික ක්‍රමයක් ආරම්භ කරනවා"යි කියලා. නමුත් අද වනකොට විකුණා ගෙන කන ආර්ථික ප්‍රතිපත්තියකට තමයි ඇවිල්ලා තිබෙන්නේ. මම ඒ ගැන පසුව කථා කරන්නම්. මේ ආණ්ඩුව ආපු ගමන් කිව්වා, "සරදියෙල් න්‍යාය" ගෙන එනවාය කියලා. අග්‍රාමාත්‍යතුමාගේ සංකල්ප දෙකක් තිබුණා. එකක්, "සරදියෙල් න්‍යාය". අනෙක් එක, "ලිවිඡවි සංකල්පය". අද ඒ දෙකම නැහැ. ලිවිඡවි සංකල්පයත් නැහැ; සරදියල් න්‍යායත් නැහැ. අද ඒ වෙනුවට සරදියල්ගේ න්‍යායේ අනෙක් පැත්ත ක්‍රියාත්මක වෙනවා. සරදියල් නම් ඇති තැනින් අරගෙන නැති තැනට දුන්නා නේ. ඔහු කළේ ඒක නේ. නමුත් දැන් මේ ක්‍රියාත්මක වන්නේ, නැති තැනින් අරගෙන ඇති තැනට දෙන ක්‍රමයක්. එවැනි ව්‍යාපාර ක්‍රමයක් තමයි මේ හවුල් ආණ්ඩුව දැන් කරගෙන යන්නේ. මේක pick-pocket ගහන ආණ්ඩුවක්. ඒ ගැන කථා කරනවා නම් අපට වෙනමම දවසක් අරගෙන කතා කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව ආපු ගමන් සමාගම්වලට ගහපු බද්ද මොකක්ද? අධිභාරය මත බද්දක් - Super Gain Tax එකක්- ගැහුවා. අධිභාරය මත බද්ද ගහපු ගමන් එය මේ රටේ මිනිසුන්ට, ව්‍යාපාර ප්‍රජාවට විශාල ලෙස දැනුණා. අප්‍රේල් මාසයේ සිංහල අවුරුද්ද වන විට දෙන්න තිබුණු බෝනස් එකවත් සේවකයන්ට දීගන්න හැකියාවක් ඔවුන්ට තිබුණේ නැහැ.

ඊළඟට, "VAT man" මොකද කළේ? අපේ මුදල් ඇමතිගේ නම, "VAT man" නේ. එතුමා "VAT man". "VAT man" ඇවිල්ලා සියයට 11ක් තිබුණු VAT එක සියයට 15ක් දක්වා වැඩි කළා. එවිට නිෂ්පාදන පිරිවැය නැවතත් ඉහළ ගියා. ව්‍යාපාරිකයා දිරි ගන්වනවා වෙනුවට, නව සමාගම් ඇති කරන්න වැඩ කටයුතු කරනවා වෙනුවට, මේ රටේ දේශීය නිෂ්පාදකයාගේ නිෂ්පාදනවලට VAT අයකිරීම තුළ නිෂ්පාදනය පහළ වැටුණා. අධිභාරය මත බද්ද අය කිරීම නිසා ව්‍යාපාර තවත් අතෘප්තිමත්භාවයට පත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවක් ආවාම දේශීය හා විදේශීය ව්‍යාපාරිකයන් උනන්දු වෙනවා. විදේශීය ව්‍යාපාරිකයන් ගත්තොත්, විදේශීය සෘජු ව්‍යාපාරිකයන් නොවෙයි එන්නේ. මං කොල්ලකාරී ව්‍යාපාරිකයෝ කිහිපදෙනා ලංකාවට එනවා. අපි ඒ ගැන පසුව කතා කරමු. රටක ආර්ථිකය දියුණු වෙන්න නම් ව්‍යාපාර ශක්තිමත් වන්න ඕනෑ. ඒ වාගේම, ආයෝජන වැඩි වන්න ඕනෑ. රටේ ආර්ථික ප්‍රතිපත්තිය සහ රාජ්‍ය පිළිබඳ විශ්වසනීයභාවයක් තිබෙන්න ඕනෑ.

මේ ආණ්ඩුව ආවාට පසුව මොකක්ද වුණේ? 2015 පෙබරවාරි 27වන දා ලංකාවේ ලොකුම මං කොල්ලය -මහ බැංකු බැඳුම්කර වංචාව- කළා. ගණන, රුපියල් බිලියන 145යි. මේවා නිසා, දේශීය නිෂ්පාදකයා තුළ, දේශීය සමාගම් හිමියන් තුළ සහ විදේශීය ආයෝජකයා තුළ ආයෝජනය කරන්න තිබුණු කැමැත්ත සම්පූර්ණයෙන් පිරිහිලා රාජ්‍ය කෙරේ විශ්වසනීයභාවය නැති වුණා. ඒ එක්කම, **අපේ රට** ලෝකයේ දූෂිතම රටවලින් 95වන ස්ථානය ලබා ගත්තා, කලින් 84 වන ස්ථානයේ ඉඳලා. මෙහෙම වුණාම කොහොමද ව්‍යාපාර සංවර්ධනය වන්නේ, නව ව්‍යාපාර ආරම්භ වන්නේ, නව ආයෝජකයන් එන්නේ? මේ නිසා විශ්වාසය නැති වුණා. විශ්වාසය ඇති කරනවා වෙනුවට මේ ආණ්ඩුව මොකක්ද කළේ? තමන්ට උදවු කරපු හෙංචයියලා ටිකදෙනාට විතරක් මහා පරිමාණ සමාගම් ඇති කරන්න අවස්ථාව දුන්නා. මහ හොරාට නැහෙනහිර පළාතේ මහා සමාගම් ඇති කරන්න - එතනෝල් සමාගම් ඇති කරන්න- බදු සහන දුන්නා. එදා එතනෝල්වලට විරුද්ධවයි කථා කළේ. මහ හොරාට නැහෙනහිර පළාතේ මහා සමාගම් ඇති කරන්න, Ethanol companies open කරන්න අය වැයෙන්ම සහන දුන්නා. අනෙක් ආයෝජනයන් විශාල ලෙස කඩා වැටිලා. මාධ්‍ය ආයතන ආරම්භ කරන්න උදවු කළා**.** ඒවා තමයි කළේ. ඒකාබද්ධ විපක්ෂය මර්දනය කරන වැඩ පිළිවෙළ වෙනුවෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හිතුවා මේ ආණ්ඩුව ආපුවාම ජනවාරි 8වන දා විප්ලවය කරන්න උදවු කරපු රටවල් කීපය ජාත්‍යන්තර වශයෙන් මේ අයට උදවු කරාවි කියා. ඒ ගැන ලොකු විශ්වාසයක් අප තුළ තිබුණා. සුඛිත මුදිත ආර්ථිකයක්, අත මිට සරු ආර්ථිකයක් දෙනවා කිව්වා. ඒ නිසා රනිල් වික්‍රමසිංහ මහත්මයා ඇතුළු සියලු දෙනා දත් මැදගෙන බලාගෙන සිටියා, "අපේ රටට නව ව්‍යාපාර ඒවි" කියලා. පොඩි පොඩි ඒවා නොවෙයි එන්නේ කියලා කිව්වා. නමුත් තවම බුල්ටෝ කොම්පැනියක්වත් ගෙනෙන්න බැරි වුණා. එක විදේශීය සෘජු ආයෝජකයෙක් ගෙනෙන්න බැරි වුණා. ආයතන එකක් ගෙනාවා, හැබැයි තවම මුල් ගල විතරයි; එතැනමයි. තවත් එකක් ආවා හොරණට. ඒ, ටයර් කම්හලක්. එතැනත් තවම මුල් ගල විතරමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට එන්නේ මොකක්ද? ඒකට අලුත් වචන දමනවා. ඒ තමයි, "Public-Private Partnership" කියන එක. රාජ්‍ය-පෞද්ගලික හවුල් ආයතන. මේවා සුන්දර වචන. - Triple "P" - ඒක නම් ඇත්ත, triple "P" තමයි. කොහොමත් triple "P" තමයි. දැන් කුමන්ත්‍රණය කරන්නේ සුන්දර වචන දාලා ඒ හරහා අපේ රාජ්‍ය ආයතන ටික විකුණාගෙන කන්න, අපේ දේශීය සමාගම් ටික විකුණාගෙන කන්න, ඒ වැඩේ තමයි අද කරන්න හදන්නේ. හම්බන්තොට වරාය, තෙල් සංස්ථාවත් සමඟ තිබුණු නැහෙනහිර ත්‍රිකුණාමල වරාය, තෙල් ටැංකි ටික, hospitals ටික, අපේ ලාභ ලබන ආයතනයක් වන ලුණු ලේවාය, බනිජ වැලි සංස්ථාව යනාදී සියලු දේ විකුණාගෙන කන්න තමයි අද ආණ්ඩුවට වෙලා තිබෙන්නේ, මේ සුන්දර වචනවල මුළාවෙන්. අපි හිතුවා මේ ආණ්ඩුව ආපුවාම

[ගරු ප්‍රසන්න රණවීර මහතා]

මිනිසුන්ගේ අත මිට සරු වෙලා අඩුම තරමින් පසුගිය සිංහල අවුරුද්දේවත් අපේ රටේ ජනතාව සුඛිත මුදිතව ඉඳීවි කියලා. මොකක්ද වුණේ? ලංකා ඉතිහාසයේ පළමුවෙනි වතාවට අපේ රටේ ජනතාව සිංහල අවුරුදු කෑවේ කණකර ටික උගස් තියලා. අපිත් පොඩි කාලයේ අපේ අම්මා තාත්තා අවුරුද්දට අලුත් ඇඳුමක් අරගෙන දෙනකම් ආශාවෙන් බලාගෙන ඉන්නවා. අද දෙමවුපියන්ට ඒ යුතුකම කරන්නට සල්ලි නැහැ. අත මිට සරු වෙනවා කිව්වාට පර්ස් එක හිල්. අන්තිමට දෙමවුපියන්ට වුණේ දරුවාගේ පංචායුධය උගස් තියලා දරුවාට "සූට්" එකක් අරන්දීලා, අලුත් අවුරුද්දට කිරි බත් ටික කවන්නයි.

තමන්ගේ දරුවාව පොළොවේ ගහලා මරලා අම්මාත් ගහට පැනලා මැරෙන යුගයක් මේ යහ පාලන ආණ්ඩුව තුළ නිර්මාණය වෙලා තිබෙන්නේ. මම හිතනවා, අපේ මහින්ද අමරවීර ඇමතිතුමා අහගෙන ඉඳලා මේ පිළිබඳව අවධානය යොමු කරාවි කියලා. ඉතිහාසයේ වැඩිම මුදල් අව්වු ගැසීම කළේ මේ ආණ්ඩුව කාලයේයි. අපේ කාලයේ ණය තිබුණේ බිලියන 7,000 ගණනයි. අද එය 9,700ට නැඟලා තිබෙනවා. නිදහසින් පසු ඉතිහාසයේ සියයට 32කින් රාජ්‍ය ණයබර වැඩි වෙලා තිබෙනවා පසුගිය අවුරුදු දෙක තුළ. ඒක පුද්ගල ආදායම අඩු වෙනවා, උද්ධමනය වැඩි වෙනවා. ලංකා ඉතිහාසයේ පසුගිය මාර්තු මාසයේ තමයි වැඩිම උද්ධමනයක් තිබුණේ. කිව්වේ මොකක්ද, කථා කළේ කොහොමද? අද ඒක පුද්ගල ආදායම අඩු වෙලා. මොනවාද කිව්වේ? මහින්ද හොරකම් කළ මුදලින් මේ වාගේ දහ ගුණයක සංවර්ධනයක් කරන්නට පුළුවන් කිව්වා. "මෛත්‍රී හෙටක්" පොතේ 20වෙනි පිටුවේ බොහොම පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා හොරකම් කරන මුදලින් -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(මාණ්පුමිකු பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

හොරකම් කරන මුදලින් මේ වාගේ දස ගුණයක් සංවර්ධනය කරන්නට පුළුවන් කියලා කිව්වා. "මෛත්‍රී හෙටක්" පොතේ 20වෙනි පිටුවේ සංවර්ධනය ගැන සඳහන් කරලා තිබෙනවා. කෝ ඒ සංවර්ධනය? අද මහින්දගේ ණය ගැන විතරක් කථා කරනවා. අද මේ ආණ්ඩුවට ආර්ථික කළමනාකරණයක් නැහැ. පෞද්ගලික ආයතනයක්, ව්‍යාපාරයක් පවත්වාගෙන යන විට එදිනෙදා වැඩ කටයුතුවලදී, අවශ්‍යතාවන්වලදී ඒ ආයතනයේ තිබෙන හොඳම දේපොළ විකුණනවා නම් ඒක දක්ෂ ව්‍යාපාර කළමනාකරණයක් නොවෙයි. ඒ වාගේම මේ ආණ්ඩුව දක්ෂ කළමනාකරණයක් ඇතිව මේ රටේ ජනතාවගේ සුඛවිහරණය, සුභ සාධනය ඇති කරයි කියලායි අපි හිතුවේ. නමුත් මේ ආණ්ඩුව විකුණාගෙන කන තත්ත්වයට, කුඩුකාරයාගේ තත්ත්වයට පත්වෙලා තිබෙනවා. දෙමවුපියන් හම්බ කළ දේ කුඩුකාරයෝ වාගේ දරුවෝ අද විකුණාගෙන කනවා. ඒ වාගේ තමයි මහින්ද රාජපක්ෂලා මේ රටට ඉතිරි කළ දේවල්- සමහර මිනිසුන් ත්‍රීවිලර් එකක් ගන්න විට finance කරලා, lease කරලා ණයට ගන්නවා. හම්බ කරලා ගෙවනවා. අවුරුදු හතර පහකට පසුව ඒක අපට වත්කමක්. හම්බන්තොට වරාය අපි අවුරුදු 15කට ගත්තේ. කළමනාකරණය නිසියාකාරව කරලා ඒවා ගෙව්වාට පසුව හම්බන්තොට වරාය අපි සතු වත්කමක්. හරියට මොළය පාවිච්චි කරලා නිවැරදි කළමනාකාරිත්වයක් සහ නායකත්වයක් ලබා දුන්නා නම් හම්බන්තොට වරාය මතු පරපුරට වත්කමක්.

අද ගෙන එන ලද නියෝග මඟින් සමහර සමාගම්වල ගාස්තු අඩු කරලා සහ සමහරක් ඒවාට ගාස්තු වැඩි කරලා තිබෙනවා. ඒ විතරක් මදි. මේ හොර නඩය ඉවත් කරලා ජනතාවට, ආයෝජකයන්ට විශ්වසනීයභාවයක් ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් ඒ තුළින් මේ රටේ ආයෝජනය වැඩිවෙලා මේ රටේ ජනතාවට සුඛිත මුදිත ජීවිතයක් ගත කරන්න පුළුවන් හැකියාව, වාසනාව ලැබේවා! කියා ප්‍රාර්ථනා කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමා.

ඊට පෙර, මූලාසනය සඳහා ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු ඒ.එච්-.එම්. ෆවුසි මහතා (ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி - தேசிய ஒருமைப்பாடு மற்றும் நல்லிணக்க இராஜாங்க அமைச்சர்)
(The Hon. A.H.M. Fowzie - State Minister of National Integration and Reconciliation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මේ අවස්ථාවේදී ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

විසින් ස්ථිර කරන ලදී
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමනි, ඔබතුමා කථා කරන්න.

[අ.භා. 4.24]

ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ඉතා වැදගත් නියෝග පිළිබඳ සාකච්ඡා වෙන වෙලාවේ අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳ මා සතුටු වෙනවා. විශේෂයෙන් අද මේ

නියෝගවලට වඩා වැඩියෙන් කථා වුණේ වෙනත් කාරණා බොහොමයක් පිළිබඳවයි. එවන් තත්ත්වයන් පිළිබඳව, එදිනෙදා පවතින තත්ත්වයන් පිළිබඳව පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා කිරීමේ වරදක් නැහැ. ඒවා ගැනත් පිළිතුරු කිහිපයක් ලබාදිය යුතුයි කියන එක මා විශ්වාස කරනවා. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා තමයි සංශෝධන කිහිපයක් සම්බන්ධව අද මේ නියෝග ඉදිරිපත් කළේ.

අපි රජයක් විධියට - ජාතික ආණ්ඩුව, යහ පාලන ආණ්ඩුව - කටයුතු කරගෙන යෑමේදී රටේ ජනතාව වෙනුවෙන් ගත් තීන්දු තීරණ පිළිබඳවත්, ඒ වාගේම සිදුවූ අඩු පාඩු පිළිබඳවත් සාකච්ඡා වුණා. මේ රජය බලයට පත් වෙනකොට එක පක්ෂයකට ආණ්ඩු කරන්න හැකියාවක් තිබුණේ නැහැ. එක පක්ෂයකට නිසි බලයක් ලැබුණේ නැහැ. ඒ නිසා තමයි ජාතික ආණ්ඩුවක් නිර්මාණය වෙන්නේ. මේ ජාතික ආණ්ඩුව තුළ එක්සත් ජාතික පක්ෂයේ අයත් අමාත්‍ය ධුර දරනවා. ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපත් අමාත්‍ය ධුර දරනවා. එතකොට මේ රජය තුළ අපට විශාල අභියෝග රාශියක් තිබෙනවා. මේ රජයට තිබෙන ප්‍රධානම අභියෝගය රට ඉදිරියට ගෙන යන අභියෝගයයි. ඒක පහසු නැති බව අපි දන්නවා. මේ වෙනුවෙන් කටයුතු කරගෙන යාමේදී යම් යම් බාධක රාශියක් ඇති වුණා. එකක් තමයි කාලගුණික වශයෙන් ඇති වූ බාධා. දිගින් දිගටම දැන් නියඟයක් පවතිනවා. ඒ වාගේම නියං සහනාධාර දෙන්නත් කෝටි ගණනක මුදලක් දැනටමත් වැය කරලා තිබෙනවා. තවත් කෝටි ගණනක මුදල් වැය කරමින් යනවා. ඒ අතර තවත් විවිධ බාධක ඇති වෙනවා. මීතොටමුල්ල කුණු කන්ද නාය යනවා; ඒ වාගේම හමුදාවේ අවි ගබඩාවක් විනාශ වෙනවා; ඒවායින් ජනතාවට හානි සිද්ධ වනවා. මේ වාගේ දේවල් බොහොමයක් සිද්ධ වෙන අතරේ තමයි රටක් විධියට ඉස්සරහට යන්න වෙලා තිබෙන්නේ. මේ කටයුතුවලදී මා විශ්වාස කරන කාරණයක් තිබෙනවා. ඒ තමයි අපි දේශපාලනය කථා කරන්න ඕනෑ; විවේචනය කරන්න ඕනෑ: අඩු පාඩු පෙන්වලා දෙන්න ඕනෑ. හැබැයි, රටක් විධියට ගත්තොත් අපි එකට යාමේ අවශ්‍යතාවයත්, වැදගත්කමත් තිබෙනවා.

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාගේ කථාවේදී එතුමා ඉතා වැදගත් කාරණයක් සඳහන් කළා. ඒ තමයි ගරු වාසුදේව නානායක්කාර හිටපු ඇමතිතුමා යුරෝපා පාර්ලිමේන්තුවට ගිහිල්ලා ඒ කණ්ඩායම් මුණ ගැසුණ වෙලාවේ පක්ෂ භේදය පැත්තකට දාලා එතුමා මේ රට වෙනුවෙන් කථා කළා; අදහස් ඉදිරිපත් කළා කියන කාරණය. ඒක ඉතාමත් හොඳ තත්ත්වයක්. එතුමාගේ සමහර කාරණා පිළිබඳ අපේ විවේචන තිබුණත්, ඒවායේ අඩු පාඩු අපි දැක්කත් එතුමා කළ ඒ දේ ගැන අපි අගය කරන්න ඕනෑ. මොකද, අපට දේශපාලනය කරන්න රටක් ඉතුරු වෙන්න ඕනෑ. රටේ ජනතාව ශක්තිමත් වුණ තරමට දේශපාලනය කරන අපි හැමෝටම හොඳයි. ඒ මිනිසුන් අගාධයට ගිහිල්ලා, රට ණය වෙලා, රට ජාත්‍යන්තරයෙන් කොන් වෙලා යද්දී දේශපාලනය කිරීමෙන් ප්‍රතිඵලයක් ලැබෙයි කියා මා හිතන්නේ නැහැ. ඒ නිසා ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා කළ ඒ දේ අනික් සියලු දෙනා කරනවාද කියන එක පිළිබඳව තම තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව කල්පනා කිරීම වැදගත් කියලා මා මේ අවස්ථාවේ කියනවා. අපි කරන කාර්යයන් ඒවා අපේ දේශපාලන කටයුතු වෙන්න පුළුවන්; වෙනත් කටයුතු වෙන්න පුළුවන්. නමුත් ඒවායින් රටට සෙතක් ඇති වෙනවාද, අයහපතක් ඇති වෙනවාද කියන එක පිළිබඳව නැවත නැවතත් අපි අවධානය යොමු කළ යුතු වෙනවා.

අපි එක දෙයක් ගැන කල්පනා කර බලමු. රටේ දිනෙන් දින ඇතිවන විරෝධතා, වර්ජන දිහා බලන්න. ඒවායින් රටට හොඳක්ද සිද්ධ වෙන්නේ? වර්ජන කරන්න, විරෝධතා පවත්වන්න ඕනෑ නැහැය කියා මම කියන්නේ නැහැ. තමන්ගේ අයිතිවාසිකම් දිනාගන්න වර්ජන කිරීම සාමාන්‍යයෙන් සිද්ධ වෙනවා. හැබැයි, වෙන කිසිම දෙයකින් විසඳා ගන්න බැරි කාරණයක් වෙනුවෙන් අවසානයටම තමයි වර්ජනයක් කළ යුතු වන්නේ. විරෝධතා පැවැත්වීම ප්‍රශ්නයක් නැහැ. රජයේ අවධානය යොමු කරගන්න විරෝධතා පවත්වන්න ඕනෑ. හැබැයි, ජනතාවට හිරිහැරයක් නොවන ආකාරයේ විරෝධතා පැවැත්වීමේ වගකීමක් ඒ අයටත් තිබෙනවා. සමහර සුළු කාරණාවලට පවා අද මේ අය විරෝධතා පවත්වන්නේ කොහොමද කියා බලන්න. පාරවල් හරස් කරනවා. පාරවල් හරස් කරලා කරන විරෝධතාවලින් පාඩු වන්නේ රජයටද? රජයටත් යම් පාඩුවක් වෙනවා ඇති. හැබැයි, ඒ නිසා අහිංසක මිනිසුන්ට කොයි තරම් පාඩුවක් සිද්ධ වෙනවාද? පාරවල් හරස් කරලා කරන විරෝධතා නිසා කීදෙනෙක් මැරිලා තිබෙනවාද? ලෙඩෙක් ඉස්පිරිතාලයකට ගෙන යන්න විධියක් නැහැ. ඒ අයට ප්‍රතිකාර ගන්න විධියක් නැහැ. මේ දේවල් නිසා කීදෙනෙක් අතරමං වෙලා තිබෙනවාද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ධීවර කටයුතු සඳහා මා හමුවන්න ලංකාවේ සෑම ප්‍රදේශවලින්ම ජනතාව එනවා. විශේෂයෙන්ම උතුරු, නැඟෙනහිර පළාත්වල සිටින විශාල පිරිසක් කොළඹට එනවා. ඒ අය මට කිව්වේ මොකක්ද දන්නවාද? "ඊයේ තමයි ආවේ. නමුත්, ඊයේ එන්න බැරි වුණා. අද තමයි මෙතැනට එන්නේ." කියන එක. ඒ අය චින්ද අමාරුකම්, අපහසුතා අපට කියා තිබෙනවා. එක වතාවක් උතුරේ ධීවර කණ්ඩායමක් මාව හමුවෙන්න ඉඳිත් තිබෙනවා. නමුත්, මේ ඇති වුණු විරෝධතා හේතුවෙන් පාර වහලා තිබුණු නිසා ඒ අයට එදා දවසේ මාව හම්බ වෙන්න එන්න ලැබිලා නැහැ. එහෙම වුණාම ඒ අයට ඉන්න තැනක් නැති ප්‍රශ්නය මතු වෙනවා. Railway Station එකේ නිදාගන්න ගියාම, ටික වෙලාවකින් පොලීසියෙන් ඇවිත් පරීක්ෂා කර තිබෙනවා. ඒ අයගෙන් කරුණු විමසලා තිබෙනවා. කාරණා කිව්වාට පසුව ඒ අයට එහි ඉන්න අවසරය දී තිබෙනවා. ඒ මිනිසුන් බොහොම වේදනා විඳගෙන ඉඳලා, ඊළඟ දවසේ තමයි මාව මුණ ගැහුණේ. ඒ මිනිසුන් ධීවර කර්මාන්තයේ යෙදෙන අය. ඒ අය දවස් දෙකක් වැඩ නවත්වලා -මුහුදු ගියේ නැතිව- ආ නිසා තමයි පැයකට මාව හම්බ වෙන්න පුළුවන්කම ලැබුණේ. මේ තත්ත්වය නිසා අහිංසක මිනිසුන් කොයි තරම් සංඛ්‍යාවක් පීඩාවට පත් වෙනවාද? මෙහෙම දෙයකින් දේශපාලනඥයන්ට සතුටු වෙන්න පුළුවන්ද? මෙයින් වෘත්තීය සමිතිවලට හෝ තවත් කාට හෝ සතුටු වෙන්න පුළුවන් නම් ඒක තමයි කාලකණ්ණි සන්තෝෂය කියන්නේ. එම නිසා මෙන්න මේ ගැන රජයේ අවධානය යොමු වෙන්න ඕනෑ.

අනිවාර්යයෙන්ම මේ කටයුත්ත කළ යුතු වෙනවා. විරෝධතා පවත්වනවා නම් යම් ස්ථාන කීපයක් නම් කරලා, ඒවායේ විරෝධතා කරන්න ඉඩ දිය හැකියි. ඒවාට ජනමාධ්‍යවලට ඕනෑ තරම් යන්න දෙන්න ඕනෑ; එය ප්‍රචාරය කරන්නත් ඕනෑ. ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මිනිසුන්ට හිරිහැර වෙන්න දෙන්න හොඳ නැහැ. ජිනීවාවලත් එහෙමයි වෙන්නේ. ප්‍රජාතන්ත්‍රවාදය තිබෙනවාය කියන බොහෝ රටවලට ගියාම -UN එකට ගියත්- ඒවායේ එක පැත්තක විරෝධතාකරුවන් ඉන්න ආකාරය අප දකිනවා. ඒ දේවල් වාර්තා කරනවා. හැබැයි, ඒ රටේ අනික් කාරණාවලට ඒක බාධාවක් වන්නේ නැහැ.

හෙට දිනයේත් වර්ජනයක් පවත්වන බව දන්වා තිබෙනවා. හැබැයි, ඒ වර්ජනයට අදාළ වන කාරණා ගැන නැවත සිතා බැලිය යුතුයි. දෙපැත්තේම අඩු පාඩු තියෙන්න පුළුවන්. මා හිතනවා රජය විධියටත් ඒ කාරණා පිළිබඳව මීට වඩා අවධානය යොමු කළ යුතුය කියා. ඒ අයගේ ප්‍රශ්න පිළිබඳව අප සාකච්ඡා කළ යුතු වෙනවා. ඒ අඩු පාඩුව අපට පිළිගන්න වෙනවා. මේ අය සම්බන්ධව සාකච්ඡා කිරීම නිසියාකාරයෙන්, ප්‍රමාණවත් පරිදි සිදු නොවුණාද කියන සැකය මා තුළ තිබෙනවා. ඒ වර්ජකයන් දිහා

[ගරු මහින්ද අමරවීර මහතා]

වැරැදි විධියටම බලන්න ගිහින් ඒ අය කේන්ති ගස්සන්නේ නැතිව, ඒ අයට එරෙහිව යම් යම් ප්‍රකාශ නිකුත් කරන්නේ නැතිව, එය සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීමට මීට වඩා ප්‍රමාණවත් මැදිහත්වීමක් තිබිය යුතුය කියන කාරණයත් මා පිළිගන්නවා. ඒ වාගේම, වර්ජනය තුළින් රිදෙන්නේ කාටද, මේ පාඩුව යන්නේ කාටද කියා වර්ජනය සිදු කරන අයත් අවංකව කල්පනා කරන්න ඕනෑ. සියලු දෙනා එකතු වෙලා හෙට දිනයේ වර්ජනයක් පවත්වනවාය කියනවා. මම ඒ අයගෙන් එක ඉල්ලීමක් කරනවා. ඔබලා මේ රටේ ජනතාව ගැන හිතන්න. රට ගැන හිතලා, මේ වර්ජනය පැත්තක තියලා තවත් සාකච්ඡා වටයක් පවත්වලා, බැරිම තත්ත්වයක් වුණොත් විතරක් වර්ජනයක් බවට පත් කර ගත්තාට ප්‍රශ්නයක් නැහැ. එම නිසා තවදුරටත් රජයට අවස්ථාව ලබා දෙන්න කියා මා ඉල්ලා සිටිනවා. එහෙම නැති වුණොත් ඒ ගොල්ලන් ආණ්ඩු පෙරළන කණ්ඩායමක් විධියට රටේ මතයක් නිර්මාණය වෙනවා. ඒක ඒ ගොල්ලන්ට හොඳ තත්ත්වයකුත් නොවෙයි. මම හිතන විධියට වර්ජකයන්ටත් ඒක හොඳ තත්ත්වයක් වෙන එකක් නැහැ.

සමහර මාධ්‍යවලින් වර්ජනය කරන අයගේ පැත්ත විතරක් නොව වර්ජනය නිසා පීඩා විඳින පැත්තක් පෙන්වන්න පටන් අරගෙන තිබෙනවා. එක පැත්තකින් මම ඒ ගැන සතුටු වෙනවා. ඒ ආකාරයට කටයුතු කරන මාධ්‍ය ආයතනවලට මේ අවස්ථාවේදී මගේ ප්‍රශංසාව පිරිනමනවා. රාජ්‍ය මාධ්‍ය ඒ කටයුත්ත කරනවා. ඒ අය පීඩාවට පත් වන අයගේ ප්‍රකාශ අරගෙන ඒවාත්, අර විරෝධතාවත් දෙකම පෙන්වනවා. ඒ වාගේම පෞද්ගලික නාළිකා කිහිපයකුත් දෙපැත්ත සමබරව ඒ කාරණා ඉදිරිපත් කරන්න කටයුතු කළ අවස්ථා කිහිපයක් මම දැක්කා. විශේෂයෙන්ම පසු ගිය දවස්වල වෛද්‍යවරුන්ගේ වර්ජනයක් වෙලාවේ "හිරු" මාධ්‍ය ගිහිල්ලා ඒ ලෙඩුන්ගෙන් - පීඩාවට පත් වුණු අයගෙන්- ප්‍රකාශ ලබා ගෙන ඒවා තමන්ගේ නාළිකාව තුළින් ප්‍රකාශයට පත් කරනවා මම දැක්කා. ඒක හොඳ තත්ත්වයක්. එතකොට රාත්‍රියේ ප්‍රවෘත්ති බලා ගෙන ඉන්නකොට වර්ජනය කළ අයට පෙනෙනවා, තමන් කළ වර්ජනය නිසා පීඩාවට පත් වුණේ කවුද කියන එක. නැවත ඒ වාගේ දෙයක් කරනකොට ඒ අය ඒ ගැන කල්පනා කරාවි. ඒ වාගේම "සිරස" මාධ්‍යයත්, වර්ජකයන්ගේ අදහස් පෙන්වනවා වාගේම, වර්ජනයෙන් පීඩාවට පත් වුණු අයගේත් අදහස් පෙන්වන අවස්ථා මම දැක්කා. ඒක හොඳ ප්‍රවණතාවක්. ඒ විධියට දෙපැත්තම පෙන්වීම පිළිබඳව රාජ්‍ය මාධ්‍ය හැරුණාම ඒ වාගේ මාධ්‍යවලටත් අපේ ගෞරවය හිමි වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හෙට දිනයේ වුණත් වර්ජනයක් සිද්ධ වුණොත්, උදාහරණයක් හැටියට වෛද්‍යවරුන්ගේ වර්ජනයක් නම්, ඒ සිදු වන්නේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වර්ජනයක් නම් ඒකෙන් කාටද පාඩු වන්නේ. ඒක රජයට පාඩුවක්ද? ඒක රජයට ලාභයි. මොකද, හෙට දවසේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වර්ජනයක් සිද්ධ වෙනවා නම් ලයිට් බිල අඩු වෙයි. වතුර බිල අඩු වෙයි. ඒ වාගේම බෙහෙත් යන්නේ නැහැ. ඒ නිසා බෙහෙත් ඉතිරි වෙයි. ඒකෙන් ආණ්ඩුවට ලාභ වෙයි. හැබැයි, පාඩුව කාටද? අහිංසක මිනිස්සුන්ට. දුප්පත් මිනිස්සු බොහොම අමාරුවෙන් ඉස්පිරිතාලයට එනවා. සමහර විට ඒ මිනිස්සු මේ වර්ජනය පිළිබඳව දන්නේත් නැහැ. ඒ මිනිස්සු රූපවාහිනිය, රේඩියෝ අහගෙන ඉන්නේ නැහැ. පුරුද්දට බෙහෙත් ටික ගන්න ඉස්පිරිතාලයට එනවා. ඇවිල්ලා පැය ගණන් රස්තියාදු වෙලා යනවා. සමහර අය ප්‍රතිකාර නැතිව මැරෙන අවස්ථා තිබෙනවා. වර්ජන නිසා සමහර අය දීර්ඝකාලීන රෝගීන් බවට පත් වන අවස්ථා තිබෙනවා. එතකොට සල්ලිකාරයන්ට වර්ජනවලින් බලපෑමක් වෙනවාද? මහජන නියෝජිතයන්ට, දේශපාලනඥයන්ට වර්ජනයෙන් බලපෑමක් වෙනවාද? වර්ජන ඇති වුණොත් පෞද්ගලික රෝහලකට ගියාම ඒ අයට ප්‍රතිකාර ලැබෙනවා. ඒ වෛද්‍යවරුම පෞද්ගලික රෝහලට ගිහිල්ලා සේවාවන් ලබා දෙනවා. එහෙම නැත්නම් ඒ අයට අමාරු වුණොත් පිටරටකට හරි ගිහිල්ලා ප්‍රතිකාර ගනීවි. හැබැයි, අහිංක මිනිස්සු තමයි මේකෙන් පීඩාවට පත් වන්නේ. ඒ පිළිබඳව තමයි කල්පනා කළ යුතු වන්නේ. ඒ කාරණය පිළිබඳව ජන මාධ්‍ය තුළින් මතයක් නිර්මාණය කර තිබෙනවා. රටත් දැනුවත් වෙලා තිබෙනවා. ඒ ගැන මම සතුටු වෙනවා. අද රටේ මිනිස්සුත් සමහර තේරුමක් නැති වර්ජන කරන අයට ගෙදර ඉඳගෙන ශාප කරනවා. ඒ සෑම ක්ෂේත්‍රකම අය නිදහස් අධ්‍යාපනය තුළින් ඇවිල්ලා මේ වාගේ දේවල් කිරීම ගැන. දෙපාර්තමේන්තුවල වෙන්න පුළුවන්, ආයතනවල වෙන්න පුළුවන්. ඒවායින් රජයට නොවෙයි, පාඩු වන්නේ. අහිංසක මිනිස්සුන්ටයි පාඩු වන්නේ. ඒ මිනිස්සුන්ට සේවයයි නැති වන්නේ. රජයට නොවෙයි. මම කලින් කිව්වා වාගේ එදා දවසේ AC වැඩ කරන්නේ නැහැ. ඒ නිසා රජයට AC බිල් නැහැ. ලයිට් පාවිච්චිය නැහැ. වතුර පාවිච්චිය නැහැ. ඒවායේ බිල් අඩු වෙයි. හැබැයි, අහිංසක මිනිස්සු ඇවිල්ලා රස්තියාදු වෙලා යනවා. අහිංසක මිනිස්සු ඇවිල්ලා තමන්ගේ වැඩේ කර ගන්න බැරිව යනවා. වෙන දා, එහෙම වෙලාවට ආණ්ඩුවට බැණ බැණ ගිය මිනිස්සු අද ආණ්ඩුවටත් බණිනවා, වර්ජනය කරන අයටත් බණිනවා. ඒ තත්ත්වය දිගින් දිගට ගියොත් අනාගතයේදී වර්ජකයන්ට විරෝධතා රැල්ලක් ඇති වෙයි. දිගින් දිගටම අනවශ්‍ය දේවලට වර්ජන කරන්න ගියොත් ඒ වර්ජකයන්ට එරෙහිව යම් මහජන බලවේගයක් නිර්මාණය වෙයි කියලා මම හිතනවා.

මේ ගරු මන්ත්‍රීතුමන්ලා කථා කරනකොට කිව්වා විදේශ ආයෝජන එන්නේ නැහැ, ආයෝජකයෝ එන්නේ නැහැ, කොටස් වෙළෙඳ පොළේ අඩුවීම් වෙනවාය කියලා. මේවා වෙන්නේ මොකද? මේ වාගේ විරෝධතා, මේ වාගේ වර්ජන, මේ වාගේ කඩාකප්පල් කිරීම් දිගින් දිගටම සිද්ධ වෙනකොට දේශපාලනඥයන් විවිධ ප්‍රකාශ නිකුත් කිරීම තුළ ආයෝජකයෝ මේ රටට එන්න මැළිකමක් දක්වනවා. එතකොට සතුටු වෙන්න පුළුවන්ද? "ඊළඟ දවසේ පාර්ලිමේන්තුවට ගිහින් මේක කියන්න පුළුවන්. ඒක කියලා අපට ලොකු චූන් එකක් ගන්න පුළුවන්, ඒ නිසා ආයෝජකයන් මේ රටට එන්නේ නැති එක හොඳයි. එන එකත් නවත්වන්න පුළුවන් නම් ඒකත් හොඳයි" කියලා සතුටු වෙන්න පුළුවන් දේශපාලනඥයෙක් ඉන්නවා ද? එහෙම ඉන්නවා නම්, ඒ රටට ආදරය කරන දේශපාලනඥයෙක් නොවෙයි කියන එකයි අපි පැහැදිලිව කියන්නේ. මේවායින් පීඩාවට පත් වෙන්නේ අපේ රටේ මිනිස්සු. මේ තරම් විරෝධතා තිබෙනවා නම්, විදේශිකයෙක් ඇවිල්ලා අපේ රටේ ආයෝජනයක් කරාවි ද? එහෙම වෙන්නේ නැහැ. ඒ නිසා අපි හැමෝටම දවසක මේවාට වග කියන්න වෙයි. මේ කාරණාවලදී අපි හැමෝටම වගකියන්න වෙනවා.

මේ වන විට අපේ රට ණය වෙලායි තිබෙන්නේ. දැන් ඒ ණය ගෙවන්න තවත් ණය ගන්නා රටක් බවට අපේ රට පත් වෙලා. අපේ රට ණය ගෙවන්න ණය ගන්න රටක් බවට පත් වෙලා. රාජ්‍ය ආදායම මදි, ණයයි පොලියයි ගෙවා ගන්න. එහෙම නම්, ඒක එක්කෙනෙකුගේ වැරැද්දක් ද? මේ ආණ්ඩුවේ විතරක් වැරැද්දක් ද? ගිය ආණ්ඩුවේ විතරක් වැරැද්දක් ද? නැහැ, නිදහසින් පසු අවුරුදු හැට ගණනක් තිස්සේ අපි ආණ්ඩු කරගෙන යනවා. ප්‍රධාන පක්ෂ දෙකක් විටින් විට මේ රටේ ආණ්ඩු කරනවා. ජනතා විමුක්ති පෙරමුණත් ටික කාලයක් සන්ධානගත වෙලා බලයේ හිටියා. අපට අවසානයේ ඉතිරි වුණේ මොකක්ද? ඩොලර් කෝටි 9,900කට වැඩි ණය කන්දරාවක් අපේ රටට ඉතිරි වෙලා තිබෙනවා. එක පුද්ගලයෙක් ලක්ෂ 4කට වැඩි ණයකාරයෙක් බවට පත් වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් මම

එක්කෙනෙකුට ඇඟිල්ල දිගු කරන්නේ නැහැ. අපේ පාලන තන්ත්‍රයන් තුළ ඇති වුණු තත්ත්වයක් මේක. මේ රජයටත් තිබෙන ප්‍රබල අභියෝගය ඒකයි. දැන් කිව්වා, ණය වැඩි වෙලා කියලා. මේ ණය වැඩි වෙන්න එක හේතුවක් තමයි, ණය ගෙවන්න ණය ගන්න වීම. ඒකත් එක හේතුවක්. ඒ වාගේම, අපි මේ කාරණා පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. හැබැයි, රජයක් විධියට අපි ලබා ගත් ජයග්‍රහණත් තිබෙනවා. ඒවාත් අපි සිහි කරන්න ඕනෑ.

අපේ ජාතික ආණ්ඩුව නිසා අද අපේ රටට වරප්‍රසාද රාශියක් ලැබුණා. එකක් තමයි, අපට ජිනීවාවල තිබුණු මානව හිමිකම් ප්‍රශ්නය සැලකිය යුතු මට්ටමකට අද පාලනය කර ගන්න පුළුවන්කම ලැබීම. විදුලි පුටු ගැන දැන් කථා වෙන්නේ නැහැ, ජාත්‍යන්තර යුද අධිකරණ ගැන දැන් කථා වෙන්නේ නැහැ. අපේ ජනාධිපතිතුමා ගැන, මේ රජය පිළිබඳව ජාත්‍යන්තරයේ ඇති වුණු විශ්වාසය මත අපේ රටට ඇතිවී තිබූ බරපතළ තත්ත්වයන් සැලකිය යුතු මට්ටමකට පාලනය කරගන්න අපට පුළුවන් වුණා. ඒ වාගේම, අපට පනවා තිබූ යුරෝපා මත්ස්‍ය තහනම අපි ඉවත් කර ගත්තා. අපේ ජාතික ආණ්ඩුව, මේ රජය පිළිබඳව ජාත්‍යන්තරයේ ඇති වුණු විශ්වාසය නිසා තමයි අපට මත්ස්‍ය තහනම ඉවත් කරගන්න පුළුවන් වුණේ.

GSP තහනම ඉවත් කරගන්න යනකොට සමහර කට්ටිය කිව්වා, "ඕක ගන්න වෙන්නේ රටේ නැති කොන්දේසිවලට අත්සන් කරලා." කියලා. "සමලිංගික සේවය නීතිගත කරන්න වෙයි; උතුරු-නැඟෙනහිරට ෆෙඩරල් දෙන්න වෙයි; අපේ රටේ වෙනම රාජ්‍ය හැදෙයි; රට ඒ තත්ත්වයට යයි; ජාත්‍යන්තරයේ සියලු මනදොළ සපුරලා තමයි GSP සහනය ලබා ගන්න වෙන්නේ." කියලා සමහරු කිව්වා. හැබැයි, අපි ඒ කියන ආකාරයේ එක කොන්දේසියකටවත් යටත් නොවී GSP සහනය ලබා ගන්නා මට්ටමට ඇවිල්ලා තිබෙනවා කියන එක ආඩම්බරයෙන් සඳහන් කරන්න ඕනෑ. අපේ ජනාධිපතිතුමා සහ ජාතික ආණ්ඩුව ගෙනියන වැඩ පිළිවෙළ පිළිබඳව ලෝකයේ ඇති කර ගත් විශ්වාසය නිසා තමයි අපට ඒ තත්ත්වය ළඟා කරගන්න පුළුවන් වුණේ. මේවා සුළු පටු ජයග්‍රහණ නොවෙයි. මම දන්නවා, මත්ස්‍ය තහනම ඉවත් කරගන්න ගිහිල්ලා කොච්චර අපට මහන්සි වෙන්න වුණාද; පාර්ශ්ව කීයක් ඒ වෙනුවෙන් කටයුතු කළාද කියලා. මම විතරක් නොවෙයි, බොහෝ දෙනාගේ කැපවීම මහන්සිය මත තමයි ඒක ලබා ගත්තේ. ඒ අය අපට නිල නොවන විධියට කිව්වේ මොකක්ද? "පසු ගිය කාලයේ විධියට ජාත්‍යන්තරය තරහා කරගෙන රට ඉදිරියට ගියා නම්, අපි උඹලාගේ තේ ගන්න එකත් තහනම් කරනවා." කියලා කිව්වා. අපේ රටේ කසළ තේ තිබෙනවා කියලා, තේවලටත් ඒ වන විට වාර්තා සකස් කරලායි තිබුණේ. කසළ තේ මේ රටේ තිබෙනවාය කියන එක පිළිබඳව කොහොමත් යම් ප්‍රමාණයක කථා බහකට ලක් වෙනවා නේ. කසළ තේ තිබෙනවා කියලා අපේ රටේ තේ ගන්න එක යුරෝපා සංගමයෙන් තහනම් කර ගත්තා නම්, අපට ඇති වෙන තත්ත්වය මොකක්ද? මේවා පිළිබඳව අපි කල්පනා කරන්න ඕනෑ. අපේ මේ ජාතික ආණ්ඩුව ලබා ගත් ජයග්‍රහණය ඒවායි. ඒ වාගේම අපට ළඟා වෙන්න බැරි වුණු ඉලක්ක තිබෙනවා. ඒ තමයි, අපි බලාපොරොත්තු වුණු මට්ටමට රට ඉස්සරහට ගෙනියන්න බැරි වුණා; රැකියා නිර්මාණය කරගන්න බැරි වුණා. ඒවා පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. අපි රට විකුණන්නේ නැහැ. අපි ඉන්නකම් මේ රට විකුණන්න ඉඩ දෙන්නෙත් නැහැ. මේ රජය තුළ අපි කටයුතු කරන තෙක් අපේ රටේ කිසිදු දේපොළක්, ඉඩමක් විදේශ රටකට විකුණන්න ඉඩ දෙන්නේ නැහැ කියන එක අපි ඉතාමත් වගකීමෙන් කියනවා.

බොහෝ අය කියන්නේ ත්‍රිකුණාමලය ඉන්දියාවට විකුණනවා; හම්බන්තොට චීනයට විකුණනවා; කොළඹ ජපානයට විකුණනවා කියලායි. නමුත් කිසිම රටකට මේ රටේ දේපළක්, ඉඩමක් විකුණන්න දෙන්නේ නැහැ. ඒ යුගය අවසාන කරලා තිබෙන්නේ. අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත්, මේ රජයත් මේ ජාතික ආණ්ඩුව තුළ ඒ වාගේ කටයුත්තකට ඉඩ තබන්නේ නැහැ. අපි ඒක ඉතාම වගකීමෙන් කියනවා. හැබැයි, ඒකෙන් අපි කියන්නේ නැහැ, ආයෝජන ගෙනෙන්න එපා කියලා. අපි ආයෝජන ගෙනෙන්න ඕනෑ. ප්‍රයෝජනයට නොගන්නා දේවල් අපි විදේශ ආයෝජන එකතු කරගෙන කරන්න ඕනෑ.

එක පැත්තකින් කියනවා, රටට විදේශ ආයෝජන එන්නේ නැහැ කියලා. තව පැත්තකින් කියනවා, ඩොලර් එන්නේ නැහැ කියලා. එසේ කියන ගමන්, අනෙක් පැත්තට කියනවා නම් විදේශ ආයෝජන රටේ සංවර්ධන කටයුතුවලට, ඵලදායී කටයුතුවලට යොදවන එක වැරදියි කියලා ඒක පරස්පර විරෝධී කථාවක් කියන එකත් මම පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ. හම්බන්තොට වරාය වෙන්න පුළුවන්, මත්තල ගුවන් තොටුපළ වෙන්න පුළුවන්, තෙල් ටැංකි වෙන්න පුළුවන්, තවත් දෙයක් වෙන්න පුළුවන් මේවා නිසි ප්‍රයෝජනයට ගැනීමේ වැඩ පිළිවෙළකුත් තිබෙන්න ඕනෑ. අපි මේවා සියල්ලම බදාගෙන ඉඳලා වැඩක් නැහැ. මේවායේ ණය ගෙවන්න ඕනෑ. හැබැයි, ඒකෙන් අදහස් කරන්නේ නැහැ, අපි කිසියම් හෝ රටකට වුවමනා විධියට එම කටයුතු කරනවා කියලා. අපේ රටට හොඳ විධියට තමයි මේ සියල්ලම සිද්ධ වෙන්න අවශ්‍ය වෙන්නේ. එතකොට කාගේවත් විරෝධතාවක් ඇති වෙයි කියලා මම හිතන්නේ නැහැ. දේශපාලන වශයෙන් ඇතිවෙන විරෝධයක් හැර, රටේ වෙනත් විරෝධයක් ඇති වෙන්නේ නැහැ.

අපි මේ රටේ හැම සම්පතක්ම ප්‍රයෝජනයට ගන්න ඕනෑ. මේවා පැත්තකට දමා තබන්න බැහැ. ත්‍රිකුණාමලයේ තෙල් ටැංකිවලින් යම් ප්‍රයෝජනයක් ගන්න අවශ්‍යයි. හැබැයි, ඒවා විකුණන්න ඉඩ දෙන්න පුළුවන්කමකුත් නැහැ. ඒවායෙන් ප්‍රයෝජනයක් ගන්න ඕනෑ. අවුරුදු ගණනාවක් ඒවා කැලෑවෙන් වැසී තිබුණු නිසා විනාශ වෙලා යනවා. ඒ නිසා ඒවායෙන් යම් ප්‍රයෝජනයක් ගන්න ඕනෑ. හැබැයි, ඒ ගැන බලනකොට, "ඔන්න, ඉන්දියාවට විකුණනවා, මේක චීනයට විකුණනවා" කියලා කථා කරන්නේ නැතුව සත්‍ය තත්ත්වය පිළිබඳව අවබෝධ කරගෙන විමසිලිමත්ව බලන්න ඕනෑ. ඒවා පිළිබඳව දකිනකොටම, "මේක විකුණනවා, මේක විකුණා ගෙන කනවා, මේ තමයි විකුණාගෙන කන න්‍යාය" කියනවා. එහෙම කියන්නේ නැතුව අපි රටක් විධියට බැලුවොත් තමයි අපට රටක් හැටියට ඉස්සරහට යන්න ලැබෙන්නේ. ඒ නිසා අපි හැම වේලාවේම ඒ ගැන හිතනවා.

මේ වේලාවේ මේ රජයට ජාත්‍යන්තරයෙන් විශාල සහයෝගයක් ලැබී තිබෙනවා. ජාත්‍යන්තරය මේ රටේ ආයෝජන සිදු කරන්න සූදානමින් ඉන්නවා. මේ අවස්ථාවේ අපි පක්ෂ-පාට විධියට බෙදිලා දේශපාලන කෝණයෙන් බලන්නේ නැතුව රටට වාසිදායක පදනම් මත, රටට වාසිදායක කොන්දේසි මත මේ අයගේ සහයෝගය ලබා ගන්න ඕනෑ. එහෙම නැතුව අපට චීනයත් එපා; අපට ඉන්දියාවත් එපා; අපට ඇමෙරිකාවත් එපා; අපට ජපානයත් එපා කියලා මේ සියලුම රටවල් පැත්තකට දමා, පැත්තකට වෙලා අපට ඉස්සරහට යන්න බැහැ. ශ්‍රී ලංකාව තිබෙන්නේ ලෝකය ඇතුළේ මිසක්, ලෝකය තිබෙන්නේ ශ්‍රී ලංකාව ඇතුළේ නොවෙයි කියන එක දැනගෙන කටයුතු කළොත් අපට වරදින්නේ නැහැ. අපි ජාත්‍යන්තරයත් එක්ක එකතු වෙන්න ඕනෑ, අපි ජාත්‍යන්තරයේ සහයෝගය ලබා ගන්න ඕනෑ. අපි ලබා ගෙන තිබෙන සහයෝගය ප්‍රමාණවත් නැහැ. මම ඒ ගැනත් කියන්න ඕනෑ. මීට වඩා ජාත්‍යන්තරය මේ රට පිළිබඳව බලන්න ඕනෑ.

අපේ රට අවුරුදු 30ක් යුද්ධ කරලා විනාශ වුණු රටක්. දැන් අපේ රටේ සාමය ඇති වෙලා තිබෙනවා. එසේ ලැබුණු සාමයේ

[ගරු මහින්ද අමරවීර මහතා]

ප්‍රතිඵල මිනිසුන්ට දැන් ලැබෙන්න ඕනෑ. උතුරු සහ නැඟෙනහිර ප්‍රදේශවල සිටින ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට අපට මීට වඩා ජාත්‍යන්තරයේ සහයෝගය ලැබෙන්න ඕනෑය කියලා මම හිතනවා. රජයටම මේ කටයුතු සම්පූර්ණ කරන්න පුළුවන්කමක් නැහැ. ඒ අයත් අපට උදව් කරන්න ඕනෑ. උපදෙස් දීලා විතරක් වැඩක් නැහැ. බටහිර රටවල් ඇවිල්ලා අපට, "මෙහෙම කරන්න- මෙහෙම කරන්න" කියලා විතරක් කිව්වාට වැඩක් නැහැ. ඒ අය මේ වාගේ රටවලට උදව්-උපකාරත් කළ යුතුයි කියලා මම කියනවා. එහෙම තත්ත්වයක් ඇති වෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා. අපට සමහර රටවල් උදව් කරනවා. දැනටමත් නෝර්වේ රාජ්‍ය අපේ ධීවර අමාත්‍යාංශයේ කටයුතු වෙනුවෙන් විශාල සහයෝගයක් ලබා දෙන බව අපි කියන්න කැමැතියි. අපි මේ වෙනකොට ධීවර අමාත්‍යාංශය තුළ ධීවර කටයුතු වෙනුවෙන් ජාතික ප්‍රතිපත්තියක් හදමින් පවතිනවා. තවත් අමාත්‍යාංශවල ඒ වාගේ හදනවාද කියලා මම දන්නේ නැහැ. එහෙම හැදෙන්න ඕනෑ. අපේ සියලු අමාත්‍යාංශවලට ජාතික ප්‍රතිපත්ති සකස් වෙන්න ඕනෑ. ජාතික ආණ්ඩුවක් හැදුණොත්, ජාතික ප්‍රතිපත්ති සකස් විය යුතුමයි. "අපේ රටේ ජාතික ප්‍රතිපත්තිය" කියලා අපි හැම දාම හදනවා; අධ්‍යාපනයටත් හදනවා, ඉඩම්වලටත් හදනවා, හැම එකටම හදනවා. හැබැයි, ආණ්ඩු මාරු වෙනකොට නොවෙයි, ඇමති මාරු වෙනකොට ජාතික ප්‍රතිපත්තියත් වෙනස් වෙලා ඉවරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට ලබා දී තිබෙන කාලය ඉවරද? නැහැ නේද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලබා දී තිබෙන කාලය නම් ඉවරයි, ගරු ඇමතිතුමනි. ඔබතුමා විනාඩි පහකටත් වඩා වැඩිපුර කාලය අරගෙන තිබෙනවා. දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මගේ කථාව මම අවසාන කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි ජාතික ප්‍රතිපත්ති සකස් කරන්න ඕනෑ. මෙපමණ කාලයක් අපි ජාතික ප්‍රතිපත්ති ගැන කථා කළා; මේක ජාතික ප්‍රතිපත්තියයි කියලා කිව්වා. හැබැයි, ඒ එකක්වත් ජාතික ප්‍රතිපත්තියක් වුණේ නැහැ. දැන් අපි අපේ අමාත්‍යාංශය තුළ ධීවර කටයුතු වෙනුවෙන් ජාතික ප්‍රතිපත්තියක් සකස් කරනවා. මම කියන්න කැමැතියි, දැන් මේ කටයුත්ත අවසාන අදියරටම ඇවිල්ලා තිබෙන බව. මේ අවුරුද්දේ මුල සිටයි අපි ඒ කටයුත්ත පටන් ගත්තේ. අපේ රටේ සිටින ඒ පිළිබඳව උනන්දුවක් දක්වන විශේෂඥයන්, විශ්වවිද්‍යාලවල ආචාර්යවරුන්, මහාචාර්යවරුන් අපි එයට සම්බන්ධ කර ගත්තා. ඒකට අපට නෝර්වේ රාජ්‍යයේ තාක්ෂණික සහයෝගය ලැබුණා. ජනාධිපතිතුමාටත්, අගමැතිතුමාටත් මම ස්තුතිවන්ත වනවා. නෝර්වේ අග්‍රාමාත්‍යතුමිය මුණ ගැහුණු වෙලාවේ ඒ දෙදෙනාම කිව්වේ ධීවර කර්මාන්තයට උදව් කරන්න කියලායි. නෝර්වේ රාජ්‍යයේ තමයි ධීවර කටයුතු සම්බන්ධයෙන් ලෝකයේ ඉහළම තාක්ෂණය තිබෙන්නේ. සෑම රටක්ම නෝර්වේ රාජ්‍යයේ තාක්ෂණය තමයි ධීවර කටයුතුවලට ලබා ගන්නේ. නෝර්වේ රාජ්‍යයෙන් පැමිණි කණ්ඩායමේ හතරදෙනෙකු මේ දවස්වලත් අපිත් එක්ක වාඩිවෙලා දිගින් දිගටම මේ ධීවර ප්‍රතිපත්තිය හදන්න අපට උදව් කරනවා. ඒ තාක්ෂණික සහයෝගය ඔවුන් අපට ලබා දෙනවා. නුදුරේම -මාසයක්, දෙකක් යන්න ඉස්සෙල්ලා- අපි මේ ධීවර ප්‍රතිපත්තිය සෑදීමේ වැඩ කටයුතු අවසන් කරනවා. මේ කටයුත්ත ඉක්මනින් අවසන් කරන්න මම පුළුවන් තරම් උත්සාහ කරනවා. මාසයකින් බැරි වුණොත්, මාස දෙකක් ඇතුළත අපි ඒ ධීවර ප්‍රතිපත්තියේ මූලික රාමුව හදලා මේ මන්ත්‍රීවරු 225දෙනාටම ඒකට සම්බන්ධ වන්න කියලා ආරාධනා කරනවා. එතකොට මේ ආණ්ඩුවේ සිටින ධීවර ඇමති විතරක් නොවෙයි, ඔය ඡායා කැබිනට් එකක් හදාගෙන සිටින ධීවර ඇමතිලාටත්, ඊළඟට කවදා හරි ධීවර ඇමතිවරු වෙන්න බලාපොරොත්තුවෙන් සිටින කට්ටිය ඉන්නවා නම්, ඒ අයටත් ඇවිල්ලා මේ ජාතික ප්‍රතිපත්තිය හදා ගන්න ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කරන්න පුළුවන්. එතකොට මොන ආණ්ඩුවක් බලයට ආවත්, මොන ඇමතිවරයෙකු ධීවර ඇමති වුණත්, ඒ ඔක්කෝම දැන් මේ ධීවර ප්‍රතිපත්තිය අනුමත කළා නම්, ඒක ක්‍රියාත්මක කිරීමේ හැකියාව ලැබෙනවා. එහෙම තමයි රටක් විධියට අපි ඉස්සරහට යන්න අවශ්‍ය වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රජය අභියෝග රාශියකට මුහුණ දෙනවා. මම කිව්වා වාගේම, එකක් විදේශ ණය අභියෝගය. මේ සම්බන්ධයෙන් අපි එක් කෙනෙකුට, දෙදෙනෙකුට වරද පටවන්නේ නැතිව, මේකට අපි අවංකවම මුහුණ දෙන්න ඕනෑ. මේකට අපි හැම කෙනෙක්ම උදව් කරන්න ඕනෑ. එහෙම උදව් කළොත් තමයි අපට මේ රටේ දැනට ඇති වී තිබෙන තත්ත්වයෙන් ගොඩ එන්න පුළුවන් වන්නේ. අපට දේශපාලනය කරන්න රටක් තිබෙන්න ඕනෑ. දේශපාලනය කරන්න මිනිස්සු හොඳින් ඉන්න ඕනෑ. මිනිස්සු බඩගින්නේ ඉන්න කොට සතුටු වන දේශපාලනයක් අපි කරනවා නම්, ඒක ඉතාමත් බරපතළ වැරැද්දක්. අපි රට අගාධයට යන දේශපාලනයක් කරනවා නම්, ඒක ඉතාමත් බරපතළ වැරැද්දක්ය කියන එක මා කියනවා. කවුරු හරි දේශපාලනඥයෙකු මේ රටට එන විදේශ ආයෝජන නවත්වන්න හිතා මතා කටයුතු කරනවා නම්, ඒක ඊටත් වඩා බරපතළ අපරාධයක්, බරපතළ වැරැද්දක් කියන එකත් මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. එහෙම නැතිව කටයුතු කරපු දේශපාලනඥයන්, විරුද්ධ පක්ෂයේ සිටියත්, මොන පක්ෂයේ සිටියත් රට වෙනුවෙන් හොඳ දේවල්වලට හොඳයි කියලා කථා කළ, ආශීර්වාද කළ දේශපාලනඥයන් තමයි 'හොඳ දේශපාලනඥයන්' වශයෙන් ඉතිහාසගත වෙලා තිබෙන්නේ. පෞද්ගලික න්‍යාය පත්‍ර අනුව තමන්ට කොහොමද බලය එන්නේ, තමන් කොහොමද වැජඹෙන්නේ, තමන් කොහොමද ඊළඟ වතාවේ මන්ත්‍රීකම ගන්නේ, ඊළඟ වතාවේ කොහොමද ඡන්දය දිනා ගන්නේ, ඊ ළඟ වතාවේ කොහොමද මනාපය ගන්නේ, කාට විරුද්ධ වෙලාද මනාපය ගන්නේ, මොන ජඩ වැඩය කරලාද මනාපය ගන්නේ කියලා හිතනවාට වඩා රට ගැන හිතා කටයුතු කළොත්, දේශපාලනයෙන් විශ්‍රාම ගිය දවසට හරි ඒ සම්බන්ධයෙන් සතුටු වන්න පුළුවන්ය කියන එක තමයි මා සඳහන් කරන්නේ.

මා නැවතත්, අවසාන වශයෙනුත් කියන්නේ දැන් වර්ජනයක් කරන්න යනවා නම්, කරුණාකර රට පිළිබඳව කල්පනා කරලා, අහිංසක මිනිස්සු පිළිබඳව කල්පනා කරලා මේ ප්‍රශ්නය විසඳගන්න උත්සාහ දරන්න කියලායි. මේ වර්ජනය කරන්න යන හැම කෙනෙක්ම, අහිංසක මිනිස්සුන්ගේ -රාජ්‍ය සේවකයන්, පොල් කඩන මනුස්සයා, මුට්ට කර ගහන මනුස්සයා වැනි අයගේ- සල්ලිවලින් ඉගෙන ගත් අය. අපේ රටේ පළමුවන පන්තියේ ඉඳලා උපාධිය දක්වා නොමිලේ අධ්‍යාපනය ලබා දෙනවා. ඒකට අහිංසක නාට්ටාමිත් දායක වනවා. ඒ මිනිස්සුන්ගේ සල්ලිවලින් අධ්‍යාපනය ලබපු අය අද වර්ජනය කරලා ඒ මිනිස්සුන්ටම හිරිහැර කරන්න පටන් ගන්නවා නම්, ඒක බරපතළ වැරැද්දක්ය කියන එක තමයි මට කියන්න තිබෙන්නේ. එම නිසා නැවත වරක් මේ පිළිබඳව කල්පනා කරලා බලන්න. වැඩ වර්ජනයකට යෑමට තරම්

අත්‍යවශ්‍යම කාරණයක්ද මේක? මේ වැඩ වර්ජනය කිරීම අත්‍යවශ්‍යමද කියන එක පිළිබඳව නැවත වතාවක් කල්පනා කරලා බලන්න. තමන්ගේ ව්‍යක්තීය සමිතිය කොහොමද ශක්තිමත් කර ගන්නේ, නැත්නම් තමන්ගේ දේශපාලන පක්ෂය මේකෙන් ඉස්සරහට ගන්නේ කොහොමද කියන එක කල්පනා කරලා වැඩ වර්ජනයකට යනවා නම්, ඒක මේ රටට කරන පාප කර්මයක් වාගේම, ඒ පුද්ගලයන් කරන මහා විනාශයක්ය කියන එක මම අවධාරණයෙන්ම සඳහන් කරන්න ඕනෑ. මේ අය අද රාජ්‍ය සේවය කඩාකප්පල් කරලා; අකාර්යක්ෂම කරලා කටයුතු කිරීම තුළින් රටට ඇති වන සෙතක් නැහැ. ඒ පිළිබඳවයි මා අවධානය යොමු කරවන්නේ.

ආයෝජන සම්බන්ධවම අද ගොඩක් අය කථා කළ නිසා මා තව එක කාරණයක් කියන්නම්. අපේ ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාත් මේ අවස්ථාවේ මේ ගරු සභාවේ ඉන්නවා. මා මේ වෙලාවේ සභානායකතුමාගේත් අවධානයට යොමු කළ යුතු කාරණයක් තිබෙනවා. අපේ රටේ මේ තිබෙන ක්‍රමවේදය අනුව නම්, විදේශ ආයෝජන බලාපොරොත්තු වන්න අමාරුයි. ඒකට ප්‍රධාන හේතුවක් තමයි, අපේ නිලධාරීන්ගේ මේ පිළිබඳව තිබෙන උනන්දුවේ මදකම. හොඳ විදේශීය ආයෝජකයෙක් ආවොත් ඒ මිනිහාට එපා වෙනකල් එපා වෙන දේවල් කියනවා. ඒ මිනිහා යවන්න තිබෙන හතර-පස් පොළේම යවනවා. යවන්න තිබෙන ආයතනවලට යවලා ඇති වෙන්න රස්තියාදු කරවනවා. පුළුවන් නම් සල්ලිත් කීයක් හරි ගන්න පුළුවන්ද කියලා බලන කට්ටිය - නිලධාරීන්- ඉන්නවා. එහෙම තත්ත්වයක් ඇති වුණොත් ආයෝජකයන් මේ රටේ ආයෝජනය කරන්නේ නැහැ. අපේ රටට ණය දෙන්න එයි. හැබැයි, අපේ රටේ ආයෝජනය කරන්න ඒ මිනිස්සු එන්නේ නැහැ. ඒ මිනිසුන්ට ඕනෑ රටක ආයෝජනය කරන්න පුළුවන්.

ආයෝජකයන් ආවාම ඉහළින් පිළිගන්නා රටවල් අද ඕනෑ තරම් තිබෙනවා. ඒ නිසා අපි අලුතෙන් ක්‍රමවේදයක් හදා ගන්න ඕනෑ. හොඳ ආයෝජකයෙක් ලංකාවට ආවොත්, ඒ ව්‍යාපෘතිය හොඳ නම්, දින කිහිපයක් ඇතුළත ඒ ව්‍යාපෘතිය අනුමත කරලා දීමේ වැඩ පිළිවෙළකට අපි යන්න ඕනෑ. එහෙම නොවුණොත්, ඒ මිනිස්සු වෙනත් රටවලට ගිහිල්ලා ආයෝජනය කරනවා. ඒ අයට ආයෝජනය කරන්න -තමන්ගේ සල්ලි යොදවන්න- ඕනෑ තරම් රටවල් තිබෙනවා. ඒ නිසා දැන් අපි මේ ක්‍රමවේදය අලුතෙන් සකස් කර ගන්න ඕනෑ අවධිය ඇවිල්ලා තිබෙනවා. සමහර අය හිතාමතාම මේ ව්‍යාපෘති කඩාකප්පල් කිරීමේ අරමුණෙන්, විදේශ ආයෝජන ආපස්සට හැරවීමේ වැඩ පිළිවෙළකුත් ක්‍රියාත්මක කරනවාය කියන එකත් අප අවධාරණය කරන්න ඕනෑ. ඒ පිළිබඳවත් විමසිමෙන් කටයුතු කරන්න ඕනෑ කියලා මා හිතනවා.

මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයට අදාළව මෙම විවාදයේදී කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. ඒ වාගේම මා සියලු දෙනාගෙන් එක ඉල්ලීමක් කරනවා. දේශපාලන පක්ෂ, පාට තිබෙන්න පුළුවන්. නැවත මැතිවරණයක් තිබෙන්නේ 2020 වසරේදී. එතකොට ඕනෑ කෙනෙක් ජයග්‍රහණය කරයි; ඕනෑ කෙනෙක් ආණ්ඩු හදයි. නමුත් දැන් ඒක නොවෙයි වෙන්න ඕනෑ. මේ වෙලාවේ රට ගැන හිතලා, කවුරුත් එකතු වෙලා මේ රට දියුණු කර ගන්න අධිෂ්ඨාන කර ගනිමුයි කියමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ප.ප. 4.55]

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கம்பனிகள் சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள் சம்பந்தமாக உரையாற்றுவதற்கு எனக்கும் சந்தர்ப்பம் தந்தமைக்காக உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். சட்டங்களை ஆக்குவது, திருத்துவது, செயற்படுத்துவது என்பன இந்தப் பாராளுமன்றத்தின் தொடர் நடவடிக்கை களாக இருந்துவருகின்றன. ஆனாலும் ஆக்கப்படுகின்ற சட்டங்கள் அனைத்தும் மக்களுக்குப் பலன் தரக்கூடிய வகையில், நன்மை தரக்கூடிய வகையில் நடைமுறைப் படுத்தப்படுகின்றனவா? என்று நாம் பார்க்கவேண்டும். வலிந்து காணாமல் ஆக்கப்பட்டோருக்கான ஓர் அலுவலகம் அமைத்தல் சம்பந்தமாக உருவாக்கப்பட்ட சட்டம் இன்றுவரை செயற்படுத்தப்படாமல் எதுவித முன்னேற்றமுமின்றி இருப்பதை நாம் காணலாம். பாதிக்கப்பட்ட மக்களுக்கு நீதியை, நியாயத்தை வழங்கக்கூடிய வகையில், அவர்களது அபிலாஷைகளை நிறைவேற்றக்கூடிய வகையில், அவர்கள் எதிர்பார்க்கின்ற முறையிலே அது அமுல் செய்யப்படாமை மிகவும் வேதனைக்குரிய ஒரு விடயமாகும்.

இதனைவிட, சட்டங்களை ஆக்குதல், சுற்றுநிருபங்களை வெளியிடுதல், தேசியக் கொள்கைகளை உருவாக்குதல் என்ற பலவேறுவிதமான நடவடிக்கைகளின்கீழ் மேற்கொள்ளப் படுகின்ற செயற்பாடுகள் இந்த நாட்டிலுள்ள அனைவருக்கும் பொதுவானதா? என்ற ஒரு கேள்வியையும் நான் முன்வைக்க விரும்புகின்றேன். ஏனென்றால், இப்பொழுது காணிகளைச் சுவீகரித்தல் என்பது வடக்கு, கிழக்குப் பகுதியிலேயே மிகவும் துரித கதியில் நடைபெற்று வருகின்றது. அந்த வரிசையில் வன வளப் பாதுகாப்பு, வன ஜீவராசிகள் பாதுகாப்பு, தொல் பொருளியல் பாதுகாப்பு என்ற வகையிலே மிகவும் விரைந்தும் வலிந்தும் பல்வேறு காணிகள் எல்லையிடப்பட்டு வருகின்றன. இந்தக் காணிகளுக்குள் எமது மக்கள் பூர்வீகமாக வாழ்ந்த காணிகள், நிலைபேறான வருமானம் தரக்கூடிய மரங்களை உள்ளடக்கிய காணிகள் என்பனவும் உள்ளடங்குகின்றன. இவை போன்ற பல்வேறு விதமான செயற்பாடுகளின்மூலம் எமது மக்களின் காணிகளை வலிந்து பிடித்துக் கொள்ளுதல் என்பது எந்தச் சட்டத்தின்கீழ் அல்லது எந்தத் தேசியக் கொள்கையின்கீழ் மேற்கொள்ளப்படுகின்றது? என்ற கேள்வியை நான் முன்வைக்க விரும்புகின்றேன்.

இது மட்டுமல்ல, இறுதி யுத்த இடம்பெயர்வின்போது அங்கு பூர்வீகமாக வாழ்ந்த மக்களுடைய காணிகளைச் சுவீகரித்ததுடன், அந்தக் காணிகளில் இராணுவத்தினர் மற்றும் கடற்படையினர் முகாம்களையும் அமைத்திருக்கின்றனர். எட்டு வருடங்கள் முடிவடைகின்ற நிலையிலும் அந்தக் காணிகளுக்குரிய ஆவணங்களை வைத்திருக்கும் எமது மக்களுக்கு அவற்றை முழுமையாக விடுவித்துக் கொடுப்பதற்கு நடவடிக்கை எடுக்கப்படவில்லை. எமது மக்கள் தமது காணிகளை விடுவிக்குமாறு கோரி, அந்தக் காணிகளுக்கு முன்பாக வீதியோரங்களிலே கொட்டகையிட்டு, கொளுத்தும் வெயிலில் பலவிதமான அசௌகரியங்களுக்கு மத்தியிலும் தமது பிள்ளைகளோடு குடும்பமாக எதிர்ப்பார்ப்பாட்டங்களை நடத்திக்கொண்டிருக்கின்றார்கள். ஆனால், இந்த அரசு இதனைக் கண்டுகொள்ளாமல் இருக்கின்றமை, இதற்கான ஒரு சரியான நடவடிக்கையை விரைவாக மேற்கொள்ளாமை எந்தச் சட்டத்தின்கீழ் அல்லது எந்தக் கொள்கையின்கீழ் மேற் கொள்ளப்படுகின்றது? இறுதி யுத்தத்தின்போது சம்பந்தப் பட்டவர்களால் வாரி அள்ளிக்கொண்டு செல்லப்பட்ட தமது அசையும் சொத்துக்களான நகைகளையோ வாகனங் களையோ அல்லது வங்கியில் வைப்பிலிட்டிருந்த தமது பணத்தையோ எமது மக்கள் கேட்கவில்லை. மாறாக, தமது அசையாத சொத்தான, ஆவணங்களைக் கொண்டிருக்கின்ற தமது காணிகளில் - தாம் பூர்வீகமாக வாழ்ந்த காணிகளில் தம்மைக் குடியேற்றுமாறுதான் கேட்கின்றார்கள்.

[ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය]

இந்த அரசானது, அண்மையில் குப்பைமேடு சரிந்ததில் பாதிக்கப்பட்ட மக்களுக்கு மிக விரைவாகச் சகலவிதமான உதவிகளையும் பெற்றுக்கொடுத்தது மட்டுமல்ல, அதற்கென ஒரு விசேட பாராளுமன்ற அமர்வையே நடத்தியது. பாதிக்கப்பட்ட அந்த மக்களுக்காக நாமும் அனுதாபங்களைத் தெரிவித்துக்கொள்வதோடு, அவர்களது துன்பத்திலும் பங்கெடுத்துக் கொள்கின்றோம். ஆனால், இந்த நாட்டிலுள்ள அனைத்துப் பிரஜைகளையும் ஒரே தரமாக வைத்து இந்த அரசு கவனிக்க வேண்டும். தமிழர்களை ஏன், மூன்றாந்தரப் பிரஜையாக எதிர்நோக்குகின்றது? என்பதுதான் இங்கு வேதனைக்குரிய விடயமாக இருக்கின்றது. எமது மக்களுக்கு சாதாரண சூழலில் வாழக்கூடிய ஓர் இயல்பான நிலையை உருவாக்கித் தாருங்கள்! என்றுதான் நாம் உங்களிடம் பணிவாகக் கேட்கின்றோம்.

வேலைவாய்ப்பு வழங்கும் விடயத்திலும் இன்று பல்வேறு விதமான முரண்பாடுகள் காணப்படுவது மிகவும் வேதனைக் குரிய விடயமாகும். கடந்த காலத்திலே யுத்தத்தினால் பல இன்னல்களை அனுபவித்து, அதன் மத்தியிலும் கல்வியைக் கற்றுக்கொண்டவர்களில் தரமுள்ளவர்களுக்கு வேலை வாய்ப்புகள் வழங்கப்படாமல், அவர்கள் வேலைகளைத் தேடி அலைந்துகொண்டு திரிகின்ற வேளையிலே, வடபகுதியிலுள்ள அரச வெற்றிடங்களை நிரப்புவதற்காக தென்பகுதியிலிருந்து உத்தியோகத்தர்கள் அனுப்பப்படுகின்ற நிலைமையானது, எமது மக்களை மேலும் பாதிப்படையச் செய்கின்றது. அதுமட்டுமல்ல, பட்டதாரிகள் வேலை பெற்றுக்கொள்வதற் காகத் தொடர்ந்தும் போராடிக்கொண்டிருக்கிறார்கள்.

அதேநேரம், ஏற்கெனவே வேலை செய்த அனுபவமுள்ள பலர் வாழ்கின்ற எமது பகுதிகளிலே யுத்த சூழலிலே மூடப்பட்ட கைத்தொழிற்சாலைகள் இதுவரை திறக்கப்படாமல் இருப்ப தானது, பலர் வேலைவாய்ப்புகளின்றி இருப்பதற்கும் எமது நாடு தொடர்ந்து ஏழ்மை நிலையில் இருப்பதற்கும் ஒரு காரணியாக அமைகின்றது. சிறு கைத்தொழிற்சாலைகளை அமைப்பது, உற்பத்தி செய்யப்படுகின்ற மூலப்பொருட்களை முடிவுப்பொருட்களாக மாற்றுவது, கைத்தொழிலில் ஈடுபட்டி ருக்கின்ற முயற்சியாளர்களை ஊக்குவிப்பது, மூடப்பட்ட கைத்தொழிற்சாலைகளைத் திறப்பது போன்ற நடவடிக்கைகளை எடுக்காமல், அதற்கு மாறாக அவர்களது வாழ்வாதாரமான மீன்பிடித் தொழிலில், அடிமடியில் கைவைப்பது போன்று, தென்பகுதி மீனவர்கள் எல்லைமீறி வந்து ஈடுபடுவதை அனுமதிப்பதும் வேதனைக்குரிய ஒரு விடயமாகத்தான் அமைந்திருக்கின்றது. எல்லைமீறி வருவது மட்டுமல்ல, அவர்கள் பொருத்தமற்ற முறையிலே மீன்பிடித் தொழிலில் ஈடுபடுவது, யுத்தத்தால் பாதிக்கப்பட்டு மீள்குடி யேறிய எமது மக்களை மேலும் பாதிப்படையச் செய்கின்றது; அவர்களுடைய வருமானம் பாதிப்படைகின்றது. இதனால் அங்கு அடிக்கடி முரண்பாடுகளும் ஏற்படுகின்றன. "முல்லைத் தீவு மாவட்டத்தில் கொக்கிளாய் பகுதியிலே எவரும் மீன்பிடியில் ஈடுபடக்கூடாது" என்று நீதிமன்றம் உத்தர விட்டதன் பின்பும் அதையும்மீறித் தென்பகுதி மீனவர்கள் அங்கு மீன்பிடித் தொழிலில் ஈடுபட்டதால், கடந்த வாரம் அங்கு பூர்வீகமாக மீன்பிடித் தொழிலில் ஈடுபட்டிருக்கின்றவர் களுக்கும் இவர்களுக்கும் இடையில் முரண்பாடு ஏற்பட்டது.

இந்த இடத்திலேதான் நாங்கள் ஒன்றை அவதானிக்க வேண்டும். இந்தச் சட்டம், இந்தச் சுற்றுநிருபம், இந்தக் கொள்கைகள், நீதிபதி, நீதிமன்றம் என்பவற்றுக்கு அப்பால் யுத்தத்தால் பாதிக்கப்பட்ட இடங்களிலே என்ன நடைபெறுகின்றது? இதற்கு இந்த அரசு என்ன பதில் கூறப்போகின்றது? அரச அதிகாரிகளும் இவற்றைக் கண்டும் காணாதவாறு இருப்பதற்குக் காரணம், அவர்களுக்கும் பாதுகாப்பற்ற நிலைமை காணப்படுவதுதான். சட்டத்தை மீறி அல்லது அரச கொள்கைகளுக்கப்பால் அங்கு நடவடிக்கைகள் நடைபெற்றுக்கொண்டிருக்கின்றன என்பது தெரிந்தும், அரச அதிகாரிகள் அதுபற்றி வெளிப்படுத்துவதற்குப் பயப்படு கின்றார்கள். அவர்களுடைய உயிர்களுக்கே உத்தரவாத மில்லாத ஒரு நிலை காணப்படுவது மிகவும் வேதனைக்குரிய ஒரு விடயமாகும்.

இதற்கும் மேலாக, கடந்த யுத்த காலத்திலே பலர் கொல்லப்பட்டும் பலர் காயமடைந்துமிருக்கின்றார்கள். இவர்களில் கடும் பாதிப்புற்றோருக்கான நிவாரணங்கள் வழங்கப்படுவதற்குக்கூட ஆக்கபூர்வமான நடவடிக்கைகள் எடுக்கப்படவில்லை. பாதிக்கப்பட்ட மக்கள் கடும் பாதிப்புற்றோர் நிவாரணத்தின்கீழ் இறந்தவர்களுக்கான நிவாரணங்களைப் பெறுவதற்காக, உரிய ஆவணங்களை அனுப்பியும் அவை கிடப்பில் இருப்பதனால் நிவாரணத்தைப் பெற்றுக்கொள்ள முடியாத நிலை காணப்படுகின்றது. காரணம், அதற்கான நிதி ஒதுக்கீடு செய்யப்படாததேயாகும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු ශ්‍රියානි වීජේවික්‍රම මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் தொடரலாம்.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)
நன்றி.

இதுமட்டுமல்ல, காணாமலாக்கப்பட்டோரின் எமது உறவுகள், தாங்கள் ஒப்படைத்த தமது உறவுகள் எங்கே? என்றுதான் நீண்டகாலமாகத் தொடர்ந்து கேட்கின்றார்கள். வட்டுவாகலில் வைத்து, ஓமந்தையில் வைத்து, கப்பலில் கொண்டுவந்து புல்மோட்டையில் வைத்து அவர்களது உறவுகளைப் பதிவுசெய்து அரசிடம் அவர்கள் ஒப்படைத்திருக் கின்றார்கள். அவ்வாறு ஒப்படைத்ததற்கான ஆவணங்களை, ஆதாரங்களை அவர்கள் வைத்திருக்கின்றார்கள். புதினப் பத்திரிகைகள் மூலமாக அவ்வாறு ஒப்படைக்கப்பட்டவர்களின் புகைப்படங்கள், பெயர் விபரங்கள் வெளிவந்திருக்கின்றன. எனவே, தாங்கள் ஒப்படைத்த உறவுகள் எங்கே? என்றும் அதற்குப் பதில் கூறுமாறும் நீண்டகாலமாக இந்தத் தாய்மார் போராட்டம் நடத்துகின்றார்கள். குறிப்பாக, இந்த யுத்தத்திலே அதிகமாகப் பாதிக்கப்பட்ட பெண்கள் வீதியோரங்களிலே கொட்டகை அமைத்து, தமது உறவுகளைத் திருப்பி

ஒப்படைக்குமாறும் அல்லது காணாமலாக்கப் பட்டிருப் பவர்களுக்கு என்ன நடந்தது என்பதைக் கூறுமாறும் குற்றவாளிகளுக்குத் தண்டனை வழங்கவேண்டும் என்றும் கோரித் தொடர்ந்து போராடிக் கொண்டிருக்கின்றார்கள். இவர்களது நிலைமைகளைத் தென்பகுதியில் உள்ள அமைச்சர்கள் மற்றும் பாராளுமன்ற உறுப்பினர்களாகிய நீங்கள் நேரில் சென்று பார்க்கின்றீர்கள்! ஆனால், இங்குவந்து நீங்கள் அவற்றைப்பற்றிக் கதைப்பதில்லை. உங்களுடைய சட்டங்களும் கொள்கைகளும் உங்களுடைய விவாதங்களும் தனிப்பட்ட முறையிலே உங்களுக்குள்ளிருக்கின்ற குரோதங்களை வெளிக்காட்டும் வகையிலும், தனிப்பட்ட முறையிலே கட்சிக்குள் நீங்கள் செல்வாக்குச் செலுத்தக்கூடிய வகையிலும்தான் இருக்கின்றனவே தவிர, பாதிக்கப்பட்ட மக்களுக்கு நிவாரணம் கொடுக்கக்கூடிய வகையில், அவர்களுக்கு விமோசனம் கொடுக்கக்கூடிய வகையில் இல்லாமலிருப்பதுடன், அவர்களும் இந்த நாட்டின் பிரஜைகள் என்ற வகையில் பேதமற்ற முறையில் நடவடிக்கை எடுக்க நீங்கள் மறுக்கின்றீர்கள்! நீங்கள் எமது தமிழ் மக்களை மூன்றாம்தரப் பிரஜைகளாகக் கருதாது, அவர்களும் இந்த நாட்டின் மக்கள் எனக் கருதுங்கள்! அவர்கள் 30 வருட கால யுத்தத்திலே பாதிக்கப்பட்டவர்கள்! அவர்கள் அந்தப் பாதிப்பின் விளைவிலிருந்து மீண்டெழ முடியாது தொடர்ந்தும் பாதிப்புக்களுக்கு முகம்கொடுத்துக்கொண்டு இருக்கின்றார்கள் என்ற விடயத்தை நீங்கள் ஏற்றுக்கொள்வதற்கு ஏன், மறுக்கின்றீர்கள்? என்று நான் உங்களிடம் கேட்க விரும்புகின்றேன்.

அன்று யுத்தத்திலே பாதிக்கப்பட்டு, 'ஷெல்' வீச்சுக்களுக்கு மத்தியிலும் 'பங்கர்'களுக்குள்ளும் இருந்து தமது கல்வியைத் தொடர்வதற்கு அந்தப் பிள்ளைகள் அனுபவித்த கஷ்டங்களை நானும் அனுபவித்திருக்கின்றேன். அந்தப் பிள்ளைகள் அதிலிருந்து மீண்டெழுந்து வந்தபோதிலும், தங்களுடைய கல்வித் தகைமைகளுக்கு ஏற்ற சரியானதோர் உத்தியோகத் தைப் பெற்றுக்கொள்ள முடியாத நிலையில் இருக்கின்றார்கள். அவர்கள் வேலைக்குத் தகுதியானவர்களாக இருந்தும்கூட, இன்னமும் வேலைதேடி அலைந்துகொண்டிருக்கின்றார்கள் இந்நிலையிலே, நீங்கள் தென்பகுதியிலிருந்து உத்தியோகத் தர்களை எமது பிரதேசங்களை நோக்கி அனுப்புகின்றீர்கள்! எனினும், அவர்கள் அங்கு மூன்று மாதங்களோ அல்லது ஆறு மாதங்களோ கடமையாற்றிவிட்டு, மீண்டும் மாற்றலாகித் தமது சொந்த இடங்களுக்குச் சென்றுவிடுகின்றார்கள். இதன் காரணமாக எமது வடக்கு, கிழக்குப் பிரதேசங்களில் தொடர்ந்து வெற்றிடங்கள் நிலவிவருவது பாதிக்கப்பட்ட மக்களை மேலும் பாதிப்படையச் செய்கின்றது.

எனவே, நீங்கள் இன, மத பேதமின்றி, பாதிக்கப்பட்ட இந்த மக்களையும் இந்த நாட்டின் பிரஜைகளாகக் கருதி - மூன்றாம் தரப்பினராகவோ, அல்லது மாற்றான் பிள்ளையாகவோ கருதாது - அவர்களும் ஓர் இயல்பு வாழ்க்கை வாழக்கூடிய வகையிலே, சுவீகரித்து வைத்திருக்கின்ற அல்லது பிடித்து வைத்திருக்கின்ற அவர்களுடைய காணிகளை விடுவிக்கவேண்டும். காணாமலாக்கப்பட்ட, இராணுவத்தின் கையில் ஒப்படைக்கப்பட்ட தமது பிள்ளைகள் தொடர்பான ஆவணங்களோடு இருக்கின்ற ஒவ்வொரு தாயினுடைய - அங்கு கொட்டில் போட்டு இருந்துகொண்டு பரிதவிக்கின்ற அந்தத் தாய்மாருடைய - கண்ணீருக்கு நீங்கள் பதில் கூறவேண்டும். எமது தமிழ்ப் பாரம்பரியத்திலே "அரசியல் பிழைத்தோருக்கு அறம் கூற்றாகும்" என்று கூறப்பட்டுள்ளது மட்டுமல்ல, அதற்கான ஆதாரங்களும் இருக்கின்றன. ஒரு தாயினுடைய கண்ணீரின் பெறுமதியானது விலைமதிக்க முடியாதது. இந்த விடயத்தில் தொடர்ந்து இழுத்தடிப்புக்களைச் செய்துவருகின்ற இந்த அரசு, அவர்களின் கண்ணீருக்குப் பதில் கூறியே ஆகவேண்டும்.

எனவே, நீங்கள் சட்டங்களை ஆக்குகின்றபொழுது, கொள்கைகளை வகுக்கின்றபொழுது, சுற்றுநிருபங்களை வெளியிடுகின்றபொழுது, அவை மக்களைப் பாதிக்குமா? அவற்றின் அமுலாக்கம் மக்கள் அனைவருக்கும் சரியாகச் சென்றடையுமா? என்பதை நீங்கள் ஒருதரம் சிந்தித்துப் பார்க்கவேண்டும். எல்லா மக்களையும் சமமான பிரஜை களாகக் கருதி, அவர்கள் ஓர் இணக்கப்பாடான சூழலிலே வாழ்வதற்கு ஆவன செய்யவேண்டுமெனக் கேட்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி!

[අ.භා. 5.10]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින සාකච්ඡාවට භාජනය කරන සමාගම් පනත සහ සමිති ආඥාපනත යටතේ නියෝග සම්බන්ධව කථා කිරීමට අවස්ථාවක් ලැබීම ගැන මා සන්තෝෂයට පත් වෙනවා. ඒ වාගේම අද මේ කථා කරන සමාගම් පනත සහ සමිති ආඥාපනත යටතේ නියෝග හරහා මේ රටේ අලුතෙන් ආරම්භ කරන සමාගම්වලට සහ අනෙකුත් ව්‍යාපාරවලට ලැබෙන අනාගත නිදහස ගැනත් මා සතුටට පත් වෙනවා. සමාගම් ගැන කථා කරනකොට විශේෂයෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වන ආදායම් ගැන කථා කළ යුතුම වෙනවා.

පසුගිය අවුරුද්ද අවසන් වන විට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සතු දත්තවලින් මා ලබා ගත් දත්ත අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති ආදායම් ගෙවන සමාගම්වල වර්ගීකරණය දෙස බැලුවා. උදාහරණයක් විධියට කියනවා නම් corporate sector එකේ වාසික සමාගම් තිබෙන්නේ, 45,295යි; විදේශ සමාගම් තිබෙනවා, 1,778ක්. රාජ්‍ය සමාගම් -State corporations - 81ක් තිබෙනවා. මේ ආදී වශයෙන් ලංකාවේ corporate sector එකේ සමාගම් 47,154යි තිබෙන්නේ. Non-corporate sector එකේ පුද්ගල ලියා පදිංචි සමාගම් හැටියට, එහෙම නැත්නම් ආදායම් උපදවන අය හැටියට 135,170ක් පමණ ඉන්නවා. හවුල් ව්‍යාපාර 11,439ක් තිබෙනවා. ඒ වාගේම associations, clubs වාගේ ඒවා 1,730ක් තිබෙනවා. බදු ආදායම් ගෙවන සේවකයින් 426,496ක් ඉන්නවා. වැඩ කරන ජනතාව හැටියට ඉන්නේ 426,496යි. මේ ආදී වශයෙන් සියලු දෙනාම එකතු කළාම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පසුගිය දත්තවලට අනුව තවම අපේ තිබෙන්නේ, 574,835ක පමණ tax files ප්‍රමාණයක්. ඉතින් මේක තමයි මේ රටේ පවතින වර්තමාන තත්ත්වය. මේ තත්ත්වය ගැන අපි කථා කරනකොට අතීතයේ වුණු සිද්ධිවලින් පාඩම් ඉගෙන ගෙන අනාගතයට මුහුණ දිය හැකි ආකාරය ගැන කල්පනා කළ යුතු වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

රාජ්‍ය ආදායම ගත්තාම පසුගිය කාලයේ අපි දැක්කා, රාජ්‍ය ආදායම දිගින් දිගටම කඩාගෙන වැටුණු බව. 1990 වසරේදී සියයට 20ක් වුණු රාජ්‍ය ආදායම 2014 වසර වන විට සියයට 10 දක්වා කඩාගෙන වැටුණා. අපි දැක්කා, පසුගිය කාලයේ ආර්ථික ඔස්තාර්ලා හිටිය බව. මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයෙක් හිටියා, පී.බී. ජයසුන්දර කියලා. එතුමා හිටියේ ආර්ථික ඔස්තාර් හැටියට. නමුත් ඒ ආර්ථික ඔස්තාර්ලා කළේ, මේ රටේ ආර්ථිකය සම්පූර්ණයෙන් කඩා වැටිටවීමයි. 1990 වසරේ දී සියයට 20ක්ව

[ගරු (මහාචාර්ය) ආෂු මාරසිංහ මහතා]

තිබුණු රාජ්‍ය ආදායම 2014 වසර වන විට සියයට 10ක් දක්වා කඩාගෙන වැටුණා. මේ රටේ ආර්ථිකය කඩා වැටීමට ප්‍රධාන හේතුව හැටියට බලපෑවේ මොකක්ද? ණය ගෙවන්න හැකි ව්‍යාපාර පටන් ගන්නේ නැතුව පසුගිය කාලයේ සුදු අලි ටිකක් හදලා ගිහිල්ලා තිබෙන ආකාරය තමයි අපි දැක්කේ. ඒ ක්‍රමවේදය තුළ අපි ණය ගෙවන්නේ කොහොමද, ආර්ථිකය ඔසවා තබන්නේ කොහොමද කියන භාරදුර කර්තව්‍යය රජයක් හැටියට අපට පැවරිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2016 වසර අවසානය වන විට 2014 සියයට 10ක් තිබුණු රාජ්‍ය ආදායම සියයට දහහතරහමාරක් වැනි ප්‍රමාණයකට ගෙනෙන්න අපට හැකියාව ලැබුණා. 2017 වසර වන විට රාජ්‍ය ආදායම සියයට 15ක් දක්වා තවත් ඉදිරියට ගෙනෙන්න හැකියාව ලැබිලා තිබෙනවා. මේ ආදී වශයෙන් වාර්ෂිකව රාජ්‍ය ආදායම සියයට 5කින් වැඩි කර ගෙන ඉදිරියට ගියේ නැත්නම් අපට මේ ණය කන්ද සඳහා තිබෙන අභියෝගයන් ජය ගන්න අපහසු වනවා. ඒ වාගේම රජයේ ව්‍යාපාර, අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා තිබෙන අභියෝගයන් කියන මේ දෙකමත් පැවරිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම රාජ්‍ය ණය ගැන කථා කරනකොට ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණයෙහි විකාශනය හා ස්වභාවය ගැන කථා කළොත්, 1950 වසරේ තිබුණු රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් මිලියන 654ක් පමණ වෙනවා. ඒක 1980 වන විට රුපියල් මිලියන 51,346ක් වුණා. 2015 වසර වන විට ඒක රුපියල් බිලියන 85ක් පමණ වනතෙක් වැඩි වුණා. මේ ආදී වශයෙන් රටට ඉතාමත් අහිතකර විධියට රාජ්‍ය ණය ප්‍රමාණයේ වැඩිවීමක් සිදු වුණා. 1950 වසරේ රාජ්‍ය ණය හැටියට තිබුණු ප්‍රමාණයයි, 2015 වන විට තිබුණු ප්‍රමාණයයි ගත්තාම, 1950 වසරේ ඒක පුද්ගල රාජ්‍ය ණය රුපියල් 87ක පමණ ප්‍රමාණයක් තමයි තිබුණේ. එතකොට මෙම ඒක පුද්ගල රාජ්‍ය ණය ප්‍රමාණය 1980 වන විට රුපියල් 3,482කට වැඩි වුණා. ඒ අනුව 2015 වන විට එක් පුද්ගලයෙක් රටේ ණය හැටියට ගෙවන්න තිබෙන ප්‍රමාණය 405,572 බවට පත් වෙලා තිබෙනවා. ලෝකයේ රටවල් අතරින් අපේ රටට කිට්ටුවෙන් තිබෙන තෝරාගත් ආසියානු රටවල් කිහිපයක 2015 වසරේ දී රාජ්‍ය ණය හා දළ දේශීය නිෂ්පාදන අනුපාතය ගත්තොත්, බංග්ලාදේශයේ රාජ්‍ය ණය සියයට 34ක් වන විට, ඉන්දියාවේ සියයට 67.2ක් වනවා. ඉන්දුනීසියාව සියයට 27.3ක් වනවා. මැලේසියාව සියයට 54.4ක් වනවා. පිලිපීනය සියයට 37.1ක් වනවා. තායිලන්තය සියයට 43.1ක් වනවා. වියට්නාමය සියයට 59ක් වනවා. එතකොට මේ region එකේ සියලුම රටවල් අතරින් වැඩිම රාජ්‍ය ණය ලබාගෙන තිබෙන්නේ ලංකාවයි. ලංකාවේ රාජ්‍ය ණය ප්‍රමාණය සියයට 76ක් වෙනවා. ඉතින්, මේක තමයි වර්තමාන තත්ත්වය. ආසියාතික රටක් හැටියට ගත්තාම අපේ මේ ණය කන්ද කියන එක දරා ගන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. එහෙම නම්, මේ අභියෝගය හරහා රට ඉදිරියට ගෙනයන්නේ කොහොමද කියන කර්තව්‍යයේදී, අපට තිබෙන අවස්ථා උපරිම ප්‍රයෝජනයට ලබා ගත්තේ නැත්නම් අපට ඉදිරියට යා නොහැකි තත්ත්වයක් ඇති වනවා.

මේ ඉදිරියට ගෙන යන ක්‍රියාමාර්ගවලදී ප්‍රධාන වශයෙන් අද අපට කථා කළ හැකි මාතෘකා කිහිපයක් පිළිබඳව මම කථා කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උදාහරණයක් විධියට GSP Plus හරහා භාණ්ඩ වර්ග 6,600කට වඩා වැඩි ප්‍රමාණයක් විදේශ වෙළෙඳ පොළ ආකර්ෂණය කර ගනිමින් වෙළෙඳාම් කරගත හැකි වෙනවා. යුරෝපා පාර්ලිමේන්තුව හරහා මේ GSP Plus සහනය ලැබීම තුළ ජාත්‍යන්තර වශයෙන් ලංකාව ලබා ගත් කීර්තිය අපි දැක්කා. මානව හිමිකම් පැත්තෙන්, යහ පාලනය පැත්තෙන්, අන්‍යෝන්‍ය සහජීවනය, උතුරු-නැඟෙනහිර ප්‍රශ්නය සම්බන්ධයෙන් අපි ගත් සාධනීය ක්‍රියාමාර්ග යනාදී මේ සියලු දේවල් උපයෝගී කරගෙනයි GSP Plus ලබා ගන්න අපට හැකි වුණේ. මේත් එක්කම අපේ නිවැරදි විදේශ ප්‍රතිපත්ති නිසා නොයෙකුත් විදේශ රටවල් හරහා ඒකාබද්ධ වෙමින් ව්‍යාපෘති පටන් ගන්න අද වන විට අපට හැකියාව ලැබී තිබෙනවා. පසු ගිය දවසක ගරු අග්‍රාමාත්‍යවරයා සමඟ ජපානයේ සංචාරය කරන්න මටත් අවස්ථාව ලැබුණා. එතකොට අපි දැක්කා, ජපන් රජයෙන් අපට ආධාර ලබාදීමට තිබෙන කැමැත්ත සහ අපිත් එක්ක ඒකාබද්ධවෙලා අනාගත සැලසුම් ක්‍රියාත්මක කරන්න තිබෙන හැකියාව ගැන සොයා බලන ආකාරය වෙනදාට වඩා වෙනස්ය කියලා. පුළුල් දැක්මකින් යුතුව ඒ ආධාර අපට ලබා දුන්නා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර ව්‍යාපෘති ජපානය සහ ඉන්දියාව එකතුවෙලා කරන තැනට ඇවිල්ලා තිබෙනවා. මෙය ඉතාමත් හොඳ වර්ධනයක්. ජාත්‍යන්තර වශයෙන් ගත්තොත්, අද ලෝකය විශ්ව ගම්මානයක් බවට පත්වෙලා තිබෙනවා. එම නිසා අප අවට තිබෙන අනිකුත් රටවල් එක්ක ඒකාබද්ධ වෙලා යන ගමන ඒ ආකාරයට ගියේ නැත්නම් අපට ඉදිරියට යන්න බැහැ. පසුගිය මාස එකහමාර තුළ ජපානය, ඉන්දියාව වැනි රටවල් හරහා Private-Public Partnership projects වාගේම Government to Government partnership projects වශයෙන් විශාල ප්‍රමාණයෙන් විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ හැකියාව අපට ලැබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කලින් කථා කළ මහින්ද අමරවීර ඇමතිවරයා ආයෝජන සම්බන්ධයෙන් කථා කළා. එතුමා කථා කරපු සමහර දේවල්වලට මමත් එකඟයි. මොකද, අද ලංකාවේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, ආයෝජන ආශ්‍රිතව විවිධ රාජ්‍ය ආයතනවල නිලධාරීන් ක්‍රියා කිරීමේදී තිබෙන ප්‍රධාන ගැටලු. ඒ කියන්නේ, සමහර ප්‍රතිපත්තිමය තීරණ කැබිනට් මණ්ඩලයෙන් ගත්තත්, රජයෙන් ගත්තත් මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න කල් යෑම තමයි තිබෙන දුර්වලතාව. මා දන්නා ව්‍යාපෘති කිහිපයක් තිබෙනවා. අවුරුදු දෙකක්, අවුරුදු තුනක් විදේශ ආයෝජකයන් ඇවිල්ලා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න උත්සාහ කළත්, විවිධ බලපෑම් ඔස්සේ විවිධ දේවල්වලින් මේ ආයෝජන ව්‍යාපෘති කඩාකප්පල් වුණා. BOI ආයතනය, මීට වඩා සක්‍රීයව මේ සඳහා දායකත්වය ලබාදෙන තැනක්, actual one-stop shop එකක්. දැනට තිබෙන්නේ non-stop shop එකක් වාගේ. එම නිසා මෙය one-stop shop එකක් වුණේ නැත්නම්, අනාගතයේදී ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ හැකියාව අපට ලැබෙන්නේ නැහැ. එය අපට තිබෙන ප්‍රධාන බාධකයක්.

ආයෝජන සම්බන්ධයෙන් නිලධාරීන්ගේ තිබෙන දැක්ම මීට වඩා සාධනීය විධියට වර්ධනය කර ගත යුතු වනවා. ඒ සඳහා තමයි අපේ රජය විසින් යෝජනා කර තිබෙන්නේ, මේ සියලු දේවල් එක තැනකින් කර ගත හැකි ආකාරයේ සුවිශේෂී ආයතනයක් මෙරටට අවශ්‍ය වනවාය කියලා. ඒ හරහා තමයි පුළුවන් වන්නේ, ආයෝජකයන් තව තවත් වැඩියෙන් ආකර්ෂණය කර ගන්න. ඒ ආකර්ෂණය කිරීම තුළින් සෘජු ආයෝජකයන්ට අවස්ථාව ලැබෙනවා, ඉතාමත් ඉක්මනින් තමන්ගේ තීරණ ක්‍රියාත්මක කරන තැනට පත්වන්න. එහෙම නැත්නම්, විදේශ ආයෝජකයන් පැමිණියාට පස්සේ ඒ අවශ්‍ය දත්ත ලබාගෙන, ඒ සඳහා තිබෙන විවිධ environmental හෝ economic වාර්තා ලබාගෙන ඉදිරියට යන්න තිබෙන කාල සීමාව වැඩි වනවා. මේ සියලුම තීරණ ගෙන ක්‍රියාත්මක කරලා ආයෝජන ව්‍යාපෘතියක් පටන් ගන්න දැනට අවම වශයෙන් සති 54කට වැඩි කාලයක් ගත වනවා. මෙය පුළුවන් තරම් කෙටි කරලා, කාලය අවම කරගෙන, අඩුම තරමේ

මාස දෙකක්, මාස තුනක් ඇතුළත මෙය ක්‍රියාත්මක කරන තැනට පත්කර ගත්තේ නැත්නම්, ලෝකයේ ඉදිරියට යන ආයෝජන ව්‍යාපෘති සමඟ තරගකාරී විධියට ඉදිරියට යා හැකි අවස්ථාවන් අපට ගිලිහී යනවා. මේ අභියෝගය අපට තිබෙනවා. රජයට තනියම මේ අභියෝගයට මුහුණ දෙන්න බැහැ. තමන්ට තිබෙන දැක්ම මීට වඩා පුළුල් විධියට, රටට ආදරය කරන ජනතාව විධියට නිලධාරීන් පැළැන්තියම ආයෝජන සම්බන්ධයෙන් බැලිය යුතුයි කියා මා හිතනවා. මේ කාර්යයන් ඉටු කර ගත්තේ නැත්නම් අපට තිබෙන අභියෝග ජය ගන්න බැරි වනවා.

ඒ විතරක් නොවෙයි. පසුගිය කාලයේ වැරදි තීරණ රාශියක් ගෙන තිබුණු බව අපි දැක්කා. අද අපි බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී ඒ සම්බන්ධයෙන් කථා කළා. උදාහරණයක් හැටියට, කෙරවලපිටිය වෙස්ට් කෝස්ට් බලාගාරයේ විදුලිය ලබා ගැනීම සඳහා වන Power Purchase Agreement එක ගත්තොත්, විශාල වශයෙන් අක්‍රමිකතාවන් වෙලා තිබෙනවා. මේ බලාගාර සම්බන්ධයෙන් Power Purchase Agreement එකට අනුව යෝජිත අවුරුද්දකට පස්සේ මේ ගිවිසුම් නැවත සමාලෝචනය කරලා ඒ සම්බන්ධයෙන් වන වියදම් අඩු කර ගත යුතුයි. නමුත් 2011 සිට පසුගිය අවුරුද්ද - 2016 - දක්වා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරලාත් නැහැ; ක්‍රියා මාර්ග ගෙනත් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මෙවැනි වැරදි තීරණ අපි දැක්කා. මේ වැරදි තීරණ නිසා විශාල වශයෙන් අපේ ජනතාවගේ බදු මුදල් රටට නොලැබී ගියා. ඒ විතරක් නොවෙයි. විදුලි බලය නිෂ්පාදනය වැනි දේවල්වලට ඉතාමත් අනවශ්‍ය විධියට වියදම් ගියා. ඉදිරි ආයෝජන සහ අනෙකුත් ක්‍රියා මාර්ගවලට අපි යන කොට මේ සියලු දේවල් නිවැරදි කර ගත යුතු වනවා. මේ යහ පාලන ආණ්ඩුව හරහා අපට ඒක කරගත හැකි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ආංශික අධීක්ෂණ කාරක සභා හරහා, අනෙකුත් කාරක සභා හරහා මුළු පාර්ලිමේන්තුවම ආණ්ඩුවක් බවට පත් වෙලා තිබෙනවා. 2017 වර්ෂයේත්, ඉදිරි කාලයේත් මෙම කාර්යයන් සක්‍රීයව ඉදිරියට ගෙනයමින් ආයෝජන අවස්ථා වැඩි කර ගන්න අපි බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරමින් මා නවතිනවා. ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you very much. Hon. Chandima Gamage, please.

[අ.භා. 5.25]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ස්තූතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් (ගාස්තු) හා සමාගම් (ලේකම්වරුන් පිළිබඳ) ඉදිරිපත් කර ඇති නියෝග පිළිබඳව අදහස් දැක්වීමට මම බලාපොරොත්තු වනවා.

2013 ජනවාරි මස 02 වැනි දිනැති අංක 1791/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා 2013 දෙසැම්බර් මස 18 වැනි දිනැති අංක 1841/8 දරන අති විශේෂ ගැසට් පත්‍ර මඟින් ඉදිරිපත් කර තිබුණු නියෝග වෙනුවට 2016 අය වැය යෝජනාවල 419 යෝජනාව අනුව, වසර තුනකට වරක් ගාස්තු සමාලෝචනය කර සංශෝධනය කිරීමට යටත්ව 2016.10.25 දිනැති අංක 1990/12 දරන අති විශේෂ ගැසට් නිවේදනය මඟින් නව ගාස්තු ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒ අනුව සමාගම් වර්ග කීපයක ලියා පදිංචි ගාස්තු සංශෝධනය කර තිබෙනවා. විශේෂයෙන්ම සීමාසහිත පොදු සමාගම්වල ලියා පදිංචි ගාස්තු සම්බන්ධයෙන් කිසිම වෙනසක් කරලා නැහැ. පැවැති ගාස්තුව ඒ විධියටම තිබෙනවා. ඒ වාගේම සමාගම් ලේකම්වරු ලෙස තනි පුද්ගලයන් ලියා පදිංචි කරනු ලබන ව්‍යාපාර සම්බන්ධයෙන් රුපියල් 2,500 සිට 5,000 දක්වා ගාස්තු ඉහළ නංවලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද රජයට වැඩිපුරම විවේචන එල්ල වන කාරණයක් තමයි, විදේශීය සමාගම්වලට විවිධ පහසුකම් සලසනවා කියන එක. එහිදී මා විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. මෙම නියෝග මඟින් අක්වෙරළ සමාගම් සඳහා ලියා පදිංචි ගාස්තුව රුපියල් 100,000 සිට 150,000 දක්වා වැඩි කර තිබෙනවා. හැම තිස්සේම විපක්ෂයේ උදව්ය රජයට ඇඟිල්ල දිග් කරන්නේ බහු ජාතික -විජාතික- සමාගම්වලට තැනක් දෙනවා කියලා. මේ නියෝග තුළින් අක්වෙරළ සමාගමක් ලියා පදිංචිය අලුත් කිරීමේ ගාස්තුව රුපියල් 50,000කින් වැඩි කර තිබෙනවා. ඒ වාගේම විදේශීය සමාගමක් විසින් ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ස්ථානයක් ලියා පදිංචි කිරීම සඳහා අය කළ ගාස්තුව රුපියල් 50,000 සිට 60,000 දක්වා වැඩි කර තිබෙනවා. සාමාන්‍ය සමිතියක් ලියා පදිංචි කිරීම සම්බන්ධයෙන් අපි ගත්තොත්, සමිතියක වාර්ෂික වාර්තා ගොනු කිරීම සඳහා අය කිරීම් සංශෝධනය කරලා නැහැ.

ඊළඟට සමාගම් ලේකම්වරුන් සම්බන්ධයෙන් කථා කරද්දී, සමාගම් ලේකම්වරු අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු වීම අනිවාර්යය කරල තිබෙනවා. විජාතීය සමාගම්වලට අපි තැනක් දෙනවා කියලා මෙච්චර කල් ගෙනාපු චෝදනාව මේ නියෝග මඟින් අපි ජාතික මට්ටමට, දේශීය මට්ටමට ගෙනැල්ල තිබෙනවා.

අද සමාගම් ගැන කථා කරද්දි විශේෂයෙන්ම විපක්ෂය කථා කරන්නේ, අවධානය යොමු කරන්නේ යෝජිත ත්‍රිකුණාමල තෙල් ටැංකි ගබඩා පර්යන්තය සම්බන්ධයෙනුයි. මෙය CEYPETCO ආයතනය සහ Lanka IOC ආයතනය අතර සාකච්ඡාවට යොමු වූ කරුණක්. මේක හවුල් ව්‍යාපාරයක් වශයෙන් පවත්වාගෙන යන්න යෝජනා වෙලා තිබෙනවා. 1930දී ඉදි කරලා අවසන් කරපු මේ තෙල් ටැංකි සංකීර්ණය අපි චීන වරාය කියලා හඳුන්වන ප්‍රදේශයේ ස්ථාපනය කර තිබෙනවා. මේ ගබඩා සංකීර්ණය ටැංකි 101කින් යුක්තයි. මෙට්‍රික්ටොන් ලක්ෂ 10ක් මේ ගබඩා සංකීර්ණයේ ගබඩා කරන්න හැකියාව තිබෙනවා. එක ටැංකියක ධාරිතාව ටොන් 12,100ක් පමණ වනවා. මෙය Upper Tank Farm සහ Lower Tank farm කියලා කොටසක් දෙකකට බෙදා තිබෙනවා. මේක දකුණු ආසියාතිකකරයේ ඉන්ධන ගබඩා කරන නිජපොළක් විධියට සංවර්ධනය කළ හැකි සම්පතක්. ඒත්, අදටත් ප්‍රයෝජනයට නොගන්නා සම්පතක් විධියට තමයි මෙය හඳුන්වන්න හැකියාව තිබෙන්නේ. ටැංකි 101 කින් භාවිතයට පත් වූ ටැංකි එකක් තිබෙනවා. ඒ වාගේම Lanka IOC සමාගම ටැංකි සියයෙන් 14ක් මේ වන විට පරිහරණය කරමින් ඉන්නවා. ඒ සඳහා ඇමෙරිකන් ඩොලර් ලක්ෂක පමණ මුදලක් රජයට ලැබෙනවා. ඒ වාගේම ඉතිරි ටැංකි 86 නිසොල්මනේ අදටත් තිබෙනවා. 1947 වර්ෂයේ සිට නිදහස ලබා 2003 වර්ෂය දක්වා

[ගරු චන්දිම ගමගේ මහතා]

මේ ටැංකි සියයම ප්‍රයෝජනයට ගත්තේ නැහැ. 2003 වර්ෂයේදී තමයි මෙයින් ටැංකි 14ක් ප්‍රයෝජනයට ගන්නට පටන් ගත්තේ. 2003 සිට 2017 දක්වා තවමත් ටැංකි 86ක් විනාශ මුඛයට යමින් තිබෙනවා. මේ කාරණය සම්බන්ධයෙන් කිසිදු රජයක් කිසිදු ආකාරයකින් අවධානය යොමු කළේ නැහැ. වාර්ෂිකව රුපියල් බිලියන 362ක පමණ මුදලකට තොග වශයෙන් ඉන්ධන මෙට්‍රික් ටොන් මිලියන 4ක් ආනයනය කරන බව විශේෂයෙන් කියන්නට ඕනෑ.

අද රට ආර්ථික වශයෙන් ගොඩ එමින් සිටියත් පසුගිය කාලය තුළ සිදුවුණු විවිධ දූෂණ නාස්ති හේතුවෙන් හදිසි තත්ත්වයකදී මාස හයක කාලයකටවත් අවශ්‍ය ඉන්ධන ගබඩා කර ගන්නට අවශ්‍ය මූල්‍ය පහසුකම් අපේ රට සතුද කියන ප්‍රශ්නයක් තිබෙනවා. සිංගප්පූරුවේ ඒ වාගේම එමීර් රාජ්‍යයේ ෆුජෙයිරා නගරය වැනි ස්ථානවල මේ වාගේ fuel hubs - ඉන්ධන ප්‍රතිඅපනයනය කළ හැකි ඉන්ධන කේන්ද්‍රස්ථාන- ලෝකයේ පිහිටුවා තිබෙනවා. එවැනි කේන්ද්‍රස්ථානයක් දකුණු ආසියාවේ ඇති කිරීමේ අවශ්‍යතාව අද රටට දැනෙනවා. එම නිසා මේ සඳහා විශාල ණය මුදලක් ගැනීම වෙනුවට IOC ආයතනය සහ ලංකා සිපෙට්කෝ ආයතනය හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීම තුළින් ලංකා රජයට නැත්නම් සිපෙට්කෝ ආයතනයට අධික ණය බරක් නැතිව මේ කටයුත්ත කර ගන්නට හැකියාව තිබෙනවාය කියා අපි විශ්වාස කරනවා. ඒ වාගේම ශ්‍රී ලංකා රජය සිපෙට්කෝ ආයතනය, IOC ආයතනය මේ සඳහා සම්බන්ධ වී කටයුතු කළ යුතුය කියා යෝජනා වෙලා තිබෙනවා. වර්ෂ 69ක් පරිහරණය නොකළ මේ සම්පත අද හවුල් ව්‍යාපාරයක් මඟින් පරිහරණය කර ලාභ ලැබීමට යෝජනා කර තිබෙන අවස්ථාවක මේ සම්බන්ධයෙන් විරෝධතා ඉස්මතු කරන පිරිසක් සිටීම ගැන ඇත්තටම මම කනගාටු වෙනවා.

එදා හම්බන්තොට වරායට මුදල් වැය කරලා කරපු නාස්තිය වෙනුවට ත්‍රිකුණාමලය වරාය සංවර්ධනය කර, මේ ඉන්ධන කේන්ද්‍රස්ථානය ආරම්භ කළා නම් අද ඒ කේන්ද්‍රස්ථානයෙන් ලබන ආදායම සහ ලාභය මත සැලකිය යුතු මුදලක් ණය ගෙවීම සඳහා උපයා ගන්නට හැකියාව තිබුණාය කියන එක මම ඒකාබද්ධ විපක්ෂයට මතක් කරන්නට කැමතියි. ඒ වාගේම අද අපි Lanka IOC සමාගම වශයෙන් හැඳින්වුවත්, Lanka IOC සමාගම සතුව ලංකා බැංකුවේ, EPF ආයතනයේ , ETF ආයතනයේ හා රාජ්‍ය ආයතනවල කොටස් තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකික කොටසුත් මේ ආයතනය තුළ තිබෙනවා. එම නිසා මේ ආයතනය සමඟ සම්බන්ධ වීම ලොකු අර්බුදයක් බවට පත් වීමට කිසිම හේතුවක් නැහැ. දේශපාලන ක්‍රියාවලියක් හැටියට තමයි මේ විරෝධතා පළ කළේ.

ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු කථා කරන අවස්ථාවේදී කිව්වා, "මේ ආණ්ඩුව බුල්ටෝ හදන ආයතනයක්වත් පටන් ගත්තේ නැහැ." කියා. එතුමන්ලාට බුල්ටෝ තමයි දෙන්න ඕනෑ. ඒ ගොල්ලන්ට වෙන දෙයක් කිව්වාට තේරෙන්නේ නැහැ. කර ගන්න හැකියාවකුත් නැහැ. බුල්ටෝ හැදුවේ නැති වුණාට GSP සහනය නැවත ලබා ගන්නට කටයුතු කර තිබෙනවා. ඒ වාගේම යුරෝපා මත්ස්‍ය තහනම ඉවත් කර ගෙන තිබෙනවා. ඒ වාගේම ප්‍රජාතන්ත්‍රවාදය මේ රටේ ක්‍රියාත්මක කර තිබෙනවා. ඒකට හොඳම උදාහරණය තමයි පසු ගිය මැයි දින රැළිය. මහින්ද මහත්මයාගේ ආණ්ඩුව කාලයේ මැයි රැළිවලට විපක්ෂය එනවාය කිව්වොත් මග රැක සිට ගහනවා. Galle Face පිටිටනියේ තුන් හුලස් කැල්ලක් අල්ලාගෙන ඒකට සෙනහ පුරවලා දැන් ලොකුවට කෑගැහැවුවාට, අපේ මැයි දින රැළියට කැම්බල් පිටියේ සිට බොරැල්ල දක්වා, බොරැල්ලේ සිට පුංචි බොරැල්ල දක්වා, පුංචි බොරැල්ලේ සිට මරදාන දක්වා, මරදාන සිට බුහාරි හන්දිය දක්වා , බුහාරි හන්දියේ සිට පංචිකාවත්ත හන්දිය දක්වා, පංචිකාවත්ත හන්දියේ සිට මාලිගාවත්ත හන්දිය දක්වා ඇති සම්පූර්ණ පාරවල, ඒ ක්‍රීඩා පිටිවල හැම තැනම සෙනහ පිරුණා. ඒක අපට රූපගත කරගන්න හැකියාවක් තිබුණේ නැහැ. මේක මහින්ද මහත්මයාගේ කාලයේ වුණා නම්, choppers 10ක් විතර දාලා රූපගත කරලා ලෝකය වටේම ප්‍රචාරය කරනවා මෙච්චර සෙනහ ආවා කියලා. යහපාලන ආණ්ඩුව ඒවාට මුදල් වෙන්කරලා තිබුණේ නැහැ. එම නිසා අපට ඒ කටයුත්ත කරගන්න බැරි වුණා. හැබැයි, යහපාලනය තිබුණේ නැත්නම් මහින්ද මහත්මයාගේ රැලියට සෙනහ එන හැටි බලාගන්න තිබුණා. එහෙම නොවුණා නම් එතැනට ආපු ප්‍රමාණයෙන් සියයට 10ක්වත් එන්නේ නැහැ. ඒක නවත්වන හැටිත් අපි දන්නවා. ඒ වාගේම මහින්ද මහත්මයා Port City ගිවිසුම හරහා හෙක්ටෙයාර විසි ගණනක් චීනයට සින්නක්කර විකුණන්න තීරණය කරලා තිබුණා. එම Port City එක දිහා බලමින් තමයි විජාතික බලපෑම්වලින් මේ රට ජාතිය බේරාගන්න කථා කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලබා දුන් කාලය අවසානයි.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
හොඳයි. ඒ වාගේම මේ රටට ආයෝජන එන්නේ නැහැ කියපු මන්ත්‍රීතුමන්ලාගෙන් මම අහන්න ඕනෑ හම්බන්තොට ගුවන් තොටුපළ හදලා, වරාය හදලා, ක්‍රීඩා පිටි හදලා ඒ වාගේම සම්මන්ත්‍රණශාලා හදලා ඒ කාලයේ ආයෝජන ගෙන්වා ගත්තාද කියලා. ආයෝජන තියා මැස්සෙක්වත් ආවේ නැහැ. නිකම්ම හදලා උඩ බලාගෙන හිටියා විතරයි. ඒවා නඩත්තු කිරීම සඳහා රාජ්‍ය මුදල් වෙනම වැය කරපු උදව්ය අද බලයකුත් නැතුව විපක්ෂයේ ඉඳගෙන, මන්ත්‍රීවරු 40 ගණනක්, 50 ගණනක් විතර තියාගෙන ආණ්ඩු ගන්න පුළුවන් කියලා බොරුවට කෑ ගහනවා. මේවායින් වෙන්නේ අභිංසක ජනතාව රැවටෙන එක විතරයි. අභිංසක ජනතාව රවටමින් මන්ත්‍රීවරු 40ක්, 50ක් තියාගෙන ආණ්ඩු හදනවා කියන එක හීනයක් බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා.

[අ.භා. 5.35]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපේ රජයේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද, විශේෂයෙන්ම මේ වකවානුව තුළ මේ රටට ඉතාමත් වැදගත් වූ සමාගම් පනතට අදාළ ගාස්තු සංශෝධනයන් ඇතුළු ඒ ක්‍රියා පටිපාටිය පිළිබඳවත්, එහි කාර්යක්ෂමතාව අනුව මේ රටට වැදගත් වන ආකාරයට අලුත් ගැසට් නිවේදනයක් පළ කරලා, ඒ පිළිබඳව අවධානය යොමු කරමින් පවත්වන මේ විශේෂ අවස්ථාවට සම්බන්ධ වීමට ලැබීම පිළිබඳවත් මා සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගෙවී ගිය කාල පරිච්ඡේදයත් එක්ක බැලුවාම විශේෂයෙන්ම වසර 20ක පමණ කාලයක් සමාගම් පනත තුළින් මේ රට තුළ විවිධ සමාගම් බිහි වුණු බව අපි දන්නවා. ඒ විතරක් නොවෙයි, මේ කාලය වන විට නොයෙක් රටවලින් ආයෝජකයෝ එනවා. විශේෂයෙන්ම කසළ ප්‍රශ්නය ගත්තත්, කසළ කළමනාකරණය කිරීම සඳහා මේ වන විට සමාගම් ගණනාවක් ලියා පදිංචි කරගෙන යනවා. අද බොහෝ විදේශ ආයෝජකයන් මේ රටට එනවා වාගේම, අනිවාර්යයෙන්ම ශ්‍රී ලාංකික ආයෝජකයින් සහ ශ්‍රී ලාංකික සමාගම් හැදිලා ඔවුනුත් මේ කටයුතු කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. එම නිසා අද මේ අවස්ථාව අපට ඉතාමත්ම වැදගත් කාර්ය භාරයක් ඉෂ්ට කරන අවස්ථාවක්. ඒ නිසා අනිවාර්යයෙන්ම මුළු රටටම ආයෝජනයන් ගලා එන වෙලාවක, විශේෂයෙන්ම ශ්‍රී ලාංකිකයින් හැටියට මේ රට තුළ සමාගම් පිහිටුවලා නිවැරදි නායකත්වයක්, ඒ එක්කම නිවැරදි ආයෝජනයක් කරන්න පුළුවන් ශක්තියක් තිබෙන පිරිස ඒක රාශි වීම වැදගත්.

අපි දන්නවා, විශේෂයෙන්ම ඉදිරි කාල පරිච්ඡේදය තුළ කිරීමට යන හම්බන්තොට ප්‍රදේශයේ සංවර්ධන වැඩ පිළිවෙළට අදාළ වීන සමාගම් ගැන කථා කළාට, එම සමාගම් සමඟ එන විවිධ කර්මාන්ත වාගේම ආයෝජනයන් සමඟ අද ශ්‍රී ලාංකිකයන් එකට එකතුවෙලා තිබෙනවාය කියලා. පසුගිය කාල පරිච්ඡේදය තුළ මේවා හතු පිපෙනවා වාගේ බිහි වුණු බව අපි දන්නවා. අතීතයේ සිදු වූ යම් දේවල් ගැන බැලුවාම, GSP+ සහනය අපට අහිමි වීමට පෙර කාලයේ මේ රට තුළ ඇඟලුම් ක්ෂේත්‍රයට අදාළව ඉතාමත් වැදගත් සමාගම් බිහි වුණා. විශේෂයෙන්ම ශ්‍රී ලාංකිකයින් හැටියට අපි දන්නවා, දිවංගත ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාල පරිච්ඡේදය තුළ මේ රටේ ඇඟලුම් ක්ෂේත්‍රය තුළ ඉතාමත් හොඳ, ඒ වාගේම වටිනාකමක් රටට ලබාදුන් විවිධ ආයතන බිහි වුණ බව. නමුත් ඒ ආයතනවලින් එකින් එක එම කාල පරිච්ඡේදය තුළදී වැඟිලා ගියා. යුද්ධයත් ඊට එක් හේතුවක් වුණා. පසුගිය අවුරුදු දහය තුළ මේ ක්ෂේත්‍රය තුළ නිවැරදි කළමනාකරණයක් තිබුණේ නැහැ. මහ ලොකුවට කයිවාරු ගහන හිටපු පාලන අධිකාරිය මේ දවස්වල මැයි දිනයෙන් උජාරුවට පත්වෙලා, මැයි දිනයේ රශ්නය පෙන්ව පෙන්වා සිටිනවා. ඔවුන් කම්කරුවන් පිළිබඳව මහා ලොකු උජාරුවෙන් කථා කරනවා. "අපි තමයි කම්කරුවන් වෙනුවෙන් බොහෝ දේවල් කළේ" කියලා ඔවුන් පුම්බාගෙන කථා කරනවා. අඩු තරමින් කම්කරු ප්‍රඥප්තියවත් මේ රටට ගෙනෙන්න ඔවුන්ට පුළුවන්කමක් තිබුණේ නැහැ. එදා කම්කරු ප්‍රඥප්තිය ගෙනෙන කොට එතුමා කිව්වා, "චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ජනාධිපතිනිය හැටියට මේක ගෙනෙන්න දුන්නේ නැහැ" කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රන් මංජුසාවක තබා තමයි මහින්ද රාජපක්ෂ මහත්තයා කම්කරු ප්‍රඥප්තිය ගෙනාවේ. අපි එතුමා ඒ කම්කරු ප්‍රඥප්තිය ගෙනාපු ආකාරය දැක්කා. කම්කරු ප්‍රඥප්තිය ගෙනැල්ලා කිව්වා, "මේකට දෙන්නේ නැහැ" කියලා. නමුත් මම මේ කාරණය සම්බන්ධයෙන් ප්‍රශ්න කරනවා. අද විපක්ෂයේ, ඒකාබද්ධ කල්ලියේ කිසිම කෙනෙක් මේවා අහන්න මෙතැන නැහැ. බොරුවට පිට්ටනිවල, වැසිකිළි ළඟ, පොළ ළඟ කයිවාරු ගැහුවාට අඩු ගණනේ මහජන නියෝජිතයෙක් හැටියට අපි කියන දේ හරිද වැරැදිද කියලාවත් කියන්න අද මේ පාර්ලිමේන්තු සභා ගැබ තුළ කිසිම කෙනෙක් නැහැ. මොකද, ඔවුන්ට මේවාට උත්තර දෙන්න බැහැ. ඔවුන් යම්කිසි යෝජනාවක් ගෙනැල්ලා, ප්‍රශ්නයක් අහලා හෙමින් පෑළ දොරින් පිටවෙලා යනවා. ඒ අයට මේවා අහගෙන ඉන්න පුළුවන්කමක් නැහැ; මේවාට පිළිතුරු දෙන්න පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා දෙවරක්ම මේ රටේ ජනාධිපති වුණා. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග හිටපු ජනාධිපතිතුමිය මේ කම්කරු ප්‍රඥප්තිය ගෙනෙන්න ඉඩ දුන්නේ නැහැ කියායි එතුමා එදා කිව්වේ. එතුමාට කම්කරු ප්‍රඥප්තිය ගෙනෙන්න තිබුණා. කම්කරු ප්‍රඥප්තිය නැති නිසා, මේ කම්කරු ප්‍රඥප්තිය ඉදිරියට ගෙනෙන්න පුළුවන්කමක් නොමැති වූ නිසා, මේ රටේ ඇඟලුම් ක්ෂේත්‍රය මහා භයානක තත්ත්වයකට පත්වෙලා තිබුණා.

කම්කරුවන් පිළිබඳව වාගේම මේ සමාගම් ක්‍රියා කරපු ආකාරය පිළිබඳව මා කියන්නට ඕනෑ. මගේ ආසනයේ, සේවකයන් 650ක් ඉන්න ඇඟලුම් කම්හලක් වහන්න කටයුතු යොදා තිබුණා. මේ කම්හලේ ආයෝජකයෝ පැනලා ගිහිල්ලා. සමාගම් පනත යටතේ ඒ ආයතන ස්ථාපිත කරපු ඇතැම් ආයෝජකයන් අද හොයා ගන්නවත් නැහැ. ඒ අය අත යට මුදල්වලටයි මේ ආයතන බාර දීලා තිබෙන්නේ.

මගේ අක්මීමන ආසනයේ, පින්නදූවේ (ආචාර්ය) රිචර්ඩ් පතිරණ මැතිතුමා ඉන්න කාලයේ පටන් ගත් "ඩයින් ලංකා" කියලා කම්හලක් තිබෙනවා. හැබැයි, මේ සමාගමට 2006 අවුරුද්දේදී සේවකයන්ට නිසියාකාරයෙන් EPF, ETF ගෙවන්න බැරි වුණා. ඒ වාගේම සේවකයන්ට දිය යුතු යම් යම් වැටුප් පවා දෙන්න බැරිව එදා උද්ඝෝෂණයක් - strike - කර තිබෙන කොට මේ සමාගම "ගිම්ලි ලංකා" කියලා ආයතනයක් බාර ගත්තා.

අපේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ වග කිව යුතු නිලධාරීන් මම හිතන හැටියට මේ රාජ්‍ය නිලධාරි කුටියේ ඉන්නවා ඇති. මම විශේෂයෙන්ම මේ කාරණය පැහැදිලි කරන්න ඕනෑ. මේ "ගිම්ලි ලංකා" කියන කොම්පැනියත් මේ ආයතනය බාර ගත්තාට, පසු ගිය සිංහල අවුරුද්දට පෙරාතුව මේ අයට වැටුප් සහ EPF, ETF ගෙවලා තිබුණේ නැහැ. ඒ නිසා ඒ සේවකයන් ලොකු උද්ඝෝෂණයකට එන්න ලෑස්තිවෙලා හිටියා. ඒ වෙලාවේදී මම කම්කරු ඇමති ජෝන් සෙනෙවිරත්න මැතිතුමාට සහ අපේ රාජ්‍ය ඇමතිතුමාට මේ කාරණය පිළිබඳව කියලා අපි කණ්ඩායමක් ගිහින් ඒ පිළිබඳව පරීක්ෂා කරලා බැලුවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අයට ඉඩම් පවා දීලා තිබෙන්නේ වැරැදි විධියට බව පරීක්ෂා කරලා බලනකොට ඔප්පු වුණා. "ඩයින් ලංකා" කියන සමාගමට ඉඩම් ලබා දී තිබුණත්, ඒ සමාගමේ සියලුම කොටස්කරුවන් විදේශිකයන්. විදේශිකයන්ට එහෙම ඉඩමක් දෙන්න බැහැ. එහෙම ඉඩම් දෙනවා නම් එහි කොටස්කරුවෙක් - පාර්ශ්වකරුවෙක් - ශ්‍රී ලංකාවේ ඉන්න ඕනෑ. එහෙම නැතිව තමයි ඒ ඉඩම් දීලා තිබුණේ. ඒ ඉඩම් ලියාපදිංචි කරලා නැහැ. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට අද උදේ මම ගියා. එහි සභාපතිතුමාත් එක්ක අපි සාකච්ඡා කරනකොට තමයි දැනගත්තේ, අඩු තරමින් මේ ඉඩම හරියට පවරා දීමක් වත් කරලා නැහැයි කියා. නිසියාකාර ගිවිසුමක් නැතිව තමයි මේ ඉඩම දීලා තිබෙන්නේ. ඒ අතරේ මේ අය "ගිම්ලි ලංකා" කියන සමාගමට මේ ආයතනය දීලා කෝටි ගණුන් මුදල් අත යට අරගෙන තිබෙනවා. මෙන්න, සමාගම් ලියා පදිංචි කිරීමේදී මේ කාරණා පිළිබඳව සොයා බලා කටයුතු නොකිරීමේ ප්‍රතිඵලය. ඒ නිසා මොකද වුණේ?

අද සේවකයන් 650කගේ කම්කරු අයිතිවාසිකම් සියල්ල ඉතාම කනගාටුදායක ලෙස පැත්තකට ගිහිල්ලා තිබෙනවාය කියා මා හිතනවා. මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. මෙවැනි එක ආයතනයක් තමයි, "ගිම්ලි ලංකා" සමාගම. හැබැයි, මේ රටේ ක්‍රියාත්මක වන බොහෝ ආයතන දිහා බැලුවාම පෙනෙනවා, රජයේ ඉඩ කඩම් තමයි මේ වෙනුවෙන් දීලා තිබෙන්නේ කියලා. LLRC එකේ ඉඩම් දීලා තිබෙනවා. නමුත් මේ සියල්ලේ වලංගුභාවයක් නැහැ. හරියට කොන්දේසි ඇතිව, ගිවිසුම් අත්සන් කරලා නොවෙයි මේ ඉඩම් දීලා තිබෙන්නේ. රජයට බදු වශයෙන්

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

ලබා ගන්න තිබෙන විශාල මුදලක් මේ නිසා අද නැතිවෙලා තිබෙනවා. මේ නිසා රජයට ආදායම් බදු හැටියට එකතු වෙන්න තිබෙන කෝටි සංඛ්‍යාත මුදලක් අපට අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා අද අපි තීන්දුවක් ගත්තා, ඒ ආයතනය "ස්ටාර් ගාමන්ට්" කියන ආයතනයට ලබා ගන්න.

මේ ගැන කථා කරන කොට අපට මේ දෙයත් කියන්න වෙනවා. මේ ආයතනය හදලා තිබෙනවා, ගොඩනැඟිලි හදලා තිබෙනවා, කර්මාන්තශාලාවට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ගෙනැල්ලා තිබෙනවා, කර්මාන්තශාලා පවත්වාගෙන ගිහිල්ලා තිබෙනවා. හැබැයි, ඉඩමේ අයිතියක් කවදාවත් ඒ සමාගම්වලට දීලා නැහැ. මේ වාගේ හොර තක්කඩිකම් කරලා, මේ රටේ අහිංසක මිනිසුන්ගේ ශ්‍රමය සූරාගෙන කාලා, විදේශ රටවලට ඇහලුම් අපනයනය කරලා කෝටි සංඛ්‍යාත මුදල් ලබා ගෙන අවසානයේ පැදුරටත් නොකියා පැනලා යන්න ඇති.

අද ඩයින් ලංකා සමාගමේ එක නියෝජිතයෙක් හොයා ගන්න නැහැ. අද ගිම්ලි ලංකා සමාගමේ කිසිම කෙනෙක් නැහැ. ඒ ආයතනයට ලියුමක් දැම්මාම ආපහු එනවා. එහෙම ආයතන නැහැ. මම කියන්නේ මෙන්න මේකයි. තමන්ට ඕනෑ විධියට තමන්ගේ බුදල් වාගේ මේවා පරිහරණය කරලා අවසානයේ මේ රටේ සම්පත් සූරාගෙන කනවා. මහින්ද රාජපක්ෂ පාලනය තුළ ඕනෑම කෙනෙකුට, ඕනෑම විධියකට හම්බ කරන්න තිබුණු ක්‍රමවේදය අපි නැති කරන්න ඕනෑ. ඒක කරන්න අවශ්‍ය වෙනවා. මම ඒ කාරණයයි කියන්නේ.

කසළ කළමනාකරණය කිරීමට, කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා අද විවිධ සමාගම් එනවා. ඉතාලියෙන් එනවා, දකුණු කොරියාවෙන් එනවා, ජපානයෙන් එනවා. ඒ වාගේ විවිධ රටවලින් ඇවිල්ලා මෙහේ පාර්ශ්වකාරයන් ගන්න සමාගම් ලියාපදිංචි කරනවා. මේවා කොන්ත්‍රාත්තුවට එහෙම නැත්නම් ආයෝජනයට විතරයි. මේවායේ තිබෙන ක්‍රියාත්මක වීම පිළිබඳව අද තිබෙන කනගාටුදායක උදාහරණයක් තමයි ඩයින් ලංකා සහ ගිම්ලි ලංකා කියන සමාගම් මේ රටට කළ පාඩුව.

ගරු අමාත්‍යතුමා අද අලුත් ප්‍රවේශයකට ඇවිල්ලා තිබෙනවා. මේ රටේ කිසිම විනයක් නැතුව, නිකම් ඔහේ ඉබා ගාතේ යන යම් යම් දේවල් අද නියම track එකට දාලා, නියම පියවර ගන්නට අවශ්‍ය පසු බිම අද සකස් කරමින් යනවා. අපේ රජය පසු ගිය කාලය තුළම කළේ ඒකයි. බොහෝ දෙනෙක් අහනවා, "මොකක්ද මේ ආණ්ඩුව කරලා තිබෙන්නේ?" කියලා. මේ ආණ්ඩුව මෙතෙක් කළේ ඒකයි.

නීතියේ ආධිපත්‍ය විනාශ වෙලා ගිය යුගයක, නීතිය කැලෑ වැදිලා තිබුණ යුගයක නීතියේ ආධිපත්‍ය තහවුරු කරන්න අවශ්‍ය පනත් කෙටුම්පත් විශාල සංඛ්‍යාවක් අපි ගෙනාවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් ඉතාමත් හොඳින් අද රටේ කොමිෂන් සභා ටික පත් කරලා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, යුක්තිය, සාධාරණත්වය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය පසු බිම සකස් කර තිබෙනවා. ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමා ඉතිහාසයේ අවුරුදු ගණනක් ගෙනෙන්න බැරි වුණු "තොරතුරු දැන ගැනීමේ පනත" ගෙනැල්ලා අද ඒක ස්ථාපිත කරලා තිබෙනවා. ඕනෑම දෙයක් විනිවිදභාවයෙන් බලන්න පුළුවන්, විනිවිදභාවයෙන් ඕනෑම ලේඛනයක් ගන්න පුළුවන් අවස්ථාව මේ රටේ ජන්දය දීපු ජනතාවට අද ලැබිලා තිබෙනවා. එහෙම එකක් තිබුණාද, පසුගිය කාලයේ? එහෙම දෙයක් කරන්න පුළුවන්කම තිබුණාද?

පෙත්සම්කාරක සභාවට ඉදිරිපත් කළ ප්‍රශ්නයක් ගැන අද කථා කරලා තිබුණා. එහි සමහර අයට ඕනෑ හැටියට නියෝග දීලා තිබුණා; සමහර තැන්වල කිසිම ටෙන්ඩර් පටිපාටියක් නැහැ. තමන්ගේ දේශපාලන නායකයාට, අමාත්‍යවරයාට ඕනෑ විධියට කටයුතු කරලා තිබෙනවා. නිසියාකාර ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තිබුණේ නැහැ. මොකද මෙහෙම තත්ත්වයන් වෙලා තිබෙන්නේ?

දැන් නියම ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුළ කටයුතු කරනවා. අපි ගමට ගියාම එක්සත් ජාතික පක්ෂයේ බොහෝ දෙනෙක් කියනවා, "අඩු ගණනේ මේ ලක්ෂ දහයේ ව්‍යාපෘතියවත් අපේ ගමේ කෙනකුට ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් අපේ අගමැතිතුමා කළේ නැහැ" කියලා. එහෙම චෝදනා කරනවා. එහෙම කියන්නේ මොකද? අගමැතිතුමා මේ සියල්ල ටෙන්ඩර් පටිපාටියට අනුව කරන්න කටයුතු කළා. රුපියල් ලක්ෂ දෙකේ ව්‍යාපෘතියත් ටෙන්ඩර් කරන්න කිව්වා, ලක්ෂ පහේ ව්‍යාපෘතියත් ටෙන්ඩර් කරන්න කිව්වා. ඒ නිසා විශාල මුදලක් ඉතුරු වෙලා තිබුණා. මගේ ආසනයේ ලක්ෂ 1,070ක මුදලක් එක වසරකට වියදම් කරන්න තිබෙනවා. දැන් ලක්ෂ 2,140ක් ලැබිලා තිබෙනවා. මේ ලක්ෂ 2,140 තුළ විශාල ප්‍රමාණයක් -සියයට 10ක විතර මුදලක්- රජයට ඉතුරු වෙලා තිබෙනවා, මේ ටෙන්ඩර් පටිපාටිය තුළ. එහෙම කරන්නේ මොකද? මේ ආණ්ඩුව මූල්‍ය විනිවිදභාවයක් ඇති කරලා තිබුණා. එතැනින් එහාට ගියාට පස්සේ මේ රටේ ඕනෑම නිලධාරියෙකුට කොන්ද කෙළින් තියාගෙන වැඩ කරන්න පුළුවන් හැකියාව අද ලැබිලා තිබෙනවා.

අද අපට බොහෝ දෙනෙක් කියනවා, "ප්‍රාදේශීය ලේකම් අපි කියන විධියට වැඩ කරන්නේ නැහැ" කියලා. සමහර වෙලාවට චෝදනා කරනවා. නමුත්, ඒක තමයි අපට අවශ්‍ය වෙන්නේ. දේශපාලනඥයාගේ ඕනෑ-එපාකම්වලට, දේශපාලනඥයාගේ අභිමතාර්ථය අනුව මේ රටේ වැඩ කරපු කාලපරිච්ඡේදය දැන් අවසන්. දේශපාලනඥයා ඉන්න ඕනෑ, නායකත්වයේ. දේශපාලනඥයා මහ පෙන්වන්නට ඕනෑ. දේශපාලනඥයා කැබිනට් මණ්ඩලයට ඒ දේවල් ගෙනැල්ලා නීති-රීති, රෙගුලාසි ක්‍රියාත්මක කරන්න ඕනෑ. හැබැයි, හොරුන්ට, තක්කඩින්ට ඕනෑ විධියට කටයුතු කරන්න අවශ්‍ය කරන පසු බිම අපි සකස් කළේ නැහැ. ඒක පසුගිය ආණ්ඩු කාලයේ සකස් කරපු නිසා තමයි ඉතාමත් අවසානාවන්ත තත්ත්වයකට මේ රට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපේ විදේශ සම්පත් අපට අහිමි වුණා. අපට ලෝකයට කථා කරන්න දෙයක් ඉතුරු වුණේ නැහැ.

අද විශේෂයෙන්ම GSP Plus වාගේ දෙයක් අපට ලබා ගන්න අවස්ථාව ලැබිලා තිබෙනවා. ඒ ගැන අද කවුරුවත් කථා කරන්නේ නැහැ. GSP Plus සහනය ලැබීම ගැන කථා කරන්නේ නැහැ, මැයි දිනයේ ගෝල්ෆේස් ගැන කථා කරනවා. ඒ සහනය ලැබීම යටපත් කරන්න කථා කරන්නයි අද ඇවිල්ලා තිබෙන්නේ. ඒක එහෙම යටපත් කරන්න බැහැ. හෙට-අනිද්දා වෙන කොට මේ රටේ කර්මාන්ත ක්ෂේත්‍රයේ අලුත් අපනයන ඇතිවෙනවා. අපනයන භාණ්ඩ හයදහසක් මේ රටේ නිෂ්පාදනය කරලා ඒවායේ වාසිය අපේ රටට ලැබෙන බව මේ ගරු සභාවේදී අද කියැවුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩි පහක් දෙන්න පුළුවන්ද? අපේ ඇමතිතුමාත් කියනවා වේලාව ගන්න කියලා. ඇමතිතුමා ඉදිරිපත් කරන ලද නියෝග ගැනයි මේ කථා කරන්නේ.

සමහර අයට මේවා අද බොහොම නිසරදයක් බවට පත් වෙලා තිබෙනවා. නිකම් මිනිස්සු ටිකක් යම් පිටිටනියකට ගෙන්නලා, ඒක පෙන්වලා කියනවා, "මේ ආණ්ඩුව ඉවරයි" කියලා. මේ ආණ්ඩුව එහෙම ඉවර කරන්න පුළුවන්කමක් නැහැ. ආණ්ඩුව ඉවර වෙන විධියට වැඩ කරන්න අපි ලැහැස්තිත් නැහැ. පසුගිය අවුරුදු දෙකක කාලය තුළ අපේ අඩු පාඩුකම් තිබුණා නම්, අපි ඒවා නිවැරැදි කර ගෙන සියලු ජන කොටස් එක්ක එකට එකතු වෙලා ඉදිරියට යනවා. ඔබතුමන්ලාගේ ද්‍රවිඩ ජනතාවත්, ඒ වාගේම මුස්ලිම් ජනතාවත්, මැලේ වැනි සුළු ජාතීනුත්, සිංහල ජනතාවත් එක්ක ඒ අයගේ අනාගතය පිළිබඳව ඉතාමත් පැහැදිලි වැඩ පිළිවෙළක් එක්කයි අපි ඉදිරියට යන්නේ. ජාතිවාදය තුළින් මේ රට හොල්මන් කරන යුගය අවසන් කරන්නට අපි ලැහැස්ති කරලායි තිබෙන්නේ. ජාතිවාදයේ උම්මත්තකයින් අද ඕනෑ තැනකට ගියාම මේ කාරණයයි ගන්නේ.

පසුගිය දවසක අපේ අධිකරණ හා බුද්ධ ශාසන අමාත්‍ය විජයදාස රාජපක්ෂ මැතිතුමා ඇතුළු පිරිසක් තායිලන්තයට ගියා. මමත් ඒ ගමනට සහභාගි වුණා. එහිදී අපේ අධිකරණ හා බුද්ධ ශාසන අමාත්‍ය විජයදාස රාජපක්ෂ මැතිතුමා මෙවර ජාත්‍යන්තර වෙසක් දිනය සමරන අවස්ථාව අපේ රටට ලබා ගත්තා. අද මේ අයගේ ඔළුවවලට මොනවා වෙලාද මම දන්නේ නැහැ. බෞද්ධ ආගම ගැන කථා කරන, ජාතික තත්ත්වයක් ගැන කථා කරන, දේශ හිතෛෂීකම ගැන කථා කරන මේ ඒකාබද්ධ විපක්ෂ කණ්ඩායම, බුදුරජාණන් වහන්සේගේ ඉපදීම, බුද්ධත්වය ලැබීම සහ පිරිනිවන්පෑම කියන දේවල් සිද්ධ වුණු දිනයේ -ජාත්‍යන්තර වෙසක් දිනය සමරන දවසේ- කළු කොඩි දමලා නොයෙක් උපක්‍රම කරන්න ලැහැස්ති වෙනවා. මම ඉතාමත් පැහැදිලිව මේ රටේ බෞද්ධ ජනතාවට, මේ රටේ සිංහල ජනතාවට කියනවා, අද මේවා කරන්නේ රජය -මේ ආණ්ඩුව- යම් කිසි අපහසුතාවකට පත් කරන්නට බව. එවැනි වැඩවලින් පුළුවන්ද මේ රට ජාත්‍යන්තරය තුළින් ලබා ගත් කීර්ති නාමය නැති කරන්න? මානව හිමිකම් ආරක්ෂා කිරීම පිළිබඳව ඉතාමත් හොඳ වැඩ පිළිවෙළක් දැන් මේ රටේ ක්‍රියාත්මක කරලා තිබෙනවා. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සංවිධාන, ලෝකයේ ඉතාමත් බලවත්ම රටවල් දෙක, තුන අද අපේ රට පිළිබඳව බොහොම අභිමානයෙන් කථා කරන තත්ත්වයට පත්ව තිබෙනවා. මෙවැනි ආකාරයට කළු කොඩි දමලා, ගෝල්ෆේස් එකට මිනිස්සු ටිකක් ගෙන්වලා ඔළු ගෙඩි ටිකක් පෙන්වලා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැති කරන්න යම් කෙනෙක් ලැහැස්ති වෙනවා නම්, එහෙම කරන්නේ උම්මත්තකයින් පිරිසක් කියලා මම හිතනවා. ඒ උම්මත්තකයින්ට නැවත මේ රට පාලනය කරන්න දෙන්න බැහැ. මේ උම්මත්තකයින්ට මේ රටේ පාලනය තුළින් නැවත වරක් මේවා නැති කරන්න ඉඩ දෙන්නේ නැහැ. මේ වාගේ අය නැවත බලයට පත් කර, නැවතත් තමන්ගේ ජනාධිපතිකම සින්නක්කරයට ලියා ගන්න, සංශෝධන ඉදිරිපත් කරලා කොමිෂන් සභා ඉවත් කරලා කැලැ නීතිය රජ කරවපු පාලකයාට ඕනෑ විධියට නැවත වරක් මේ රට විනාශ කරන්න පුළුවන් තත්ත්වයකට පත් කරන්න ඉඩ දෙනවාද කියන එක මේ රටේ බුද්ධිමත් ජනතාවගෙන්, -මුළු රටෙන්ම-මම අහනවා.

මේ සමාගම් පනත තුළින් අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත්, අපේ අමාත්‍ය මණ්ඩලයත්, අපේ ආණ්ඩුවත් බලාපොරොත්තු වෙන්නේ ඉතාමත්ම විනිවිදභාවයක්, නිවැරැදිභාවයක්, ක්‍රමවේදයක් එක්ක යන්නයි. මෙහිදී අපිට පැහැදිලිව පෙනෙනවා සමාගම් ලියා පදිංචි වුණාට වැඩක් නැහැ කියා. ඒ සමාගම්වල තිබෙන යම් යම් කාර්යයන් පිළිබඳව, එනම් ඒ ගිවිසුම්වලට ඇතුළත් වන ආකාරය, සමාගම් විසින් ලේඛන සැබෑ බවට සහතික කිරීම, කොටස් නිකුත් කිරීම, කොටස් හිමියන්ට බෙදා හැරීම, කොටස් හිමියන්ගේ බලතල හා වගකීම්, සමාගම් පරිපාලනය හා කළමනාකරණය, සමාගම් වාර්තා රැස්වීම් වාර්තා, ගිණුම් වාර්තා, මූල්‍ය ප්‍රකාශන, විගණකවරුන් පත් කිරීම, ඔවුන්ගේ ගාස්තු හා වියදම්, සමාගම් කටයුතු විමර්ශනය, අධ්‍යක්ෂවරුන්ගේ කාර්ය භාරය, උපදේශක සභා වාගේ ඒ සියලු දේවල් පිළිබඳව සොයන්න, ඒ පිළිබඳව අවශ්‍ය විමර්ශන කරන්න මේ සමාගම්වලින් වඩාත් ශක්තිමත්ව කටයුතු කරනවා. නිකම් බොරු ලේබල්වලට, බෝඩ් ලැලිවලට සීමාවී තිබෙන සමාගම් මේ රටෙන් තුරන් කරන්නට ඕනෑ. ඒ නිසා ඒ ගමනට ආණ්ඩු පක්ෂය හැටියට අපි ශක්තිය දෙනවා. අපි නිරන්තරයෙන් ඒ සඳහා බැඳී සිටිනවා. යහ පාලන රජයේ ඉතාමත් විශිෂ්ට ප්‍රතිඵලයක් හැටියට අපි මේ කටයුත්ත කරනවාය කියන එක ඉතාමත් ඕනෑකමින් සඳහන් කරමින්, ඒ සඳහා සියලු දෙනාටම අපත් එක්ක එකතු වෙන්න කියලා ආරාධනා කරමින්, මගේ කථාව අවසන් කරනවා. මට කාලය ලබාදීම සම්බන්ධව ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

සමාගම් පනත: නියෝග
கம்பனிகள் சட்டம் : ஒழுங்குவிதிகள்
COMPANIES ACT: REGULATIONS

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
Hon. Deputy Chairman of Committees, I move,

"That the Regulations made by the Minister of Industry and Commerce including the new sub-section (ix) published in the Gazette Extraordinary No. 1998/11 of 20th December 2016, amending the Section 2(i)(b) relating to the Companies (Secretaries) Regulations under Section 527 of the Companies Act, No. 7 of 2007 published in the Gazette Extraordinary No. 471/6 of 14th September 1987 which were presented on 24.03.2017, be approved.

(Cabinet approval signified.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 5.54ට, 2017 අප්‍රේල් 06 වන දින සභා සම්මතිය අනුව, 2017 මැයි 05 වන සිකුරාදා පූ. භා. 10.30 වන තෙක් කල් ගියේ ය.

அதன்படி பி. ப. 5.54 மணிக்கு பாராளுமன்றம், அதனது 2017 ஏப்பிரல் 06ஆம் திகதிய தீர்மானத்துக்கிணங்க, 2017 மே 05, வெள்ளிக் கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது

Parliament adjourned accordingly at 5.54 p.m. until 10.30 a.m. on Friday, 05th May, 2017 pursuant to the Resolution of Parliament of 06th April, 2017.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.